kathapothak.blogspot.com



මහේෂ් රත්සර මද්දුම ආරච්චි

# තඹ පාට හැන්දෑව

# 01

kathapothak.blogspot.com

පාළුවක්, කාන්සියක් නොවසේනම් කිසියම් දුකට හුරු හැඟීමක් සිතෙහි දඟලනු, තෙරපෙනු මට දැනුණේ හිමිදිරියේ අවදි වූ තැන් පටන්ය. මේ දුකට පාළුවට නිශ්චය කරගත් හේතුවක් කියන්නට නොවූණි ද ජීවිතය පිළිබඳ කලකිරීමක් නම් මසිත වූ වග විශ්වාසය.

ඒ කලකිරීම කවදා කෙලෙස කොතැනක දී ඇති වූවක්දැයි මම නොදනිමි.

දරුවන් සිව් දෙනෙකුගේ පවුලක බාලයා වූ මම ජීවිතයෙන් හරි අඩකට වඩා නොඅඩුව ආදරය විඳි අයෙක්මි. මගේ අප්පච්චී රජයේ රැකියාව කළ නැත්පත් ශාන්ත ගති පැවතුම් ඇති නාගරිකයෙකු වූයේය. කිසිදිනෙක අපට පෙනෙන්නට මත්පැන් තොල නොගෑ ඔහු ඉඳහිට රහසේ ඒ කටයුත්තේ යෙදුණ බව දන්නේ අප ද වැඩිමහල්ලන් වූ පසුවය.

කවදාකවත් රැකියාවක් නොකළ අම්මා හා ඔහු ගෙවූ ජීවිතය හරිම සොඳුරු ආදරණීය එකකි. ඔවුන් කිසිවකට රණ්ඩු සරුවල් කර ගත්තේ නම් ඒ කලාතුරකිනි. එවැනි ආරවුලක දී ''මේ ගෑනිත් එක්ක වසන්නම බෑනේ.'' යැයි කීම තාත්තාගේ පුරුද්දය. ''එහෙනම් වසන්න පුලුවන් කෙනෙක් එක්ක යනවා.'' ඒ අම්මාගේ පිළිතුරය. අපි සිව්දෙනා කවමදාකවත් අම්මාගේත්, අප්පච්චීගේත් ඒ රණ්ඩු සරුවල්වලින් ශෝකයටත්, භීයටත් පත් වූයේ නැත.

අම්මාගෙනුත්, අප්පච්චිගෙනුත් ලද ආභාශය නිසාදෝ ලොකු අක්කාත්, අයියාත්, පොඩි අක්කාත් අදටත් හොඳ පවුල් ජීවිත ගත කරති. නොඑසේනම් යහපත් පවුල් ජීවිත ගත කරන බව ඔවුන් ලෝකයාට පෙන්වයි. එසේ පෙන්වන්නට කියාවත් මට පවුල් ජීවිතයක් නොවේ. අප්පච්චි මිය ගියේ ඔහුගේ අවසාන බලාපොරොත්තුව වූ මා විවාහ කරදීමේ සිහිනය සැබෑ කරගත නොහැකිවය. වයසට ගිය අම්මා තවම එම සිහිනය දකිමින් හිඳින වග මම දනිමි.

විවාහ වී දරුවන් ලැබ ගෙවන ජීවිතය පිළිබඳ ලෝභකමක් මා තුළ නැතත් අම්මාගේ සිහිනය සැබෑ කරන්නට නොහැකි වීම පිළිබඳ දුකක් මේ මොහොතේ ද මා සිතේ වේ. ජීවිතය පිළිබඳ සිතත් දී මට දැනෙන වේදනාව සිරුර තුළ වන තුවාලයක් පිටතින් පිරිමැද ලබන මිහිරි වේදනාවට සමාන එකකි.

අද වැඩට නොඑන්නට තිබිණි. වැඩට නොඇවිදින් කරන්නට යමක් ද නැත. මේ හිරිපොද වැස්සේ මා ගෙදර උන්නා නම් කරන්නේ නිදිමත යන්නට පොතක් කියවීමය. මට නිදිමත එන්නේ ද එයිනි.

''මට පොඩ්ඩක් ලොකු මහත්තයව හම්බ වෙන්න දෙන්න. මම මේ ගමන ආපු තුන්වෙනි වතාවනෙ.'' යාන්තමින් ඇසෙන ඒ සිහින් ගැහැනු කටහඬේ කෝපයක් නොඑසේ නම් ශෝකයක් විණි. කාමරයෙන් පිටතට ගොස් ඒ පිළිබඳ විපරම් කිරීමට සිත් වී ද එය මා වැන්නෙකුට නොතරම් යැයි සිතුණෙන් මං මොහොතක් කරබා උන්නෙමි.

''මේක හරි අසාධාරණයක්නේ. මහජන බදු මුදල්වලින් පාලනය වන ආයතනයක නිලධාරියෙක් හම්බවෙන්න මෙහෙම දුක් ගැහැට විඳින්නොන ද...?''

කටහඬින් ඈ තරුණය.

''අඩුම ගානේ මට මේ ගැන පැමිණිලි කරන්නවත් යන්න ඉඩදෙන්න.''

ඇය දැක බලා ගැනීමේ ලෝභකමක්, උනන්දුවක් මා තුළ හට ගත්තේ මෙවැනි සිද්ධියක් සත වැකුණු මුල් අවස්ථාව මෙය නිසා නොවේ. දේශපාලනික වශයෙන් අසාධාරණයට ලක්වූවන්ට වන්දි ලබාදීමට ස්ථාපනය කරන ලද මෙම ආයතනය තුළ මෙවැනි



ගෝරනාඩු එමටය. නමුදු මෙම ගෝරනාඩුවෙහි හිමිකාරියගේ කටහඬ ලාබාලය. ඇය ගෙනෙන තර්කවල ස්වභාවය ද නිරවුල්ය. ඉන් එහා මට සිතන්නට ඉඩ නොලැබුණි. ලා නිල් පැහැති සාරියකින් සැරසිගත් විසිපස් වියැතියැයි කිව හැකි තරුණියක් මාගේ කාමරයට ගොඩ විණි. ඈ පසු පස මගේ කාර්යාල සහයකයා ද විය.

සර් මේ....''

කාර්යාල කාර්ය සහායකයා වූ ගුණසිරිට ඉන් එහා කතා කරන්නට ඉඩ නොතබා මම අතින් පිටතට යන්නැයි අණ කළෙමි. එය හිතාමතා නොකළ ද ඉන් යම් පෞරුෂයක් මවෙතින් දිස්වන්නට ඇත. ආවේගශීලී වූ යුවතියගේ දිරිය රත් වූ තාච්චියකට දැමූ අයිස් කැටයක් සේ දිය වී යනු මම දිටිමි. මා තුළ හටගත්තේ සියුම් ආඩම්බරයකි. මම ඇයට ඉදිරියේ වන අසුන අතින් පෙන්වීමි.

''බොහොම ස්තූතියි සර්...''

පෙර දී ආවේගයෙන් කතා කළ ඇගේ කටහඬේ වූයේ ළයාන්විත බවකි. එක තත්රපයක් තුළ ගැහැනියක්, යක්ෂණියක් හා දෙව්දුවක් වෙන හැටි...?

''මොකද්ද කෙරෙන්න ඕන....''

''සර්... මගේ තාත්තා අනුවේ අන්තිම හරියෙ තුඩාවෙ වන සංරක්ෂණ නිලධාරී හැටියට වැඩ කරා. ඒ කාලේ දේශපාලන මාරුවක් හින්දා හිත් වේදනාවට තාත්තා වැඩට නොයා හිටියා.''

ඇය සන්සුන්ව ආයාචනාත්මක හඬින් කතා කරන අතර මං වරින් වර ඇගේ ඉරියව් කියවීමි. සිහින් දේහධාරී පැහැපත් යුවතියක වූ ඔ දිගැටි මුහුණක් ඇති දිගු ඇස් ඇත්තියක් වූවාය. කතා බහේ අනිසි කලබලයක් වී ද වචන පැහැදිලිය. අසා ඉන්නට ප්‍රියය.

''පස්සෙ තාත්තගෙ වැඩ තහනම් කරා. අනූ පහේ පත් කරපු කොමිසමෙන් තාත්තා වන්දි හිමි නාමලේඛනේට සුදුසුයි කියලා නම් කරා...''

''දැන් එතකොට කවුද වන්දි හිමියා.''

මා ඇසුවේ මේ කාමරය තුළ දී මා අසන සාම්ප්‍රදායික ප්‍රශ්නයකි. අනෙක් අතට ඇගේ ඉරියව් කියවමින් උන් මගේ මිතකයේ ඈ පැවසූ ඇතැම් කරුණු නොරැඳිණි.

''තාත්තා....''

ඇය කතා කරේ හඬන්නට අර අඳින දැරිවියක වාගේය.

''එහෙමනම් තාත්තා නේද මෙ ගමන එන්නෝන.''

''රස්සාව නැති වෙච්ච දා ඉඳලා තාත්තා ලෙඩ උනා සර්... මෙ වෙනකොට තාත්තට අංශබාගේ.''

යුවතියගේ දෑසේ කඳුලක් විණි. ඇය කෙරෙහි අනුපමේය අනුකම්පාවක් මසිතේ මෝදු විණි. නමුදු ඒ බවක් පළ නොකර හිඳින්නට මම පරිස්සම් වීමි.

''මං ෆයිල් එක චෙක් කරනකම ඔයා ටිකක් ඉස්සරහින් ඉඳගෙන ඉන්න.''

යුවතිය හුනස්නෙන් නොනැග්ගාය. ඒ වෙනුවට ඕ තියුණු බැල්මෙන් මාදෙස බලා උන්නාය.

''මෙතුවකට මට හම්බවුණේ ඔය උත්තරේ සර්... ඔතෙන් පස්සෙ මෙකේ අය කියන අනික් වචනෙත් මට කටපාඩම්.''

''මොකක්ද ඒ...''

මෙ යුවතියගේ ඍඩිතරකම සම්බන්ධයෙන් මසිතේ පැහැදීමක් ද ඒ වනවිට ගොඩනැගී තිබුණි.

''සතියකින් විතර ලියුමක් එයි. ඒ ලියුමත් අරන් වන්දි නිලධාරියා හම්බවෙන්න කියනෙක...''

මට සිනහ වන්නට උවමනා විය. නමුදු මම එසේ නොකළෙමි.

''ගෑනු ළමයෙක් උනාම ඔයිට වඩා මුදු මොළොක් වෙන්නෝන... පිරිමි ගහලා බැනලා යමක් දිනා ගත්තත් ගෑනුන්ට ඒ හපන්කම් කරන්න බෑ.''

මා කීවේ රළු හෝ දැඩි හඬකින් නොවේ. මලානික මන්දස්මිතයකින් මදෙස බලා උන් ඕ නැගිට කාමරයෙන් නික්මිණි. අද දවස තුළ ඇගේ කටයුත්ත නිමා කර දීමෙ උවමනාවක් මසිතේ විණි. ඒ සිතිවිල්ල කුමක් නිසා, කෙසේ හටගත්තා දැයි නොදත්ත ද ඉන් මට සහනයක්, සැනසිල්ලක් දැනිණි.

''ගුණසිරි අර දැන් ආපු ළමයගෙ ෆයිල් එක ගේනවා.''

අභ්‍යන්තර දුරකතනයෙන් කතා කළ මම නැගිට සැහැල්ලු සිතින් කවුළුවෙන් ඈත බැලීමි. පොද වැසි නිසාදෝ පාත විදිය පාළුවට ගොසින් තිබුණි. නමුදු මින් පෙරාතුව නොදුටු කිසියම් සොඳුරු බවක් වැස්සේ විණි. මගේ දැහැන බිඳුණේ දොර විවරවන හඬිණි. රෝස පැහැ ෆයිල් කවරයක් අතැති ගුණසිරි කාමරයට පිවිසිණි.

''මෙච්චර ඉක්මණට කොහොමද ෆයිල් එක එළියට ආවේ.''

''සර් මේකෙ ඔක්කොම වැඩ කෙරිලා තිබුණේ.''

''එහෙනම් චෙක් එක දෙන්න පරක්කු උනේ ඇයි...?''

ගුණසිරි බයාදු සිනහවකින් හිස කැසුවේය.

''සිල්වා මහත්තයලා චෙක් පාස් කරන්නේ පොරොත්තු ලේඛනේකටනේ සර්...''

''කෙහෙල් මල... උන්ට කීයක් හරි දුන්නම පොරොත්තු ලේඛන කැලේ...''

''ඒක නම් එහෙම තමයි සර්...''

ආයතනය තුළ මාගේ පෞද්ගලික ස්වරූපය දන්නා එකම සේවකයා ගුණසිරිය. එනිසා වෙන්දෝ ඔහු ඉදිරියේ ඕනෑම දෙයක් කියන්නට මට චකිතයක් නැත.

''සු සී ට කියනවා පැයක් ඇතුළත මේ චෙක් එක ලෑස්ති කරන්න කියලා... ඇවිල්ලා ඉන්නෙ වන්දි හිමියගේ දරුවා හින්දා චෙක් එක වන්දි හිමියගෙ ගිණුමට බැර වෙන විදිහට ලෑස්ති කරන්න කියනවා.''

''එහෙමයි සර්...''

මම ආයෙම කවුළුවෙන් පිටත බලාගත්තෙමි.

''සර් හරියටම පැයක් තුළනේ.''

ගුණසිරි ඇසුවේ දොර ඇරගන්වනමය.

''ඔව් අයිසෙ ඔව්.''

මා ගුණසිරිට සැර වූයේ බොරුවටය. තමන් පෙළන නිලධාරීන් පෙළන්නට ගුණසිරි මගේ මෙවැනි විධාන පාවිච්චි කරන වග දනිමි. ඔහුගේ අහිංසක පළිගැනීමට මම යටි සිතින් උල්පන්දම් දෙමි.

වසී... හදට වසී...

මම වළාකුලක පාවෙන්නාක් බඳු හැඟීමකින් වීදිය දෙස බලා උනිමි. හද වැස්සේම මගේ කාමරයේ හිඳ නික්ම ගිය යුවතිය පාර මාරුවනු මම දිටිමි. මොහොතකට පසුවේ ගැස්ම නතරව ගියාක් බඳු හැඟීමක් මට දැනිණි.

මම දහවල් කෑම පැය ගෙවෙන්නට  හැර බලා උන්නෙමි. පෙර කී යුවතිය පෙරළා ආවේ නැත. මහත් වූ නොසන්සුන්කමක් මගේ ඇතුලාන්තයට වද දෙන්නට ගත්තේය. ඇය දහවල් කෑම වේල පිණිස කොහේ හෝ යන්නට ඇතැයි මට සිතිණි. නොඑසේනම් මම එසේ සිතුවෙමි. ඒ සිතිවිල්ල මොහොතින් මොහොත හිතළුවක් බවට පත් වෙමින් තිබුණි. පෙරළා එතැයි සිතුව ද ඇය නැවත ආවේ නැත.

කාර්යාල කාමරයෙහි වන පැරණි තොම්සන් ඔරලෝසුව සවස තුන සනිටුහන් කළේය. කිසිවකු දොරට ගසන ලද්දේ ද ඒ මොහොතේමය. මම වහා යුවතියගේ ලිපිගොනුව පෙරලවා ගත්තේ ඒ ඇය වන්නට ඇතැයි සිතූ නිසාවෙනි. නමුදු විවර වූ දොරින් මතු වූයේ ගුණසිරිය.

"සර් කෑම ටික හීතල වෙනවනේ."

සෑම දිනකම දහවල් එක වනවිට මගේ කෑම මේසය සැකසීම ගුණසිරිගේ පුරුද්දය. බඩගිනි වී ද, නොවී ද දහවල් කෑම වේල එකට ගන්නට මා පුරුදු වී සිටියේ එනිසාය.

"මට බඩගිනි නෑ..."

"සර් දැන් තුනටත් කිට්ටුයිනේ."

"තුනට කිට්ටුයි නොවේ අයියේ දැන් තුනත් පහුවෙලා... කමුසෙට බඩගිනි නම් බත් ටික කාලා අස් පස් කරලා දානවා."

"එහෙමයි."

ගුණසිරි යන්නට හැරිණි. නන්නාඳුනනා යුවතියගේ මතකය යළිදු අලුත් විය.



"ගුණසිරි."

ගුණසිරි දොර හැරගත් වනම හැරී බැලීය.

"කෝ මේ මනුස්සයා..."

මම ලිපි ගොනුව අතට ගෙන පෙන්වීමි.

"විසිටින් රූම්මෙකේ සර්..."

"ඉන්නවද...?"

"ඔව් සර්... කතා කරන්නද...?"

"හ්ම්... කතා කරනවා..."

මසිතට සියුම් සතුටක් දැනිණි. සිතෙහි වූ බරක් බිම තැබුවාක් වැන්න. මම ලිපිගොනුව පෙරළා බැලීමි. චන්ද්‍රිහිමි ශීර්ෂය යටතේ සඳහන්ව තිබුණේ සිරිවංශ පුද්ගසිංහ ආරච්චි යන නමෙකි. හිමි චන්ද්‍ර මුදල දෙලක්ෂ අසූ හත්දහස් පන්සිය විසි එකයි සත පනහකි. චෙක් පත අද දිනට යොදා තිබිණි. හපන්කමක් කළ පුංචි දරුවෙකුගේ සිතට දැනෙන සතුටක්, සැහැල්ලුවක් මට දැනුණි. නමුදු ඒ සතුට සැහැල්ලුව බාල වයසින් මියැදිණි.

"ඒ මනුස්සයා ගිහින්නෙ සර්."

මම තත්පරයක් දෙකක් හෝ ඊට වැඩි කාලයක් එක එල්ලේ ගුණසිරි දෙස බලා උන්නමි.

"මං හැම තැනම බැලුවා සර්."

ගුණසිරි උත්තර බැන්දේ මගේ නියුණු බැල්මට විය යුතුය.

"ම..."

ඉන් එහා කිසිවක් කියන්නට වචන මගේ මුවට නොනැංගේය.

"සර්ට තේ ගේන්නද...?"

"එපා."

මට උවමනා වී තිබුණේ තනිවන්නටය. තනිකමක් සමඟ සිතට ගොඩවන ඉම්හිරි කරදරය විඳගන්නටය.

මට තිබුණේ පෙර යුවතිය මා ඉදිරියේ තබාගත්වනම ප්‍රශ්නය විසඳන්නටය. එය එසේ වූවා නම් රාජ්‍ය සේවය පිළිබඳ ඇ සිතේ වන කලකිරීම තුනී වන්නට තිබුණි. අනෙක් අතට රාජ්‍ය සේවය යකාට ගිය ද ඇගේ සිතෙහි මා හොඳ මිනිසෙකුය යන සිතිවිල්ල පහළ වන්නට තිබිණි. එක අතකට ඉන් මා හට ඇති ප්‍රයෝජනය කුමක් ද...?

කොහේවත් යන කෙල්ලක් මගේ හිත හැඩි කළ හැටි.

මම ලිපිගොනුව වසා දැමීමි. කාර්යාලයේ සාමාන්‍ය සම්ප්‍රදායට අනුව නම් මා දූන් මෙය ප්‍රධාන ලිපිකරු වෙත යැවිය යුතුය. නමුදු හිත ඊට ඉඩ නොදුන් තැන ලිපිනය පමණක් කඩදාසියක ලියා ලිපිගොනුව මගේ බ්‍රිෆ් කේසයේ දමා ගතිමි.

''චතුරිකා... ටිකක් එන්ඩ.''

අභ්‍යන්තර දුරකතනයෙන් කන්තෝරුවට කතා කළ මම කවුළුවෙන් පාත බලා සිට ගතිමි. ඇසට පෙනෙන හැම මං මාවතක්ම තෙත බරිතව ගොසිණි.

''සර්...''

සිහින් කෙසඟ යුවතියක වූ චතුරිකා දොරකඩ විණි. සිරුරින් පිරිපුන් යුවතියක් නොවුණ ද ඈ ඇන්දේ පැළැන්දේ අඟ පසඟ පෙනෙන පරිදිය. ඇය දුටුවන මට මෙනෙහිවන්නේ ටෙලිවිෂනයේ විලාසිතා දක්මක වූ බටහිර යුවතියකි. උන් සෝමාරිය. පෙනුමට කෙසඟය. නමුත් කුමක්දෝ සිත් ඇදගන්නා සුළු ගතියක් ඔවුන් තුළ වේ. චතුරිකාගේ රූප කායේ වන්නේ ද එවැනි අමුත්තකි. ඔය ඇය පිළිබඳ එක තත්පරයක් තුළ මගේ සිතෙහි හටගත් සිතිවිලි ගොන්නෙහත් අංශු මාත්‍රයකි.

''මෙන්න මේ එඩ්‍රස් එකට ටෙලිග්‍රෑම් එකක් ගහන්ඩ... දුටු විගස මා හමුවන්න කියලා.''

මම උන්හැනම හිඳ චතුරිකාට අතින් කඩදාසිය පෙන්වීමි. ඕ කඩදාසිය අතට ගෙන බලා පෙරලා මාදෙස බැලුවේ වරදක් දුටු කලෙක වාගේය.

''කාට ද සර් එඩ්‍රස් කරන්නෙ.''

''අහ්... ම...''



මට මෙනෙහි කරන්නට යමක් නොවිණි. සුදුසිංහ ආරච්චි යන පෙළපත් නාමය මට හොඳටම මතකය. නමුදු පුරුද්දට වාගේ මම කල්පනා බර වීමි.

''සුදුසිංහ ආරච්චි...''

චතුරිකා මේසය මතට නැඹුරුව නම ලියන්නට ගත්තාය. ඇය හදිසියේ යමක් මෙනෙහි වී වාගේ ගැඹුරු ගවොම්කරත් පපුවත් තදවන සේ අත්ල තබාගත්තාය. අඟ පසඟ පෙනෙන්නට අඳින පළඳින ඇය එය වසා ගන්නට දරණ උත්සාහය විලාසිතාවක් මෙතැයි මට සිතිණි.

''සර් මහත්මයා ද - මහත්මිය ද''

''ඔහොම දක්කම ඇති.''

මා එසේ කළේ පෙරකී යුවතිය ආයේම ගෙන්වා ගැනීමේ උවමනාවෙනි.

''මට මතක හැටියට මහත්මිය.''

එවර මම සාප්‍ර තීරණයක් ගතිමි. මහත්මිය යැයි සඳහන් කොට යැවූ විට නිසැකවම යුවතිය එනු ඇතැයි මට සිතිණි.

මා ඇය ගෙන්වා ගන්නට තතන්නේ කුමකට ද...?

රැය මැදියමට හැරෙත්දිත් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු සොයමින් උන්නෙමි. ඇය හිස් අතින් යැවීමෙන් මා අතින් විශාල වරදක් වී ඇතැයි මට සිතිනි. ඇගේ මලානික දිගු දෑසේ වූ අපරිමිත දුකක බර මගේ පපුවට දනෙමින් තිබිණි.

ඇය රෝගාතුර පියා හා තනිව වෙසෙනවා විය යුතුය. නොඑසේ නම් විවාහ වී දරුවන් ලැබූ ඇය ළඟ තාත්තා ජීවත් වනවා විය යුතුය. එය එසේනම් තාත්තාගේ වන්දි මුදල ගන්නට ඇයට සැමියා සමඟ එන්නට තිබුණා නොවේද? ඇය විවාහක එකියක් වන්නට බැරිය. විවාහ වී දරුවන් ලැබූ කතකගේ සිරුරෙන් දිස්වෙන ඕනෑනි බව ඇගේ සිරුරේ නොවේ. සමේ දීප්තිය සේම බැල්මේ කාන්තිය ද විවාහක එකියකට පිහිටන්නේ නැත. මේ සියලු සකලවිධ සිතිවිලි අස්සේ මට මා ගැනම සිනහා නැගේ.

රුවැති ගැහැනියකගේ බැල්මට පිරිමි සිතේ කෙතරම ලස්සන වෙනස්කම් ඇති කළ හැකි ද?

ඇගේ බැල්ම කැල්ම මගේ සිත ශෝකයෙන් බර කරන්නට යෙදුණු හැටි. දින සති හැලහොල්මනකින් තොරව අභියසට එක්වද්දී මා නොසන්සුන් වූ තරම්.

පුංචි සංදියේ මම තාත්තා යන ගමන්වලට පංගාර්තු වන්නට බෙහෙවින්ම ආශා කළෙමි. එවැනි ඔහුගේ ඇතැම් ගමන්වලට මා එක්වූයේ ඔහුගෙන් අප්‍රමාණ දොස පරොස් අසා සමහර විට ගුටි බැට ද කා හමාරවය. එය එසේ වුවද කවමදාකවත් තාත්තා මගේ හිත පාරවා රිදවා මා තනිකර දමා ගෙයින් බැහැර ගියේ නැත. බැන දොස් කියා හමාරව මා ගමනට එකතු කරගත්තේය. තාත්තා ඒ හිත් නැවුල යනතෙක්ම මට නොසැහෙන්නට සලකයි. ගමන පුරා මා ළං කොට තුරුල් කොට යන ඔහු නා නා ප්‍රකාර දේ මට කන්නට බොන්නට දෙයි.

තාත්තාගේ මේ දුර්වලකම අක්කලාත් පොඩි අයියාත් මාත් පමණක් නොව අම්මාත් දැන උන්නාය. අපි සිය පවුලම ඔහුගේ මෙම දුර්වලකමින් නොසැහෙන්නට ප්‍රයෝජන ගතිමු. තාත්තාගේ එවැනි අහිංසක සොඳුරු ගති පැවතුම් සිහිවන් දී පපුව බරට නෙතට කඳුළු උනයි.

වරෙක මා තාත්තා හා කොහේ හෝ යමින් හිඳිය දී පෙනුමට දුප්පත් අම්මා කෙනෙකු රැකවල් කරගනු පිණිස මට බෑගයක් දුන්නාය. බසයේ කවුළුවෙන් මගතොට නා නා ප්‍රකාර විසිතුරු බලමින් උන් මට උකුලෙහි වූ බෑගය අමතකව ගියේ එය දුන් තත්පරයේමය.

"බහිමු... බහිමු... සුදු මහත්තයෝ බහිමු."

පිටත අසිරියෙන් අමන්දා නන්දයට පත්ව උන් මම තාත්තාගේ කලබල කිරීමෙන් බසයෙන් බැස්සේ ආච්චි අම්මා බලාගන්නට දුන් බෑගය ද ගෙනය.

"මේ කාගෙද...?"

තාත්තා මා තුරුළු කොට උන් බෑගය උදුරාගෙන ඇසුවා මට මතකය. අච්චි අම්මාගේ බෑගය දැකීමෙන් මම දෙලෝ රත්විමි.



"ආච්චි අම්මා කෙනෙක් බස් එකේ දී තියාගන්න දුන්නෙ."

තාත්තා නළලත අත්ල ගසා ගත්තා මට මතකය.

"ඉතිං බුරුවෝ උඹ මේක අරං බැස්සේ අහවල් එහෙකටද...?"

"අමතක උනානේ තාත්තෙ."

සිතෙහි වන තිගැස්ම මගේ නෙත කඳුළින් පිරී තිබෙන්නට ඇත. මා පෙර කී තාත්තාගේ දුර්වලතාවය ඉස්මතු වීමෙන්දෝ හෙතෙම මගේ හිස පිරිමැද හිස් මුදුන සිඹබෙය. අනතුරුව බෑගය විවර කර බැලුවා මට මතකය.

"කුඩෙකුයි... හැඹිලියකුයි."

තාත්තා හැඹිලිය විවර කර බැලුවේය. එහි වූයේ රුපියල් හතලිහකුත් සිල්ලර කාසි කිහිපයකුත්ය. ඒ හැරුණු විට එහි ලිපිනය ලියූ කඩදාසි කැබැලි කිහිපයකුත් විය.

"පව් කවුරුහරි දුප්පත් මනුස්සයෙකුගෙ."

පුසුමක තැවරිගත් තාත්තාගේ දුක්බර කටහඬ රත් වූ යකඩ බරු පරද්දෙන් මගේ පපුතුරට රිංගා ගත්තේය. ඒ යකඩ ඔරු එතැන් පටන් රැයක් දවාලත් නැතිව මට වද දිනි. මගේ ලියන මේසය පසෙක වූ නන්නාඳුනනා ආච්චි අම්මාගේ බෑගය දකින හැම විටෙකම මම හැඬුම්බර වීමි. කිරි බොන දරුවෙකුගේ මව ගෙළ මිරිකා මරා දමූවා සේ මම පශ්චාත්තාපවීමි.

මගේ සිත් වේදනාව තේරුම් ගත් තාත්තා මා හා එක්ව දෙදිනක් වෙහෙස මහන්සිව ආච්චිගේ ගෙදර සොයා ගත්තේය. අනුමාන කළා වාගේම ඇය දුප්පත් අසරණ මැහැල්ලක වූවාය. තාත්තා බෑගය ඇයට පවරා දී අතින් රුපියල් පන්සියක් ද ඇයට දුන්නා මට මතකය. තාත්තා ගැන මසිතේ වූ භක්තිය පැහැදීම එක තත්පරයක් තුළ නුග රුකක් සේ මෝරා වැඩුණි.

"උඹ ආයෙම එහෙම මෙහෙම ගොන් වැඩක් කළොත් අනිනවා ඔළුව හිල්වෙන්න." තාත්තා ආච්චිගේ ගෙදරින් දොරට බැස මඳ දුරක් ආ පසු මට කීවේය. මම හිස වැනීමි.

"මඩගිනි ද...?"

"නෑ."

මා කීවේ තරහින් නොවේ.

"හොඳ තෝස කඩයක් තියෙනවා. කමුද...?"

"හා"

"අනේ මන්දා පුතේ."

මම එදා තාත්තාට හොරා තාත්තාගේ අත පිරිමැද බැලීමි. ඒ අත හරිම උණුසුම්ව තිබූ වග මට මතකයි. අනේ ඒ උණුසුම් අතින් ඔහු මා හිස පිරිමැද කෙතරම් නම් සිත් වේදනා මහිහින් ඇද දැමුවේද...?

එදා ආච්චි අම්මාගේ බැගය වාගේ අද තන්තාදූතන යුවතියගේ වන්දි හිමිකම් චෙක්ප මා සිත රිදවයි. පාරවයි. කම්පා කරවයි.

අනේ තාත්තා හිටියා නම්...!

"ගුණසිරි"

ගුණසිරි උන්නේ මාගේ කාර්යාල මේසය අස්පස් කරමිනි.

"සර්..."

"අර තාත්තගෙ වන්දියකට මරා ගන්න ගිය ගෑනු මනුස්සයා චෙක් එක හැදුවට පස්සෙ මේ පැත්ත පළාතක ආවෙ නැහැ."

මට උවමනා වූයේ කා සමඟ හෝ ඇය ගැන කතා කොට සිතෙහි වන දුක්බර තුසිත බව යම් තරමකට හෝ තුනී කරගන්නටය.

"අර නිල් ඇස් තියෙන සුදු ලස්සන නෝනා."

"තමුසේ ඔය බලලා තියෙන තරන් මං බැලුවේ නත් නෑ. මං කියන්නේ තමුසෙත් එක්ක රණ්ඩු කරපු මනුස්සයා ගැන."

"ඔව් සර්. මං කියන්නෙත් එයා ගැන තමයි."

තන්තාදූතනා යුවතිය පිළිබඳ ගුණසිරි කී කතාවෙන් මට සතුටක් දැනුණි. ඒ ඇයි කියා සිතන්නට මම නොවෙහෙසිමි.

"කොහොමටත් සර් ඉතිං ගෑනු දෙයක් දෙන කොට එපා කියනවා. නොදෙන කොට් අඬා වැටෙනවනෙ."



"ගුණසිරිගෙ පවුල එහෙමද...?"

"එහෙමදත් කියලා අහනවා... ඒකනං ඉතින් දෙනකොටත් අඬනවා. නොදෙන කොටත් අඬනවා."

මම යාන්තමට සිනාසුනෙමි.

"කෝකටත් ආයෙ ඒ ටෙලිග්‍රෑම් එක ගහන්න කියලා වතුරිකා මිස්ට කියනවකො."

"කෙරුණා වගේ තමයි සර්."

මම සියුම්ව මට කියන්නට උවමනාව තිබූ දෙය කියා ගතිමි. සිතට යම් සහනයක් දැනුණේ මෙවර විදුලි පණිවිඩය දැකී හෝ ඇය එතැයි සිතුණු නිසාවෙනි.

එළැඹී බදාදායින් නිවාඩු සහිත දීර්ඝ සති අන්තයක් ඇරඹිණි. බදාදා දවසේ කොයියම්ම මොහොතක හෝ තන්තාදූතනා යුවතිය එතැයි මා තුළ වූ බලාපොරොත්තුව සවස් වන් දී තුනී වී ගියේය. මට පාළුවක් - කාන්සියක් - සිත්වේදනාවක් දැනෙමින් තිබිණි.

"මොකෝ ළමයො හෝන්දු මාන්දු වෙලා."

අම්මා මා ප්‍රශ්න කරනතෙක් මාගේ හැසිරීමේ වෙනසක් වෙතැයි මට දැනී තිබුණේ නැත.

"මොකවත් නෑ අම්මා."

"මොකවත් ඇති කොට උඹ හැසිරෙන විදියයි. මොකවත් නැති කොට උඹ හැසිරෙන විදියයි මං දන්නැද්ද දරුවො."

"අම්මට විකාර."

"ඔව්... උඹත්තෙක්ක වසලා."

කෝපයක් සිතට දැනුණ ද මම එය පළ නොකළෙමි. ඒ වෙනුවට මුවගට උපහාස සිනහවක් නඟාගත් මම කාමරයට වැදුණෙමි. සිරුර තුළ කුඩා සතුන් සමූහයක් එහා මෙහා දිව යන්නාක් සේ මසිනෙ හැඟීම් නලියමින් තිබිණි. මම කාමරයෙන් කවුළු පියන් හැර බැලීමි. වසා දැමීමි.

යහනේ මුනින්නලා වැතිර මළාක් සේ නිසොල්මන්ව උන්නෙමි.

කෙළවර නැගිට කාමරයේ ඔබ මොබ ඇවිදිමි. අවසන මටුවිතකට මම හිත හදාගතිමි.

මුහුණකට සෝදා හැඳ පැළඳ මම ඔරලෝසුව දෙස බලා උන්නෙමි. රාත්‍රී අටයි තිහට තව විනාඩි දහයක් පමණ වේ. අටයි තිහේ ටෙලිනාට්‍යයට හිඳගන්නා අම්මාත් මෙහෙකාරියත් ඒ අඩ පැය තුළ මා මළත් සොයා බලන්නේ නැත. ඔරලෝසුවේ මිනිත්තු කටුව හය අංකය වසා ගත් තත්පරයේ මම නැකත එළඹියා වාගේ කාමරයෙන් පිටවීමි.

"අම්මා මම ටිකකට එළියට යනවා."

"මේ රෑ කොහෙද යන්නෙ."

අම්මා කතා කරන්නේ රූපවාහිනී තිරයෙන් ඇසි එහා මෙහා නොකරන්නට පරෙස්සමින්ය.

"පොඩි වැඩකට යාළුවෙක්ගෙ ගෙදරට."

"ඒ අහවල් එහෙකටද...?"

"වැඩකට අම්මා."

"යන තැනක ගිහින් රෑ වෙන්න ඉස්සර එනවා."

අම්මාට මා තවමත් කුඩා එකෙකි. ඇයගේ දැනුමට අනුව මට හිතුමතේ තීරණ ගත හැක්කේ විවාහ වූ පසුවය. විවාහ වූ පසුව තීරණ ගතයුත්තේ බිරිය යැයි සිතන කාන්තාවක් මට ලැබුණොත් පමණි. එසේ වුවහොත් ජීවිතයෙන් අඩක් අම්මාට යටත්වත් ඉතිරි අඩ බිරියට යටත්වත් ගෙවා දමන්නට මට සිදුවනු ඇත. ගෙදර ආධිපත්‍ය පිළිබඳව මහා ලොකුවට පම්පෝරි ගසන බොහොමයක් පිරිමින්ගේ තත්ත්වය එයයි.

අම්මා පිළිබඳ සිතේ දුවවුණු සිතිවිලි කෙළවර වූයේ මා නොසන්සුන් කළ යුවතියගේ මතකයෙනි. ඇය නාවේ ඇයි...? තම පියාගේ වන්දි මුදල වෙනුවෙන් තදබල අරගලයක යෙදුණු ඇය විදුලි පණිවුඩ දෙකක් නොසලකා හැරියේ මන්දැයි වටහාගත නොහැකිය.

කෝපය ආවේගය විසින් එය නොසලකා හරින්නට ඇය පෙළඹුවාවත්ද...? මගේ මතකය නිවැරදි නම් වන්දි මුදල දෙලක්ෂ



අසූහත්දාස් පන්සිය විසි එකයි ශත පනහකි. එවැනි මුදලක් අමතක කරන්නට තරම් ඇය ළඳ බොළඳියක් වේද...? මම මත් මතත් සමඟ සිතිවිලි අතරේ අතරමංව උන්නෙමි.

"එක්ස්කියුස් මී..."

මම හිස ඔසවා බැලීමි. හැට හැවිරිදි වියේ යැයි කිව හැකි තලත්තැති මිනිසකු තම මත්පැන් වඩිය අතැතිව මා දෙස බලා උන්නේය.

"මම මෙතන ඉඳගත්තට ප්‍රශ්නයක් නැනෙ."

"කිසි ප්‍රශ්නයක් නෑ."

මේසය මත ඕනෑ තරම් ඉඩකඩවී ද මගේ මත්පැන් වඩිය තවත් මවෙතට කරගත්තේ ඔහුගේ පැමිණීම මගේ කැමැත්තට හේතු වූ බව හඟවන්නටයි.

"මං බලාගෙන ඉලන්දාරියා අහස පොළොව ගැටලන්න කල්පනා කරනවා."

මම හිනැහීමි. ඔහු ද පෙරළා සිනාසුණේය.

"ඕ.... නම ගමවත් නොදන මෙහෙම කතා කරනෙක හරි මදිනෙ.... මම සහබන්ධු... රිටයඩ් පෝස්ට් මාස්ටර් කෙනෙක්."

හෙතෙම අමතක වූ යුතුකමක් ඉටු කරන්නා වාගේ මට අත දිගු කළේය.

මම ඔහුගේ අතට අත දුනිමි.

"ජොබ් එකක් කරනවා."

මම හිස වැනිමි. රැකියාව පිළිබඳව ප්‍රසිද්ධියේ කතා කරන්නට මා තුළ වූ නොකැමැත්ත නිසාවෙන් කතාව වෙනතකට හැරවීමේ තදබල ඕනෑකමක් මට විණි.

"කොහෙද ප්‍රයිවට් ෆර්ම් එහෙකද...?"

"නෑ."

"ගවර්මන්ට්."

"රස්සාව ගැන කතා කරන්න අකැමැතියි වගේ."

මම හිනැහීමි. රස්සාව ගැන කතා කරන්නට ගොස් අනවශ්‍ය කරදරවලට පැටලෙන්නට නොහැකිය. මගේ රැකියාව පිළිබඳ අසන අය ඉන් තමන්ට ප්‍රයෝජනයක් ගන්නට නොහැකිනම් දන්නා හඳුනන හැනැත්තෙකු හෝ ඊට පටලන්නේය. ඒ නිසා එවැනි කරදරවලින් ගැලවෙන්නට මම පරෙස්සම් විමි.

"කමක් නෑ... කමක් නෑ... සමහර විට රාජකාරිය හෙළිදරව් කරනෙක රාජකාරියට පටහැනිවෙන වෙලාවල් තියෙනවා... අපි ඒ ගැන කතා නොකර ඉමු."

ඔහුට ඕනෑම දෙයක් සිතා ගන්නට හැර මම තවත් වතාවක් හිනැහුනෙමි.

"මිනිහෙක් අඩියක් ගහන්න තනියම එන්නේ එක්කෝ... තනිකමට. ම්... එහෙම නැත්නම් දුකට... එහෙමත් නැත්නම් ඔය දෙකටම."

ඔහු තම මත්පැන් වඩිය එක හුස්මට හිල දැම්මේය. අනතුරුව මගේ මත්පැන් බෝතලය දෙස බැලීය.

"මං ටිකක් දාගන්නද පුතා..."

"දා ගන්න... දා ගන්න..."

ඔහු මගේ මෙසයට එන්නට හේතුව වැටහුණේ එවෙලේය. සහබන්ධු කිසිදු අපහසුතාවයකින් තොරව තම වීදුරුව මත්පැනින් පුරවා ගත්තේය. මත්පැන් තනුක කරන්නට කිසිවක් දමන්නට ඉඩක් වීදුරුවේ නොවීය. තවත් වතාවක් මගෙන් මත්පැන් වඩියක් නොලැබේ විය යන සැකයට ඔහු එසේ කළා වන්නට ඇතැයි මට සිතිණි.

"මං මේ ටික බොන්නෙ නිකම් නෙවෙයි පුතා..."

සහබන්ධු මත්පැන් වීදුරුව මවෙතට දිගු කරමින් කතා කළේය.

"පුතා ඔය අහස පොළොව ගැටලන්න කල්පනා කරපු ප්‍රශ්නෙ... මං විසඳනවා මෙහෙම කරනකොට."

සහබන්ධු නිදහස් අතින් අසුරක් ගැසුවේය. ඉන් ඔහුගේ සිරුර ගැස්සී ගියෙන් මත්පැන් බිඳු කිහිපයක් ද හැලිණි.



ඔහු මහත් ලොබින් මත්පැන් වඩිය ගිල දමනු මා බලා උන්නේ බලාපොරොත්තුවක් සිත ලියලවන හැඟීමෙනි.

"හරි දැන් කියන්න පුතාගෙ ප්‍රශ්නෙ."

මම මඳහසකින් ඔහු දෙස බලා උන්නෙමි.

"බය නැතුව කියන්ඩ පුතා... පෙනුමින් නාකි උනාට මගේ පපුව තාම තරුණයි... අනික මං අනුන්ගෙ ප්‍රශ්න විකුණන් කන මිනිහෙක් නෙවෙයි... කියන්න."

එවර ඔහු මගේ අවසරය නොතකාම තවත් මත්පැන් වඩියක් පුරවා ගත්තේය. ඔහුගේ ඇසුර පිළිබඳ කිසියම් ප්‍රියමනාප හැඟීමක් මසිතේ පණ ගැහෙමින් තිබිණි.

මා ඉදිරියේ හිඳ මත් මතින් දොඩවන මේ මිනිසාට මා වෙනුවෙන් යමක් කළ හැකිය යන විශ්වාසය තදින මා සිතේ ලියලමින් තිබිණි. ඒ හැඟීමට සාධාරණ හේතුවක් නොවීද ඔහු ඇසුරේ මට අප්පච්චි සිහිව තිබිණි. ඒ නිසාදෝ ඔහුට හොඳින් සැලකීමේ උවමනාවක් මට විණි.

"මිස්ට සහබන්ධු මොනවා හරි කනවද...?"

තවත් මත් පැන් වඩියක් වෙනුවෙන් මගේ බෝතලය යටැසින් බලමින් උන් සහබන්ධු මදෙස බැලුවේ බයාදුවය.

"බොන ගමන් කන දෙයක් තමයි පුතා."

"වේටර්..."

ඇස ගැටෙන මානයක වේටර්වරයෙකු නොවූයෙන් මම මඳක් උස් හඬින් ඈතට කතා කළෙමි. ඒ කාලය ද ප්‍රයෝජනයට ගත් සහබන්ධු තවත් මත්පැන් වඩියක් පුරවා ගත්තේය. අවන්හල් සේවකයා කුඩා අත්පොතක් අතැතිව විත් සිට ගත්තේය.

"මොනවද මිස්ට සහබන්ධු කන්නෙ...?"

"ඕන දෙයක්."

"එහෙම නොවෙයි. කැමැති දේ කියන්න."

සහබන්ධු අතැඟිලි තුඩු පිරිමදිමින් මා දෙසත් වේටර්වරයා දෙසත් මහත් ඕනෑකමින් බැලීය.

''මෙතැන මික්ස් ඩෙවල් එක නම් මරු.''

මම වේටර්වරයා දෙස බැලූ බැල්මෙන්ම ඇනවුම අනුමත කළෙමි.

''ස්මෝල් එකක් ද... ලාජ් එකක් ද සර්...?''

''ලාජ් එකක් දාන්න.''

වේටර්වරයා නික්ම ගිය ඇසිල්ලේ සහබන්ධු මදක් කල්පනාබරව තම මත්පැන් අඩිය තොලගාන්නට ගත්තේය.

''ඔනැවට වැඩිය බොන්ඩත් එපා. දැන් මිස්ට සහබන්ධුට විසඳන්න ප්‍රශ්නයක් කියනවනෙ.''

''ප්‍රශ්නෙ බිල ද පුතා...?''

''ඒ කිව්වෙ...?''

''පුතා හදන්නේ මට බිල තියලා පැනලා යන්ඩ එහෙම නොවෙයිනෙ පුතා.''

මට සිනහා නැගිණි. මම හැකිලී මුළුගැන්වී තිබූ පපුව දිගහැරෙන්නට සිනහා වීමි. හාත්පස උන් කිහිපදෙනෙකුගේම අවධානය මවෙතට යොමු විණි.

''මීට ඉස්සර එහෙම දේවල් වෙලා තියෙනවද...?''

''ඉහේ කෙස් ගානට පුතා... ඉහේ කෙස් ගානට.''

''එහෙම උනහම මොකද කරන්නෙ...''

''මං පෙන්ෂන්කාරයනෙ පුතා... පෙන්ෂන් එකෙන් ටික ටික ගෙවනවා. මං ඉතින් මෙහෙ ඩේලි කස්ටමර් කෙනෙක් හින්දා අවුලක් නෑ.''

''මම මිස්ට සහබන්ධු හිතන ජාතියෙ මනුස්සයෙක් නෙවෙයි.''

මම කමිස සාක්කුවේ රාජකාරි හැඳුනුම්පත ගෙන සහබන්ධුට පෑමි. හෙතෙම තත්පර කිහිපයක් ඇස් පුංචි කර එදෙස බලා උන්නේය. අනතුරුව මට හැඳුනුම්පත දෙමින්ම හුනස්නෙන් නැංගේය.

''අයැම් සොරි පුතා... අයැම් සෝ සොරි.''

ඔහු අත දෙකවා බෙඳුවට දෝත් එක්කොට මට වැන්දේය. එය මසිතේ තිගැස්මට හේතුවිණි.



''ඇයි මේ මට පව් පුරවන්නෙ ඉඳගන්න.''

''අයැම් සොරි... අයැම් සෝ සොරි...''

ඔහු හිඳගත්තේ ද මුමුණමිනි.

''කියන්න පුතා... කියන්න... මං මෙතන්ට ප්‍රශ්න තියෙන මිනිහෙක්. ඒ ප්‍රශ්නවලින් බේරෙන්න මේ වගේ තැන්වලට ආවට මට අනුන්ගෙ ප්‍රශ්න විසඳන්න පුලුවන්...''

සහබන්ධු කතා කළේ නළල ළඟට ඇඟිලි තුඩු හරහට තබාය.

''මගෙ රස්සාව ගැන මම දැන් ආයෙම කියන්නෝන නැනෙ.''

මම කතාව ඇරඹීමි.

''ඕන් නෑ.''

සහබන්ධු හරිබරි ගැහෙමින් හිඳ ගත්තේ කල්පනාබර ඉරියව් පාමිනි.

''මේ ළඟ දි තමුන්ගෙ තාත්තගෙ වන්දි මුදල් සම්බන්ධ ප්‍රශ්නෙකට ගැනු ළමයෙක් මාව හම්බ වෙන්ඩ ආවා.''

මම කතාව ඇරඹීමි.

සහබන්ධු ඇස් කෙවනි අගට ඇඟිලි තුඩු තබා කතාවට කන්දෙන්නට ගත්තේය. මම මුල, මැද, අග යා කරමින් කතා කළෙමි. සහබන්ධු කන්දුන්න ද නොදුන්න මසිතට සැහැල්ලුවක් සැනසීමක් දනෙමින් තිබිණි.

නමුදු කෙමෙන් මසිතේ වූ උද්යෝගය තුරන් වූයේ සහබන්ධු නින්දට වැටී ඇතැයි සිතුණෙනි.

සහබන්ධු කෙරෙහි කෝපයක් ද මා කෙරෙහි ශෝකයක් ද මසිතේ හටගත්තෙන් කතාව නතර කළෙමි. මා පුදුමයට පත්කරමින් සහබන්ධු ඇස් හැර බැලුවේය.

''ඇයි පුතා නතර කළේ ඩෝප් මරගාතේ මට නින්ද ගිහින් කියලා හිතුවද...?''

මම මුවගට සිනහවක් නගා ගත්තෙමි. නොඑසේනම් මගේ මුවගට සිනහවක් නැඟුණි.

''කියන්න පුතා... මට ප්‍රශ්න අහන්න තරම තැනක් නාපු නිසයි... මං කන්දූන්නෙ.''

මම පෙරදීටත් වඩා ජවයකින් කතාව ඇරැඹිමි. සහබන්ධු පෙර ඉරියව්වට පැමිණියේය.

''මෙච්චර ටෙලිග්‍රෑම් ගහලත් ඒ ළමයා නාපු එක මට හරි ප්‍රශ්නයක් මිස්ට සහබන්ධු''

මම කතාව හමාර කරමින් කීවෙමි. සහබන්ධු බර සුසුමක් හෙළා හිස වැනුවේය. කෙළවර ගැඹුරු කල්පනාවක දැවටී බෝතලයෙන් මත්පැන් වඩියක් දමා බිව්වේය. කට ගැස්මක් ද ගත්තේය.

''ප්‍රශ්නයක් නෙවෙයි පුතා හිත් තැවුලක්.''

අනතුරුව හෙතෙම කතා කළේය.

''සමහර විට.''

''සමහර විට නෙවෙයි... ඒක තමයි ඇත්ත.''

මම කරබා ගතිමි.

''ඔය හිත් තැවුල සුවවෙන්න නම් ඔය කියන වන්දි මුදල ඒ ගෑනු ළමයා අතට පත්වෙන්නෝන.''

මම හිස වැනිමි.

''ඒ කාරණාවට ඒ ළමයා නේනවා නම් අපි හොයාගෙන යන්නෝන.''

''ඒක හරි මදිනෙ.''

සහබන්ධුගේ මුවේ වූ රහස් සිනහව මා නොදුටුවාම නොවේ.

''අපි ජීවිතේ කරන්නෙ හරි දේවල් විතරක්ම නෙවෙයිනෙ පුතා. අනික අපි හරි කියලා හිතලා කරන සමහර දේවල් වැරැදියි. අපි වැරැදියි කියලා හිතන සමහර දේවල් හරි.''

ඔහු යෝජනා කළේ මා සිතැඟිමය. මා ඒවාට එරෙහිව කරුණු කීවේ බොරුවටය.

''අපි හෙට ගමන යමු.''



ඔහු තද තීරණයක් ගත්තේය.

''හෙට නිවාඩුවකුත් තියෙනවනේ.''

මද බමන මතකින් උන් මම හිස වැනිමි.

''අනික් එක පුතා කැමැති නම් මං තව සියක් හමාරක් බොන්න කැමැතියි.''

අප දෙදෙනාටම තුහුරට සිටියේ ඒ මත්පැන් වඩී කිහිපයය. රාත්‍රී එකොළහ වනතෙක්ම ගෙදර යාමේ උවමනාවක් මට ඇති නොවූයේ ද එනිසාය.

මා උන්නේ නින්දත් නොනින්දත් අතරේය. හිසෙහි වන බර ගතියත්, කුසෙහි වන දැවිල්ලත් නිසාවෙන් සුව නින්දක් මා කරා ආවේ නැත. ඒ හේතුව නිසාම ප්‍රබෝධමත්ව නැගිටින්නට ද නොහැකියාවක් මට විණි. කුස ගින්දර දැනී ද කන්නට පිරියක් නොවීය.

මම යහනින් මෑත්ව ශීතකරණය වෙත ගියේ ඔත්පල රෝගියෙකු මෙනි. සීතල වතුර උගුරෙන් පහළට වැටෙද්දී මොහොතකට කුසගිනි නිවී ගියේය.

ඊළඟ තත්පරයේ ආයේම පෙර අපහසුවම දැනුණි. මා කවමදාකවත් මෙතරම්ම බීමත්ව නැත. මට මා ගැනම දැනුණේ පිළිකුලකි.

වාසනාවකට මා එන්දි අම්මා අවදියෙන් උන්නේ නැත. ඇය ද අවදියෙන් උන්නා නම් අද දවස මීටත් වඩා අඳුරුවන්නට තිබිණි.

# 02

''සුදු බේබිව හම්බ වෙන්න කවුද ඇවිත්.''

මට මහත් වූ නොරිස්සුමක් දැනුණි. මම සෙදෝනා දෙස බැලුවේ ද ඒ නොරිස්සුමෙන්මය.

''කවුරු...?''

''මං නම නම් ඇහුවෙ නෑ.''

''කවුද හරි ආවහම නම අහන්ඩෙපැය. ආවෙ මොකද... මොකටද කියලා අහන් නැතුව දුවන් එනවා.''

මැණිකා මා දෙස බලා උන්නේ මගේ කෝපයට හේතු වටහා ගන්නට වාගේය.

''මං ඉන්නවා කිව්වද...?''

''ඔව් සුදු බේබි...''

''මැණිකා කරන්නෙම මොළේ නැති වැඩ.''

''වෙනදාටත් කවුරු හරි ආවහම මං වතගොත හාර අවුස්සන් නැතෙ සුදු බේබි.''

මැණිකා කරුණාබරව කීව ද මසිතට දැනුණේ කෝපයකි.

''ඒක තමයි කියන්නෙ... දවසක වැරැද්දකට කට වහගෙන හිටියම ඒක පුරුද්දට ගන්නවා.''



මැණිකාගේ මුහුණ අඳුරු විය. ඇය කෝපයට පත්වුවහොත් අම්මා කෝපයට පත්වූවා වාගේම හිරිහැරයකි.

''ගිහින් බලන්න කවුද මොකටද ආවෙ කියලා.''

මා සන්සුන් වන්නට වෙර දරමින් කීවෙමි. ඔන්න හඬන්නට මෙන්න හඬන්නට උන් මැණිකා යන්නට ගියේ ද නරක් කරගත් මුහුණිනි.

මම කාමරයට වැදී අඩපැයක් පමණ දිය නෑවෙමි. ඇගේ පතේ වූ අමාරුවෙන් සියයට පණහක්වත් තුනී වූ වගක් මට දැනුණි.

නා කියා හමාරව මැණිකා තතා දූන් අලිගැට පේර යුෂ පානය කළ මම හිස් වීදුරුව බන්දේසිය මත තැබීමි. පෙර කී අමුත්තා මට මෙනෙහි වූයේ ඇගේ බැල්ම දැකීවනය.

''අර මනුස්සයා තාම ඉන්නවද...?''

''ඔව්.''

''මැණිකා මතක් කළේවත් නෑ.''

''මතක් කළත් වැරැදියි... නොකළත් වැරැදියි අනේ මන්දා.''

මැණිකා ගෙට ගියේ නරක් කරගත් මුහුණිනි. මම කලබලයෙන් පිවිසුම් ආලින්දයට යත් දී කකුලක් පිට කකුලක් දමාගත් අමුත්තා ඉංග්‍රිසි පුවත්පතක් කියවමින් උන්නේය.

මුහුණ නොදකම ඒ සහබන්ධු බැව් මම හඳුනා ගතිමි. ආයේම ඔහු දකින්නට අවන්හලටම යන්නට වෙතැයි සිතා උන් මම වික්ෂිප්ත වීමි.

''මිස්ට සහබන්ධු... ගුඩ්මෝනිං...''

හෙතෙම සුබ පතන්නට පෙර අත්ඔරලෝසුව දෙස ද බැලීය.

''පරක්කු උනාට සමාවෙන්න.''

''කිසිම ප්‍රශ්නයක් නෑ. පුතා ඊයෙ බීපු හැටියට කැමිටින්න පරක්කු වෙන විත්තිය මං දැනගෙන හිටියා. ගණන් ගන්නෙපා. ඔය ගතිය දවල් වෙනකොට ඇරිලා යයි.''

''මං කවදාවත් ඔය තරම බොන්නෑ ඊකයි.''

මම කතා කළේ අම්මා හෝ මැණිකා අවට වේ දැයි සැක හැර බලාය.

"අපේ ගමනට පරක්කු නෑ නේද...?"

සහබන්ධු ඇසුවේ රහසින් මෙනි. සහබන්ධුගේ පොරොන්දුවේ වන අවංකකම ගැන මා තුළ භක්තියක් විණි.

"මං පැය භාගෙන් ලෑස්ති වෙලා එන්නම්."

"පුතා කලබල නැතුව ඇඳගන්න... මට කොහොමත් මේ පත්තරේ කියවලා ඉවර වෙන්න පැයක්වත් යනවා."

මම හිනැහී අසුනෙන් නැගිටින අතර අම්මා පිවිසුම් ආලින්දයට ගොඩවිණි.

ඇය සහබන්ධු දෙස බලා මා දෙස බැලුවේ මේ කවුදැයි අසන බැල්මකිනි.

මා තරමක් තක්කු මුක්කු වී ගියේ සහබන්ධු ඉදිරියේ බොරුවක් කියන්නට වන නොහැකියාව නිසාය.

"මේ පුතාගෙ අම්මා වෙන්නෝන."

"ඔව්."

"මේ අම්මා... මිස්ට සහබන්ධු."

"මං... තිවංක පුතාගෙ යාළුවෙක්ගෙ තාත්තා... ෆාදර්."

සහබන්ධු මගේ ගැටලුව වටහාගෙන වාගේ කතා කළේ අම්මාට අතට අත දෙමිනි.

"ඔ... වන්දි මුදලක් සම්බන්ධ වැඩක්ද...?"

අම්මා සහබන්ධුගේ බොරුවට රැවටුණි. මා ඔවුනට කතා කරන්නට ඉඩ දී හැඳ පැළඳ ගතිමි.

කැඩපත ඉදිරියට ගිය මට සියුම් ලැජ්ජාවක් දැනුණේ මනාලියක් බලන්නට යන්නටවත් මා මෙතරම් හැඩවුණු වගක් මතකයේ නොවුණු නිසාය.

"මෙයා මේ අනුන්ගේ වැඩකට මෙච්චර උනන්දුවෙන් යනවා මම දුක්කමයි."



ගෙයින් දොරට බසිද්දී අම්මා කී වචන මට දැනුණේ ඇනුම් පදයක් ලෙසිනි.

"අම්මා රැවටුණා."

මඳ දුරක් සන්සුන්ව රියෙහි ඉදිරිපස අසුනට වී ගිය සහබන්ධු කතා කළේ මදහසකිනි.

"රැවටුණා නෙමෙයි... මිස්ට සහබන්ධු රැවැට්ටුවා."

"කමක් නෑ. චේතනාහං හික්ඛවේ කම්මං වදාමි කියනවනේ."

සහබන්ධු හිනැහෙමින් කීවේය.

තවත් මඳ දුරක් ගිය තැන හෙතෙම සාක්කුවෙන් කාලේ බෝතලයකින් මත් පැන් උගුරු කිහිපයක් ගිල දුම්මේ තිබහට වතුර බොන්නාක් මෙනි.

මත් පැන් පිළිබඳව ජුගුප්සාජනක හැඟීමකින් උන් මට ඔක්කාරයට ආවේය.

එපමණක් නොවේ මට යන ගමන පවා එපා විණි.

නමුදු සමන්මලීගේ ගම පියසට ආසන්න නගරයට ළං වෙද්දී මගේ පපුව කිසියම් ඉමිහිරි රිද්මයකට ගැස්සෙමින් තිබිණි.

ඇය මා කෙසේ පිළිගනීද...? මගේ මේ ගමන ඇය කෙසේ බාර ගනීවිද? යන දෙගිඩියාවෙන් මම නිරුත්තරවම උන්නෙමි.

සිරිවංශ සුදුසිංහ ආරච්චි,

සමනල කන්ද,

නුගවෙල.

මම යටි සිතින් ලිපිනය මිමිණුමි. 'ටවුමේ' සිට කිලෝමීටර් හත අටක් ඔබ්බට රිය පැදවී ද සමනල කන්ද යනුවෙන් සටහන් වූ පුවරුවක් මට හමුවූයේ නැත. නිරපරාදේ පිච්චෙන තෙල් ටික ගැනත්, ගෙවෙන කාලය ගැනත් මා සිත තුළ උපන්නේ ලෝභකමකි. සියල්ලටම වඩා හැල හොල්මනක් නැතිව නිදන සහබන්ධු මගේ නොරිස්සුමට හේතු වී තිබිණි.

මම කුඩාවට කඩා හැලෙන දිය පහරක් ළඟ මෝටර් රිය නතර කොට බැසීමි.

තුරු හිස් දිගු සෙවනැලි සිත්තම් කරමින් තිබුණු සවස් වරුවේ හාත්පස වූයේ පාළු මුසල හුදෙකලා බවකි. නමුදු ඒ පාළු මුසල බව අස්සේ මොකක්දෝ ලස්සනක් විණි. මම මෝටර් රියෙන් බැස ගලා හැලෙන දිය කඩිත්තෙන් මුහුණ, අත්, පා, ගෙල දෝවනය කොට ගතිමි.

''ඇයි පුතා නතර කළේ...?''

සහබන්ධු අවදිව උන්නේය.

''පිස්සට හැකැප්ම නෑ වගේ නිකං දුවලා හරියන් නැතෙ. ඒකයි නතර කළේ...''

''ඉතින් පුතා කාගෙන්වත් මග විස්තර ඇහුවෙ නැද්ද...?''

සහබන්ධු ද ගලින් ගල පැන එමින් කතා කළේය.

''ඇහුවා.''

''ඉතින්...''

''තව ඉස්සරහ...?''

''එහෙමද...''

මම සහබන්ධු නොතකා විත් මෝටර් රියට නැගීමි. මා තමා දමා යතැයි බියෙන් වාගේ සහබන්ධු කලබලයෙන් විත් රියට ගොඩ විය.

''මං උන්නේ පුතා මාවත් දාලා යන්න හදනවා කියලා.''

මම මදහසක් පෑමි. සහබන්ධු සාක්කුවෙන් හිස් කාලේ බෝතලය අතට ගෙන බලා මුහුණ බෙරි කොටගත්වනම එය අකුලකට විසිකොට දැම්මේය.

''අපි වැඩේ සාර්ථකව නිම කරලා එමින් ගමන් අඩියක් ගහමු නේද...?''

සහබන්ධු කතා කළේ හිත හදාගන්නට වාගේය. මම ඔහු



බැල්මකින්වත් නොතකා උන්නෙමි. ඔහේ ඉදිරිය බලා ගත්වනම රිය පැද වූ මගේ බැල්මට බවලතෙකු හා යුවතියක් ගැටිණි. ඇස ගැටුණු යුවතිය සමන්මලී වග මනස වටහා ගනිත් දී මම අවිඥානයෙන් තවත් යාර විස්සක් තිහක් ගෙවා දමා තිබිණි.

''මොකෝ පුතේ...?''

මම කලබලයෙන් වාහනය ආ පස්සට ගනිත් දී සහබන්ධු ඇසුවේ නොසන්සුන්වය.

''ඔය පාර අයිනෙ ඉන්නෙ අපි හොයන් යන ළමයා.''

''නෑත්...''

මම රිය සමන්මලී අභිමුව නතර කළේ ආපස්සට එන කාරය පිළිබඳව ඔවුන් දෙදෙනාගේ අවධානය සම්පූර්ණයෙන්ම යොමුව තිබූ මොහොතේය.

''ඔකට තමයි පුතා කියන්නෙ කන්න පින තියෙනවා නම් ඉබ්බා කුනපහ පිටේ බැඳන් ගෙට එනවා කියලා.''

සහබන්ධු උජාරුවෙන් කියන තත්පරයේම මම රියෙන් බැසීමි. සමන්මලී එක එල්ලේ තියුණුව මා දෙස බලා උන්න ද ඈ මා හඳුනාගත් වගක් නොපෙනිණි. එදා හැඳ පැළඳ උන් සාරිය නිසාදෝ මදක් මුහුකුරා ගිය පෙනුමෙන් දිස් වූ සමන්මලීගේ නොකිළිටි ළාබාල බව මට පැහැදිලිව පෙනුනේ හැඳවුත් සුදු දිගු ගවොම නිසා වන්නට ඇත.

''මතකද මාව...?''

මම බවලතා දෙස කරුණාවන්ත බැල්මක් හෙලා දවසක සමන්මලීගෙන් ඇසුවේ මට වැදගත් විය හැකි උපරිම මට්ටමිනි.

''ඔව්...''

සමන්මලී කතා කළේ ද හිස වැනුවේ ද ලෙන්ගතු ලීලාවකින් නොවේ.

''සමන්මලී චෙක් එක ගෙනියන්න ආවෙ නැතෙ.''

සමන්මලී ඉන් එහා කතා නොකළෙන් මට කතා කරන්නට සිදුවිණි.

"අපේ තාත්තා මළා. සර්ලා කට්ටිය ඒ සල්ලි ටික බෙදාගන්න.''

මගේ පපුව දෙදරා ගියේය. දෑසට උනන කඳුලු මැඩ වෙර වීරියෙන් කතා කරන්නට වෙර දරන සමන්මලී දෙස බලා සිටින්නටවත් මට දිරියක් ශක්තියක් නොවීය. මෝටර් රියේ දොර වැසෙන හඬින් සහබන්ධු රියෙන් බසින්නට ඇතැයි මම අනුමාන කළෙමි.

''වෙච්ච දේට මට කණගාටුයි.''

මම වචන අහුලා වාගේ කතා කළෙමි.

''කණගාටුවක් දැනෙන්න සර්ට පපුවක් තියෙනවාද...?''

සමන්මලී කතා කළේ පෙර පුරුදු සන්සුන් උද්වේගශීලී බවින්මය.

''සමන්මලී...''

බවලතා තරවටුවක ස්වරයෙන් කෑගැසුව ද සමන්මලී මෙල්ල නොවිණි.

''සර්ලා අහිංසක මිනිසුන්ගේ දේපල හූරන් කන හොරු...''

මම පිහිට අයදින්නාක් බඳු බැල්මකින් සහබන්ධු දෙස බැලීමි. ඔහු හදිසියේ යමක් මෙනෙහි වී වාගේ කතා කරන්නට ගත්තේ එවේලේය.

''ඔය දරුවාගෙ කේන්තිය සාධාරණයි. නමුත් ඔය දරුවා ඉන්නේ වැරැදි නිගමනේක.''

''සම්පූර්ණ කතාව දැනගෙන ද ඔයා කතා කරන්නේ...?''

සමන්මලී කතා කරද්දී ඇගේ ඇස් තටු අගට උහුලාගත නොහැකිව තිබූ කඳුලක් බේරී වැටිණි.

''ඔව්...''

සහබන්ධු සෑජුව උත්තර බැන්දේය.

''මම සමන්මලීගේ චෙක් එක එදාම ලෑස්ති කළා. ඒත් ඒ වෙනකොට සමන්මලී ගිහින්.''

''ඔව් වෙන්ඩැති.''

''ඒ චෙක් එක දකින දකින හැම වෙලාවෙම මට මහා මානසික වදයක් දැනෙන්න ගත්ත නිසයි මං මේ සමන්මලීව හොයන් ආවේ.''



මෙය අහඹු හමුවීමක් නොවන බව දැනුණ නිසාදෝ සමන්මලී මඳක් මෙල්ල විණි. මෙම මෝටර් රියෙහි වූ ලිපිගොනුව ගෙන සමන්මලීට පෑවෙමි.

''මේකෙ වවුචරයක් ඇති... ඒක අත්සන් කරලා තැපෑලට දාන්න.''

සමන්මලී ලිපිගොනුව අතට නොගෙනම මදෙස බලා උන්නාය.

''තාත්තගෙ මරණ සහතිකේ ඉදිරිපත් කළාම සමන්මලීට මේ චෙක් එක මාරු කරගන්න පුළුවන්.''

ගිනියම් යකඩ මත වත් කළ වෙඩරු දියවන්නා සේ සමන්මලී රැකගෙන උන් දැඩි බව දියාරුව යමින් තිබුණි.

''අපේ තාත්තා නැති උනා සර්...''

කෙළවර ඕ ඉකිබිඳ හඬමින් යාදිනියක සේ කතා කළාය. ක්‍ෂණයකින් මගේ පපු කුහරයේ යම් තැනෙක ඇති වූ ගින්නක් බුර බුරා නැගෙමින් සියොළඟම වෙළා ගන්නාක් බඳු විය. මම සාක්කුවේ රුවා වුන් මගේ දකුණත ගෙන ඇගේ හිස් මුදුන මත තැබුවේ හිතා මතා නොවේ.

''අපි ගෙට ගොඩ වෙලා තේ ඩිංගක්වත් බීලා යන් මහත්තයෝ.''

සමන්මලී වත්තන්කොට උන් බවලතා කතා කළේ ද හැඩුම්බර බවකිනි.

සමන්මලීගේ නිවෙස වත්තක් මැද පිහිටි පැරැණි ගුරු ගෙදරකට සමානකම කී එකකි. වත්ත පිටිය ගහකොළින් හැඩි වුවද නිවෙස මඳක් ජරාජීර්ණව ගිය ද එහි ඉපැරැණි ශ්‍රී විභූතිය සම්පූර්ණයෙන්ම පහව ගිය බවක් නොපෙනේ.

සාත්තුවක් නොලැබුව ද ගහකොළ උරණ වූ බවක් නොපෙනේ. කිසියම් ගසක එල දරා නොතිබුණේ නම් ඒ එය නොමේරූ එකක් වීම නිසාය. ගෙදරත් වත්තේත් වූ අසිරිය සොරා ගෙන තිබුණේ අකලට වැඩී තණකොළය.

''මේ ඉඩම කොළඹ කිට්ටුව තිබුණා නම් පරම්පරා හතක් ගොඩ.''

සහබන්ධු වත්ත පිටිය වටේ දෑස් කරකවමින් කතා කළේය. මේ

ඇස් වෙහෙස වූ තැන කිසිවකු හිස වැනිමි. වත්ත පිටිය දක බලා ඇස් වෙහෙස වූ තැන කිසිවකු හිස වැනිමි. වත්ත පිටිය දක බලා අවංකවම ආලින්දයට නොඒම පිළිබඳ කනස්සල්ලක් මට දැනුණි. අවංකවම කනස්සල්ලට හේතුව වූයේ සමන්මලී කියනවා නම මසිතේ කනස්සල්ලට හේතුව වූයේ සමන්මලී නොපැමිණීම පිළිබඳවය.

"ඇහුණද...?"

සහබන්ධු කතා කළේ රහසින් මෙනි.

"ම..."

"මේ කෙල්ල හද හිතක් තියෙන මෘදු කෙල්ලෙක්."

"හද හිතක් තියෙන මෘදු කෙල්ලෙක්." මම යටි සිතින් මුමුණා ගතිමි. මගේ මුවගට මදහසක් එළැඹියේ ඒ කියමනෙහි වූ අපූර්වත්වය නිසාය. නමුදු ඉන් එහා ඒ ගැන සිතන්නට ඉඩ නොතබා සමන්මලී ආවේ තැඹිලි වතුර වීදුරු දෙකක් සහිත බන්දේසියක් අතැතිවය.

"රස්නෙ හින්දා තැඹිලි වතුර ටිකක් ගෙනාවා."

"පංකාදුයි."

සහබන්ධු තැඹිලි වතුර වීදුරුව ගෙන එක හුස්මට බීවේ සමන්මලී අතින් මගේ පංගුව ගන්නටත් පෙරාතුවය.

"තව ටිකක් ගේන්නද...?"

සහබන්ධු තැඹිලි වතුර බොනු සමන්මලී බලා උන්නේ තමන් වෙහෙස වී තැනූ අහරක් කිසිවකු පිරියෙන් රස විඳිද්දී මෙනි.

"එපා. හොඳටම ඇති."

සහබන්ධු කතා කළේ උගුරින් හඬක් ද නංවා තැඹිලි වතුරට තුසෙහි ඉඩකඩ හදා දෙමිනි.

"තාත්තා නැතිවෙලා කොච්චර කල් ද සමන්මලී."

"මං එදා කොළඹ ඉඳලා ආපු දවසෙ ඉස්පිරිතාලෙ නතර කළේ. පස්සෙන් දා නැති උනා."

"හාට් ද...?"

සහබන්ධු බෙරිකරගත් බැල්මෙන් ඇසුවේ මරණය කෙරෙහි උපන් හදිසි බියකින් වාගේය.

"ඔව්."

"පව්."

සහබන්ධු කීවේ අවංකවම බව ඔහුගේ කටහඬින් මට වැටහිණි.

"නැතිවෙන කොට තාත්තට වයස කීය ද...?"

"හැට හයයි."

මම තත්පර කිහිපයක් ඉන් එහා කතා නොකළෙමි.

"හැට හයත් වයසක් ද...? මට දැන් හැට දෙකයි."

සහබන්ධු කීවේ කනස්සල්ලෙනි.

"මගේ තාත්තා ලෙඩෙක් නෙවෙයි මහත්තයා. තාත්තා ලෙඩ උණේ රස්සාව නැති උනාට පස්සෙ. මේ වත්දිය පරක්කු වෙච්චි එකටත් තාත්තා ගිටියෙ ගොඩක් හිතේ අමාරුවෙන්."

සහබන්ධු මදෙස බැලුවේ වරද මගේ අතින් යැයි කියවෙන බැල්මෙනි.

"ආයතන ප්‍රධානියා උනාට මොකද එතන සිද්ධ වෙන සමහර දේවල් මටත් පාලනය කරන්න බෑ සමන්මලී."

"රාජ්‍ය ආයතනනෙ."

සහබන්ධු කතා කළේ තමාටම මුමුණා ගන්නා ස්වරයකිනි. සමන්මලී යන්තමින් හිස වැනුවාය.

"එතකොට අර හිටිය බවලතා මේ දරුවගෙ...?"

"මගෙ නැන්ද."

"එතකොට අම්මා."

"මං පුංචි කාලෙම නැතිවෙලා."

සමන්මලී පිළිබඳ අවංක කණගාටුවක් මසිත පිළිසිඳිණි. මට බර දිගු සුසුමක් හෙළුණේ එනිසාය. සමන්මලී ඉන් තිගැස්සී වාගේ මදෙස බැලුවාය.

"රස්නෙයි... මං ටිකක් වත්ත පිටියෙ රවුමක් ගහලා එන්නම්."

ගහකොළ අතරේ රැඳි සිසිලස ආලින්දයෙ පිනුම් ගසත් දී සහබන්ධු කිවේ අප තනිකිරීමේ උවමනාවෙන් වග මට ඉවෙන් මෙන් වැටහිණි. මෙරූ එකියක වූ සමන්මලීට එය නොවැටහුණා වන්නට බැරිය. මට සියුම් ලැජ්ජාවක් දැනුණි. මනමාලියන් බලන්නට ගොස් ඕනෑතරම් ඔද්දල් වෙන මට මෙවැනි අපහසුතාවක් දැනුණේ කලෙකට පස්සේය. ඒ අපහසුවේ කිසියම් ඉමිහිරි බවක් වූයේ එනිසා වන්නට ඇත.

මම යටැස් බැල්මෙන් සමන්මලී දෙස බැලීමි. එදාටත් වඩා අද ඇය සොඳුරුය.

"ඇයි සර් මේ චෙක් එක දෙන්න මාව හොයාගෙනම ආවෙ...?"

මම හදිසියේ කම්මුල් පහරක් කෑ සෙයින් තක්කු මුක්කු වීමි.

"ආ..."

මා ඇසුවා නොව මට ඇසිණි.

"ඇයි සර් චෙක් එක දෙන්න මාව හොයාගෙනම ආවේ...?"

සමන්මලී පෙර ප්‍රශ්නයම ඇසුවේ ඇළපිල්ලක් හෝ පාපිල්ලක්වත් අඩු නොකොටය.

"මං අතින් නංගිට වරදක් උනා කියලා මට හිතුණා. මට ලොකු පසුතැවිල්ලක් දැනුණා සමන්මලී."

මා වචන අහුලා ගත්තේ පරෙස්සමිනි. තුනී මන්දස්මිතයක් සමන්මලීගේ මුවේ ඇඳිණි.

ඔය අද දවසටම මම ඇගේ මුහුණේ සිනහා රැල්ලක් දුටුවාමය.

"ඇයි හිනා උනේ...?"

සමන්මලී කිසිවක් නැතැයි හඟවන්නට හිස දෙපසට වැනුවාය.

"මං ප්‍රෝඩාකාරයෙක් කියලා හිතනවද...?"

සමන්මලී ගැස්සී වාගේ මදෙස බැලුවාය.

"අනේ නෑ... මට හිනා ගියේ අර නංගි කිව්ව හන්දා. අනික මගේ නම සමන්මලී නොවෙයි සමන්දිනී."



සමන්මලී කතා කළේ වරදක් නිවැරදි කරන පුංචි එකියක පරිද්දෙනි. සහබන්ධු කිවේ ඇත්තකි. මේ තද හිතක් ඇති මෘදු කෙල්ලකි. මගේ මුවඟට ද සිනහවක් නැගිණි.

"නැන්දා කුස්සියෙ තනියම උයනවා. මං ටිකක් බලලා එන්නං."

සමන්දිනී නැගිට්ටේ සොම්නස තැවරුණු බැල්මකිනි.

"උයනවා කිව්වෙ අපිට ද...?"

සමන්දිනී හිස වනා ගෙට ගියේ මගේ ප්‍රතිචාර දකින්නට පමා නොවීය. සහබන්ධු වාගේ මට ද වත්ත පිටියේ සුළං ගැන ලෝබකමක් දැනිණි. මම ආලින්දයෙන් දොරට බැස වත්ත පිටියේ මදක් ඔබ්බට ඇවිද ගියෙමි.

දිගු කලක් රෝගීව හිඳ සුව වූවා වාගේ ශරීර සනීපයක් මට දැනෙමින් තිබිණි. සිත විසින් කය ගිලන් කරනවාය යන සත්‍යය මම වටහා ගත්තේ හිත හොඳ වීමෙන් හටගත් උද්දාමය නිසාය.

"ඇඟට හරි සනීපයක් දැනෙනවා නේද...?"

මා පිටුපසින් සහබන්ධු හිඳින වග දැනගත්තේ එවේලේය.

"ම්... පරිසරේ උනත් හරි කොලිටි. කොහොමද මේ වගේ වත්තක ගස් හෙවණක ඉඳන් අඩියක් ගහන්ඩ තිබුණා නම්."

මගේ මුවගේ ඇඳුණු සිනහවට හේතු වූයේ සහබන්ධු කෙරෙහි හටගත් කෝපයයි.

"කෑම කාලා ඉමු සර්."

සමන්දිනී මා පස්සේ වූයෙ පීරිසියක තබාගත් වතුර වීදුරුවක් අතැතිවය.

"සමන්දිනී අපි නිසා මහන්සි වෙනවා."

මා කුමක් හෝ කිවයුතු නිසාවෙන් කීවෙමි.

"ගෙට ගොඩ වෙච්චි මනුස්සයෙකුට කෑම ටිකක් දෙන එකේ මොන මහන්සියක් ද සර්... අනික සර්ලා වෙනුවෙන් කියලා හැදුවෙ මාළුවක් විතරයි."

"සමන්දිනී විවෘත කෙල්ලක්."

සහබන්ධු කීවේ මසිතේ හටගත් සිහිවිල්ලය.

"යමු කාලා ඉමු."

ඇය ඉස්සර වූවාය. මම සහබන්ධුගේ පසුපසින් වැටීමි. පිටුපා යන සමන්දිනී දෙස වඩාත් හොඳින් බලන්නට මට හැකි වූයේ එවේලේය. සමන්දිනී සිහින්ය. නමුදු ඇගේ උකුළ ඉඟටියට ඔරොත්තු නොදෙන්නෙකැයි සිතෙන තරමට පුළුල්ය. දෙවුර ද එසේමය. ඉංග්‍රීසියෙන් "කැට් වෝක්" යැයි කියැවෙන බඳ නළවා යන ගමන ඇයට වේ. ඇගේ හැඩයට සමෙහි ඇත් දළ පාට ආභරණයකි.

කෑම මෙසයේ දී ද මා රස වින්දේ ඇගේ ලස්සනය. ඒ නිසාම මගේ කුස ගින්දර පහව ගියේ නැත. හිත පිරුණාට පස්සෙ බඩගින්නත් ගින්නක් දැයි අසන ගැමි වහර බොරුවක් නොවේ.

"දැන් තාත්තත් නැති එකේ මේ දරුවට චෙක් එක මාරු කර ගන්න කරදර වෙයි ද...?"

ඒ අප පෙරළා එන්නට සූදානම් වූ මොහොතයි. සහබන්ධුට උවමනා වූයේ නැවත සමන්දිනී හමුවන්නට මට පොටක් පාදා දෙන්නට විය යුතුය.

"එහෙමමත් නෑ... තාත්තගෙ මරණ සහතිකේ ඉදිරිපත් කරාම ඒක කරගන්න බැරි වෙන්නෑ."

මා උත්තර බැන්දේ අඩමානයටය.

"නරක ද මේ දරුවගෙ චෙක් එක මුදල් කරලා දුන්නොත්."

"මෙච්චර දුර ආ එකේ සර් ආයෙ කරදර වෙන්නෙපා... මට දැන් සල්ලි හදිස්සියකුත් නැති එකේ මං ඕක හෙමින් කරගන්නම්."

බලාපොරොත්තු බිඳී යාමෙන් හට ගන්නා හිස් බව මසිතේ ඉහිරිණි.

"ඒ උනාට පුතේ."

සමන්දිනීගේ නැන්දා ඉදිරිපත් වූයේ ද මගේ හිත සුව පිණිසය.

"අනූෂයියට දුන්නම මේක මාරු කරගන්න පුලුවන් නැන්දෙ."

සහබන්ධු හා නැන්දා ඉන් එහා ඒ ගැන කතා කළේ නැත. මොහොතකට පෙර මසිතේ වූ සතුට හොරු අරන් ගිය ගානය.

"මොනවා හරි ප්‍රශ්නයක් උනොත් මට කෝල් කරන්නකො."

මම පසුම්බිය ගෙන නම් කාඩ්පතක් ඇයට දුන්නෙමි. ඕ කාඩ් එක ගෙන බලා හිස වැනිය.

"යන්නම්."

ඇගේ ප්‍රතිචාරය පෙර පරිදිම විය. මෝටර් රිය කෙමෙන් ඇයත්, නැන්දාත් ඈත් කොට පෙරට පදවමින් මම පැති කණ්ණාඩියෙන් ඈ දෙස බැලීමි. මෝටර් රිය පිටත් වෙන තෙක්වත් බලා නොඉඳ ඕ ගෙට ගියාය.

මසිත තදින් පෑරිණි. ඇය කෙරෙහි මා තුළ වන තදබල හැඟීම ප්‍රේමය වග මට වැටහෙමින් තිබුණි. සමන්දිනී හෙළිදරව් කළ අනූෂ අයියා ගැන මා දිගින් දිගටම සිතුවේ එනිසාය. ගමන යද්දී වූ දෙගිඩියාව වෙනුවට දැන් දැන් මා සිත වන්නේ ශෝකයකි, ඊර්ෂ්‍යාවකි. නොඑසේ නම් කෝපයකි. අනූෂ අයියා යනුවෙන් ඇය හැඳින් වූ තැනැත්තා එක්කෝ ඇගේ ඥාතියකු වන්නට ඇත. නොඑසේනම් ඕහු ඇගේ මිතුරෙකි. සමහරවිට ඇගේ ප්‍රේමවන්තයා වන්නට බැරි කමක් නැත. චරිතය හා පැවැත්ම පිළිබඳ දිගක් පළලක් නොදන්නා කෙල්ලක් මත්තේ හිත දුර ගියා වැඩි යැයි මට සිතිණි.

"මොකෝ කතා නැත්තේ....?"

සහබන්ධු වරින් වර තනිව සිතීමේ මාගේ උවමනාවට අකුල් හෙළීය.

"නිකං..."

"නිකං වෙන්න බෑ... නිකං ඉන්න වෙලාවට මිනිස්සු කරන්නෙ හිතන එක නෙමේ... කියෝන එක..."

"එහෙම මිනිස්සු ඇති... මං එහෙම මිනිහෙක් නෙවෙයි."

"පුතා... පුතා හිතන්නෙ මොනවද කියලා මට ඇහෙනවා. හැම සතාම පැටව් දාන්නෑ පුතා. සමහර සත්තු දාන්නෙ බිත්තර. ඒ බිත්තර රැක්කාම තමයි පැටව් එන්නේ... සමහර කරුණුවල දී ඉවසන්න වෙනවා පුතා."

සහබන්ධු කීවේ ඇත්තක් වූවද එය පිළිගන්නට තරම් මසිත සන්සුන්ව නොතිබිණි.

"සහබන්ධු බොනවද...?"

ඔහුගේ නත් දෙඩවීම හිරිහැරයක් වූ තැන මම ඇසීමි.

"බොනවානම් බොමු."

සහබන්ධු තරුණයෙකු සේ උද්‍යෝගයෙන් කතා කළේය.

"නෑ මට බොන්නෝන් නෑ... මිස්ට සහබන්ධුට ඕන කරන අඩුම කුඩුම ටික අරගෙන කාරෙකට නගින්න. එන කොට බීව්වා වගේ යනකොටත් බොන්න බැරියෑ..."

"ඒක නම් එහෙම තමයි... ඒත් ඉතින්..."

"මොකක්ද ඒත් ඉතින්...?"

"මනී තමයි පුතා ප්‍රොබලම් එක..."

මම රට බීමහලක් ළඟ මෝටර් රිය නතර කොට රුපියල් දාහේ නෝට්ටුවක් සහබන්ධුට පෑවෙමි.

"තැන්ක් යූ සනා... තැන්ක් යූ... තැන්ක් යූ සෝ මච්."

සහබන්ධු වාහනයෙන් බැස ගිය තැන ආයේම සමන්දිනී මගේ සිතිවිලි අවුරා සිට ගත්තාය.

ඇය නැවත හමු නොවේය යන සිතිවිල්ල මහා වේදනාවක්ව පපුවට දැනිණි.

ඇය කෙරෙහි මසිත තුළ වන ලෝභකම නිසාදෝ කිසියම් ද්වේශ සහගත හැඟීමක් මට ඇතිවෙමින් තිබිණි. කොළඹ ගිය වහාම ඇගේ වෙක්පතට ගෙවීම් නතර කරන්නට මම තීරණය කළෙමි. ප්‍රශ්නය විසඳන මුවාවෙන් නැවත ඇය කීපවරක් හමුවන්නට මග පාදා ගත හැකිය. මම ඒ සිතිවිල්ල ක්‍රියාත්මක කරන අයුරු පිළිබඳ පිඹුරුපත් සකසමින් මෝටර් රිය පැදවීමි.

මා සිතුවා වාගේම සහබන්ධු වෙරිමතින් නත් දොඩා කෙළවර නින්දට වැටිණි.

කරින් වත්තත් කොට ඔහු ගෙදරට ඇරළවා ඔහුගේ බිරියගෙන් නොසැහෙන්නට බැනුම් අසා මා ගෙදර ආවේ රැය අළුයමට හැරෙත්දීය.



සඳුදා උදෑසන මා කාර්යාලයට ගියේ අට වන්නටත් පෙරාතුවය. මා කන්තෝරු පරිශ්‍රයට ගොඩවද්දී ගුණසිරි ප්‍රධාන ලිපිකරුගේ අසුනේ හිඳ බත්මුලක් කමින් උන්නේය. මා දැකිවනම හෙතෙම තිගැස්සී ගියේය. මම කිසිවක් නොකියාම කාර්යාල කාමරයට වැදීමි.

ඔහු ප්‍රධාන ලිපිකරුගේ නොව මගේ මේසයේ හිඳ බත්මුල කමින් උන්න ද මා උන් මානසිකත්වයට අනුව එය මට ප්‍රශ්නයක් නොවේ. මගේ ඒකායන අරමුණ වී තිබුණේ සමන්දිනී නැවත කාර්යාලයට ගෙන්වා ගැනීම හෝ මට ඇගේ ගෙදර යාමට මගක් පාදා ගැනීම පමණි. ඒ සඳහා කළ හැකි පහසුම දේ ඇගේ වෙක්පතට ගෙවීම නතර කිරීමය.

නමුදු ඒ පිළිබඳ ඇගේ ප්‍රතිචාරය නපුරු එකක් විය හැකිය. සමහර විට මේ පිළිබඳව සභාපතිවරයාට හෝ විෂයභාර ඇමතිවරයාට පැමිණිලි කරනු ඇත. බොහෝ විට මා ඇය සොයා පැමිණ වෙක්පත දී ගිය වග ද ඇය කියන්නට ඉඩ ඇත. එසේ දී ගිය වෙක්පතට මා ගෙවීම නතර කළේ ඇගෙන් අයුතු ප්‍රයෝජනයක් ගන්නට විය හැකියැයි සභාපතිතුමා සේම අමාත්‍යවරයා ද සිතන්නට ඇත. මේ සියල්ල කෙළවර විනය කමිටුවක් ඉදිරියේ වරදකරුවකුවන මා සේවයෙන් නෙරපන්නට හෝ තාවකාලිකව වැඩ තහනමකට ලක් වන්නට හෝ ඉඩ ඇත.

වායු සමීකරණය කළ කාමරයේ උන්න ද මට හීන් දාඩිය දැම්මේය. ඇයට හිමි වෙක්පත මාරු කරගන්නට ඉඩ දිය යුතු යැයි මට සිතෙයි. ඒ සිතිවිල්ලේ පිහිටා මට ඉන්නට හැකි වූයේ විනාඩි කිහිපයක් පමණි. ඇය වෙක්පත මාරුකර ගැනීමෙන් පසුව සිදුවන දේ ඉන් අහවර එක පෙළට මාසිතට ගොඩ වන්නට විය.

ඇය නිසැකවම අනූෂ අයියා යැයි හැඳින් වූ තැනැත්තා ලවා වෙක්පත මාරු කරගනු ඇත. දෙලක්ෂ හැටඑක්දාහක් යනු සුළුපටු මුදලක් නොවේ. සමන්දිනීට දේපල ද ඇත. මේ සියල්ලටම වඩා ඇගේ රුව නෙතට රසඳුනකි. අනූෂ අයියායි හැඳින් වූ තැනැත්තාට ඇය විවාහ කර ගන්නට වෙනත් කරුණු කාරණා අවශ්‍ය නැතියැයි මට සිතිණි. ඒ සිතිවිල්ල කෙළවර වූයේ මා පිළිබඳව උපන් ලජ්ජාවකිනි. මා ගමේ ගොඩේ තුගත් ගැහැනියක වාගේ ඔපාදූප සිතිවිලිවල එල්ලී හිඳී. සමහර විට අනූෂ අයියා ඇගේ සමීපතම ඥාතියකු විය හැකිය.

අයියායි කිවාට ඔහු විවාහ වී දරුවන් ලැබ දිවි ගෙවන තලත්තැනි අයෙකුට අනූෂ නම් නමක් තිබිය හැකිද? හැට පැනපු උපාලිලා, ලලිත්ලා ඔනැතරම් වන්නා වාගේ තලත්තැනි අනූෂලා සිටිය නොහැකි මන්ද...? සමන්දිනිට චෙක්පත මාරු කර ගන්නට ඉඩ දිය යුතුය. දින කිහිපයක් යන්නට හැර අහම්බෙන් ආ වග හඟවමින් ඇය සොයා යන්නට මට හැකිය.

තත්පර කිහිපයකට මම හිත හදා ගත්තෙමි. ඊළඟ තත්පරයේ ආයෙම මසිත නොසන්සුන් විය. කුමක් වුවත් කමක් නැතැයි සිතූ මම ඇගේ චෙක්පතට ගෙවීම නතර කරන්නට තීරණය කළෙමි. ඒ සිතිවිල්ල පසුගාමීව තවත් සිතිවිලි සිතට එබෙන්නට පෙරාතුව මම විදුලි සීනුව නාද කළෙමි. විනාඩියක් යන්නට මත්තෙන් චතුරිකා හැමදාම ගෙනෙන කුඩා පොතත්, පෑනත් ගෙන කාමරයට ගොඩ වූවාය. ඔනැවට වඩා හීන්දෑරි ඔ අත් කැපූ, කර ගැඹුරු බ්ලවුසයකින් ද ඉනෙන් පමණක් තද වී ඇති ඩෙනිම් කලිසමකින් ද සැරසී උන්නාය.

"මේ වහංගතේට හරියට ඇඳුමක්වත් තෝරගන්න බැරි හැටි."

සිහෙහි වන කළබගෑනිය අස්සේ ඒ සිතිවිල්ල ද හදවතට රිංගා ගත්තේය.

"වන්දි හිමි නාමලේඛනවල චෙක් එකක් තියෙනවා ස්ටොප් පේමන්ට් කරන්න."

මං පුරුදු ගරු ගාම්භීර සෙයියාවෙන් කතා කළෙමි.

"ස්ටොප් පේමන්ට් කරන්න."

ඔ පෙරළා ඇසුවේ මම මහා අපරාධයක් කරන්නට ඇයට පැවරුවක් මෙනි. "ඔව්... ඔය සමහර වන්දිහිමියො නැති වෙලා... කවුරු ඔය චෙක් මාරු කරගනී ද කියලා කවුද දන්නේ..."

"වන්දි හිමියට විතරක් චෙක් එක මාරු කරගන්න පුළුවන් විදියට චෙක් එක දාන්න ද සර්..."

හරියට අඳින්නට, කරන්නට නොදන්නවාට රාජකාරී මට්ටමෙන් සිතන්නට පුදුමාකාර හැකියාවක් චතුරිකාට විණි. පොදුවේ මෙවැනි තීරණයක් ගැනීමෙන් සමන්දිනිට හෝ අන් කිසිවෙකුට මා පිළිබඳ සැකයක් සිතන්නට නොහැකිය.



"දැන් මොකද්ද අපේ ගනුදෙනු කෙරෙන පිළිවෙළ."

"අපි චෙක් ලියන්නෙ එකවුන්ට්ස් පේ නෙ සර්. ඕන්නම් කාගෙ හරි එකවුන්ට් එකට දාලා උනත් චෙක් එක මාරු කරගන්නට පුළුවන්. වන්දිහිමි ඉල්ලුම්පතින් කාට හරි බලය පවරන්න උනත් පුළුවන්නෙ සර්."

චතුරිකාගේ දැනුම පිළිබඳව මා තුළ සියුම් ඉරිසියාවක් ද හටගත්තේය.

"ඔවා මහ යල් පැනපු ක්‍රම. හොඳම දේ තමයි පිට කෙනෙකුට චෙක් එකක් මාරු කරන්න බලය පවරනවානම් මගේ ඇප්පෘවල් එකට කරනොක."

"සර්ට හැබැයි වැඩ ටිකක් නම් වැඩි වෙයි."

චතුරිකා කීවේ මනමාල සිනහාවකිනි.

"වැඩේ හරියට කෙරෙනවානම් ඒක ප්‍රශ්නයක් නෑ."

මම මගේ පෞද්ගලික උවමනාව රාජකාරී මට්ටමෙන් ජයග්‍රාහී ලෙස ඉටුකර ගත්තෙමි. සිතට සැහැල්ලුවක් සැනසීමක් දැනුණි.

"වෙන මුකුත් තියෙනවද සර්."

චතුරිකා කාරණාව තම කුඩා පොතේ සටහන් කර ගැනීමෙන් අනතුරුව කතා කළාය.

"නෑ... ඔය සම්බන්ධයෙන් එන හැම පැමිණිල්ලක්ම මට දාන්න."

"හොඳයි සර්."

චතුරිකා පිටුපා යනු මම බලා උන්නෙමි. ඇගේ ඇඳුම් පැළඳුම් ගැන මසිතේ වූ නොරිස්සුම අලුත් විණි. ඒ නොරිස්සුම පහව ගියේ විවරවන දොරටුව අතරින් යාන්තමට සමන්දිනී දුටීමෙනි. මොහොතකට මගේ හදගැස්ම නතර විණි. එය හිතේ හෝඩියට මට පෙනුණු මායාවක් ද...? මම නැවත සීනුව නාද කළෙමි. එවර ද චතුරිකා කාමරයට ගොඩ වූ නමුදු සමන්දිනී උන්නා යැයි මට පෙනුණු හසුන හිස්ව තිබිණි.

"ගුණසිරිට පොඩ්ඩක් කතා කරන්න."

චතුරිකා හිසවනා යන්නට ගියාය. මිනිත්තුවක් ගත වන්නට මත්තෙන් ගුණසිරි කාමරයට ගොඩ වූයේ සී. සී. ගේ මේසය මත තබාගෙන බත්මුල කෑ වරදකාරී හැඟීමෙන්ම විය යුතුය.

"තමුසෙ කන්න තෝරන් ඉන්න තැන හරි අපූරුයිනෙ ගුණසිරි."

මට ඔනෑවූයේ වචින් ගොඩින් කතාවට පිවිසෙන්නටය.

"බඩගින්නෙ සර් හිටියේ... කල්පනාවක් නැතිව සී.සී. මහත්තයගෙ මේසේ වාඩි උනේ."

"ඒ යකා ඒ මේසෙට වෙලා කරන දෙයක් නැති එකේ තමුසෙ බත් කාපු එකේ වරදක් පේන්නෙත් නෑ."

මාගේ පිළිතුරින් ගුණසිරි උද්දාමයට පත්වන්නට ඇත. ඔහුගේ මුහුණේ බයාදු සිනහවක් ඇඳිණි.

"කවුරු හරි මාව හම්බ වෙන්න ඇවිල්ලා ඉන්නවද...?"

"ආ... සර් අර චෙක් එක ගෙනියන්න ආපු නැති නෝනා අර මගෙයි, සර්ගෙයි දෙන්නගෙම ඇඟට ගොඩ උන නෝනා."

"කවුරු..."

මම මුහුණින් ප්‍රකට වන සතුට යටපත් කර ගන්නට වෙර දරමින් ඇසුවේ නොවැදගත් යමක් හාරා අවුස්සන්නා වාගේය.

"අර සර්... චෙක් එක ලියලත් ගෙනියන්න නාපු නෝනා."

"ආ... එන්න කියනවා බලන්න."

ගුණසිරි කාමරයෙන් නික්ම ගිය ඇසිල්ලේම මා වහා වහා දෝතින් හිසකේ සකසා ගතිමි. ඇඳුමේ රැල් බුරුල් ද හැර ගතිමි. ගැටවරයකු සන්දියේවත් මසිත මෙතරම් මනමාල වී නැතැයි සිතුණෙන් මට සියුම් ලැජ්ජාවක් දැනුණි.

දොරට වරක් දෙවරක් තට්ටු කරන හඬ ඇසුණෙන් මම වහා මේසය මතවන ලිපි ගොනුවක් පෙරලා ගතිමි. අනතුරුව මහත් ගැටලුවකට මැදි වූවකු වාගේ ඒ මත බැල්ම තැබුවෙමි. දොර ඇරෙන වැසෙන හඬත් මඳ මුදු සමන්පිච්ච මල් සුවඳකුත් එකවර දැනිණි.

"එක්ස්කියුස් මී..."



මම හිස නොඋස්සාම අකින් අසුන පෙන්වීමි. සමන්දිනී හිඳ ගත්තාය. මේසය මතවන වීදුරුවෙන් ඇය හැඳි ලා රෝස පාට සාරියේ මල් කම පවා පෙනිණි. මම තවදුරටත් ලිපි ගොනුවට යොමා ගත් නෙතින් උන්නෙමි.

පාඩම් කරන්නට මසිත ඉඩ නොදෙන දවසක මා අනුගමනය කළේ මෙවැනිම ප්‍රයෝගයකි. අම්මා ඒ සම්බන්ධයෙන් රැවටුණ ද තාත්තා නම් මගේ එවැනි විජ්ජාවන් පහසුවෙන් හඳුනා ගත්තේය. එවැනි විටෙක ඔහු කළේ පොතෙහි මුහුණ වදින්නට හිසට පහරක් ගැසීමය.

"කාවද ඔය රවට්ටන්න හදන්නේ... ගිහින් හිතේ නලියන වැඩේ කොරපං..."

පහරක් කන්නට වුවද තාත්තාගේ ඒ ගෝරනාඩුව මට සහනයකි. කෙසේ වුවද තේරුමක් නැතිව ලිපි ගොනුව දෙස බලා හිඳීම මට පුරුදු කළේ අම්මාය. අතීතය මෙනෙහි වීමෙන් සිතට වේදනා සහගත සොම්නසක් දැනුණේ තාත්තා ජීවතුන් අතර නොවන නිසාවෙනි.

මට සිතිවිල්ලකින් තොරවම බර සුසුමක් හෙළිණි.

"මං ආවේ සර්ට වැඩ අධික වෙලාවකද මන්දා...?"

සමන්දිනී මට හිස ඔසවා බලන්නට රුකුල ලබා දුන්නාය.

"සම...න්දිනී..."

මා මවා ගන්නට උත්සාහ කළ උද්දාමය කටහඬේ වූවාදැයි මම නොදනිමි. නමුදු සමන්දිනී මගේ රඟපෑමට වශී වී හුන් බව නම් මට ඉඳුරාම විශ්වාසය.

"ඔයා ආපු විත්තිය මං දැනගෙන හිටියෙ නෑ."

"ඒ කියන්නෙ සර් මට සලකන විදියට නෙවේද මෙහෙන්ට එන අනිත් මිනිසුන්ට සලකන්නේ...?"

"එහෙමමත්ම නෙවේ... මං ඉතින් දන් සමන්දිනීව පෞද්ගලිකවත් දන්නවනේ."

"හැම රජයේ සේවකයෙක්ම තමන් ගාවට එන මිනුස්සයො

ගැන පෞද්ගලික මට්ටමෙන් හිතනවානම් රාජ්‍ය සේවය මීට වඩා සුන්දර වෙයි.''

සමන්දිනීගේ රුව කෙතරම් පියකරුද? එවැනිම පියකරු බවක් ඇගේ පෞරුෂයේ ද විය.

''මං සමන්දිනීත් එක්ක තර්ක කරන් නෑ...''

''ඇයි ඒ...? විවාදෙකින් දිනන්ට පුලුවන් පහසුම මඟ විවාද නොකර ඉන්න එක නිසා ද...?''

''අනේ නෑ... ඔයා හරි නිසා.''

ජීවිතයේ සොඳුරුම තත්පර කිහිපය අතරට මේ ගෙවෙන කාලය ද එක්වෙමින් පවතිතැයි මට සිතිණි.

''සමන්දිනී ආසු එක හොඳයි... අද ඉඳලා වන්දි හිමියන්ගෙ නමින් මාරු නොකරන චෙක්ස්වලට මගේ ඇපෑවල් එක ඕන.''

''මං ආවේ ඒක මාරු කරගෙන යන්න නොවේ.''

''එහෙනම්...''

''ඔපත් යුනිවර්සිටි හරහා ලෝ කරන්න හිතුවා. ඒකෙ තොරතුරු ටිකක් අරන් යන්න.''

මගේ මුවගට මඳහසක් නැගිණි. ඊට හේතු දෙකක් විය. එකක් අන් ගමනක් යන අතරවාරයේ ඇ මා බලන්නට පැමිණීමය. අනෙක කට සැර ඇ නීතිය හැදෑරීම පිළිබඳව හටගත් ආශ්වාදයයි.

''ඇයි හිනා උනේ...?''

''නෑ, ඉතින් කතා කරන්න අප්‍රමාණ වචනත් තියෙනෙකේ ලෝ කරාට පස්සෙ කසාද බඳින මනුස්සයට දෙයියන්ගෙම පිහිටයි...''

සමන්දිනී හිනැහිණි. සමහර විටෙක විවෘත විශ්ව විද්‍යාල කතාව ඇ ඇඳා ගන්නට ඇත්තේ චෙක්පත මාරු කර ගන්නටම පැමිණියායැයි අඟවන්නට ඇති ලැජ්ජාව නිසා විය යුතු යැයි මට හදිසියේම සිතුණි.

''චෙක් නම්බරේක කියන්නකෝ... අපි ඉස්සෙල්ලම චෙක් එක ඇපෑවල් එකට දාලා ඉමු.''



''මං ඒක ගෙනාවෙ නෑ සර්... දැන් ඉතින් මට සල්ලි මොකටද...?''

සමන්දිනී අවසාන වචන ටික පිට කළේ සිත් වේදනාවකිනි. නමුදු මට සොම්නසක් දැනිණි. ඊට හේතුව වූයේ ඇගේ මේ පැමිණීම මා අරඹයාම සිදු වූවක් යැයි සිතුණු නිසාවෙනි.

''සමන්දිනී හොඳ ළමයෙක්.''

මා එය හිතාමතා කිවා නොව, මට එසේ කියැවිණි. සමන්දිනීගේ මුහුවට කෝල සිනාහවක් එක් විණි.

''ඇයි එහෙම කියන්නේ...?''

''නෑ මට එහෙම හිතෙනවා.''

ඒ කතාව එතනින් හමාර කරන්නට මා පෙළඹුණේ සිතට දැනුණු ලැජ්ජාවය.

''අපි මොනව හරි බීලා ඉමු.''

මා විදුලි සීනුව නාඬවන්නට යොමු කළ අත ආපස්සට ගත්තේ මින් පෙරාතුව වන්දි හිමියෙකුට මා මේ කාමරයේ දී මෙවැනි සත්කාරයක් කර නොමැති නිසාවෙනි.

''මීට ඉස්සෙල්ලා මේ කාමරේ දී වැඩක් කරගන්න ආපු මනුස්සයෙකුට මෙහෙම සලකලා නැතුව ඇති.''

''ඔව්... එහෙම දෙයක් උනොත් මේක මේ මිනිස්සුන්ට මාස ගානක් කතා කරන්න කාරණාවක් වෙයි.''

''සර් අච්චර දුර ගෙවාගෙන ආපු නිසා කොළඹටත් ඇවිත් පිට පාරෙන් යන්න බැරිකමට ආවේ... බීම බොන්න පස්සෙ බැරිගෑ සර්... මං ගිහින් එන්නම්.''

අනුන්ට වටිනා වීදුරු භාණ්ඩයක් මගේ අතින් ගිලිහී වැටෙන්නට ගියා වාගේ මසිත ගැස්සිණි.

''අපි එළියට ගිහින් මොනවා හරි බොමු.''

''මේ රාජකාරි වෙලාව අස්සේ...''

''මට අද එච්චර වැඩ තියෙන දවසක් නොවෙයි සමන්දිනී...''

''වැඩක් කර ගන්න ආපු කෙනෙකුට බීම එකක් දෙන එක ගැටලුවක් වෙනකොට එළියට බැහැලා යන එක ප්‍රශ්නයක් නෙමෙයිද...?''

ඒ අවදානම පිළිබඳව මට මෙනෙහි වූයේ එවේලේය. සමන්දිනී මදහසකින් මදෙස බලා උන්නේ මගේ ප්‍රතිචාරය කෙබඳු වේදැයි සිතමින් මෙනි.

''ඒකත් ප්‍රශ්නයක් තමයි.''

''මං හින්දා ප්‍රශ්න ඇති කරගන්නෙපා... සර් වැඩ කරගන්න... මං කොහොමත් ආයෙ චෙක් එකත් අරගෙන මෙහෙ එන්නෙපැයි... අපි එදාට තේ බොමු...''

අර පෙර කී විදුරු බඳුන ආයෙම බිඳෙන්නට යන හැටි...!

''නෑ... සමන්දිනී... මං කොහොමත් ලන්චවලට එළියට යන්න හිටියේ...''

අම්මා විසින් මහන්සිව බැඳ දුන් බත් පාර්සලය බ්‍රීෆ් කේසයේ තිබිය දී මං බොරුවක් කීමි.

''මං සර්ත් එක්ක මෙතනින් එළියට බැස්සොත් මේ මිනිස්සුන්ට හිතන්න අප්‍රමාණ කාරණා තියෙයි... අපරාදේ නිකම් අමාරුවේ වැටෙන්නෙපා...''

''මිනිස්සුන්ට මොනවා හිතන්න බැරි ද සමන්දිනී...''

මම මේසය මත වූ විදුලි සීනුව නාද කළෙමි. මිනිත්තුවකට පමණ පසු චතුරිකා කාමරයට ගොඩ විණි.

''ගුණසිරිට කියන්න චතුරිකා අපිට තේ දෙකක් ගේන්න කියලා...''

''හා...'' කියන්නට හෝ හිස වනන්නට චතුරිකාට අමතක වූවා බඳුය. ඕ තල්ලු කොට තුන් දොර අතහැර නික්ම ගියාය.

සමන්දිනී මදෙස බැලුවේ මුල්වරට දෙපයින් සිට ගත් තම දරුවා දෙස මවක බලන බැල්මෙනි.

ගුණසිරි තේ බඳුන් දෙක දී යන්නට ගියේ ද චතුරිකා සේම නොසන්සුන්වය. හිතවත් අයෙකුට මිසක ආගන්තුකයෙකුට මින් පෙර කිසිමදාක මා මෙවැනි සත්කාරයක් කර නොමැති නිසාවෙන් ඔවුන් මේ සිදුවීම දැවැන්ත එකක් කොට ගෙන තිබිණි.

ඔවුන් ඉදිරියේ එය නොවැදගත් කොට සලකන්නට තරම් මා සිතට දිරියක් නොවූයෙන් මා කාර්යාල කාමරයෙන් පිටව කන්තෝරුව හරහා ගියේ ද කිසිවෙකුගේ බැල්මට මගේ බැල්ම හසු නොවන්නට පරිස්සම් වෙමිණි. සමන්දිනී මා ළඟින්ම ගමන් කළ ද මම ඇය පිළිබඳව එතරම් තැකීමක් කළේ නැත. කන්තෝරු පරිශ්‍රයෙන් පිටතට පැමිණි මම මෝටර් රිය ගෙන එන්නැයි ආරක්ෂක නිලධාරියාට අතින් සංඥාවක් දුනිමි. අප පසුකර යන එන්නන් සේම, තැන තැන හිඳ යටැස් බැල්මෙන් අප දෙස බලා සිටින්නන්ට ද අප අතර වන බැඳීම පරණ එකකැයි හඟවන්නට මට මහත් ඕනෑකමක් විය. ඒ සඳහා උපායක් සොයමින් හුන් මට සමන්දිනීගේ නැන්දණිය සිහි විණි.

''නැන්දා ගෙදර ද...?''

මා එම ප්‍රශ්නය ඇසුවේ මදක් උස් හඬිණි.

''අපේ නැන්දද...?''

හමු වී බොහෝ වේලාවකට පසුව එවැනි ප්‍රශ්නයක් ඇසීම ගැන සමන්දිනී අන්ද මන්ද වන්නට ඇත.

''ඔව්.''

''මං එද්දි නම් නුගේලන්දෙ මාමලගේ ගෙදර ගිහිල්ලා... දැන් ඇවිත් ඇති...''

ඒ වන විට රියදුරු මෝටර් රිය මා පාමුලට ගෙනවිත් නතර කොට තිබිණි.

''නගින්න සමන්දිනී.''

මම සමන්දිනීට මෝටර් රිය හැර දී රියදුරු අසුනට ගොඩවීමි. මේ පෙම සිතින් යුවතියක් මගේ රථයට නංවා ගත්තාමය.

එපමණක් නොව කෙල්ලකට කැමක් දෙන්නට තරම් දිරියක් මා තුළ තිබුණු බව දැනගත්තේ ද ඒ මොහොතේය. ගියේ දිවා ආහාරයට වුවද අප කළේ ඔහේ නා නා ප්‍රකාර දේ කතා කිරීම පමණි.

ඇනවුම් කළ ප්‍රමාණයෙන් දහයෙන් එකක්වත් අප ආහාරයට ගත්තේ නැත. දෙපැයකට ළඟ කාලයක් අපි අවන්හලේ ගත කළෙමු.

"ඔයාගේ බස්සෙක තියෙන්නෙ කීයටද...?"

"හතරෙ බස්සෙකේ ගියොත් ලේසියි... එතකොට නමය වෙද්දි සමනල කන්දෙත් බහින්න පුලුවන්."

"නවය කියන්නෙ සෑහෙන ඊ වෙලානේ...?"

"මගදි නැන්දට කෝල් කරාම එයයි, අනූෂ අයියයි බස් හෝල්ට් එකට ඇවිත් ඉන්නවා."

ආයෙම වතාවක් අනූෂ අයියා මගේ සිතට ඇතුළු විය.

"ඔයා පවුලෙ එකම දරුවා කිව්වා නේද...?"

අවන්හලෙන් පිටව බස් නැවතුමට යන ගමනේ දී මම ඇසීමි. ඒ අනූෂ අයියා පිළිබඳ තොරතුරු දැන ගැනීමේ උවමනාව නිසාමය.

"ම්..."

"එතකොට අනූෂ අයියා කාගේ කවුද...?"

"අපේ ලොකු නැන්දගේ වැඩිමල් දුව බැඳලා ඉන්නෙ එයා..."

ඔහු විවාහකයෙකු වීම පිළිබඳව මට සියුම් සතුටක් දැනිණි.

"ඒ කිව්වෙ ගෙදර ඉන්න නැන්දගෙද...?"

"නෑ ඒ පුංචි නැන්දා... ලොකු නැන්දා නැති වෙලා."

"අනූෂ අයියට බබාල ඉන්නවද...?"

"ඔව්... පුතයි... දුවයි..."

"ගොඩක් පුංචි අය ද...?"

"පුතාට අවුරුදු නමයයි... දුවට හතරයි... පව්..."

සමන්දිනී දරුවන් පිළිබඳව කතා කරේ කිසියම් ළතැවුල් සහගත බවකිනි.

"ඇයි පව් කිව්වෙ...?"



"අපේ අක්කා මීට අවුරුදු දෙකකට උඩ දි නැති උනා සර්... එතකොට චූටි දුවට යාන්තම් අවුරුදු දෙකක් ඇති... ඒ කාලෙ ඉඳලම චූටි දුව පුරුදු උනේ මට..."

මට විශාල සංවේගයක් දැනිණි. එය වේදනාවට හුරු කළකිරීමකි.

සමන්දිනී නොදරුවන් නිසාවෙන් අනූෂ අයියාට කිට්ටු වී ඇතැයි මට සිතිණි. එසේ වී නම් ඇය මා සමග පවත්වන්නට යන සම්ප සබඳතාව කෙබඳු එකක් විය හැකි ද...? මා ඇගේ හිතවත් මානසිකත්වය ප්‍රේමයකට පෙරළවා ගත්තා වැනි සිත් තැවුලකින් මසිත පෙළෙන්නට විය.

මා ඇය බස් රියට ගොඩ කළේ ද ඒ සිතිවිල්ලෙනි. වෙක්පත මාරු කරගැනීම පිළිබඳව කතාබහ කරන්නට මට අමතක විණි. සමන්දිනීට ඒ පිළිබඳව උනන්දුවක් නොවන්නට ඇත. කෙසේ වුවද ඕ සමුගෙන ගියේ අපට හමුවන්නට තවත් ඉඩකඩ ඉතිරි කරය.

"සර් අර නෝනව අඳුරනවද...?"

මා පෙරළා එද්දි කාර්යාලයේ වූයේ ගුණසිරිත් අතවැසි සේවකයන් කිහිප දෙනෙකුත් පමණි.

"ම්... ඒ ළමයා මතක් කරනකම් පරණ දැන ඇඳුනුමකම් මට මතක් උනේ නෑ."

ගුණසිරි එය පිළිගන්නට ඇතැයි මා අනුමාන කළෙමි. ඊට හේතුව මගේ චරිතය පිළිබඳව දෙගිඩියාවෙන් සිතන්නට කිසිවක් මෙතෙක් සිදු වී නොතිබීම විය යුතුය.

# 03

රැයෙහි වැස්සේය.

හරි තදින් වැස්සේය. මම නිදන්නට වෙර දැරීමි. මුළු රැයම පහන් කළෙමි. අක්කා මිය ගියාම නංගී දරුවන් රැකීම ද, මියගිය අක්කාගේ ස්වාමි පුරුෂයා හා දීග යන කතා ඕනෑතරම් ගම්බද වේ.

මෙය ද එවැනි එක් කතාවක් වන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

නොයෙක් තැන්වල දී නොයෙක් තරාතිරමේ ගැහැනුන් කෙරෙහි ආදරබර සිතිවිලි මසිතේ පහළ වුවද පෙම් සිත් මට පහළ වූයේ සමන්දිනී කෙරෙහි පමණි.

නොකිවාට ඈ හා ගෙවන පවුල් ජීවිතයක් පිළිබඳව මම සිහින දුටිමි. ඒ සියලු සිහින බිඳී ගියාක් වැනි වේදනාවකින් මම පීඩා වින්දෙමි.

පසුදා කාර්යාලයට ගිය මම වෙනදාට වඩා වැඩ කළේ මේ සිදුවීම අමතක කර දමන්නටය.

නමුදු අමතක කර දමන්නට වෙර දරන හැඟීම්වලට සාපේක්ෂව ඈ පිළිබඳ මතකය මා සිත අවුළුවාලුවේය.

මම ඇයට ලිපියක් ලියන්නට ගතිමි. ආමන්ත්‍රණය සොයා ගන්නට පැයකට වඩා ගතවිණි. ''ආදරණීය සමන්දිනී....'' කියාය.



පළමු ලිපියෙහි ප්‍රේමය වැක්කෙරෙන තරමට තිබුණ ද දෙවන, තෙවනවර හෝ සිව්වන වර ලියූ ලිපියෙහි තිබුණේ රාජකාරි ලිපියක ගුණය. ඔබේ අංකයත්, මගේ අංකයත් හැරුණුවිට රාජකාරි ලිපියකට උවමනා සියලු කළමනා සහිත පේළි දහයකට, පහළොවකට වඩා නොවැඩි ලිපියක් අවසන මා අතින් ලියැවිණි.

එය ද පොඩිකර විසි කර දමූ මම කන්තෝරුවෙහි විධාන සටහන් කර යවන හිස් කඩදාසියක් පිළිවෙළට නවා ඇයට තැපැල් කළෙමි.

එම හිස් කඩදාසිය මා එවූ එකක් බව වටහා ගන්නට ශීර්ෂ, උපශීර්ෂ හා මුද්‍රණ දත්තයන් එහි විය.

එම හිස් කඩදාසිය දැකීමෙන් ඇය කෙබඳු ප්‍රතිචාරයක් දක්වයි දැයි බලමින් මම දින කිහිපයක් ගෙවා දැමුවේ වසින තෙක් පෙරුම් පුරන මැඩියෙකු මෙනි.

අම්මා කීවේ ඉස්සර තාත්තාගේ කියමන්ය. ඔහු කී කරුණු කාරණාවල ගැඹුරත් ඇත්තත් අම්මාටත් මටත් වැටහෙන්නේ දැන් දැන්ය. ඉස්සර තාත්තා, දවසක එක වතාවක් හෝ සෝමාරි නොවී වැඩ කරහං යැයි කියා මට කීවේය.

ඔහු බලාපොරොත්තු වූ තරමට මා වේගවත් වූයේ නම් පරිපාලන නිලධාරියකු වී මා නතර වන්නේ නැත. ඔහු හැමදාම මට කියා දුන්නේ ගසක මුදුන් අත්තේ එල්ලෙන්නටය. එවිට මැද ඉත්තක හෝ රැඳෙන්නට හැකි වේය යන අවබෝධය මා සොයා ආවේය. මිය ගොස් බොහෝ කලකට පසුවත් තාත්තා හිතට ගෙන එන්නේ සොඳුරු කල්පනාවන්මය.

''තාත්තා පව්...''

මා එය හිතාමතා කිව්වා නොව මට එසේ කියැවිණි. අම්මා තිගැස්සී මෙන් මදෙස බැලුවී මා අහේතුකව එය කීවූ නිසා වන්නට ඇත.

''තාත්තා වෙනුවෙන් මට කරන්න බැරි උනේ තාම එක දෙයයි... ඒ උඹව කසාද බන්දලා දෙන එක... මැරෙන්න මොහොතකට කලින් ඉස්සෙල්ලා මං ඒකත් කරනවා.''

අම්මා එය කීවේ වරදක් නිවැරදි කර ගන්නට වෙර දරණ පසුතැවිලි සහගත හඬකිනි. තාත්තා කැමති, ඇය අකැමැති බොහෝ දේ ඔවුන් අතර විය.

ඒ අරඹයා ඇති වූ ගැටුම හුදෙකලාව ජීවිතවන ඇයට මානසික වදයක් විය නොහැකිද...? මම කෑම මේසයෙන් නැගී උන්නෙමි.

දින කිහිපයක් හැල හොල්මනක් නැතිව ගෙවී ගියේය. ඇලුම් කරන ගැහැනු හිතක් හදවතට රිංගා ගැනීමෙන් දනෙන චිත්ත පීඩාව දැඩි සේ මට වද දෙමින් ද පීඩාවට පත් කරමින් ද උන්නේය. සිතිවිලි පිටතට පෙන්වන්නට "මුහුණ හොඳ කැඩපතක්ය" යන කියමන මම දිවා රෑයේ සත්‍ය ලෙස අත්දැකීමි.

මගේ මුහුණේ මට පෙනෙන පියකරු බව ගිලිහී යමින් තිබිණි. එය මට පමණක් නොව අන් අයට ද පෙනෙන එකක්යැයි සිතුණේ අම්මා ඒ පිළිබඳව කතා කළාට පසුවය.

"උඹට මොකක් හරි අසනීපයක් ද පුතේ...?"

උදෑසන කාර්යාලයට යාමට සූදානම්ව උඩින් පල්ලෙන් කමින් උන් මගෙන් අම්මා ඇසුවාය.

"නෑ ඇයි...?"

"ඇයි කියන්නෙ උඹේ මූණකට හේබාලා ගිහින්නේ..."

මම පෙරළා කිසිවක් නොකීමි.

"වැඩ පොළේ මොකක් හරි ප්‍රශ්නයක්ද...?"

මගේ කයින් පිළිබිඹු කරන සිතෙහි වෙනස සුළුපටු නොවේ යැයි මට සිතුණේ එවේලේය.

"මේ දවස්වල ටිකක් වැඩ වැඩියි."

"වැඩ වැඩියි කියන්නෙ තමුන් වැඩිමනත් කාලය නිකම් ඉන්නවා කියනෙකනේ... වැඩ කිරීමේ හැකියාව කියන්නෙ කපන්න කපන්න මුවහත් වෙන පිහියක් වගේ... ඉහළට ගියාට මොකද උඹ ඉස්සර වගේම ශෝමාරියි..."

"උඹ ඔය කාලා ඉවරද...?"



"ඇති..."

"ඇති කියන්නෙ උඹ කෑවයෑ... අත ගෑවනේ..."

මම කිසිවක් නොකියා ගෙදරින් පිටවීමි. පසුතැවිල්ලක්, කුසීත ගතියක් හෝ හිස් බවක් මට දනෙමින් තිබිණි. කන් දෙන්නකු උවමනා වන්නේ කියන්නට යමක් ඇති විටය. මම සහබන්ධුට දුරකතන ඇමතුමක් දී හැකි නම් කාර්යාලයට එන ලෙස දැනුම් දුන්නෙමි. කාරණාව කුමක්දැයි නොඇසූ ඔහු මාගේ ආරාධනාවෙන් අමන්දානන්දයට පත් විය.

"මම කියට විතර ආවොත් ද හිවංකට කරදරයක් නැත්තෙ...?"

"කෑම ටිකක් කන්න එළියට යන්න බලාගෙන එන්නකෝ..."

"වොන්ඩපුල්... වොන්ඩපුල්... අද මගේ අතෙත් ගානක් තියෙනවා."

සහබන්ධු රිසීවරය තැබුවේ දැඩි සොම්නසකිනි. මම මහා වැඩ ගොඩක් මැද තෑප්තියෙන් කරන්නට කිසිවක් නැතිව බලා උන්නෙමි. එවැනි විටක මා කළේ මා නමට යොමු වූ සියලුම ලිපි ගෙන කියවා අදාළ තැන්වලට යොමු කිරීමය. මම මේසය මතවන විදුලි සීනුව නාද කළෙමි.

මොහොතක් ගතවන්නට මත්තෙන් සුපුරුදු කුඩා පොත අතැතිව චතුරිකා කාමරයට ගොඩ වූවාය.

"ඊයෙ පෙරේදා ලියුම් කැඩුවද...?"

"ඔව් සර්..."

ඈ "ඔව් සර්" යැයි කීවේ කිසියම් ද්වේශ සහගත සිතාහවකින් යැයි මට සිතිණි.

"ලියුම් අදාළ තැන්වලට දැම්මද...?"

"සර්ගෙ ඇපෑවල් එක තියෙන්න ඕන ලියුම් ටික ඇරෙන්න අනිත් ඒවා දැම්මා."

"ඒ ලියුම් ටික අරන් එන්න."

ඈ යන්නට ගියේ නොමනා මඳහසකින්යැයි මට සිතුණි. පෙරළා ආවේ ද ඒ සිනහවකිනි.

"මං හිතන්නෙ මෙක පුද්ගලික ලියුමක් සර්..."

ඔ ලියුම අතරින් එකක් ගෙන මට දුන්නාය. ක්ෂණයකින් විදුලි සැරයක් සිරුර පුරා දිව ගියාක් බඳු හැඟීමක් මට දැනුණි.

චතුරිකා දුන් ලිපියේ වූයේ මා සමන්දිනීට යැවූ කඩදාසියයි. මා කඩදාසිය අතට ගෙන බැලුවේ එය මට අදාළ නොවන්නකැයි හැඟවෙන බැල්මකිනි.

මගේ බැල්මේ අදහස සාර්ථකව චතුරිකාට සන්නිවේදනය නොවූයේ එම කඩදාසිය මුළු ආයතනය තුළම පාවිච්චි කළ එකම තැනැත්තා මා වීම නිසාය. මම කඩදාසිය ගෙන දිග හැර බැලීමි. "ලිපිය මාරු වී හෝ ලියන්නට අමතක වී හෝ ඇත. වහාම තොරතුරු සොයා බලන්න."

සමන්දිනී වටකුරු අකුරින් ලියා තිබුණි.

"මොකද්ද මේ...?"

මම යන්තම් ඇස් තවු ඔසවා චතුරිකා දෙස බැලීමි. චතුරිකා දෙවුර හකුළුවා නොදන්නා බව හඟවා යන්නට ගියේ මා කෙරෙහි නොරිස්සුමකින් මෙනි.

මාගේ ලියකියවිලි වැඩට අත් උදව්වට සිටින ඕ ඇතැම් විට හැසිරෙන්නේ මා ඇගේ ස්වාමි පුරුෂයා කොට සලකාය. වරෙක එය රහස් වින්දනයකි. භාරදූර රාජකාරී අතර ඇගේ කෝලම් ද මට අස්වැසිල්ලක් වන අවස්ථා නැත්තේ නොවේ.

වරෙක දත අව හැව්රිදි වියට යමින් ද තවත් වරෙක ආදරයෙන් ආදර ප්‍රේමවන්තයකු ලෙසින් ද කීප වරක් මම සමන්දිනීගේ ලිපිය කියවීමි.

පේළි දෙකකට සීමා වූ ඇගේ ලිපිය කියවා අවබෝධ කරගන්නට සහබන්ධු එනතෙක් මට හැකිවූයේ නැත. හෙතෙම මගේ ගරුත්වය සලකාදෝ පැමිණ උන්නේ ටයි කෝට් ඇඳ පයිප්පයක් ද අතින් ගෙනය.

"මං යන තැනයි කෙනයි අනුව කිව් එක මාරු කරනවා... හොඳයි නේද...?"



හෙතෙම විලාසිතා දැක්මකට පැමිණියකු වාගේ කාමරයට පැමිණ සිට ගත්තේ හැඩරුව පෙනෙන පරිද්දෙනි.

"හොඳයි ලස්සනයි."

සහබන්ධු දැකීමෙන් මනෙතට කඳුලක් මෝදු වූයේ හාත්පා සිහිවීමෙනි.

මා සහබන්ධු ගෙන්වා ගත්තේ සමන්දිනී විසින් හිස් කරන ලද සිතෙහි පාළුව කාන්සිය මකා ගන්නටය. නැවත ඇය දකින්නට යාමේ මා තුළ වූ අභිලාෂය ඔහුගේ ඇවැමෙන් මුදුන්පත් කර ගන්නට උනන්දුවක් මා තුළ නොවුණා ද නොවේ.

නමුදු කැපුවම ඔහුගෙන් ඒ උදව්ව ඉල්ලන්නට මා තුළ දිරියක් නොවිය. මා සමඟ දුර බැහැර ගමනක් යන්නට සහබන්ධු තුළ ඇත්තේ ලොකු උවමනාවක් සහ උනන්දුවකි.

ඔහු තුළ එවැනි උනන්දුවක් වී ද සමන්දිනී හමුවන්නට යැමේ යෝජනාව ඔහුට ඉදිරිපත් කරන්නට ලැජ්ජාවක් මා සිත තුළ විය.

මා කමින් ද, සහබන්ධු කමින් සහ බොමින් ද හිඳිය දී ඒ යෝජනාවට වටින් ගොඩින් එළඹෙන්නට මම උත්සුක වීමි.

"සමන්දිනී චෙක් එක මාරු කර ගන්න ආවෙ නැතේ..."

මා නොවැදගත් පුවතක් හෙළිකරන්නා වාගේ කතා කළෙමි.

"මං දන්නවා."

සහබන්ධු වඩා හොඳ අවුළපතක් සොයමින් කීවේය.

"සහබන්ධු කොහොමද ඒක දන්නේ...?"

"නෑ ඉතින් ඉලන්දාරියට හදිස්සියෙම මාව මතක් වෙන්න හේතුව වෙන කාරණාවක් වෙන්න බැනේ."

"මිස්ට සහබන්ධු මං ගැන මවන් ඉන්න චිත්‍ර වැරදියි."

"හරි... එහෙමනම් හදිස්සියෙ මට කතා කරන්න කාරණාව කියමු බලන්න."

කියන්නට කාරණාවක් නොවූයෙන් මඳ නොසන්සුන් කමක් මට දැනුණි.

"ඒකට විශේෂ හේතුවක් නෑ... මට ඉතින් සහබන්ධුව දවස් ගාණකින් මුණ ගැහුනෙත් නැනේ."

"තිවංක කතා කරන්නෙ අවංකවම නම් උඩු හිතට ප්‍රබල යටි හිත කියන කතාව ආයෙම ඇත්ත වෙනවා..."

"මට සහබන්ධු කියන්නෙ මොනවද කියලා තේරෙන්නෑ..."

"නෑ ඇත්තටම තිවංක මට එන්න කියන්නෙ සමන්දිනී ගැන ආරංචියක් නැති දුකට. උඩු හිත ඒක හෙළි කරන්න බයයි පෞරුෂයට හානි වෙන හින්දා. යටි හිතට එහෙම රැකගන්න දේවල් නෑනේ."

මගේ මුවගට සිනහවක් නැඟුණේ සහබන්ධු ජීවිතය ගැන සිතන පිළිවෙල ආශ්වාදජනක වූ නිසාය.

"ඇත්තටම මට ඒ කෙල්ලව තේරුම් ගන්න බෑ සහබන්ධු."

"ඔය පැන්නෙ බළලා මල්ලෙන් එළියට..."

සහබන්ධු හිනැහෙන්නට ගත්තේය.

"මිනිහෙක්ගෙ අසරණකමට හොඳ මිනිස්සු හිනාවෙන් නෑ සහබන්ධු."

මා කීවේ විහිළුවක සරිනි. සහබන්ධුගේ සිනහව තුනී වූයේ නැත.

"එතකොට ඒ කෙල්ල හින්දා දූන් ඉලන්දාරියා ඉන්නෙ අසරණ වෙලා."

මා සිනහ වූවා මිස කිසිවක් නොකීමි.

"මං කියන්න දී...? මං ටයි කෝට් දාගෙන ආපු එකේ මඟුල් ගේකට ආපු විදියට අපි යං කෙල්ලගෙ ගෙදර..."

"දූන්..."

"ඔව්... රාජකාරි වැඩකට පිට යනවා කියලා ගෙදරට කිව්වා... ගියා... තුනට ගියොත් හතට එහෙ... හමයට එහෙන් ආවොත් එකට මෙහෙ මොකද කියන්නේ...?"

"එතකොට එකට ගෙදර ආවම සහබන්ධුගෙ වයිෆ් ගන්නෙ ඉදල ද කොස්සද...?"



"මගෙ මූනේ දූලි නැද්ද...?"

සහබන්ධු එක්වරම ඇසුවේ කතාවට කොහෙත්ම සම්බන්ධ නැති පැනයකි.

"නෑ... ඇයි...?"

"මං මේ කෝච්චියෙ ඇන්ජිම ඉබලා එන ගමන්."

"සහබන්ධු මොනවා කියනවද කියලා මට නම් තේරෙන් නෑ..."

"නෑ... අද උදේ අපේ වයිෆ් කළුතර නංගිලගෙ ගෙදර ගියා. මං සතුටට ඉඹා ඇන්ජිම. මං මේ චණ්ඩියා වගේ කතා කරන්නෙ අද මං කීයට ආවත් ඉලපත ගන්න කෙනෙක් නැති නිසා. මෙහෙම චාන්ස් හැමදාම වදින්නෑ පුතා... යනවානම් යං..."

"හෙට වැඩ අධික දවසක්."

"එහෙමනම් නොයා ඉමු."

"හැබැයි ඉතින් ඒ වැඩ ටික අනිද්දා උනත් කරන්න පුළුවන්."

ඒ වන විට සමන්දිනී බලන්න යාමේ තීරණය ගෙන තිබිණි. මා කළේ මුනිවච්චාවට මගේ හිතත් රවටා නිකරුණේ සහබන්ධුගේ හිතත් රැවටීමය.

"දොං නම් දොං පුතා... සිමං නම් සිමං... දොං සිමං දෙකක් බෑනේ... යනවා නම් යං... ඉන්නවනම් ඉමු..."

මම කල්පනාබර ඉරියව් ප්‍රකට කරමින් තත්පරයක් දෙකක් ගෙවා දැමීමි.

"මේ රෑ ගියාම ඒ මිනිස්සු අපි ගැන මොනවා හිතයිද...?"

"අපි යන්නෙ වෙඩින් එහෙකටනෙ පුතා. අහම්බෙන් යන ගමන් තමයි එහෙට ගොඩ වෙන්නේ... එතකොට මං බෙල්ල සාක්කුවේ වැටෙන තරමට බීලා හිටියත් කමක් නෑනේ පුතා. ගිහින් එන්නෙ මඟුල් ගේකනේ."

"එතකොට සහබන්ධු මේ ගමන යන්න එන්නෙ මොන්න."

"ඒකත් එක අරමුණක්... බොරු කියන්නෙ මොකටද...?"

''එහෙම කතාවක් කිව්වට මමත් ඉතින් මඟුල් ගෙදරකට යන විදියට ඇඳලා යන්නෙපැයි.''

''ඔව්... ඉතින් ඇඳලා යං... පුතා දැන් ගෙදෙට්ට කෝල් කරලා කියන්න විෂය භාර ඇමතිවරයත්තෙක්ක නුවර යනවා කියලා සාකච්ඡාවකට. එතකොට අම්මා සර්වන්ට් ලවා තියෙන හොඳම ඇඳුම ලෑස්ති කරලා තියයි... පුතාට තියෙන්නෙ ගිහින් ඇඳගෙන පිටත් වෙන්න විතරයි...''

''ඒක පොඩි විකාර වැඩක්නේ...''

''මුළු ජීවිතේම විකාරයක් වෙච්ච කොට කරන වැඩක් දෙකක් විකාරයක් උනාම මොකද පුතා.''

''ඒකනම් ඇත්ත... එහෙමනම් අපි යං...''

''පිරිමියෙක් උනාම වැඩ කරන්නෝන අන්න එහෙම පුතා...''

සහබන්ධුගේ සැලැස්ම කලක් තිස්සේ සැලසුම් කළා වාගේ සාර්ථක විණි. වෙනසකට වූයේ කොළඹින් නුවරට පිටවන්නට සිටි අප මහරගමින් පිටවද්දී හතරට ආසන්නව තිබීමය. සහබන්ධු මෝටර් රියට ගොඩ වූයේ කුඩා බෑගයක් ද ඩිකියට දමාය. ඒ කුමක්දැයි අසන්නට මා ඉක්මන් නුවූයේ ඒ මත්පැන් හෝ ඊට අවශ්‍ය වෙනත් කලමනා එහි තිබෙන්නට ඇතැයි අනුමානයට සිතාය.

පැමිණි ගමන පිළිබඳව මා තුළ තදබල පසුතැවිල්ලක් හට ගතතේ නුවර නගරය පසුකරද්දීය. ඒ වනවිටද රාත්‍රී දහය පසු වී තිබිණි.

''අපි ආයෙම යං සහබන්ධු... මේක තේරුමක් ඇති ගමනක් නෙවෙයි.''

සමනලතැන්නට ළඟාවන්නට තවත් පැයක් හෝ ඊට වැඩි කාලයක් ගත වෙතැයි සිතින් අනුමාන කළ මම ගමනේ අවසානය පෙනී පෙනී එය අතහැර දැමීමි.

''මෙච්චර දුර ඇවිල්ලා ආයෙ යන්න පුතාට පයිත්තියන්ද...?''

''මේක හෙවල්වලට යන වෙලාවක් ද සහබන්ධු...''



''අපිට වැඩිම උනොත් තව පැයකින් කෙල්ලගෙ ගෙදරට යනෑකි... දැන් කීයද වෙලාව...?''

මගෙන් වෙලාව ඇසූ සහබන්ධු තමාගේම අත් ඔරලෝසුව දෙස ඇස් පුංචි කර බැලීය.

''දහයයි... දහයයි... වැඩිම උනොත් අපි එහෙට යද්දි එකොළහමාර වෙයි... එකොළහාමාරත් වෙලාවක් ද පුතා.''

මම රිය මග අයිනට වත්නට නතර කළෙමි.

''ඒක වෙලාවක් නෙමෙයි වවුලන්ට.''

මම තරගින් පැවසීමි.

''අන්න හරි පුතා... අන්න හරි... වෙලාවට කලාවට කූඩුවලට ගාල් වෙන්නෙ කුරුල්ලො... අපිත් කුරුල්ලො වගේ තමයි. ඒ උනාට කමු නෑනේ. ඔන්න ඔය බඩකඩුත්තුව ස්ටාට් කරන් යං පුතා.''

''එහෙම ගිහින් මොනවද ඒ මිනිස්සුන්ට කියන්නේ...?''

''කියන්න දේවල් ද නැත්තේ පුතා... කොළඹ දී පටලන් ආපු කතාවට අපි තව එක වාක්‍යයක් එකතු කරමු.''

''ඉන්න හිටින්න තැනක් නෑ වාගේ ගමනට එක් වූ සහබන්ධු සැහැල්ලුවෙන් කතා කිරීම පිළිබඳව මා තුළ හටගත්තේ තොරිස්සුමකි.

''මොකද්ද එකතු කරන වාක්‍යය...''

''මඟුල් ගෙදරට ගිහින් එන ගමන් කාරෙක මිස් කරන්න ගත්තා... මෙතන්ට වෙනකම් ආවෙත් තැන් තුන හතරක නතර කර කර කියනවා...''

''ඒවා පිළිගනීද ඔය මිනිස්සු...''

''පිළිගන්නේ නැතෑ අපිට මොකෝ පුතා... අපිට දෙන්න උත්තරයක් තියෙනවානේ. ආයි කොළඹ ගියොත් පැය පහයි. සමනලතැන්නට ගියොත් පැයයි.''

මම තීරණයක් ගත නොහී තවත් තත්පර කිහිපයක් ගෙවා දැමීමි. යනවාද නොයනවාද යන දෙගිඩියාව අතිශය තදබල ලෙස මගේ සිතිවිලි හැඩි කර තිබිණි.

"අනිත් එක ගෑනියෙකුගෙ චර්යාව බලන්න ගෙට ගොඩ වෙන්න කියාපු වෙලාව මේක."

"මොකද්ද ඒ කතාවෙ තේරුම...?"

"නෑ ඉතින් ඔය ගෙවල්වල කවුරු ඉන්නවද...? මොකට ඉන්නවද කියලා කවුද දන්නේ... අනිත්තෙක අපි නොදන්නවට මේ කෙල්ල බැඳලා ද දන්නෙ නැනේ."

සිහිවිලි විසින් මෙහෙයවන ලද මම මෝටර් රිය පණ ගැන්විමි. සහබන්ධුගේ මුවෙහි ඇඳෙන මඳහස මා නුදුටුවා සේ උන්නේ ලැජ්ජාව නිසාය. සහබන්ධු පැයක් ගතවේනැයි අනුමාන කළ ගමන මම විනාඩි තිස්පහකින් අවසන් කළෙමි. සමන්දිනීගේ නිවෙසේ ඉදිරිපස ආලින්දයේ මලානික විදුලි බුබුලක් දල්වෙමින් තිබුණි. ඒ හැරුණු විට ගෙයි එකත්පස කාමරයක ආලෝකයක් වේ.

"පුතාට බොරු කියනකොට ගොන ගැහෙනවනම් කතා නොකර ඉන්න... මං කියන ටිකට හිනා වෙලා ඔළුව වැනුවහම ඇති..."

මා පෙරළා කිසිවක් කියන්නට පෙරාතුව සහබන්ධු මෝටර් රියෙන් බැස ගියේය. මගේ පපුවේ ගැස්ම තීව්‍රව තිබුණි. සහබන්ධු හඬෙහි රැල් බුරුල් හැර දොරට තට්ටු කළේය. තත්පර කිහිපයකට පසු ගෙයි සියලුම විදුලි පහන් දල්වුණේ එක පෙළටය. තවත් මොහොතක් ගෙවුණු තැන ගෙයි දොර හැරිණි.

දොර හැරියේ පිරිමියෙකි. මගේ පපුව නතර වූවාක් බඳු විය. නුවර දී සහබන්ධු කී කියමන මට සිහි විය. තත්පර කිහිපයක් ගෙවෙන්නට මත්තෙන් සමන්දිනීගේ තාත්තා ද, සමන්දිනී ද ආලින්දයට පිවිසිණි. සමන්දිනී රාත්‍රී නිදන ගවුමට උඩින් කබායක් ලා උන් අතර ඔවුන්ගේ කතාබහ අතර මෝටර් රිය දෙස බලනු මම දිටිමි. මා පියවි සිහිය ලැබුවේ ඉන් අනතුරුව වග විශ්වාසය. ඒ අතර සමන්දිනී පිරිසෙන් මිදී මෝටර් රිය වෙතට ආවෙන් මම වහා රියෙන් බැසිමි.

"හරි වැඩේනෙ වෙලා තියෙන්නේ...?"

මම ළා මඳහසකින් හිස වැනීමි.

"යං සර් ගෙට."



"අපි ගිත්දා සමන්දිනීලටත් කරදරේ... මං ඒත් මේ බූරුවට කිව්වා හොටෙල් එකෙක නතර වෙලා උදේම යං කියලා... මූට මෙහෙම එන්න ඕන උනානේ."

මා එසේ කතා කරාවියැයි විශ්වාස නොකළ නිසාවෙන්දෝ සමන්දිනී විශ්මයෙන් මා දෙස බැලුවාය. මා සහබන්ධු මඟින් පිට කළේ සමන්දිනී කෙරෙහි මසිතේ වූ අපැහැදීමයි, කෝපයයි.

"නෑ... ඉතින් හෝටල්වල නතර වෙනවට වඩා හොඳයිනේ මේ පැය හත අට මෙහෙ ඉන්නෙක."

"ඉන්න වෙලාවක් නෑ සමන්දිනී."

"යන්නෙ කොහොමද කාරෙක කැඩිලා නම්..."

සහබන්ධුගේත් මගේත් කුමන්ත්‍රණය මට සිහිවූයේ එවේලේය. අපගේ කතා බහ අතර සහබන්ධු අප වෙත ආවේය.

"මේ වාගේ අකරතැබ්බ වෙයි කියන බයට තමයි මං මගේ ඇඳුම් බෑග් එක අරන් ආවේ."

"යතුර පොඩ්ඩක් දෙන්න පුතා."

සහබන්ධු මෝටර් රියෙහි ඩිකිය හැර කොළඹ දී දමා ගත් බෑගය පිටතට ගත්තේය. ඔහු සූදානම්ව ආවේ කුමකටදැයි මට වැටහුණේ ඒ මොහොතේය.

"ඇඟ පත හෝදන් ඇඳුමක් දාගමු. තිවංක... මං ගාව වැඩිපුර කමිසයක්, සරමක් ඇති."

වයස තත්ත්වය තරාතිරම නොබලා සහබන්ධුගේ කතාට පහරක් ගැසීමෙ තද බල වුවමනාවක් මසිත පිළිසිඳිණි. නමුදු මම සිහිවිලි යටපත් කොට ඔරවා සහබන්ධු දෙස බැලීමි. සහබන්ධු මගේ කෝපය වටහා ගන්නට ඇත.

"නෑ... ඉතින් තිවංක පුතාට ඔහොම ඉන්න පුලුවන් නං කමක් නෑ. මං කිව්වෙ මට මෙහෙම ඉන්න අමාරු නින්දා..."

සහබන්ධු නිවෙස වෙත යමින් වාගේ කතා කළේය.

"යං සර් ගෙට."

''මං කාරෙක්කම ඉන්නම් සමන්දිනී... එළිවෙන්න වැඩි වෙලාවක් ඇත්තෙත් නැහැනේ.''

''ඔයාට විකාර ද... මෙන්න මෙහෙ යං ගෙට.''

සමන්දිනී හදිස්සියේ හටගත් ආවේගයකින් වාගේ මගේ අත අල්වා ගත්තාය. මගේ සියොළඟම වූ දාහය ද, කෝපය ද ක්ෂණයෙන් අතුරුදන් වූවා වැනිය.

''සොරි....''

ඊළඟ තත්පරයේ ඕ මගේ අතින් අත ඉවතට ගනිමින් කතා කළේ ලැජ්ජාවෙනි.

මා හෝ සහබන්ධු පිළිබඳව සමන්දිනීට, ඇගේ නැන්දනියට හෝ අනූෂට සැකයක් නොවීය. ඔවුන් හැසිරුණේ අප සම්භාවනීය අමුත්තන් කොට සලකාය.

ඇඳුම් පැළඳුම් ගෙන ඒමෙන් සහබන්ධු කළේ නොමනා කමකැයි මා සිත තුළ වූ නොරිස්සුම කෙමෙන් පහව ගොස් තිබුණි. මුහුණකට සෝදා හමාරව මා ඇඳ ගත්තේ ද ඔහු ගෙන ආ පාවිච්චි නොකළ සරමකි. කමිසය අනූෂගේය.

කිරි අම්මා උයා ඉතිරිව තිබූ ව්‍යාංජන ආයේම රත්කර ඔවුන් සකස් කළ කෑම මේසයේ කිසිම අඩුපාඩුවක් නොවීය. නමුදු මා කෑවේ උඩින් පල්ලෙනි. රෑ එක හෝ එකහාමර වනතුරු අපි ඔහේ සම්ප්‍රප්‍රලාප දොඩමින් උන්නෙමු.

''උදේට පැය තුන හතරක ගමනක් යෙදිලා තියෙනෙකේ මහත්තුරුන්ට නිදාගන්න සූදානම් කරා නම් හොඳයි.''

අනූෂ ඒ යෝජනාව කළේ තමන්ට නිදිමත නිසා නොවන වග මට ඉඳුරාම පැහැදිලි විය. ඔහු ඇවතුමෙන් පැවතුමෙන් යහපත්ය. කතාබහින් ද සිත් ගන්නා සුළුය. පෙනුමෙහි ද වරදක් නොවේ. නමුදු එක දිගට විඳි දුක්ඛ දෝමනස්සයන් නිසාදෝ ඔහු වෙතින් තරමක වියපත්, වෙහෙසකර බවක් දිස් වේ. රැයෙහි නිදි යහනේ දී ද ඔහුත් සමන්දිනීත් අතර වන සබඳතාවය කෙබඳු එකක් ද යන්න සිතන්නට මම වෙහෙසීමි.

අවස්ථා කීපයකදීම මා මඳක් නිදිබර වී ද අප්‍රුල දනවන සහබන්ධුගේ ගොරහැඬි හුස්ම ඉහළ පහළ හෙළීම මා තදබල නින්දකට පත් නොකළේය. ඒ අතර වරින් වර අනූෂගේ පුංචි දරුවා හඬනුද නැළවෙනුද මම අසා උන්නෙමි.

එවැනි එක් වරෙක දරුවා නළවන සමන්දිනීගේ ලයාන්විත කටහඬ නැඟිණි.

''ගඟ ද සුළඟ සමඟිනි
කතා නැතුව පෙරමිනි
හබල් පහර ඔරුවෙනි
නිසොල්මනේ විඳගමී...''

සන්සුන්කමත් හුදෙකලාවත් දනවන ඒ ළමා නැළවිලි ගීතයේ හඬ මා නොසන්සුන් කර තිබුණි. මේ රැයෙහි දරුවා නළවන්නට සමන්දිනී අනූෂගේ කාමරයට ගියාද... අනූෂ සමන්දිනීගේ කාමරයට දරුවා රැගෙන ආවා ද යන ගැටලුව විසඳා ගන්නට මම සිතින් වෙර දැරීමි. ඉන් මාගේ නින්ද සහමුලින්ම තුරන් වී ගිය ගානය.

බිරිය මළ සැමියෙකු දරුවෙකු සමඟ ගැහැනුන් දෙදෙනෙකු හිඳින නිවෙසක ජීවත් වීම විවිධාකාරයේ සිතිවිලි ඇති කරන්නට සමත් සිද්ධියකි. අනූෂ සමන්දිනීගේ නැන්දනියගේ මියගිය ලොකු දුවගේ සැමියාය. සමන්දිනී හා ඔහු අතර කිසිදු ලේ නෑකමක් නැත. මෙය නීත්‍යානුකූල නොවන පවුල් කෑමකි. මා තුළ හට ගත්තේ තදබල කළකිරීමකි. නිසිකලට විවාහ නොවුණු විට ජීවිතය අයාලේ යතැයි අප්පච්චි කියූ කියමනෙහි ගැඹුරු අර්ථය මට වැටහෙන්නේ දැන්ය. මා මේ කොහේවත් යන යුවතියක් පස්සේ වැටුණේ එනිසා යැයි මට සිතිණි.

පාන්දර හතර වන්නට පෙරාතුව මම නා කියා ගත්තෙමි. හතරයි හතලිස් පහ වද්දී මා පිටත්ව යන්නට සූදානම් වීමි. මම ජනේලය හැර පියා දමා අඳුර දෙස බලා උන්නෙමි. ගස් කොළන් වට ගෙවත්තේ සද ඇබින්දක්වත් නොවේ. අඳුරට ඇස් යොමා උන් මගේ දෑහැන බිඳුණේ පිරිත් හඬ ඇසීමෙනි. වසර ගණනාවකින් ආපස්සට ගියා වාගේ මට අතීතය සිහිවිණි. අප්පච්චි දවස ආරම්භ කළේ ද වෙළෙඳ සේවයේ පිරිත් දැමීමෙනි. එය හොඳ පුරුද්දක්ය යන විශ්වාසය

තදින් මා සිත තුළ විණි. නිවෙසක උදෑසන පිරිත් ඇසෙද්දී උදෑසන අවදිවන නිවැසියන් ප්‍රබෝධමත් දැහැමි පිරිසකැයි යන සිතිවිල්ලක් මා තුළ පහළ වන්නේ පෙර කී අප්පච්චිගේ පුරුද්ද නිසාමය. හෙතෙම විශ්‍රාම ගිය පසු එම පුරුද්දට දැඩි සේ ඇබ්බැහි වූ වග මට මතකය. උදෑසන පිරිත් දමන ඔහු බුදු පහන පත්තු කොට හමාරව සැඳැල්ලට වී පොතක් කියවයි. නන්නාඳුනනා නිවෙසක දී ඇහැරුණේ ඔහු පිළිබඳ මතකය පමණක් නොවේ, මාගේ ළමා විය ද එහි විය. පිරිත් හඬ කෙළවර භාවනාව ඇරඹි මොහොතේ රේඩියෝ හඬ පාත් විණි. කුස්සියේ බඩු බාහිරාදිය ගැටෙන පෙරළෙන හඬ ඇසෙන්නට ගත්තේ ඉන්පසුවය. මම කාමරය සිසාරා බැලුවේ කාන්සියට කියවන්නට පොතක් වේදැයි සොයන්නටය. ගෘහ භාණ්ඩ හැරුණු විට පොත පත හෝ වෙනත් යමක් කාමරයේ නොවීය. ඒ සමන්දිනීගේ පියාගේ කාමරය වන්නට ඇත. ඔහු මිය යාමෙන් පසු කිසිවකු එය පරිශීලනය කළ බවක් නොපෙනිණි.

මම කාමරයෙන් පිටතට වැද සාලය හරහා ආලින්දයට ආවෙමි. සවස හයට හතට වාගේ ගෙයි අවැසි සැමතැනම විදුලි පහන් දල්වී තිබුණි. මම ආලින්දයට වී අසුනකට බරව පුවත්පතක් පෙරලා ගතිමි. එය පැරණි මා කියවූ එකකි. නැවතත් එහි මුල සිට අගට කියවනවා හැර මට කරන්නට අන් යමක් නොවිණි.

පුවත්පතෙහි පළමු පිටුව කියවා හමාර කිරීමටත් පෙරාතුවම නා අවසන් වූ සමන්දිනි තෙත හිසකේ පිට දිග ඉහිරවා මා පසුකර මිදුලට බැස ගියේ මා නොදකමය. මා පුවත්පත හකුලා ස්ටූලය මත දැමීමි.

සමන්දිනි මිදුලේ වතුසුද්ද මල් ගාලින් අතැති බන්දේසියට මල් නෙළන්නට ගත්තාය. ඇය අතිශය සොඳුරු දසුනක්ව නෙත දකිද්දී කිසියම් වේදනාකාරී හැඟීමක් මසිතට රිංගා ගත්තාක් බඳුය. ඇය අනූෂගේත් ඔහුගේ දරුවාගේත් ජීවිතය වෙනුවෙන් තම ජීවිතය කැප කළා බඳුය.

එය ඇගේ සතුටට හේතු වී නම් මා සතුටට අකුල් හෙළිය යුතු නැත. අනූෂ හෝ සමන්දිනි අතරට කෙවැන්නෙකු නොවී සමන්දිනි පිළිබඳ මතකය අමතක කර දැමිය යුතු යැයි මට සිතිණි.



"ඔයා වේලපහම නැගිටලා ඇඳගෙනත් ඉවරයිනෙ..."

මල් නෙලා ආයේම එමින් උන් සමන්දිනි මා දැක විස්මයට පත්වූවාය. මම මඳහසක් නඟා ගතිමි.

"කීයටද නැගිට්ටේ...?"

"මට නින්ද ගියේ නෑ සමන්දිනී."

"ඇයි ඒ...?"

"මන්දා... මං තුන හතර වෙද්දී යන්න ලෑස්ති වෙලත් ඉවරයි."

"එහෙම යන්නෙ කොහොමද වාහනේ හදාගත් නැතුව."

"සහෝදරවරුන්ගේ මනෝ විකාර හින්දා මෙහෙ ආවට මොකද... අපි වවුන් එකට ගියා නම්... මේක හදාගෙන ගෙදරත් ගිහින්."

සමන්දිනීගේ මුවගට මඳහසක් නැගිණි.

"ඇයි හිනාවෙන්නෙ...?"

"නෑ... හේතුවක් නැතුව ඔයා කේන්තියෙන් කතා කරන හින්දා."

"මං මොකටද කේන්ති ගන්නෙ."

"ඒකම තමයි මටත් තියෙන ප්‍රශ්නෙ."

"පිස්සු කතා."

මම සමන්දිනීගේ කියමන මායිම් නොකොට ඉවත බැලීමි. සමන්දිනි තුනී මඳහසකින් ඇතුල් ගෙයට යන්නට සූදානම් වූවාය.

"ඇයි අර ඔගොල්ලන්ගෙ බබා ඊයේ තිස්සෙ ඇඬුවේ...?"

මට උවමනා වූයේ අනූෂත් සමන්දිනීත් පටලවා ඇනුම් පදයක් කියන්නටය.

"එයා එහෙම තමයි... විඩෙන් විඩේ අඬනවා..."

සැහැල්ලුවට කියා යන්නට හැරුණු සමන්දිනි බරපතල ගැඹුරු සිත් වේදනාත්මක බැල්මකින් මදෙස බලනු මම යාන්තමට දිටිමි. මම ඒ බැල්ම නොදුටුවා වාගේ ආයේම පුවත්පත පෙරලා ගතිමි.

සමන්දිනී රිදවා සතුටු වීමෙ සිතක් මා තුළ නොවුණ ද - ඇගේ පැවැත්ම කෙරෙහි උපන් කෝපයක් නම තදින් මසිතට වද දෙමින් තිබිණි.

මා ඇගේ නිවෙසේදී හැසිරුණේ ද කතාබහ කළේ ද ඇයත් අනූෂත් අතරත් අයථා සම්බන්ධයක් වෙතැයි මා තේරුම් ගෙන උත් පරිද්දෙනි.

සමන්දිනී මගේ සිතැඟි වටහාගත් වග මට විශ්වාසය.

නමුත් ඕ ඒ පිළිබඳව පෙරළා ප්‍රශ්න නොකළාය. මා වඩ වඩාත් කෝපයට පත් වූයේ ඇගේ ඒ දරා ගැනීම සම්බන්ධයෙනි. එක අතකට එය කෝපයක් නොවේ ඊර්ෂ්‍යාවකි.

"මං චෙක් එකේ වැඩේ කරගන්න සඳුදා එන්නම් සර්..."

මෝටර් රිය ඇගේ මිදුලෙන් බැහැර වන්නට ඔන්න මෙන්න කියා තිබිය දී සමන්දිනී කීවේ රිය කවුළුවෙන් එබිය.

"ඒ වෙනුවෙන්ම කොළඹ රස්තියාදු වෙන එක අපරාදයක්නේ... මට එකවුන්ට් නම්බරේක දෙන්න... මම එකවුන්ට් එකට දාන්නම්..."

මා කීවේ සමන්දිනී නොතකා හරින බව පිරිසට හඟවන්නටය. සහබන්ධු නෙතඟින් මදෙස බලනු මම දිටිමි.

"එක අතකට ඒක ලේසි නෙවෙන්නම්. මෙයැයි කොළඹ ගියාම එන්නෙ බාගෙට මැරිලා..."

මගේ සිතැඟි නොදත් සමන්දිනීගේ නැන්දා ඒ කියමනට මුක්කු තැබුවාය.

"දැන් බැංකු පොත් හොයන්න ගියොත් මහත්තයලට පිටත් වෙන්න වෙලා යයි... ඔක ෆෝන් කරලා කියන්න බැරියැ..."

නැන්දනිය වාගේම අනූෂ ද මගේත්, සමන්දිනීගේත් නිහඬ සටන හඳුනා නොගෙන උන්නේය.

"මං හෙට උදේට සර්ට ෆෝන් කරන්නම්."

"ෆෝන් එක වැඩ නොකළොත් මොබයිල් එකට මැසේජ් එකක් තියන්න."



මම අන් කවරදාටත් වඩා ඇය සුළු කොට කතා කළෙමි. සමන්දිනී හිස වැනුවාය. මා සමනලතැන්නෙන් නික්මුණේ මහත් සිත් වේදනාවක් ද කරදරකාරී බවක් ද බරක් කොට ගනිමින්ය.

සහබන්ධු නුවර ටවුම පසුවන තෙක්ම නන් දෙඩවිය. කඩුගන්නාව පසු කරන විට හෙතෙම උන්නේ වෙරි මතිනි.

හේ එද්දී ඉතිරි වූ මත්පැනින් සප්පායම් විය. කඩුගන්නාව පසුවද්දී නින්දට වැටුණු හෙතෙම අවදිවූයේ කැලණි පාලම උඩදිය.

මම මහරගමින් ඔහු බස්සවා විත් යහනට වැටුණේ රෝගීව ඔත්පලව හුන් අයෙකු වාගේය.

නින්දත් නොනින්දත් අතරේ උන් මා නෙත් අභියස සමන්දිනීගේ ගෙදර ගත කළ පැය කිහිපය චිත්‍රපටියක රූප රාමු මෙන් දිග හැරිණි. වරෙක ඇය පිළිබඳ ඇතිවූයේ කණගාටුවකි.

ඇයත් අනූෂත් අතර සම්බන්ධතාවය ඇගේ උවමනාවට ඇති වූවක් නොවන්නට ඇත.

අම්මා මිය යාමෙන් හුදෙකලා වූ දරුවා කෙරෙහි උපන් අනුකම්පාව මේ සබඳතාවයට මඟ පෑදුවා විය හැකිය. එකතකට ඇය කොට ඇත්තේ පරිත්‍යාගයකි.

මට අහිමි දරුවා පිළිබඳව මා තුළ පශ්චාත්තාපයක් හට ගත්තේය.

කරදඬු උස් මහත්ව ගිය පසු ද අප්පච්චි අහිමිව ගිය ශෝකයෙන් මම පෙළෙමි. ඔහු සිටියානම් සමන්දිනීට මේ තරම් මගේ සිත හැඩි කරන්නට ඉඩ කඩ නොලැබෙනු ඇත.

තාත්තා මගේ සිතට එබුණු අපූරුව. තාත්තා බොහෝ විට මට කතා කළේ වරෙන්, පලයං, උඹ, බං බොලං වැනි සම්මත නොගොඩීනා වචනවලිනි. වෙනත් තාත්තා කෙනෙකු "මෙහෙ එන්න පුතේ" යැයි කියද්දී ගැබ් නොවුණු කරුණාවක් සෙනෙහසක් "මෙහෙ වරෙන්කො බං යැයි" කියා තාත්තා මා අමතද්දී විය. මට ගහන්නට බනින්නට ඔහු පැනගෙන ආ සෑම වරෙකදීම මට පහර දුන්නා නම් මා ගුටි කා මියෙන්නට පවා ඉඩ තිබිණි. නමුදු ඔහු ගහන්නට කනතා වාර ගණන සියයක් නම් පහර දී ඇත්තේ වරකි දෙවරකි.

"ගොඟරවන තරමට වහින්නෑ කියනවනේ..."

ඒ මා කෙරෙහි තාත්තාගේ සිතෙහි උපදින කෝපය අම්මා හැඳින් වූ හැටිය. තාත්තාගේ සිතෙහි මා කෙරෙහි වූ කැක්කුම ආදරය මෙ මුළු විශ්ව ධාතුවටම වඩා ටිකක් ලොකුය.

තාත්තා ගැන සිහවන සෑම වරෙකම ඔහුට පෙරාතුව මා මියෙන්නට තිබුණායැයි මට සිතෙන්නේ ඔහු නොමැතිව ජීවත් වන්නට බැරිය යන මා තුළ පවතින තදබල බිය නිසාය.

අනෙක් අතට තාත්තා ජීවත්ව සිටියා නම් තනිකමක්, පාළුවක් හෝ බියක් මා වටකොට නොගනු ඇත.

සත්තකින්ම මා මේ සොයා වෙහෙසෙන්නේ තාත්තාවක් නොවේ. සෙනෙහසකි. තාත්තා පිළිබඳ සියලු සිතිවිලි තතර වන්නේ ආදරයෙන් හිස්ව ගිය ජීවිතය ළඟය.

මම ඔද්දල්ව ගිය සිතින් දවස ගෙවා දැමීමි. සෙනසුරාදා නිවාඩු ද දැමීමි.

ඉරිදා පොදු නිවාඩුවයි. සඳුදාට පෝය යෙදී තිබිණි. ඉරිදා රෑ යෙහි සහබන්ධු හමුවන්නට ගොස් මා ආවේ රෑ බෝ වීය. සඳුදා අවදිවන්නට පමා වූයේ නිදිමැරිමෙ වරදටම නොවේ.

රාත්‍රියෙහි බී අරක්කු සඳුදා දවස කාලකණ්ණි කොට තිබිණි. උදෑසන එකොළහ වද්දීත් මා ඔහේ කකුල් වනමින් ඇඳට වී උන්නෙමි.

දොරට ගසන හඬෙන් ඒ අම්මා බව මම සැක කළෙමි.

ඇය දොරට ගසන්නේ පොලිසියෙන් අපරාධයකාරයෙකුගේ දොරට ගසන ආකාරයටය. කකුල් සෙලවීම පවා මොහොතකට නතර කළ මම සන්සුන්ව උන්නෙමි. අම්මා තම කටයුත්ත අත නොහැරියාය.

"දොර ඇරලා තියෙන්නෙ ඇයි...?"

"උඹව හම්බවෙන්න කවුද ඇවිල්ලා."

අම්මා උත්තර බැන්දේ මගේ නොරිස්සුම් කටහඬටය.

"කවුද...?"



"ඇවිල්ලා බලාගනින්... රෑ දෙගොඩහරිජාමෙ කනමදයා වගේ බීලා ගෙට ගොඩ වෙලා උදේ එකොළහටත් නිදි..."

"මං ඉන්නවා කිව්වද...?"

"ඔව්..."

අම්මා කාමරයෙන් පිටත සිටත උත්තර බැන්දාය.

"ආපු කාරණාව පොඩ්ඩක් අහන්නකො අම්මා..."

ඊට පිළිතුරු දෙනවා වෙනුවට අම්මා නික්ම යන හඬ මට ඇසිණි.

ආවේ සහබන්ධු වන්නට ඇතැයි මම අනුමානයට සිතිමි. ඔහු කෙරෙහි කෝපයක් ද මා කෙරෙහි කලකිරීමක් ද එකවර සිතට රිංගා ගත්තාක් බඳුය. ඔහු ජීවිතයේ පශ්චිම යාමය කාලය හා දමමින් ගෙවා දමයි. ඔහුගේ ඇසුරට වැටී මා මෙ විනාශ කර ගනිමින් හිඳින්නේ මගේ ජීවිතයේ ලස්සනම දවස් ටික නොවේද?

සහබන්ධු රස්තියාදු වී ගියාවේ යැයි සිතා මම ආයේම නොතු පියා ගතිමි. නින්ද අහලකවත් නොවීය. වූයේ හිසරුදාව පමණි. මම හිස්බඩම වේදනානාශක පෙති දෙකක් බී සියලු කවුළු හැර දැමීමි. සහබන්ධු දැන් අඩපැයකට වඩා රස්තියාදු වී ඇත. තව අඩපැයක් ගත වන්නට මත්තෙන් ඔහු යනු ඇත. සිතිවිල්ලේ නිස්කාන්සුවේ උන් මම ගැස්සී ගියේ දොරට ගසන හඬිනි.

"සුදු මහත්තයෝ..."

අම්මා දොර ගසන සෙයියාවෙන් දොරට ගැහුවේ මැණිකාය. මසිතට සියුම් කෝපයක් නැඟිණි.

"මොකෝ...?"

"අර ළමයා තාම ඉස්තෝප්පුවෙ... නෝනා සුදු මහත්තයට පට්ට පතුරු යන්න බනිනවා."

"මොන ළමයද...?"

සිතෙහි වූ කුහුල කටහඬේ ද වන්නට ඇත.

"අපි කොහොමද සුදු බේබි දන්නෙ."

මම කලබලයෙන් දොර විවර කළෙමි. කිසිවෙක් නොදුටු මට මැණිකා තරප්පු පෙළ බැසයන හඬ ඇසිණි. ආවේ කවුද යන දෙගිඩියාව මසිතේ දළු දැම්මේය.

කණ්ණාඩි මේසයට එබී උඩින් පල්ලෙන් හිසකේ පීරාගත් මම ආලින්දයට ගියේ ඇවිත් ඇත්තේ ගුණසිරිය යන අනුමානයෙනි. නමුදු අම්මා හා කතාබහ කරමින් ආලින්දයේ උන්නේ සමන්දිනීය. දෙනෝදාහක් ඉදිරියේ ඇඳිවත ගැලවී ගියාක් බඳු ලැජ්ජාවක් ද තිගැස්මක් ද මගේ පපු කුහරයට රිංගා ගත්තේය.

''ආ සමන්දිනී...''

ඈ සිනහා වූයේ මලක් පෙති විහිදූ පරිද්දෙනි.

''මම සර්ගේ නින්ද කැඩුවද මන්දා.''

''අනේ නෑ... මං ඇහැරිලා හිටියෙ... මං ඔෆිස්සෙකේ පොඩි වැඩවගයක් කළා... සමන්දිනී ඉන්න ම ටග්ගලා ලෑස්ති වෙලා එන්නම්.''

''තව මොනවා ලෑස්ති වෙන්න ද තිවංක... මේ ළමයා දූත් පැයක් එකහමාරක් තිස්සේ මෙතන.''

අම්මා නොහොබිනා ලෙස සැරවීම ගැන මා තුළ හට ගත්තේ අප්‍රසන්න හැඟීමකි. තව අතකින් එය ලැජ්ජාවකි.

''කමක් නෑ... අම්මා... අම්මා මට දවල්ටත් කාලා යන්න ඉන්න කියපු එකේ මං කාලෙ ගෙවා ගන්නත් එපායැ...''

අම්මා හා සමන්දිනී අතර ළෙන්ගතු ඇසුරක් ගොඩනැඟීම පිළිබඳව සොම්නස මගේ ලේ නහර පුරා දුවන්නට ගත්තාක් බඳුය.

''සමන්දිනී ඉන්න මං ටග්ගාලා වොෂ් එකක් අරන් එන්නම්.''

සමන්දිනී මඳහසකින් හිස වැනුවාය.

''ඊයේ ඊ. ගෙදර ආවේ කනමදයා වගේ බීගෙන. ඔළුවා රිදෙනවට වෙන්ඩැති නාන්න යන්නෙ.''

පෙරළා යන් දී සාලය මැද දී මට අම්මාගේ කටහඬ ඇසිණි. ඇති වුණු ලජ්ජාව, සිත් වේදනාව සුළු පටු නොවේ.



කාගේ කවුදයි කියා දිගක් පළලක් නොදන සමන්දිනි ඉදිරියේ අම්මා මේ කියන කතා කුණුහරුප බඳුය.

''වයසත්තෙක්ක මොළොත් නරක් වෙලා ද කොහෙද...?''

මම මටම මුමුණා ගතිමි. සමන්දිනී පැමිණීම පිළිබඳ මසිතේ වූ සොම්නසට හුරු හැඟීම ද, අම්මාගේ නොමනා හැසිරීම පිළිබඳව උපන් කලකිරීම ද ගතෙහි වූ කෙඩෙත්තු බව පහකර දමා තිබිණි.

සමන්දිනී මා සොයා ගෙදරටම එන තරමටම එඩිතර වීම පිළිබඳ සියුම් චකිතයක් ද මා තුළ විණි. ජීවිතය පටලවා කඩා ඉහිරවා ගත් ඕ කවුරුන් හෝ පිරිමියෙකු ඇසුරේ විමුක්තිය සොයනවා වත්ද...? නන්නාඳුනනා පිරිමියෙකුගේ ගෙදරට කිසිදු වග විභාගයකින් තොරව එන්නට ඕ එඩිතර වූයේ මන්ද...?

එක්කෝ චෙක්පත මුදල් බවට හරවා ගැනීමේ තදබල උවමනාවක් ඇයට ඇති වූවා විය යුතුය. නොඑසෙනම් ඕ මේ ආදරය හින්දා ආ ගමනකි. එසේත් නොවී නම් ඇගේ අරමුණ විය යුත්තේ මා මුලින් කී එකය. කුමක් වුවද මා දූන් ඇයටත් ඇය පිළිබඳව අම්මා අසන ප්‍රශ්නවලටත් උත්තර බැඳිය යුතුමය.

මම හොඳින් නැඳ පැළඳ හිසකේ පීරා සුවඳ විලවුන් තවරා පාන මාලයට බැසීමි.

සමන්දිනී ආලින්දයේ නොවීය. මිදුලේ හෝ සාලයේ ද නොවීය. ඇගේ කරබෑගය ආලින්දයේ ස්ටූලය මත විණි. හීන් පටි යෙදූ සෙරෙප්පු යුවළ ද දොරකඩ විණි. ඕ නාන කාමරයේ වන්නට ඇතැයි අනුමාන කළ මම පත්තර පෙරළවා ආලින්දයේ අසුනකට වීමි. තත්පර මිනිත්තුවලට එකතු වත්දී මම ඇගේ පමාවෙන් නොසන්සුන් වීමි.

මා ඇතුල්ගෙයට ගියේ ද තවත් මිනිත්තු කිහිපයක් ගත වන්නට හැරය. සාලයත්, මුළුතැන්ගෙයත් යා කෙරෙන කොරිඩෝරය මත්තේ දී මට සමන්දිනීගේ කටහඬ ඇසිණි.

ඇගේ ගෙදරදීවත් මේ කටහඬේ මෙතරම් පිබිදීමක් නොවිණි.

''මම මේ ළඟ දී ටී.වී. එකේ දැක්කා බෝංචි හැට අට විදිහකට කපනවා.''

''කොහොම කැපුවත් පුතේ හැපිලා කරලා බඩට යන්නෙ එක විදියටනෙ.''

''ඒ උනාට අම්මෙ ඇහැට ප්‍රිය දේ කියනවනෙ දිවට රස වෙන්නෙ.''

''ඒක හැබැව නැත්නම් ඉතින් ඔක්කොම එළොළු එකට දාලා සාම්බාරු එකක් හදන්න බැරියැ.''

අම්මා සේම මැණිකා ද නව නිවෙසකට ගෙවැදුණාක් මෙනි. සමන්දිනී ගෙදර කොහේ හෝ තැනෙක නැති වී තිබූ සතුට සොයා එළිපෙහෙළි කොට ගෙන ඇත්තේය. මම මුළුතැන්ගෙයි තිර රෙද්ද අතරින් ඇතුළට බැල්ම යැවීමි. සමන්දිනී සාරි පට ඉණෙහි ගසා කොණ්ඩය ගුලියකට ගෙළට බැඳ බෝංචි කපයි.

මෙ උදාවන්නට යන්නේ පමා වූ වසන්තයද...?

මා මුළුතැන්ගෙයට ගොඩවීමත් සමගම සමන්දිනීගේ සිනහා කතා නතර විණි. ඒ වෙනුවට ඔ මගේ බැල්මෙන් ඇගේ බැල්ම සඟවා ගත්තාය.

''සමන්දිනී කාලෙක ඉඳන් අපේ අම්මව දන්නවා වගේ...''

මුලින් කතා කළ යුත්තේ මා යැයි මට සිතිණි.

''කුළුපග වෙන්න මහ කාලයක් අඳුරගෙන ඉන්න ඕනායැ... ඒකට විනාඩියකුත් ඇති.''

මා කියන්නට එරෙහි වීම අම්මාගේ විනෝදාංශයක් බඳුය. පිටස්තරයකු ඉදිරියේ ඈ මෙසේ හැසිරීම නිසා මා කෝපයට පත්වූ වාර අනන්තය. මා කුමන තානාන්තරයක් දරුව ද අම්මාට තවම මා වගකීමක් නැති බාල පුතුය. ඇය ඕනෑම කෙනෙකු ඉදිරියේ මා විවේචනය කරන්නට මැලි නොවේ. සමන්දිනී ඉදිරියේ දී වන්නේ ද එයමය.

''මෙහෙම ගෙදරට ගොඩවෙන මනුස්සයෙක්ගෙන් වැඩ ගන්නෙක හොඳද...?''

''කවුද වැඩ ගත්තේ... ඉස්සරහට වෙලා බකං නිලාගෙන ඉන්න වෙන නිසා මං කුස්සියට අඬගහ ගත්තා විතරයි...''



මැණිකා මා දෙසත්, සමන්දිනී දෙසත් බලා හිනැහුණේ අම්මාගේ වචනවලින් උද්යෝගයට පත් සෙයියාවෙනි.

''වැඩ කරලා පුරුදු නිසා තවත් කවුරුවත් වැඩ කරන දිහා බලාගෙන නිකන් ඉන්න බෑ.''

''සමන්දිනී ඕක තියලා යන්න ඉස්සරහට. ආපු කාරණාවත් කතා කරගන්න බැරි උනානේ.''

''පටන් ගත්ත වැඩේ ඉවර කරලම එන්නද...?''

ඇය ඇසුවේ එළවළු ගොඩද මට නෙතින් පෙන්වමිනි.

''ඔයා ආවේ ඒකට නම් ඒක ඉවර කරලම එන්න.''

''මොකට මූගෙ කතා අහනවද ළමයෝ... ඔන්න ඔහෙ ගිහින් ඔය ළමයා ආපු කාරණාව කතා කරගන්න. අපි උයලා කරලා අහක් වෙලා කතා කරන්නම්.''

සමන්දිනී පිහිය පසෙක තබා ඉගටියෙහි ගසා හුන් සාරි පට මුදා හැරියාය.

''ඔය මූණකට පොඩ්ඩක් තෙමත් යන්න දරුවෝ.''

අම්මා ඇයට සෙනෙහසින් කියනු මට ඇසුණේ සාලය මැදදීය.

මම ආලින්දයට පිවිස රාජකාරි කතාවකට මුල පුරන්නට වාගේ හරි බැරි ගැසී වාඩි වීමි. සමන්දිනී ගෙදර ඒම පිළිබඳ හටගත් දෙගිඩියාව මඳක් තුනී වී තිබුණ ද ඇගේ පැමිණීම පිළිබඳ හටගත් විස්මිත්තභාවය නම් පහව ගොස් තිබුණේ නැත.

රාජකාරි කටයුත්තකට පැමිණි ඇය ඉන් අනතුරුව ඇති වුණු ඇයි හොඳයිය හරහා ගෙදර පැමිණීමත් විමතියට හේතුවන මුරණ්ඩුකමකි. ඇය එපමණකින් නතර වී නැත. කාලයක් තිස්සේ දන්නා හඳුනන්නියක වාගේ ඕ කුස්සියට ද බැස හමාරය. ජීවිතය වරද්දාගෙන හිඳින ඇය මගේ කරේ එල්ලෙන්නට යනැයි යන චේතනාව ආයේම අලුත් විණි. ඉන් එහා ඒ පිළිබඳව සිතන්නට ඉඩ නොතබාම සමන්දිනී විත් මා ඉදිරියේ හිඳ ගත්තේ නොරිස්සුම් සහගත මුහුණකිනි.

''ඔයාට දෙතුන් දවසෙ අපේ ගෙදර ඇවිල්ලා ය් නතර වෙන්න හොඳයි... මං මෙහෙ ඇවිත් අර අසරණ මිනිස්සුන්ට අත් උදව්වක් දෙන එක තරකයි.''

''ඔයා මේ ගෙදරට අමුත්තෙක්නේ...''

''ඉතින් ඔයත් අපේ ගෙදරට අමුත්තෙක්නේ...''

''ඉතින් ඔයත් අපේ ගෙදරට රිංගන්න ආවෙ

''ඔව්... ඉතින් මං ඔගොල්ලන්ගෙ කුස්සියට රිංගන්න ආවෙ නැනේ.''

''ඔව් ඒ උනාට නැති කුණු කන්දල් ඔළුවට දාගෙන ඔයා මෙහෙට ආවේ...''

''මොකක්ද ඒ කතාවෙ තේරුම...?''

අප දෙදෙනා උන්නේ රණ්ඩු වෙමිනි. නමුදු ආරවුල සොඳුරු වූ නිසාදෝ එය අත් හැර දැමීමේ සිතක් මට නොවුණි. ඇයට එසේම වන්නට ඇතැයි මට සිතුණි.

''මොකද්ද ඒ කතාවේ තේරුම කියලා දැනගෙන යන්න තමයි මාත් ආවේ...?''

''මොනවද සමන්දිනී මේ කියන්නේ...?''

''එදා ඔයා අපේ ගෙදර ඉඳන් ආවේ පුලුවන් තරම් ඇනුම් පද කියලා... ඔයයි ඔයාගෙ හිතයි මට නා නා ප්‍රකාර කතන්දර හදපු විත්තියත් මං දන්නවා.''

සමන්දිනී ආවේගයෙන් කියා ගියාය.

''මං කාත් එක්ක ඔයා ගැන කතා කරන්නද...?''

''ඔයා කතා කරේ ඔයාගෙ හිතත් එක්ක. මේ දැනුත් ඔයා කරේ ඒක.''

''මොකද්ද...?''

''මං ඔගොල්ලන්ගෙ ගෙදර ආපු එක ඔයාට දැනෙන්නෙ ඔයාගෙ කරේ එල්ලෙන්න හදන කෙල්ලෙක් ආපු විදියටනේ.''

ඇය සොඳුරුව, නිපුණුව වචන හසුරුවයි. මම මදහසකින් අසා උන්නෙමි. සත්තකින්ම ඈ මාගේ සිත කියවීම පිළිබඳ කුහුලක්ද බියක් ද මා සිත තුළ විය.

''මං මේ අහන ප්‍රශ්නවලට ඔයා අවංකවම උත්තර නොදෙනවා



කියලා මට දැනුණොත් මං ඔගොල්ලන්ගෙ අම්මට කියනවා ඔයා අපේ ගෙදර ඇවිත් දවස් දෙක තුනක් නතර උනේ.''

''කවුද දවස් දෙක තුනක් නතර උනේ...''

''හරි ඉතින්... එක දවසත් එකයි. දෙකත් එකයි. තුනත් එකයි... එක මිනිහෙක් මැරුවත් මිනීමරුවා... මිනී දෙක තුනක් මැරුවත් මිනීමරුවා...''

''මට වෙලා නෑ සමන්දිනී... අහන්න තියෙන දෙයක් අහන්න.''

''වෙලා නැත්තේ අර වළ පයයි ගොඩ පයයි ඉන්න මනුස්සයත් එක්ක බොන්න යන්න තියෙන හින්ද ද...?'' මට සිනහ නැඟිණි. සමන්දිනීට ද සිනහ නැඟිණි.

මෙවැනි අල්ලාප සල්ලාප නිකම් ඇයි හොඳයිකම ඇසුරේ ගොඩ නැගෙන්නේ නැත. මා සිතෙහි සමන්දිනී කෙරෙහිවන ඇඟෑළුම්කම, ඕනෑකම හා ලෝභකම සමන්දිනීගේ සිතෙහි මා කෙරෙහි වන්නේද අප හරියට පත්වීම් ලද පෙම්වතුන් වැන්න.

''හරි අහන්න තියෙන දේ අහලා ඉන්න.''

සමන්දිනී තත්පර කිහිපයක් මදෙස බලා උන්නේ ඔරවා ගත්වනමය.

''ඔයා මාවයි අනූෂවයි සැක කරා නේද...?''

මං දිය යුතු හොඳම පිළිතුර සොයා ගන්නා තෙක් කල් මැරීමි.

''අවංක උත්තරයක් නුදුන්නොත් මං අම්මට අරක කියනවා.''

සමන්දිනී කීවේ ආදරණීය තරවටුවක ස්වරූපයෙනි.

''ඔව්...''

මම වචන පිට කළා නොව වචනවලින් දමා ගැසීමි.

''ඇයි එහෙම හිතුවේ...''

''එක වහලක් යට ඔහොම ජීවත් වෙනකොට වැරදි සිද්ධ වෙන්න පුලුවන් හින්දා.''

''ඒ ඔගොල්ලෝ වගේ මිනිස්සු අතින්... මං එහෙම ගෑනියෙක් නොවේ.''

අප අතර මුනිවතක් ඉහිරිණි.

''මොකද්ද එහෙම හිතන්න තියෙන අයිතිය.''

මම අවංකවම ඒ පිළිබඳව කල්පනාබර විමි.

''ඒ ගැන නම් මමත් හාම හිතනවා.''

කෙළවර මම හීන් සීරුවේ කියා දැමීමි.

''යන්න ඉස්සෙල්ලා මට ඒකට උත්තර ඕන...''

සමන්දිනි නැගිට ගෙට යමින් කීවාය.

''කොහේද යන්නෙ...?''

''කුස්සියට...''

ඇගේ කටහඬ මට ඇසුණේ සාලයෙනි.

අප ආදරය කරන්නට පටන් ගත්තේ එලෙසිනි.

දන්නා හඳුනන ඥාති යුවතියක් හැරුණු විට මෑත කාලයේ ගෙදර කෑම මේසයට වාඩි වූ පිටස්තර යුවතියක් නොවන තරම්ය. කවුරුන් හෝ ගෙදරට ආ විට එක්කෝ මම කෑම ගැනීමේ වේලාව වෙනස් කළෙමි. නොඑසේ නම් මැණිකා ලවා කෑම, කාමරයට ගෙන්වා ගතිමි. සමන්දිනි හා එක්ව සියල්ලෝම කෑම ගනිද්දී මා කිසියම් අපහසුතාවයකට පත්ව උන්නේ ඒ නිසාය.

''මයා ළමයා කනවයෑ... අත ගානවනේ...''

වෙනදා මට කියන සියල්ල අම්මා අද කීවේ සමන්දිනීටය.

''මේ ඉතින් මං කන වේගෙ තමයි අම්මේ...''

''වේගෙ නම් යකාට ගියාවෙකෝ... මෙච්චර මහන්සි වෙලා හදපු කෑම ටිකෙන් ඔය ළමයා කන්නෙ හැන්දයි දෙකයි.''

''මං ගොඩක් කන කෙනෙක් නෙවේ අම්මා... චුට්ට චුට්ට හැම වෙලාවෙම කනවා.''

''කපුටියෙක් වගේ.''

අම්මාගේ කියමනින් මට සිනහ නැගිණි. අඩු වැඩියා බෙදමින්



නුන් මැණිකා ද සිනහසුනාය. සමන්දිනි කෝපයට පත් පුංචි දරිවියක වාගේ මදෙස බැලුවාය.

''අම්මා කපුටි කිව්වෙ කන පිළිවෙලට මිසක් පෙනුමට නෙමේ... එහෙමනම් කපුටා කපුටා කියන්නෝන ඔයාට...''

මේ සුහද හුරුබුහුටි කතා බස් කුමන දනහැඳුනුම් කුමකටද...? සමන්දිනි හිතට ඉතිරි වන්නේ ප්‍රශ්නමය.

සවස තුනයි තිහේ බසයට සමන්දිනි ඇරලවන්නට මා පෙළඹවූයේ අම්මාමය. ඇය හා නිදහසේ කතා කරන්නට එය හොඳ ඉඩකඩකැයි සිතූ මගේ සිතිවිලි පුස්සක් බවට පත්වූයේ අම්මා ද සාරියක් දවටා ගමනට එක්වීමෙනි.

සමන්දිනි අම්මාගේ පම්පෝරි කතාවලට හූ මිටි තබමින් ගොස් තුනයි තිහේ බසයට ගොඩවිණි. ඈ හා තනිව එක වචනයක් හෝ කතා කරන්නට තිබුණු උවමනාව නිසාවෙන් චෙක්පත පිළිබඳව සිහිප කරමින් මා අම්මා මෝටර් රියේ තබා බස් රියට ගොඩවීමි.

''චෙක් එකට මොකද කරන්නේ...?''

''පුච්චලා තළලෙ අළු ගාගන්නවා.''

සමන්දිනි කීවේ මවාගත් කෝපයකින්, විහිළුවටය. නමුදු අවට ඉන්නවුන් මදෙස බැලුවේ බිරියගේ දේ කඩා වඩා ගන්නා සැමියකු දෙස බලන බැල්මෙනි.

''අනේ සොරි...''

සමන්දිනිද විහිළුවේ තරම වටහා ගත්තාය.

''ටිකක් ඉඳගන්නකෝ...''

සමන්දිනි කීවේ මගේ අතකින් අල්වා හිස් අසුනේ හිඳගන්වමිනි.

''සමන්දිනීගේ කට හොඳ නෑ...''

''ඔක අපේ අම්මත් ඉස්සර කියනවා... හැබැයි ඉතින් මං හොඳටම යාළු කෙනෙක් එක්ක මිසක් විහිළු කරන්නෑ.''

සමන්දිනි කීවේ පාත් හඬිනි. ඇය පිළිබඳ අනුකම්පාවක් මා සිත පිළිසිඳිණි.

''චෙක් එකට මොකද කරන්නේ...?''

මා ඇසුවේ වඩාත් කරුණාවන්තවය.

''ඒක සල්ලි උනොත් මට ඔයාව හොයන් එන්න කාරණාවකුත් නෑ... ඔයාට මාව හොයන් එන්න කාරණාවකුත් නෑ.''

''ඒක එහෙම වෙන්නෑ... ගන්න චෙක් එක. මං සල්ලි ටික එකවුන්ට් එකට ට්‍රාන්ස්ෆර් කරන්නම්.''

සමන්දිනී අත් බෑගය විවර කර චෙක්පත ගෙන මට දිගු කළාය. එය දුන්නා වාගේමය. ඇදක්, පළුද්දක් නැත. බස් රියේ රියදුරු අසුනට රියදුරා ගොඩ විය.

''හෙට අනිද්දා දිහාට මං එහෙ ඇවිත් එකවුන්ටෙකට සල්ලි වැටිල ද කියලා බලන්නම්.''

සමන්දිනීගේ මුවගට මඳහසක් නැඟිණි.

''ඒක නම් ඉතින් ටෙලිෆෝන් කරලා හරි දැනගන්න බැරියැ... හෙට අනිද්දා ඔයාව බලන්න මං එන්නම් කියාල යන්න.''

මං කිසිවක් නොකියා බසයෙන් බසින්නට නැගිටීමි.

''සර්....''

මම ආයේම හැරී බැලීමි.

''කඩල ගොට්ටක් අරන් දීලා යන්නකෝ.''

ඇය කනිපින්දම් බැල්මකින් කීවේ පුංචි දැරිවියක වාගේය. යාබද අසුනේ යුවතියන් දෙදෙනා ඉවත බලමින් හිනැහුණෝය. මම බසයෙන් බැස රුපියල් පනහක කඩල ගෙන බසයේ කවුළුවෙන් ඇයට දුන්නෙමි.

''මෙන්න වදේ... කඩල ගොට්ටක් ඉල්ලුවහම කඩල මල්ලක්ම ගෙනල්ලා.''

සමන්දිනීගේ නොක්කාඩු මුහුණ බලන්නට ඉඩ නොදීම බස් රථය ඉගිල්ලිණි. මට බර සුසුමක් හෙළිණි. අවසන හැරී බලද්දී අම්මා මාගේ සියලු කෙරුවාවන් බලා සිටිනා වග දිටිමි.

මා මෝටර් රිය වෙතට ආවේ කකුල් පටලැවී වැටෙන්නට යන



සෙයියාවෙනි. මෝටර් රිය පණ ගන්වා සැතපුමක් දෙකක් යන තෙක් අම්මා කතා නොකළාය. මම කැසට් රෙකෝඩරය පණ ගැන්වූයේ සන්සුන්කම හිතට වදයක් වූ නිසාවෙනි.

''නිවහන් ඔය කංකරච්චලේ...''

ඇත්තටම මා අම්මාගේ කටහඬින් ගැස්සිණි. මම කැසට් රෙකෝඩරය නිවා දැමීමි.

තවත් සැතපුමක් දෙකක් සන්සුන්ව ගෙවිණි. මා හැකි තරම් වේගයෙන් රිය පැදවූයේ ඉක්මනින් ගමන නිමා කරන්නටය.

''ඔක හෙමින් පැදහං... උඹ මේ ගමන්ම මාව කැරකොප්පුවට ඇරලවන්නද හදන්නේ...''

''මොනවා කියනවද මන්දා.''

මට තරහා ආවා නොව මම තරහා ගත්තෙමි.

''කවුද ඒ ළමයා...''

මම තක්කු මුක්කු වී යන ප්‍රශ්නය අම්මා ඇසුවේ තවත් මොහොතකට පසුවය. දිය යුතු හොඳම පිළිතුර සොයාගන්නට මා පමා වූවා වැඩිය.

''කවුද බං ඒ ළමයා...''

අම්මාගේ කටහඬ සැරවිණි.

සමන්දිනී නික්ම ගිය වහාම අම්මාගේ හැසිරීමේ වූ වෙනස මා නිකමටවත් සිතූ එකක් නොවේ. එනිසාම ඊට ප්‍රතිචාර දක්වන්නට මා පමා වූ සෙයකි.

''ඈ බං... කවුද ඒ ළමයා.''

''කොයි ළමය ද... සමන්දිනීද...?''

''නැතුව ඉතින් උඹව හම්බ වෙන්න අද දහදොළොස් දෙනෙක් ගැනු ළමයි ආවේ නැනේ.''

''දන්න කියන ළමයෙක් අම්මා.''

''දන්න හින්දනෙ උඹ ඔහොම සැලකුවේ. මං අහන්නෙ ඒ කවුද කියලා.''

කුඩා කාලයේ හිදම අම්මා සැරවද්දී උත්තර සොයා ගැනීම මට දුෂ්කර කටයුත්තකි.

දරුවකු කාලයේ වාගේ මම අම්මාගේ ප්‍රශ්න කිරීම හමුවේ තිගැස්මකට ලක්ව උන්නෙමි.

''ඒ ඔය වන්දි මුදලක් ගන්න ආපු ළමයෙක්...''

''ගෙදරට හොයාගෙන එන්න තරම් තියෙන ඇයි හොඳයිය මොකද්ද...?''

කෙටියෙන් උත්තර දී ගැලවෙන්නට බැරි තැන මම අම්මාට සම්පූර්ණ කතාව සංස්කරණය කොට පැවසීමි.

''ඔය ළමයා ආවේ එයාගෙ තාත්තගෙ වන්දි මුදලක් ගන්න... අවුරුදු ගානක් තිස්සේ එක දිගට ඇවිත් රස්තියාදු වෙච්ච හින්දා මට කම්ප්ලේන් කරා...''

''ඉතින්...''

''මං වැඩේ කරලා දෙද්දි තාත්තා නැති උනා... තාම ඒ ළමයා චෙක් එක සල්ලි කරගෙනවත් නෑ.''

''දැන් එතකොට ඔය උඹේ පස්සෙන් පන්නනෙ චෙක් එක මාරු කරගන්නද...?''

''ඔව්...''

''ඕක ඔච්චර දුර බැහැර ඉඳන් ඇවිත් කරගන්න මේක දා හත් වැනි ශත වර්ෂෙ ද බං... ඔය ආවේ ඒකට වෙන්න බෑ.''

මම පෙරළා කිසිවක් නොකීමි. විනාඩි හත අටක් අම්මා සන්සුන්ව රිය කවුළුවෙන් ඈත බලාගත්වනම උන්නාය.

''කවුද ඔය ළමයගෙ වෙන පවුලෙ ඉන්නෙ...?''

''සමන්දිනී ඉන්නෙ නැන්දා කෙනෙක් ගාව.''

''අම්මත් නෑ.''

''නෑ...''

''සහෝදර සහෝදරියෝ...''

''එයා පවුලෙ එකම ළමයළු.''

''වයස කීයද...?''

''විසි ගානක් ද කොහෙද...?''

අම්මාගේ ඒ පැනයත් සමඟම ඇගේ උපායශීලී ප්‍රශ්න කිරීමට මා හසුව හිඳින වග මට දැනුණි. ලැජ්ජාවක්, අපහසුතාවක් පේම මද නොරිස්සුමක් ද මට දැනුණි.

මම රියෙහි වේගය වැඩි කළෙමි.

''ඔය වන්දි ගන්න එන මිනිස්සුන්ගෙ තෝම්බුව උඹ හොයන්න ගන්නෙ කොයි කාලෙ ඉඳලද...?''

''අම්මා පිස්සු කියෝනවා.''

ඉන් එහා දිය හැකි සාර්ථක පිළිතුරක් සොයා ගන්නට මම අපොහොසත්ව උනෙමි.

''මොන චකුලේබෙන් ද උඹට ඒ බලය දුන්නේ...?''

මම අම්මා දෙස නෙතගින්වත් නොබැලීමි. ඉන් එහා අම්මා ද කිසිවක් කතා නොකළාය. පසුදා සමන්දිනී මට දුරකතන ඇමතුමක් දුන්නාය. මම ඇයට තතු කීවෙමි.

''මං ආවේ මෝඩ ගමනක්... ඒක මට තේරුණේ පස්සෙ.''

''ඒ උනාට... අම්මා ඔයාට අකැමැති නෑ...''

සමන්දිනී හිනැහෙන්නට ගත්තාය. මා දුන් පිළිතුරෙහිවන දුර්වලකම මට වැටහුණේ එවේලේය.

''එතකොට මට අම්මා කැමති කොයි විදියට ද...?''

''හොඳ යාළුවෙක් විදියට වෙන්නැති. දෙන්නම හිතන්නෙ පතන්නෙ එක විදියටනේ.''

''වයසෙනුත් ලොකු වෙනසක් නැතේ... නේද...?''

සමන්දිනී යළි හිනැහෙන්නට ගත්තාය.

"හෙට නුවර එන්න බැරිද...?"

සිනහව තුනීව ගිය තැන සමන්දිනී කතා කළේ පරිස්සමෙනි.

"යොදාගත්ත වැඩ ටිකක් නම් තියෙනවා."

මා කළේ අගය කිරීමකි.

"එහෙනම් කමක් නෑ... වෙන දවසකට දා ගමු."

"වෙනස් කරගන්න බැරි වැඩ මුකුත් නෑ."

මම ඉක්මනින් පැවසුවේ මගේ කියමනින් ඇගේ තීරණය වෙනස් වෙතැයි හට ගත් දෙගිඩියාවෙනි.

"එහෙනම් හෙට මං නමය වෙද්දි වැව ළඟ ඉන්නද...?"

"නමයත් දහයත් අතර..."

මා ඇයට එහා යමක් කීමෙන් තෘප්තියක් ලබනවා වැන්න.

"හරි... වැඩ තියෙනවනේ... මං තියන්නම්."

"හ්ම්..."

ඉන් එහා මට කිසිවක් කියන්නට ඉඩ නොතබා ඕ රිසිවරය තැබුවාය. පාළුවක්, කාන්සියක්, තනිකමක් වැනි හැඟීමක් මසිත වසා ගත්තේය.

# 04

සවස කාර්යාලයෙහි රැඳෙන්නට තරම් සිත් පහසුවක් නොවූයෙන් වේලපහින් පිටත්ව රූබි සිනමාහලේ ඉංග්‍රීසි චිත්‍රපටිය නරඹා රැයෙහි ගෙදර ආවේ මැණිකාට ද අම්මාට ද මට ද පිටින් කෑම ගෙනය.

සාමාන්‍යයෙන් ටෙලි නාට්‍ය නරඹා අහවර කෑම ගැනීම අම්මාගේ සිරිතවන නමුදු කඩෙන් කෑම ගෙන ආ විට ඕ ටෙලි නාට්‍ය නරඹමින් කෑම ගනියි.

"හෙට මුකුත් වැඩ දාගන්නෙපා. මට ගමනක් තියෙනවා යන්න..."

අම්මා ටෙලිනාට්‍ය නරඹමින්, චීන කෑම රස බලමින් මගේ සිහින බිඳ දැමූවා වැන්න.

මම අසරණව ගිය බැල්මෙන් අම්මා දෙස බැලීමි.

මේ ඊට එරෙහිව යමක් කියන්නට වේලාව නොවේ යැයි මට සිතුණි. මම අඩක් කා හමාර කළ බත්පත එසේම තිබිය දී වතුර උගුරු කීපයක් බී හුනස්නෙන් නැගිටීමි.

බලාපොරොත්තු කඩ වීමෙන් හටගන්නා සිත් තැවුලින් මම පීඩා විඳිමින් උන්නෙමි. අම්මා මගහැර සමන්දිනී දකින්නට යන්න ද සිතට දිරි නැත. සමන්දිනී මඟ හැර අම්මාගේ ගමන යාමද දුකකි. සියල්ලකටම වඩා හෙට ගමන පසුවට දමාගන්නට සමන්දිනීට ඇමතුමක් දෙන්නට ද ක්‍රමයක් පිළිවෙලක් නොවේ.

අම්මාගේ ගමන සඳහා රියදුරෙකු සමඟ හිතවතෙකුගේ රියක් යොදවා ගන්නට මම කල්පනා කළෙමි.

ආයතනික රියක් ඒ සඳහා යොදවා ගැනීම ඊට වඩා නුවණට හුරු යැයි පසුව මට සිතිණි. පහසුවෙන්ම මගේ ගමන ඒ රියෙන් කළ හැකිය. වෙනත් රියදුරෙකු දවසේ පඩියට ගෙන්වා ගෙන අම්මාගේ ගමනට මගේ රිය යෙදවිය හැකිය.

ඊළඟට සිතට එළඹි ගැටලුව වූයේ පෞද්ගලික ගමනක් ආයතනයේ රියදුරෙකු සමඟ යාමේ නොහැකියාවයි.

ගෙදරට රියදුරු සමඟ වාහනය ගෙන්වා - යන ගමන රාජකාරි එකකැයි අම්මාට ඒත්තු ගන්වා අහවර රියදුරු මගින් බස්සවා නුවර යන්නට මම තීරණය කළෙමි.

දුෂ්කරම කටයුත්ත වූයේ අම්මා හා මේ පිළිබඳව කතා කිරීමය. ඒ සඳහා සුදුසුම වේලාව රැයෙහි ඕ භාවනා කොට අවසානයේ නින්දට යන්නට සූදානම් වන මොහොතේය.

ඒ මොහොතේ ඕ කෝපයක් ද්වේශයක් ඇති වුව ද එය ප්‍රකට නොකර හැසිරෙන්නට වෙරදරයි.

හරියටම ඒ නැකත අල්වන්නට මම තෙවරක් ඇගේ කාමරයට ගියෙමි.

ඒ තෙවරම ඕ උන්නේ භාවනාවේය. සිව්වන වර මා දොරකඩින් මතුවන්දී ඕ නෙත් හැරියාය.

"ඇයි...?"

මා සිතුවා වාගේම අම්මාගේ කටහඬ කාරුණිකය.

"අම්මලා හෙට කොහේ යන්න ද...?"

මම ද යාප්පුවෙන් කතා කරමින් කාමරයට ගොඩ වීමි.

"වන්දනා ගමනක්... ඇයි...?"

"දුරකද...?"

"හෙට දවසෙ උඹට අපිත් එක්ක එන්න බැරි නම් ගමන කල්දාමු."



"පැයකින් දෙකකින් ගිහින් එන ගමනක් නම් යනැකි."

"නැත්නම්."

"මට ටිකක් දුර බැහැර රාජකාරි වැඩක් යෙදිලා අම්මා."

අම්මාගේ මුහුණ මැලවී යනු මම පැහැදිලිවම දිටිමි.

"හෙට මාව ගෙනියන්න එන වාහනේ ඩ්‍රයිවර්ව දාන් අම්මලට ගෙදර කාරෙකේ යන්න බැරි ද...?"

"ඔවා රස්සාව ගහලා යන වැඩ ළමයෝ."

"මට පල්ලෙහා මිනිස්සු පුද්ගලික වැඩවලට ඕන තරම් ආයතනයේ වාහන යොදා ගන්නවා අම්මෙ. හෙට නිවාඩු දවස හින්දා ඩ්‍රයිවර්ට දවසෙ කුලිය දුන්නම හරි."

"උඹට කරදයක් වදයක් නෙවෙයි නම් එහෙම කොරහං."

ඉන් එහා කතා කරන්නට නොයා යුතු යැයි තීරණය කළෙන් මම කාමරයෙන් පිටව යන්නට සූදානම් වීමි.

"අපි මෙහෙන් හතරටවත් පිටත්වෙන්නෝන... ඒ වෙලාවට ඔය කියන ඩ්‍රයිවර්ලා එයි ද...?"

"මම ගෙන්නන්නම් අම්මා."

මම කාමරයට වැද පසුදා හැඳගෙන යන්නට සුදුසු ඇඳුමක් සොය... සොයා... ගලපා බැලීමි. සමහරක් ඇඳුම් හොඳ වැඩිය. සමහරක් හොඳ මදිය.

තවත් සමහරක් මගේ තත්ත්වයට නොගැළපේ.

රාත්‍රී දොළහ පසුවන්දී එක ඇඳුමකට මම හිත හදා ගත්තෙමි. ඒ අත්කොට ටී ෂර්ටයකට හා ඩෙනිම් කලිසමකටය.

ඊට ගැළපෙන සෙරෙප්පු ජෝඩුවක් ද ඔප දමා හමාරව මා නින්දට ගියේ මැදියම් රැය ගෙවී හමාර වූවාට පසුවය.

හිමිදිරියේ මා අවදි වනවිට අම්මාත් මැණිකාත් ගමනට සූදානම්ව උන්නෝය.

"රත්නසිරි නෝනලා එක්ක මගේ කාරෙකේ යන්න. මං කැබ් එකේ යන්නම්."

"එහෙමයි සර්."

මම කලබලයකින් තොරව ගමන සංවිධානය කොට දුන්නෙමි.

"මැඩම්ලා කොහෙද සර් යන්නෙ."

"යන්නෝන කියන ඔනම තැනක එක්ක යනවා.. කාරෙකේ ෆුල් ටැංක් තෙල් තියෙනවා. මදි උනොත් නෝනා ලවා තෙල් ගස්ස ගන්නවා."

"හොඳමයි... සර් අද කොහෙද යන්නෙ..."

"පොඩි රාජකාරි ගමනක්... නෝනා ඇහුවත් එහෙම කියනවා."

"එහෙමයි."

අම්මාත් මැණිකාත් රියට ගොඩකර අවසන මෝටර් රිය ගේට්ටුවෙන් නික්ම යද්දීම මම කඩිසරව නාන කාමරයට වැදීමි.

නා කියා හමාරව ලකලෑස්ති වී ගෙදරින් බැහැරව යන්නට මට ගත වූයේ අඩ පැයකට අඩු කාලයකි.

මද අඳුරේ හුදකලා මංමාවත් දිග රිය ඇදෙද්දී සිතට දැනුණේ පිණි සිසිලකි.

සැතපුම් දහයක පමණ දුර ගෙවා හමාර කළ සැනින් ආපන ශාලාවකට වැද මම උණු කෝපි බීමි. කොළඹින් බැහැර වද්දී කෙමෙන් හිරු එළිය අඳුර පලවා හරිමින් තිබිණි. කෑගල්ලේ දී වික්ටර් රත්නායකගේ C.D. පටියක් ගෙන රියෙහි රෙකෝඩරයට දමාගත් මම දෙපැයක් යන විට නුවරට සමීප නගරයකට සේන්දු වෙමින් උන්නෙමි.

ඒ වන විට යාන්තමින් හත පහුවූවා පමණි.

සමන්දිනීට පොරොන්දු වූ වේලාවට පැයකට පමණ කලින් මම නුවර වැව ළඟට පැමිණියෙමි. හිතවතෙකු පවත්වාගෙන ගිය පෞරාණික භාණ්ඩ වෙළඳසැලක රථ ගාලේ රිය ගාල් කොට අහවර වළාකුළු බැම්ම මතට වී මම වැව දියට නෙත් යොමා ගත්තෙමි.

සිතෙහි යටිපත්ල මත සොම්නසක් පණ ගැහෙමින් තිබුණ ද හැමදාම මා පෙළන පාළුව, කාන්සිය සිතෙන් බැහැරව ගොස් තිබුණේ



නැත. ජන්ම උරුමයක් ලෙස මගේ සිතිවිලි වටා හැමදාම ඉහිරී තිබුණි. ජන්ම උරුමයක් යයි කීවාට ඒ සිතිවිලි උත්පත්තිය ලැබුවේ අප්පච්චිගේ මරණයත් සමඟය.

ඔහුගේ නීති රෙගුලාසිවලට යටත්ව ඇනුම් බැනුම්වලට ලක් වෙමින් ළමයෙකු ලෙස ඔහු ඇසුරේ ගෙවූ ජීවිතය අතිශය තෘප්තිමත් ශෝභන එකකි. ඔහු ගැහුවේද බැන්නේද කප්පරක් සෙනෙහස අග්ගිස්සේ හිඳය.

ඒ නිසාදෝ ඔහු පිළිබඳව කිසිම දිනක මා සිත තුළ කෝපයක් හටගෙන නැත. ඔහුගේ ඇනුම් බැනුම් ඇසුරේ සියුම් තාවකාලික තරහවත් ඇති වීද ඒවා ආවාට වඩා වැඩි වේගයකින් තුනී වී ගිය වග මට මතකය. අප්පච්චි සිහිවීමෙන් මා තුළ තදබල ශෝකයක් ඇති වන්නේ ඇයි දැයි මම නොදනිමි. ළමයෙකු ලෙසින් ඔහුගෙන් බොහෝ දේ ලබා ගත් මම වැඩිහිටියෙකු ලෙසින් ඔහුට කිසිවක් දී නැතැයි යන චේතනාව මා සිත තුළ තිබීම ඊට හේතුව වන්නට ඇත.

ඉස්සර නම් විසිහතර පැයේම අප්පච්චි මසිතේ හොල්මන් කරන්නේය. මා කරන කියන සියලු දෑ ඔහුගේ හැසිරීමට ළඟපාතින් ගියේ ඒ නිසා වන්නට ඇත.

සමන්දිනී හමුවීමෙන් පසුව අප්පච්චිත් මාත් අතර වූ චෛතසික බැඳීම විසිරී ගියාදෝයි විටෙක මට සිතිණි.

එය බෙහෙවින්ම දුක්බර සිතිවිල්ලකි. ජීවත්ව සිටිය දී වාගේම අප්පච්චි මියගිය පසු ද පුරුදු පෞරුෂයෙන් විරාජමානව සිටිනවාට මම කැමැති වීමි.

අප්පච්චිගේ ආත්මය කොහේ හෝ සිට මා රක්ෂා කරතැයි යන බොළඳ සිතිවිල්ල දන උගත් මා තුළ හැමදාම තිබිණි. ගෙයි බුදු පහනට වැඳ නමස්කාර කළ දෝතින්ම අප්පච්චි මෙනෙහි කරන්නට මා පෙළඹුයේ ඒ සිතිවිල්ල වන්නට ඇත.

මට බර සුසුමක් හෙළිණි. හැමදාම වාගේ අප්පච්චිගේ මතකය දිගේ මගේ සිත දුර ගියා වැඩිය. නවයයි තිහ පසු වී තිබුණ ද සමන්දිනී පොරොත්තු වූ තැන නොවූවාය.

මම සාක්කුවල දෑත් රුවා සන්සුන් ගමනින් වැව වටා වටක්

ඇවිද්දෙමි. හිරුඑළිය ළපටි වී ද දාහය තිවූ විය. එය වටයක් සක්මන් කර අහවර වද්දී කිලෝමීටර හත අටක් පයින් ගෙවා ආවා වාගේ මම වෙහෙස වීමි.

ආයේම පුරුදු තැන වලාකුළු බැම්ම මත මා වාඩි වූයේ අදම සමන්දිනීට සෙල්ෆෝනයක් රැගෙන දිය යුතුය යන සිතිවිල්ලේ පිහිටාය.

''මට මහත්තයගෙ අයිඩෙන්ටි කාඩ් එක චුට්ටක් බලන්න පුලුවන්ද...?''

මා තුෂ්නිම්භූතව ගියේ වටපිට හුන් ආරක්ෂක නිලධාරීන් දකිමෙනි. කාත් කවුරුවත් නැතිවා වාගේ වැව රවුමේ මා හැසිරුණු අන්දම පිළිබඳව මට සිහිවූයේ එවෙලේය. මම කිසිවක් නොකියාම මගේ ජාතික හැඳුනුම්පත පොලිස් නිලධාරියා අත තැබීමි.

''මේ මහත්තයා වන්දනා ගමනක් ආපු ගමන්ද...?''

පොලිස් නිලධාරියා මාගේ හැඳුනුම්පත පිරික්සමින් ඇසුවේ බෙහෙවින්ම කාරුණික ලීලාවෙනි.

''මං මේ කෙනෙක්ව හම්බෙන්න ආපු ගමන්.''

'මහත්තයා කොහෙද රස්සාව කරන්නේ...?''

''වන්දි කොමිෂන් සභා කාර්යාලේ...''

''රාජකාරි හැඳුනුම්පත තියෙනවද...?''

''ඔව්. ඇති.''

මම පසුම්බියෙන් ගත් හැඳුනුම්පත ආරක්ෂක නිලධාරියාට දුනිමි. පොලිස් නිලධාරියා එය දකිමෙන් මදක් විස්මිත්තව යනු මම දිටිමි.

''සමාවෙන්න සර්... මේ වන්දි කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා.''

පොලිස් නිලධාරියා සෙසු නිලධාරීන්ට මා හඳුන්වා දෙමින් කතා කළේ කුළුපග ලීලාවෙනි.

''රාජකාරිය හරියට කරලා සමාව ඉල්ලන්න නරකයි.''

මම ඔවුන්ගේ සේවය අගය කරනු වස් පැවසීමි.

''ඔව්... ඒ ඉතින් සර්ලා වගේ දන්න උගත් රාජ්‍ය නිලධාරීන්ගෙන් විතරයි. එහෙම නොවෙන්න අපි ගෙදර.''

මම එය අනුමත කරන සෙයියාවෙන් හිනැහිමි.

''යං සර් පොලිස් පෝස්ට් එකට වෙලා ඉඳන් ඉමු.''

''එහෙම උනොත් යාළුවා මග හැරෙයි. බොහොම ස්තූතියි.''

''මෙතන ජේත මානෙනෙ සර් යං.''

ඒ පෙරැත්තය කළේ වෙනත් නිලධාරියෙකි.

''ඔව්... ඔව්... හෙට අනිද්දා වෙනකොට අපිටත් ඕන වෙන මහත්තයෙක් ඔහොම හිටන් ඉන්න කොට අපිට බලන් ඉන්න පුලුවන්ද...''

එවර ආරාධනාවට එකතු වූයේ යුධ හමුදා නිලධාරියෙකි.

මට සියුම් ලැජ්ජාවක් දැනුණි. දුර තියා දකින්නෙකුට පෙනෙන්නේ පොලිස් නිලධාරීන් මා අත් අඩංගුවට ගත් බවෙකි.

''යමුකො එහෙනම්.''

මම පොලිස් නිලධාරීන් අතරින් පෙරට යද්දීම වාගේ කොහේදෝ සිට ආ සමන්දිනී මගේ අතකින් අල්වා ගත්තේ තැති ගත් ස්වරූපයෙනි.

''අනේ ඇයි මේ...? එයා මාව හම්බවෙන්න ආවේ.''

පොලිස් නිලධාරීන්ගේ මුවගට සිනහා එක්විණි. සමන්දිනී තවදුරටත් මගේ අත නැර බලා උන්නාය.

''හොඳ වෙලාවට නෝනා ආවේ... නැත්නම් අපි මේ මහත්තයව උසාවියට ඉදිරිපත් කරන්න ගෙනියන්න හැදුවේ.''

කාරණාව වටහා ගත් නිසාදෝ සමන්දිනීගේ අතෙහි ග්‍රහණය බුරුල් විණි. ඕ ලජ්ජාවෙන් හේ බා ගියාය. මසිතට ද දැනුණේ ලැජ්ජාවකි.

''කරදරයක් නොවෙයි නම් සර්ගේ ටෙලිෆෝන් නම්බරෙක දීලා යනවද...?''

සමුගන්නට පෙරාතුව පොලිස් නිලධාරියෙකු කළේ ආයාචනයකි. මම නිර්ලෝභීව ඔවුන් සියලු දෙනාටම නම් කාඩ්පත් දිගු කළෙමි.

"මොනවා හරි ඔනකමක් උනොත් එන්න."

"අනිවාර්යෙන්ම සර්... එන්නම් මැඩම්."

පොලිස් නිලධාරීන් මට කතා කළ ගෞරවයෙන්ම ඇයටද කතා කොට නික්ම ගියෝය.

"යං..."

සමන්දිනී කතා කළේ වරදක් කළ දැරිවියක වාගේය.

"කොහෙටද...?"

මම සාම්ප්‍රදායික පෙම්වතෙකු විලසින් ඇගේ පමාවට උරණ වීමි.

"මාළිගාවට."

"මෙතන වෙච්ච දේ හැටියට දෙයියො බුදුන් වඳින්න යන්න හිත හදා ගන්න බෑ සමන්දිනී... යං කාරෙකට."

"අම්මලා මාළිගාවෙ."

මා ගැස්සී වාගේ සමන්දිනී දෙස බැලුවෙමි. පෙරාතුව ඕ කියා තිබුණේ ඇගේ මව මිය ගිය බවෙකි. මගේ බැල්මෙන් සමන්දිනී ද තිගැස්සී ගිය වග මම දුටිමි.

බොරුකාරියක ලෙසින් සමන්දිනී දකින්නට වීමෙ වේදනාව ක්ෂණිකව මා තුළ හට ගත්තේය.

අම්මා, තාත්තා අහිමිව ගිය යුවතියකැයි ඇය කෙරෙහි මා තුළ වූ පැහැදීම ද දෙදරා ගිය සෙයකි. පසුවට කල් නොදමාම එය ආරවුලක් කරගන්නට මසිත පෙලඹවූයේ එනිසා වන්නට ඇත.

"ඔයා මට මුලින් කිව්වෙ අම්මා නැති කතාවක්නෙ සමන්දිනී."

ඇගේ මුහුණේ සෝබමාන, දඟකාර සිනහවක් ඇඳිණි.

"ඔයා ඔය කතා කරන්නෙ මගෙ අම්මා ගැනද...?"

"නැතුව ඉතින් මගෙ අම්මා ගැනයැ..."

"ඔව්... මං කතා කරන්නෙ ඔයාගෙ අම්මා ගැන තමයි."



සමන්දිනී එහෙන් මෙහෙන් කියනා කරුණුවල අග මුල මුලදී මට නොවැටහිණි.

"කියන දෙයක් තේරෙන්න කියන්නකො..."

"ඔගොල්ලන්ගෙ අම්මයි, මැණිකයි, අපේ නැන්දයි මාළිගාවේ..."

ඉහළට ගත් හුස්ම පහතට හෙළන්නට අමතක වූ සෙයියාවෙන් මම සමන්දිනී දෙස බලා උන්නෙමි.

මගේ ස්වරූපයෙන් ඇ මදකට නැති ගත්තාය.

"ඔයා මාව විහිළුවට ගත්තද...?"

මගේ වචනවල තැවරී තිබුණු සිත් තැවුල අවංක එකකි. සමන්දිනීගේ මුහුණේ ඉරියව් වෙනස්වන ස්වරූපයෙන් මගේ සිත් තැවුල ඈ වටහා ගත් බව මට නිශ්චය විය.

"අනේ නෑ... විහිළුවක් කරන්න හිතාගෙන කරපු දෙයක් නෙවේ. මේ... අම්මලා නැන්දලත්තෙක්ක කතා කරගෙන මාළිගාව වඳින්න දාගත්තා. ඔයා තේයි කියලා බයටයි මං එහෙම කෙරේ."

"දැන් අම්මා දන්නවද මම ආපු විත්තිය..."

සමන්දිනී වරදක් කළ දැරිවියක වාගේ හිස වැනුවාය. මාගේ පපු කුහරයේ ඊයම් බරුවක් සිරව ගියාක් වැනි වේදනාවක් මට දැනුණි.

"මං මෙ ගමන ආවේ අම්මලගෙ ගමන මඟ ඇරලා සමන්දිනී... මං ඔයාව හම්බවෙන්න එන්න අම්මලගෙ ගමන මඟ ඇරියා කියලා අම්මා හිතයි."

දැඩි වේදනාවකින් මදෙස බලා උන්නා විනා සමන්දිනී කතා කළේ නැත.

"අපෙ අම්මා ඔය වගේ දේවල් සුළුවට ගන්න කෙනෙක් නෙවේ සමන්දිනී... එයාට මේ සිද්ධිය ඇති මගේ හිතේ තියෙන මුළු ආදරේම මනින්න."

"මට සමාවෙන්න... මං ඇත්තටම කළේ වරදක්."

මා තුළ දුකක් හට ගැනිණි. නමුදු අම්මා කෙරෙහි වන බිය ඒ දුක වසා පැතිරී තිබිණි.

''දැන් ඉතින් වෙච්ච දේ උනා... මං මෙහෙමම කොළඹ යන්නම්. මං ආපු බවක් ඔයා අම්මට අඟවන්න එපා.''

''අනේ...''

සමන්දනීගේ මුවින් පිට වූ ඒ වචන පැන තැංමෙග් ඇගේ හදවතින්මය.

''ඔයාට තේරෙනවනේ සමන්දිනී මං දැන් ඔතෙන්ට ආවොත් ඔයාව ලොකු කරන් එයාට නොසැලකුවා කියලා එයා හිතයි.''

සමන්දිනී කිසිවක් නොකියා කරබා උන්නාය.

''අනික මං ආවේ රාජකාරි ගමනක් යනවා කියලා... මම දැන් මාළිගාවට ආවොත් බොරු ගොඩක් එළිවෙනවා. නාවොත් ඔයාගෙ අතින් වෙච්ච අත් වැරැද්දක් මග ඇරෙනවනෙ සමන්දිනී... මං යන්නම්...''

''එහෙනම් තව ටිකක් ඉඳලා යන්න.''

සමන්දිනී හිස එසවූයේ අන්ත අසරණ දුර්වල බැල්මකිනි. නමුදු ඈ වෙනුවෙන් යමක් කරන්නට තරම් දිරියක්, ශක්තියක් මා තුළ නොවිය.

''මම ලබන සතියෙ එන්නම්.''

මට යමක් කියන්න හෝ හිස ඔසවන්නට සූදානම් වූ සමන්දිනීගේ දෑස් මඟහැරී ගියෙන් මම ඇගේ බැල්ම දිග පිටුපස බැලීමි. අම්මාත්, මැණිකාත්, සමන්දිනීගේ නැන්දාත් අප දෙසට එමින් උන්නෝය. මහමග දී නිරුවත් කොට පාරට ඇද දමූවාක් වැනි ලැජ්ජාවක්, අපහසුතාවක් මට දැනුණි. ඒ වෙනුවට සමන්දිනීගේ මුවගේ ඇති වූයේ කළ වරදට පසුතැවෙන අතරවාරයේ ප්‍රතිඵලයට සිනාහා නොවී බැරිකමට ඇඳෙන මඳහසකි.

''අනේ මොනවා හරි කියලා බේරෙන්න මගෙ වරද කිව්වත් කමක් නෑ...''

සමන්දිනී තොල් මැතිරුවාය. ඉන් එහා ඇයට හෝ මට හෝ කතා කරන්නට අවකාශයක් නොවීය.

''රාජකාරි වැඩේ කරගෙනම ද පුතේ ආවේ...?''



අම්මාගේ කටහඬ තුළ ගැබව තිබුනේ උපහාසයත්, තොරිස්සුමත්ය. මැණිකා පසුපසින් හිඳ සිනහව සඟවා ගන්නට වෙර දරනු මම දිටිමි. හදවතේ වූ සියලු ශක්තිය මිටකට ගෙන අවස්ථාවට මුහුණ දෙන්නට මම සිතට දිරිගෙන උන්නෙමි.

''ඔව් අම්මා.. වරකාපොල ඒ.ජී. ඔෆිස්සෙක්නෙ වැඩේ තිබුණෙ. මිටිම ඉවර වෙනවත්තෙක්කමයි සමන්දිනී කෝල් කරේ.''

සමන්දිනීගේ නැන්දා පමණක් මා පිළිගෙන හිස වනමින් උන්නාය.

''අම්මලා මෙහෙ එන කතාවක් කිව්වනම් එක වාහනේ එන්න තිබුණා... අපරාදෙ වාහන දෙකක් ආවේ.''

''ඔයා වරකාපොල එන කතාවක් අපිට කිව්වෙත් නෑනේ පුතේ. යං යං පව් ගෙවෙත්තත් එක්ක දළදා වැඳලා එමු...''

අම්මා ආයේම දළදාව දෙසට යමින් කතා කළාය. මම සමන්දිනී දෙස බැලීමි. ඕ කරබා ගත්තාය.

''යමු පුතේ...''

මඟදී හැරුණු සමන්දිනීගේ නැන්දනිය කතා කළේ කිසිවක් නොදන්නා සෙයියාවෙනි. සියල්ලටම වඩා මට ඉහිලුම් නොදුන්නේ හැටවිය ඉක්ම වූ මැණිකා දහඅට හැවිරිදි දූරිවියක වාගේ ඔලොක්කුවට සිනහ වෙද්දීය.

නුවර ගමන මගේ ළය සැහැල්ලු කළ සොඳුරු එකක් විය. අම්මා ද කලකට පසුව සොම්නසින් හිඳිනු මම දුටිමි.

ගමන පුරාම මා පෙළ දෙගිඩියාවක් වී නම් ඒ මාත් සහබන්ධුත් සමන්දිනීගේ නිවෙසට ආ ගිය තොරතුරු අම්මාට හෙළිවේයැයි වූ බියය.

නමුදු කිසිවකු එවැන්නක් පිළිබඳ කතා කළේ නැත.

අප සමන්දිනීගේ ගෙදර ගොස් පැයක් යන්නට මත්තෙන් හදිසි කටයුත්තකට අනුෂ දරුවා සමඟ නික්ම යැමෙන් ඒ දෙගිඩියාවත් තුනී වී ගිය වග මට මතකය. සමන්දිනී ඇසුරේ මගේ ජීවිතයේ අනේකවිධ හිස්තැන් පිරෙමින් පවතින වගක් මට දැනේ.

අම්මා පවා ඇය පිළිබඳව සිතා තිබුණේ එලෙසමය.

"උඹ ඒ ළමයව බැඳහන්..."

විවේකී ඉරිදාවක මා උන්නේ පොතක් කියවමිනි.

ගහෙන් ගෙඩි එන්න වාගේ අම්මා හදිස්සියේ කතා කළේ සමන්දිනී ගැන වග මට ඒත්තු ගිය ද මම කිසිවක් නොදන්නා බැල්මකින් අම්මා දෙස බැලිමි.

"උඹට හොඳ හින්දනේ හොයා ගත්තෙ... චාරිත්තරේට කේන්දර බලලා නැකැත් හදලා කටයුත්ත අහවර කරහම මාත් නිදහස්."

"මොනව ගැන ද අම්මා මේ කියන්නේ...?"

අම්මාගේ කතාව පිළිබඳව අගක් මුලක් නොවැටහෙන සෙයියාවෙන් මම අම්මා දෙස බලා ඇසීමි.

"ඔක්කොමත් හරි මට ඉවසන්න බැරි උඹ ඔබා වෙන්න හදන එක තමයි."

තවදුරටත් අම්මා දෙස බලා සිටීමට නොහැකියාවක් මට විණි. මුවගට සිනහවක් නැඟුණේ එනිසාය.

"මේ සති අන්තෙ ගිහින් කේන්දර කොපි අරන් වරෙන්."

"නොගැළපෙනවනම් නොකරන්නද...?"

මා ඇසුවේ අම්මා කෝප ගන්වන උවමනාවෙනි. කෝප ගන්නවා වෙනුවට ඕ මගේ කියමන බරපතලව ගත්තාය.

"බැලූ බැල්මට එහෙම නොගැලපීමක් උඹලා කේන්දරවල ඇතැයි කියලා මං හිතන්නෑ. එහෙම අඩුවක් පාඩුවක් තිබුණත් ඉතින් එව්වට ත්‍රිවිධ රත්නේ පිහිට ආරක්ෂාව ගන්න පුලුවන්."

"මං කිව්වෙ අම්මව කේන්ති කරන්න."

මට සියුම් ලැජ්ජාවක් දනුණෙන් මම පැවසීමි.

"කවදාවත් මට උඹත් එක්ක කේන්ති ගිහින් නෑ පුතේ... අම්මලා දරුවන්ට නොහොඳ තෝක්කාඩු කියන්නෙත් ආදරේට..."

අම්මා හැඟුම්බරව කතා කරන්නේ කලාතුරකින් දවසකය. එනිසාදෝ ඈ හැඟුම්බරවද්දී මම ඕනෑවට වඩා සංවේදිය. ඇගේ කටහඬේ වූ දයාර්ද්‍ර බවින් මගේ දෑස් තෙත් වූයේ එනිසාය.

"ඒ කෙල්ල ගුණයහපත්... පෙනුමින් කියන්න අඩුවකුත් නෑ... මට ප්‍රශ්නෙකට කියලා තිබුණේ ඔච්චර ලස්සන, ගුණයහපත්, දූන උගත් කෙල්ලට විසිහත් අවුරුද්දක් යනකම් කසාදයක් හරි නොගියේ ඇයි කියලා...?"

මම සුරංගනා කතාවක අහපසු වූ කොටසකට කන්දෙන පුංචි දරුවෙකු වාගේ අසා උන්නෙමි.

"කෙල්ල එන එන කසාදවලට අකැමැති වෙලා තියෙන්නේ අර දරුවා නිසා."

"මායි සමන්දිනීයි කසාදයක් ගැන කතා කරලා නෑ අම්මා..."

කුමක් හෝ කිව යුතුයැයි හැඟුණු නිසාවෙන් මම කතා කළෙමි.

"මායි ඒ ළමයයි මේ ගැන කතා කොළා. උඹත් මෙච්චර කලක් හිටියේ මගේ කැමැත්තට ඉඩදීලා වෙච්ච කොට මේක මගේ කැමැත්ත කියලා හිතා ගනින්කො."

අම්මා එය කීවේ ඇනුම්පදයක ස්වරූපයෙනි.

"ඒ ළමයා මාව කසාද බඳින්න කැමැති වෙයිද අම්මා...?"

"අනේ මේ මගේ ලේ කෝප නොකර ගිහින් කේන්දර කොපිය ඉල්ලන් වරෙන්."

අම්මා හුන් තැනින් නැගිට ගස්සාගෙන ගෙට ගියාය.

මම මහත් වූ චිත්ත සංතෘෂ්ටියට පැමිණි සිතකින් ගෙමිදුලට බැස්සෙමි.

ඉකුත් වසන්තයේ දී මෙන් නොව මෙවර වසක් සමයේ දී ගෙමිදුලේ ගහ කොළට මහ පොළව ලෝබකමකින් තොරව මල් දී තිබිණි.

මම ගෙමිදුලෙහි ඔබ්බට ඇවිද ගොස් තනරව හැරී අප්පච්චි හදාදුන් නිවෙස දෙස බැලිමි.

දශක තුනකට පමණ පෙරාතුව තනා නිම කළ නිවෙස දැන් මදක් පරණ කාලයට ගොසින්ය. නමුදු එහි කිසිදු වෙනසක් කරන්නට අම්මා හෝ මා හෝ පෙළඹුණේ නැත.

මේ පර්චස් පනහට නොඅඩු බිම් කොටසේ හැම අඟලකම අප්පච්චිගේ සුවඳත්, මනුස්සකමත් විය.

සමන්දිනී අප්පච්චි මේ ගෙදරට කැන්දාගෙන ඒමට පෙරුම් පිරූ ලේලිය වග මට විශ්වාසය.

සමන්දිනී ගෙදරට කැන්දාගෙන ඒම අප්පච්චිගේ සිහින සැබෑ කිරීමක් වන්නේය.

මම පසුදා නුවර ගියේ එන බවක් සමන්දිනීට දන්වා නොවේ.

මගේ පැමිණීමෙන් ඕ අමුතු කලබලයකට පත් නොවූවාය.

"අම්මලා ආවෙ නැද්ද...?"

"මං එන විත්තිය ඔයා දැනගෙන හිටියද...?"

"එන විත්තිය විතරක් නෙවේ.. ආපු කාරණාවත් දන්නවා."

"මොකක්ද...?"

"මගේ වෙලපත්කඩේ ගෙනියන්න."

ඕ පුරුදු මදහසින් තැන්පත් ශාන්ත ස්වරයෙන් කතා කළාය. නමුදු ඇගේ වතින්, හඬින් මට පෙනුණේ මැවුණේ මායම්කාරියකගේ විලාශයකි.

"මං හරි ද... වැරදිද..."

"හරි... ඔයා කොහොමද ඒක දන්නේ...?"

"අම්මා මගෙන් ලග්නෙයි උපන් නැකතයි ඇහුවා."

"වෙන..."

"ඔයයි මායි අතර තියෙන සම්බන්ධෙ මොකක්ද කියලා ඇහුවා."

"ඔයා මොකද කිව්වෙ...?"

"අපි හොඳ යාළුවෝ කිව්වා."

"පස්සෙ...?"

"ඒ යාළුකම හිතාගන්නැකි කියලා මට එරෙව්වා."

"අපේ අම්මා..."

"ඔව්..."

ඇය පිළිවදන් දුන්නේ කාලයකටය.

"ඔය දරුවව මිදුලෙ තියාගෙන මොනවද සමන්දිනී ඔය කරන්නේ...?"

මගේත්, සමන්දිනීගේත් අවධානය දිනා ගත්තේ ආලින්දයේ ඉස්මත්තේ හුන් ඇගේ තැන්දාය.

"මෙයා ඇවිල්ලා තියෙන්නෙ කේන්දර කොපිය ගෙනියන්න."

සමන්දිනී ආලින්දය වෙතට කෑ ගැසුවාය. මගේ ඇඟ හිරි වැටී ලැජ්ජාවක් පපු කුහරයට රිංගා ගත්තේය. සමන්දිනීගේ දුර්වියක බඳු හැසිරීම මගේ සැකයට මුල් වරට බඳුන් වූයේ එවේලේය.

කේන්දර පිළිබඳ ලොකු විශ්වාසයක් මා තුළ නොවිණි. කේන්දර හොඳ දෙයක් කියද්දී එය විශ්වාස කරන්නටත් නරක දෙයක් කියද්දී අවිශ්වාස කරන්නටත් පෙළඹුමක් මා තුළ විණි. එය තාත්තාගෙන් ලද ආභාෂයයැයි මට දැන් සිතේ. අපේ පවුලේ කේන්දරයක් බලා හොඳක් කී විට තාත්තාට ඒ දෛවඥයා හිතට අල්ලයි. නරකක් කී විට ඔහු කෙතරම් හොඳ දෛවඥයෙක් වීද තාත්තාට නම් පල් හොරෙකි. මා තුළ ද ඔහු තුළ වූ ඒ සිතිවිල්ල විණි. අම්මා නම් මටත්, තාත්තාටත් වඩා බුද්ධි ගෝචර ප්‍රාණියෙකි.

ඇය හොඳ දෛවඥයා ලෙසින් සැලකුවේ කියන්නට ඇති දෙය කෙළින්ම කියන, නමුත් කියන අපල උපද්‍රවවලට පිළියම් ඇති තැනැත්තාය. බොරලැස්ගමුවේ සෙනරත් නමින් ප්‍රසිද්ධ, කියන්නට ඇති දෙය පොල්ලෙන් ගැහුවා වාගේ කියන දෛවඥයෙකු මෙකල අම්මාගේ සිත් ගෙන තිබිණි. අම්මා මගේත්, සමන්දිනීගේත් කේන්දරය ගලපා බලන්නට දුන්නේ ඔහුටය.

"මාර මිනිහෙකුටනෙ වැඩේ භාර දීලා තියෙන්නෙ...?"

ආරංචිය ලද මොහොතේම වාගේ මට කියැවිණි.

"ඇයි මොකද්ද ඒ මනුස්සයගේ තියෙන වරද...?"

මැණිකා උන්නේ අම්මාගේ හිසෙහි තෙල් ගල්වමිණි.

ඇගේ දෝතේ සාත්තුව විඳිමින් උන් අම්මා යාන්තමට ඇස් හැර බලා කතා කළාය.

"ඒ මනුස්සයා බාර දෙන වැඩක දකින්නෙම වරදක්ලු."

"බොගේ නමට අකුරු දුන්නෙත් ඒ මනුස්සයා... බොට ඉඳුල් කට ගෑවෙත් ඒ මනුස්සයගෙ නැකතට."

"ඇයි හාමිනේ සුදු මහත්තයට අකුරු කියෙව්වෙත් උන්නැහෙගෙම නැකැතකටලු නේද...?"

"නෙවෙන්නම්... එහෙම මිනිහාගෙන් බොගෙ පරස්තාවට කේන්දර ගලපන එකේ තියෙන වරද මොකද්ද...? මිනිස්සුන්ට ඒ මිනිහව අල්ලන් නැත්තෙ ඇත්ත ඇති සැටියෙන් කියන හින්දා."

විභාගයට හිඳගත් පසු ප්‍රතිඵල එන්නට ආසන්නයේ සිත පෙළණ නොසන්සුන්කම මසිතේ විය.

"ඔයාට ඔච්චර සැක නම් අපි කේන්දර කොපි දෙක වෙන තැනකට දීලා බලමු."

කේන්දර ගැලපීම සම්බන්ධයෙන් මා තරමටම සමන්දිනි නොසන්සුන්ව උන්නේ නැත.

"කොහෙට දුන්නත් වැඩේ කෙරෙන්න බලපාන්නෙ අම්මාගෙ ගැලපිල්ල."

සමන්දිනී හිනැහුණාය. කෙළවර එම සිනහව තුනී වී ගොස් ඇගේ මුහුණේ නතර වූයේ කල්පනාවකි. ඇගේ බැල්ම වැවේ දියරැළි මතට යොමුව තිබිණි. වැව් ගැඹුරේදී ශාන්ත දිය රැළි වළාකුළු බැම්මේ තැපෙන්නේ මුරණ්ඩුවය. එය කල්පනාවට සිත යොමන්නට හොඳ දසුනකි.

"ඇයි කල්පනා කරන්නෙ...?"

මම දියරැළි දෙස තත්පර කිහිපයක් බලා හිඳ කෙළවර ඇසීමි.



"මුකුත් නෑ."

සමන්දිනි කතා කළේ මලානික සිනහවකිනි.

"මුකුත් නැත්තෙ නෑ."

සමන්දිනි ඊට සිනාසුණාය. කෙහෙ රැල්ලක් පොකුරින් මිදී ඇගේ මුහුණේ දඟකරමින් තිබිණි. මම දබරැඟිල්ලෙන් එය කන්පෙති අතරට කළෙමි. සමන්දිනි හඬන්නට අර අඳින දැරිවියක වාගේ මදෙස බැලුවාය.

"නිකමට හරි කේන්දර නොගැලපුණොත් මොනාව වෙයිද...?"

ඇය ඇහුවේ සිත් වේදනාව යටපත් කරගන්නට අසාර්ථක උත්සාහයක යෙදෙමිණි.

"පොඩ්ඩක් නොගැලපුණොත් අම්මා පතන්නෙ බුදුන්ගෙ සරණ."

"මහා ගොඩක් නොගැලපුණොත්."

"එහෙම වෙන එකක් නෑ."

"එහෙම උනොත්...?"

"ඒක ඒ වෙලාවට බලමු."

ඉන් එහා බොහෝ වේලාවක් යනතුරු ඇය කතා නොකළාය. මම ද මුනිවතින් තත්පර කිහිපයක් ගෙවා දැමීමි.

"ඔයාට ඉන්නෙ අම්මා විතරයි. අම්මා මොන තීරණේ ගත්තත් ඔයාට කැමති වෙන්න වෙනවා."

"එහෙම හිතුවම ඔයාට අම්මයි තාත්තයි දෙන්නම නැතෙ."

සමන්දිනීගේ මුවගේ ඇඳෙන මලානික මඳහස අලුත් විණි.

"අම්මයි... තාත්තයි... විතරක් නෙවෙයි... හරියට බැලුවම මං ගැන හිතන්න කාත් කවුරුවත් නෑ තිවංක."

මට දැනුණ සිත් වේදනාව මෙතෙකැයි කිව නොහැකිය. සිතා මතා ඇගේ සිත පෑරුවාක් වැනි වේදනාවක් මට දැනුණි.

"ඒ හින්දා කේන්දර නොගැලපුණොත් ඒක ප්‍රශ්නයක් වෙන්නෙත් ඔයාටමයි තිවංක..."

මගේ පපු කුහරයේ පත්ලට ගිනි ඇවිලී තිබුණි.

''මං හරියට උඩු හුළඟට අහුවෙච්ච පරඬලක් වගේ තිවංක. කොහෙට ගිහින් කොහොම වැටුණත් දුක් වෙන්න කෙනෙක් නෑ.''

දෙනෝදාහක් අතර මාත්, ඇයත් හුදෙකලා වූවාක් වැනි හැඟීමක් මට දැනුණි. කප්පරක් ආදරය, කප්පරයක් සෙනෙහස මගේ සිත පත්ල අවුළුවාලූවා වැන්න. මම පියෙකු සේ සෙනෙහෙබරව ඇගේ හිස පිරිමැද්දීමි.

''ඉස්සර එහෙම වෙන්නැති... ඒත් දැන් මම ඉන්නවනෙ.''

ඕ කඳුළු මෝදු වූ දෑසින් මදෙස බැලුවේ එක අතකින් මගේ කමිසය පොඩි කොට අල්වා නොතම සංවේගයකිනි.

''කේන්දර කොපි දෙක නම් කියලා හදෝලා වගේ...''

අම්මාගේ කටහඬ ගලා ආවේ සාලයෙනි. මම උඩින් පල්ලෙන් කියවමින් හුන් පොත පපුව මත මුලින් පෙරළා ගත්තෙමි.

''කොච්චර ගැලපෙනවද හාමිනේ...?''

ඒ කටහඬ මැණිකාගේය. ඔවුන්ගේ කතාබහට වඩාත් හොඳින් කන්දෙන උවමනාවෙන් මම යහනින් නැගිට කවුළුව ළඟට වීමි.

''සීයට අසූ පහක් මෙගොඩ. එගොඩට තියන්නෙ පහළොවයි... එච්චත් එච්චර වගතුවක් තියෙන පොරොන්දම් නෙවේ.''

''අනේ හොඳයි.''

''මටත් හිතුණේ ඔකමයි... හැබැයි කසාදෙ ඉක්මන් කරන්නෝන කියලා සෙනරත් මහත්තයා දෙතුන් වතාවක් කිව්වා...''

''මොකද්ද හාමිනේ හේතුව...?''

''පෑහෙන ප්‍රමාණේ වැඩි උනාම වැඩේ නොකෙරෙන පැත්තට බර වෙන්න ඉඩ තියෙනවා.''

මගේ මුවගට තුනී මඳහසක් එක් වූයේ අම්මා වචන හසුරුවන උරුවටය. දූන උගත් ගැහැනියක වුවද ඇයත් අන් ගැහැනුන් වාගේම පොදු සමාජ සම්මතයන් ඉදිරියේ අන්ධවන තරම්.

''මගෙයි අපේ මහත්තයගෙයි කේන්දර ගැලපුනෙත් සීයට



හැටයි... හැටක් පැහිලා අපි දෙන්නා මෙහෙම දරුවෝ හදන් පවුල් කෑවානම් අසූ පහක් පෑහුනාම කොහොමට තියෙයිද...?''

''ආයෙ මොන කතාද... දෙන්නා ඉඳියි ඩයනයි චාල්ස් කුමාරයයි වගේ...''

''නොදන්න කමට බහුබූත කියන්නෙපා බං... උන්දලා දික්කසාද උනා...''

''හැබෑද...?''

අම්මාත් මැණිකාත් අතර හුවමාරු වන දෙබස් මුලදී මගේ ප්‍රීතියට හේතු විණි. දෙවනුව ඒවා නිකම්ම නිකම් හිස වචන යැයි මට හැඟුණි. තෙවනුව ඒ වචනවල සැඟවුණු ගැඹුරු ජීවිත ඇත්තක් මට යාන්තමට වැටහිණි.

අපේ අම්මාත්, තාත්තාත් අතර විවාහය සිදු වී තිබුණේ යෝජනාවක් අනුවය.

යෝජනාවෙන් පසුව දැවුරුද්දක් දෙදෙනා ආශ්‍රය කළ වග අපට කීවේ ලොකු අම්මාය. දෙදෙනා අතර අනේක විධ නොගැලපීම්, හැළහැප්පීම් වී ද සමස්තයක් ලෙස ගත් කළ ඔවුන් හොඳ පවුල් ජීවිතයක් ගත කළා යැයි නිගමනය කළ හැකිය.

තාත්තා කවියෙකු විය. සාම්ප්‍රදායට තදින් ඇලුම් කළ ගැමියකු විය. අම්මා කවිකම දක්කේ පිස්සුවක් ලෙසිනි. ඇය ගම්බද තැනැත්තියක් වී ද නගරබද ගැහැනියක වීමේ තෘෂ්ණාවෙන් පෙළුණු තැනැත්තියකි.

කෙසේ වුවද අප සම්බන්ධයෙන් ඔවුන් දෙදෙනා තුළම වූයේ එකම අරමුණකි. එකම ඉලක්කයකි.

මා හැරුණු විට අන් දරුවන් විවාහ කර දීමෙන් පසුව ඔවුන් තෘප්තියට පැමිණි වග මට විශ්වාසය.

නමුදු විවාහ ජීවිතය තුළ ඔවුන් ලද සතුටක් තෘප්තියක් හෝ නිරාමිස ප්‍රීතියක් වන්නේ දැයි මට සැක සහිතය. තාත්තා, අම්මා පිළිබඳව දැඩි කලකිරීමකින් පසු වූ වග මම දනිමි. අම්මාද තාත්තා පිළිබඳව සිතුවේ නුරුස්නා සිතකිනි.

තාත්තා මළ මොහොතේ අම්මා වඩාත් හැඬුවේ ඔහුගේ සතුට වෙනුවෙන් තමන් යමක් නොකළ වග සිහිවීමෙන් විය යුතුය. මළ ප්‍රාණියෙකු කෙරෙහි සිතෙහි ඇති වන බිය නිසාදෝ ඔ දැන් දැන් තාත්තාගේ සිහින සැබෑ කරන්නට වෙර දරන්නීය.

මගේ විවාහය ද ඒ අතුරෙන් එකකි.

අම්මා, තාත්තා මුහුණ දුන් සත්‍ය ජීවන අරගලයට මාත් සමන්දිනීත් නොවෙතැයි කාට නම් කිව හැකිද...? සිතිවිලිවල ගැඹුරට ගිය කළ සජීවී ලෝකයේ නිස්සාර බව මතු වන්නට ගනී. මා වැනි තනිකඩයෙකුට මේ සිතිවිලි බර වැඩිය.

කේන්ද්‍ර ගැලපෙන වග කියන්නට මා සමන්දිනීට කතා කළේ අනූෂගේ ජංගම දුරකතනයටය.

"සමන්දිනී මෙතැන නම් නෑ... මොකක් හරි හදිස්සි පණිවිඩයක් ද...?"

"හදිස්සි පණිවිඩයක්ම නෙවෙයි... අනූෂ කීයටද ගෙදර යන්නේ...?"

"අද නම් ටිකක් හවස් වෙයි තිවංක... මොනවා හරි කියන්න තියෙනවා නම් මං කියන්නම්."

"කේන්ද්‍ර නොගැලපෙයි කියලා සමන්දිනී ටිකක් හිටියෙ දෙගිඩියාවෙන්... කේන්ද්‍ර හොඳටම ගැලපෙනවා... ඒක කියන්න කතා කළේ."

"ඒක නම් මම කියනවට වඩා හොඳයි තිවංක කියනෙක. මං ගෙදර ගියාම සමන්දිනීට කෝල් එකක් අරන් දෙන්නම් තිවංක ෆෝන් එක ඔන් කරලා තියන්න."

"හොඳයි."

අනූෂ ඇමතුම විසන්ධි කළේ සමුගැනීමකින්ද තොරවය. කේන්ද්‍ර ගැලපෙන පුවත ඇසීමෙන් ඔහු මඳක් දෙදරා ගිය වගක් මට දැනුණි.

ඒ මගේ සිත් සෝදිසියට දැනුණු කරුණකැයි පසුව මම ඒත්තු ගතිමි. නමුදු ආයේම අනූෂගේ දුරකතනයට කතා නොකරන්නට ගත්



තීරණය නිසාවෙන් කලක් මා පාවිච්චි කළ ජංගම දුරකතනයේ සේවා කාලය නැවත ලබා ගතිමි.

ඒ සමන්දිනී වෙනුවෙනි. එය රැගෙන නුවර යන්නට මා යොදා ගත්තේ සති අන්තයයි. නමුදු ඒ ගමනට ඉඩක් නොවිය.

"උඹ මේ සති අන්තෙ කොහෙවත් යන්න තියාගන්නෙපා... අයියලා මෙහෙ එනවා."

"අයියලා කිව්වෙ ඔක්කොමල්ලද...?"

"ඔව්... ලොකු අක්කා කියනවා නොදන්වා සමන්දිනීව බලන්න ගියාම හැබෑ සුරුපෙ බලාගන්න පුලුවන් කියලා."

ලොකු අක්කා පිළිබඳව මසිතේ පිළිසිඳ ගත්තේ අප්‍රසන්න හැඟීම් එකතුවකි.

මා වෙනුවෙන් හෝ අම්මා වෙනුවෙන් කිසියම්ම කැප කිරීමක් නොකරන ඔවුන් මෙවැනි විටක බලපුළුවන්කාරකම් පෙන්වන්නට ඒම මගේ කෝපයට හේතු විණි.

"මායි අම්මයි සමන්දිනීට කැමති නම් වෙන මොනවද අම්මේ..."

මා කීවේ පපුවෙ දැවෙන කැකෑරෙන කෝපය වචන කීපයකට පෙරලාය.

අම්මා පෙරලා කිසිවක් නොකීවේ එවැනි සිතිවිල්ලක් ඇ තුළත් වූ නිසා වන්නට ඇත.

ලොකු අයියාත්, කුසුම් අක්කාත් සමන්දිනී පිළිබඳ කතා කළේ ප්‍රශංසා මුඛයෙනි. හරියාකාර වැඩිහිටි හව්හරණක් නොලැබූ ඇ යහපත් ගති සිරිත්වලින් යුතුවීම පොඩි අයියාගේත්, අක්කාගේත් විස්මයට හේතු වී තිබිණි.

අන් සියලු කරුණුවලදී වාගේම මේ කරුණේදීද අක්කා උන්නේ අනෙක් පැත්තේය. සමන්දිනී වැඩිහිටි හව්හරණක් නොලැබ හැදී වැඩීම ඇ දුටුවේ සැක මුසු ආකල්පයකිනි. අනෙක් අතට ඇයට ඉඩ කඩම දේපල, වස්තුව නැති වීම පිළිබඳ කනස්සල්ල පළ කළාය.

මල්ලිට කාටක් යටත් නොවී ජීවත්වෙන්න රස්සාව තියෙනවා.

"මල්ලිට කාටත් යටත් නොවී ජීවත්වෙන්න රස්සාව තියෙනවා. ඉන්න හිටින්න ගේ දොර තියෙනවා. දැවැදි බලාගෙන මෙවා කරන්න ඕනකමක් නැහැනේ. වැඩි කාලයක් නොගෙන මේක ඉවර කරලා දම්මම ඉවරයි."

අවසාන තීන්දුව ගත්තේ ලොකු අයියාය. දන උගත් ඔහු පවුලේ කරුණු දෙස බැලුවේ අප්පච්චිගේ සෙයියාවෙනි.

එනිසාම ඔහු කෙරෙහි ප්‍රසාදයක් මා කෙරෙහි විය.

නුවර දී සමන්දිනී අත පත ගාමින් නා නා ප්‍රකාර කතා කිවූ ලොකු අක්කා යන්නට ගියේ, "තව ටිකක් ඔය කෙල්ල ගැන හොයලා බැලුවනම් හරි" යයි කියමිනි.

"එයා ඉතින් දේවරූපවලත් අඩුපාඩු හොයන ගෑනිනේ."

අම්මා අක්කාගේ යෝජනා චෝදනා සියල්ල මායිම් කළේ නැත.

යුතුකමකට ආවා විනා ලොකු අයියාට, පොඩි අයියාට හෝ අක්කාට මා පිළිබඳ වගක් නොවීය.

කෙසේ හෝ කෙළවර සියල්ලෝම මාත්, සමන්දිනීත් අතර විවාහය තීන්දු කළෝය.

සමන්දිනි පිළිබඳ පුවත නෑදෑ හිත මිත්‍රාදීන්ටත්, ආයතනය තුළ වූවන්ටත් ඉන් අහවර රහසක් නොවීය.

මුල දී ආයතනය තුළ පැතිර ගියේ මා වාඩක් කර ගන්නට ආ කෙල්ලක සමඟ පැටලී ඇතැයි යන ආරංචියයි.

දෙවනුව මා ඇය විවාහ කරගන්නට යතැයි යන ආරංචිය ඔවුන් අතර පැතිර ගියේය.

"සර් බඳින්න යන්නෙ අර මෙහෙට ඇවිල්ලා මගෙ ඇඟට ගෝඩවෙච්ච නෝනවද...?"

ඕන දෙයක් කෙළින් අසා දැනගන්නා ගුණපාල කෑජුවම මගෙන් තොරතුරු විමසීය.

"ඔව්..."



මම ඕනෑවටත් වඩා සමන්දිනී පිළිබඳ තොරතුරු ඔහුට පැවසීමි.

ඒ ඔහු හරහා ආයතනය තුළට තොරතුරු ගලා යනු පිණිසය. සතියක් දෙකක් මසක් ඒ පිළිබඳව කතා කළ ආයතනයේ අයවලුන් තවදුරටත් ඒ කතාව නීරස වූ බැවින් අමතක කර දැම්මාසේය.

ආයේම ඒ කතාව මතුවූයේ සමන්දිනී කාර්යාලයට ආ ගිය විටය. අහම්බෙන් වැඩක් කර ගන්නට ආ කතක් මගේ ජීවිතයට විශාල බලපෑමක් කිරීම සම්බන්ධයෙන් මම වරෙක විස්මයට පත්විමි.

සොම්නස හා තැවරී ගත් ඒ විස්මය සිතට එක් කළේ වචනවලට පෙරළිය නොහැකි ආශ්වාදයකි.

"ඇයි ඔයා මට කැමති උනේ...?"

අවුරුදු දාසයේ, දහ අටේ කොල්ලත් පිළිතුරු බලාපොරොත්තුවන ප්‍රශ්න මා තුළ හට ගෙන තිබිණි.

"ඇයි ඔයා මට කැමති උනේ කියලා කිව්වොත්... කියන්නම්."

සමන්දිනී මා මුලින් දුටුවාට වඩා ප්‍රබෝධමත්ය, ප්‍රසන්නය. ගැහැනුකම එදාටත් වැඩියෙන් අද ඈ වෙතින් දිස්වේ.

"මම ඔයාට කැමති වෙච්ච කාරණාව මොකද්ද කියලා කියන්න මට තේරෙන්නෑ."

"මට දෙන්න තියෙන උත්තරේත් ඕකමයි."

ඇත්තටම අප අතර ප්‍රේමයක් ඇති වූයේ කවදා කොතැනක දී කුමක් නිසාද වන වග නිනව් නොවේ. එය විචාරන්නට යෑම මුලින් ඇති වූයේ කිකිළිය ද බිත්තරය දැයි සෙවීමක් බඳු විය. මා දන උන්නේ අප අතර ප්‍රේමයක් ඇති වග පමණි. අපිට ඔවුනොවුන් නැතිව බැරි වග පමණි.

නමුදු ඉන් එහා සිතන්නට කරුණු කාරණා එක් කළ ඇමතුමක් එක් සති අන්තයක මට ලැබුණි. ඇමතුම අනුෂගෙන්ය.

"මට වැදගත් කාරණාවකට තිවංකව මුද්ගලීකව හම්බවෙන්නෝන."

"මං සිකුරාදා නුවර එනවා."

"නුවර දී මෙ ගැන කතා කරන්න බෑ තිවංක. මං හෙට කොළඹ එන්නම."

"මොකද්ද අනූෂ ඔය තරම වැදගත් කාරණාව...?"

"මෙක බරපතල කාරණාවක් තිවංක. ඔයත් එක්ක මේ ගැන කියන්න මං හිත හදා ගත්තෙත් අමාරුවෙන්."

"අනූෂ ඔහොම කිව්වට පස්සෙ මට හෙට වෙනකම්වත් ඉවසන්න බෑ වගේ... ඔයා මෙ කියන්න හදන දේට සමන්දිනී සම්බන්ධ ද...?"

"ඔව්... සීයට සීයක්..."

මා තුළ හටගත් දෙගිඩියාව සුළුපටු නොවේ.

"ෆෝන් එකෙන් කියන්න බැරි කාරණාවක් ද අනූෂ..."

"ඔව්... කාරණාවක් කිව්වට මෙක එක්තරා විදියක ඉල්ලීමක්."

තිවංකව මුණ ගැහිලම මේ ගැන කතා කරන්න හිතුවෙ ඒකයි... මං හෙට දහය වෙද්දි ඔෆිස් එකට එන්නම්."

අනූෂ ඇමතුම විසන්ධි කළේ අවසර ගෙනවත් නොවේ.

මා මනසින් දැඩි සේ ව්‍යාකූලව ගියෙමි. සමන්දිනීට කතා කොට තතු කියන්නට නොයෙක් වර සිතුණ ද මම ආයාසයෙන් එය මැඩ පවත්වා ගත්තෙමි. සහබන්දු මුණගැසී ඒ පිළිබඳව කතා කරන්නට සිත් වී ද එය ද නොහොබිනා කමකැයි මට සිතිණි.

අනූෂගේ දුරකතන ඇමතුමෙන් පසු එළඹෙන හැම තත්පරයක්ම මට කල්පයක් බඳු විය.

විශ්වාස කරන්න මම පසුදාට රැය පහන් කළේ එකදු තත්පරයක් හෝ නින්දක් ලැබ නොවේ.

පසුදා දහයට, දහයක් තිබිය දී අනූෂ කාර්යාලයට ආවේය.

"සර්ව හම්බෙන්න කවුද ඇවිල්ලා..."

ගුණපාල රැගෙන ආවේ අනූෂ පැමිණීම පිළිබඳ පුවත වග මම හොඳාකාරව දැන උන්නෙමි.

"චුට්ටක් ඉඳන් ඉන්න කියන්න."

අනූෂට මුහුණ දීමේ නොහැකියාවක් මා තුළ විය.

කාමරයේ දොර වසා හුදකලාව මම ඊට සිතින් දිරි ගතිමි.

මම විනාඩි කිහිපයක් කාර්යාල කාමරයේ ඔබ මොබ යමින් ගෙවා දැමීමි. කෙළවර කාර්යාල කුටියේ වීදුරු බිත්තිය පාමුළ හිඳ පාත මාර්ගය දෙස බලා උන්නෙමි.

මට පෙනෙන විදියෙහි නා නා ප්‍රකාර වාහන ගැහැනු මිනිසුන් යයි. එයි. කොලට්ස් ගොඩනැගිල්ල දෙස හිඳ ආ ගිලන් රියක් සේනානායක මාවතින් හැරී ගියේය. ගිලන් රිය නොපෙනී ගිය ද අනතුරු සංඥා හඬ තවමත් තුනී වෙමින් පවතී.

බැල්ම විදියේ වී ද මසිත වූයේ කාර්යාලයේ අමුත්තන්ගේ කුටිය තුළය. අනූෂ ආවේ මන්ද...? ඔහු කියන්නට තනන්නේ මොනවාද...?

ඔහුගේ පැමිණීමෙන් හෝ කියන්නට ආ ආරංචියෙන් මා මෙතරමම කලබල විය යුතුද?

මම විදිය මතට හෙලා උන් බැල්ම ඉවතට ගන්නට යද්දීම වාගේ දරුවා කරපින්නාගත් අනූෂ පාර මාරුව යනු දිටිමි.

හිතේ හෝදිසියට ඇස් රැවටුණාවත්ද?

මම වහා මේසය මත වූ විදුලි සීනුව හඬ නැංවීමි.

දොරකඩින් මතු වූයේ චතුරිකාය.

"මාව මුණගැහෙන්න ආපු විසිටට එන්ඩ කියන්ඩ."

"බබාට මොනා හරි බොන්ඩ අරන් දෙන්ඩද කොහෙද එළියට ගියා සර්."

මගේ පපුව හෝස් ගා පත්තු විණි. ඇති වූ සිත් වේදනාවක් පසුතැවිල්ලත් සුළු පටු නොවීය.

"ආපු ගමන් රූම් එකට එවන්න ද සර්...?"

"ඔව් එහෙම කරන්න."

මාගේ කටහඬ ඇසෙන නෑසෙන තරම දුර්වලව තිබිණි.

අනූෂ පැමිණියේ දරුවා සමගය යන්න මා දැන සිටියානම් කුමන හේතුවක් නිසාවෙන්වත් ඔවුන් පමා කරන්නේ නැත.

මම අසුනේ සුවපහසුව හිඳ උන්න ද සිතට දැනුණේ දරුණු අපහසුවකි.

දරුවා කරපින්නාගත් අනූෂගේ රුව මත්තේ මගේ සිතිවිලි අතීතයට ඇදෙමින් තිබිණි.

තාත්තාගේ යහළුවෙකුගේ මඟුල් ගෙයකට ගිය දිනක් පිළිබඳ මතකයක් මගේ පපු කුහරයේ එල්ලී තිබේ. එදවස අපට වාහනයක් නොවිණි. අප මඟුල් ගෙදර ගියේ කුලී රියකිනි. යද්දී වූ ආටෝප එද්දී අප කිසිවකු තුළින් විද්‍යමාන වූයේ නැත.

මඟුල් ගෙ හමාර වූ තැන සියල්ලන්ම නික්ම යන තෙක් තාත්තා කල් මැරුවේ තමා ආවේ වාහනයක වන බැව් මිතුරන්ට ඒත්තු ගන්වන්නටය.

එහිදී කුලී කාරයක එන්නට තාත්තා ළඟ මුදල් වූයේ නැත.

"බස් එකේ යන්නෝනා."

තාත්තා ලොකු අයියාත් පොඩි අයියාත් අක්කාත් දෙස බලා කෙළවර මා කරට ගත්තේය.

අම්මාට හොරෙන් හීන් අඩියක් සප්පායම්ව උන් තාත්තා ඇන්ජිමය අඟලට ගෙන බස් නැවතුම තෙක් යන් දී අක්කාත්, අම්මාත්, අයියාත් ඔහු පසුපසින් දිව ආ අයුරු මට මෙතෙහි වන්නේ නෙතු බොඳ කරමිනි.

"වාහනයක් ගන්නෝන හාමිනේ... අද මට මං ගැනම දුක හිතුනා."

තාත්තා රැයෙහි දුක කීවේ සපත්තුවට කැපුණු කකුල්වල කුකුල් තෙල් තවරමිනි. එදා තාත්තාගේ දුක අසන්නට අම්මාවත් ළඟ විණි.

දරුවා කරපින්නා යන අනූෂට එවැනි පිහිටක් හෝ නොවේ. ඉන් එහා සිතන්නට ඉඩ නොතබාම කිසිවකු කාමරයේ දොරට තට්ටු කළේය. ඒ අනූෂ වග මම අනුමාන කළෙමි.



මගේ අනුමානය නිවැරදි විය.

හැඬීමෙන් දෙඩීමෙන් වෙහෙසකර වූ දරුවා කරපින්නාගත් අනූෂ කාමරයට ගොඩවිය.

"අනේ සොරි අනූෂ වෙයාමන්ගෙ ඩොකියුමන්ට් එකක් තිබුණා චෙක් කරන්න. ඒකයි ටිකක් ඉන්න උනෙ..."

"අපොයි... කමක් නෑ තිවංක... වැඩ රාජකාරි අස්සෙ මෙහෙම ගමක් එනවට... සමාව ඉල්ලන්නෝන මං..."

"මොන පිස්සුද... මං ගෙදරට වඩා රිලැක්ස් එකේ ඉන්නෙ මෙහෙ. බබාව මෙහෙත් තියමු."

මම සෝෆාවේ වූ පත්තර කිහිපය පසෙකට කළෙමි.

"කමක් නැද්ද...?"

අනූෂගේ කටහඬේ වූයේ අන්ත අසරණ බයාදු බවෙකි.

"කිසි ප්‍රශ්නයක් නෑ අනූෂ..."

අනූෂ නිදා හිඳන දරුවා සෝෆාවේ සතපවද්දී මම වායුසමීකරණයෙහි කට්ටයක් වැඩි කළෙමි.

"ඉතින්..."

අනූෂගේ පැමිණීම අරඹයා හටගත් දෙගිඩියාව මැඩ ගන්නට වෙර දරමින් මම සෝෆාවේ හිඳගත්තේ මවාගත් සැහැල්ලුවකිනි. හැඟීම්වලට වංක නොවූ අනූෂ වෙතින් තවදුරටත් බියත් දෙගිඩියාවත් අසරණකමත් ඉස්මතුව පෙනුණි.

"අනූෂලා එහෙන් ආවෙ කීයට ද...?"

"පාන්දර පහට විතර."

"අනූෂයි බබයි විතර ද...?"

"ඔව්. මං මෙහෙ ආපු බවක් සමන්දීනිලා දන්නේ නෑ."

මා වටින් ගොඩින් කතාවට පිවිසියේ ඔහුගේ චකිතයත් මැඩ මගේ දෙගිඩියාවත් සමනය කරගන්නටය.

නමුදු අනූෂගේ වචන හරහා මට වල්පල් කතා කරන්නට ඉඩක් නොවීය.

"මං කතා කරන්න හදන්නේ තිවංකගෙ ජීවිතේට ලොකු බලපෑමක් කරන තීරණාත්මක දෙයක්."

හිස වනනවා හැරෙන්නට මට කරන්නට කිසිවක් ඉතිරි වී නොතිබිණි.

"තිවංක මිනිස්සුන්ගෙ දුක වේදනාව අඳුනන සංවේදී කෙනෙක් උනොත් මං මේ කරන ඉල්ලීම තිවංකට බරපතල දෙයක් වෙයි. එහෙම නොවුනොත් තිවංක මේ ඉල්ලීම මායිම් කරන එකක් නෑ."

මම හිනැහීමි.

"අනූෂ කාරණාව කියනකම් මට ඒ ගැන අදහසක් පළ කරන්න බෑනේ... කියන්නකෝ බලන්න..."

මම ආවේගය මැඩ කතා කළෙමි. අනූෂ සෘජුව මා දෙස බලා උන්නේය.

අනූෂ කල්පනාබරව තත්පර කිහිපයක් ගෙවා දැමීය. මෙහෙතෙම ඒ අතරවාරයේ නිදන පුතුගේ හිස සිනිඳුවට පිරිමදිනු මම දිටිමි. ඔහු වෙතින් දැඩි වේදනාවක් ද පශ්චාත්තාපයක ඉරියව් ද ප්‍රකට විණි. ඔහු සන්සුන්ව ගෙවා දමන එක තත්පරයක් මට කල්ප කාලාන්තරයක් බඳු විය. නිහඬකම පසු පස ඇත්තේ මහා කලබලයකැයි යන චීන කියමන මසිතට නැඟිණි.

"මොකක් හරි ප්‍රශ්නයක් ද අනූෂ...?"

තවදුරටත් ඔහුගේ සන්සුන්කම ඉවසා දරා හිඳින්නට බැරි තැන මම කතා කළෙමි.

"අපි මෙහෙම හමුවුන විත්තියක්වත් කතා කරපු දේවල්වත් තිවංක සමන්දිනීට කියන්නෙපා."

"එපා කියපු දෙයක් කියන පුරුද්දක් මට පුංචි කාලෙදිවත් තිබුන් නෑ අනූෂ..."

"මට සහනයක් කරන්න බැරි උනත් කමක් නෑ... තිවංකට මට



කරන්න පුලුවන් ලොකුම උදව්ව තමයි අපි කතා කරන දේවල් අපි අතරම තියාගන්නෙක..."

"මං ඒ ගැන පොරොන්දු වෙනවා."

අනූෂ කතාබහ දිග්ගැස්සීම පිළිබඳව සියුම් තුරුස්නාවක් මා තුළ ඇතිවෙමින් තිබිණි.

"මේ ඉන්නෙ ප්‍රියංකා..."

පසුම්බියේ වූ කුඩා ඡේයාරුවේ වූයේ හැඩරුවින් බොහෝ සෙයින් සමන්දිනීට සමාන කැනැත්තියකි. මම අනූෂ වෙතින් පසුම්බිය අතට ගෙන වඩාත් හොඳින් ඡේයාරුව දෙස බැලීමි.

"ප්‍රියංකා තමන්ගෙ ජීවිතේ ගැන අවිශ්වාසයක් ඇති වෙච්ච මුල් දවස්වල මහ පුදුමාකාර විදියට කම්පා උනා. මාව අතෑරලා දාලා යන්න එයා හිත හදාගත්තත්, දරුවව අතෑරලා දාලා යන්න එයාට හිත හදාගන්න බැරි උනා."

අනූෂගේ දෑස් තෙත්ව දිලිසිණි. මම ඔහුගෙන් ඇස් මුදා දරුවා දෙස බැලීමි. හයක් හතරක් නොදන්නා කිරි සප්පයා වරින්වර සිහිනෙන් හිනැහෙමින් නිදන්නේය.

"ප්‍රියංකා එයා නැතුව දරුවා තනිවෙයි කියන සාංකාවට ගොඩක් දරුණු විදියට අසනීප උනා තිවංක. එයාගෙ හිත ඩිංග ඩිංග හරියන්න ගත්තෙ පුතා සමන්දිනීට කිට්ටු වෙද්දි..."

වායු සමීකරණය කරන ලද කාමරය තුළදී පවා මගේ නලලෙහි උඩු තොලට ඉහලින් සිහින් ඩා බිඳු නැඟී තිබුණි. අනූෂට වෙනසක් නොඅඟවා සිටින්නට මහත් සේ වෙර දරුවද එය නොහැකි විය. ඊට හේතුව වූයේ අනූෂගේ කතාබහ ඔහැවටත් වඩා මා දෙබිඩියාවට පත් කොට තිබීමය.

"තිවංක දන්නවා ඇතිනෙ මගෙ වයිෆ් නැති උන විත්තිය."

"ඔව්. මට සමන්දිනී කිව්වා."

"එයා නැති උනේ මීට අවුරුද්දකට ඉස්සෙල්ලා."

මම හිස වැනීමි.

''නැකිවෙන්න අවුරුද්දකට විතර උඩදී ඉඳන්ම එයා උන්නෙ ලෙඩ ඇඳේ.''

මගෙ පපුව අනියත බියකින් සැලෙමින් තිබිණි. ඊට හේතුව මේ යැයි නිශ්චය කොට ගත නොහැකි වීද මොහු කියන්නට තතන්නේ මගේත් සමන්දිනීගේත් පෞද්ගලික ජීවිතයට බෙහෙවින් බලපාන කරුණකැයි මගේ යටි සිත කීය.

''දරුවා උපන්දා ඉඳලාම ප්‍රියංකා ලෙඩ ඇඳේ හිටපු නිසා අම්මා වගේ දරුවව බලා කියා ගත්තෙ සමන්දිනී...''

අනූෂ මොහොතකට කතාව නතර කොට කලිසම් සාක්කුවෙන් පසුම්බිය ගෙන එය දිග හැරිය. කෙළවර පසුම්බියේ ඇතුල් පැත්ත මවෙතට හැරවීය.

මාගේ සෑම ඉරියව්වකින්ම නොසන්සුන්කම කළඑළි බසිමින් තිබිණි.

''අන්තිමට පුතා ප්‍රියංකා ළඟට කිට්ටු නොවෙන තරමට සමන්දිනීට ළං උනා... ප්‍රියංකා, ඇස් දෙක පියා ගත්තෙ පුතාට අම්මා කෙනෙක් ඉන්නවා කියන හැඟීමෙන්... අන්තිම මොහොතෙ ප්‍රියංකා, දරුවව ඇස් දෙක වගේ බලාගන්න කියලා සමන්දිනීට කිව්වා.''

අනූෂගේ ඇසින් කඳුළු කඩා වැටුනේය. ඒවා මගෙන් සඟවාලීමේ ඕනෑකමක් ඔහුට නොවීය. හෙතෙම කලිසම් සාක්කුවෙන් ගත් ලේන්සුවෙන් දෙකොපුල් පිස ගත්තේය.

''ඇත්තටම සමන්දිනී මගෙ දරුවට අම්මා කෙනෙක් උනා තිවංක... ඒත්...''

අනූෂ මොහොතක් වචන ගිල ගත්තේය. ඒ කතාවේ වඩාත් ඇරඹෙන්නේ වේදනා සහගත අදියරයැයි මට සිතිණි.

''කියන්න අනූෂ... මං අහගෙන ඉන්නේ...''

''ඒත් තිවංක ඔයා මුණ ගැහිච්චදා ඉඳලා සමන්දිනී සෑහෙන්න වෙනස් වෙලා.''

මඳහසක් මුවගට නගා ගන්නවා ඇරෙන්න මට කරන්නට කිසිවක් ඉතිරි වී නොතිබිණි.



''දැන් සමන්දිනී ටික ටික දරුවගෙන් ඈත් වෙන්න උත්සාහ කරනවා. නැත්දත් බලන්නෙ සමන්දිනීගෙන් දරුවව ඈත් කරලා එයා ගාවට දරුව ළංකරගන්න...''

''මොකද්ද ඒකට හේතුව...''

අනූෂ බර සුසුමක් හෙළීය.

''එක අතකට නංගි සාධාරණයි. දරුවා එයාගේ පුද්ගලික ජීවිතේට බලපෑමක් වෙනවා කියලා එයාට හිතෙනවා ඇති... පුතා අම්මා කියන්නෙත් සමන්දිනීටනෙ.''

''ඕක පුළු ප්‍රශ්නයක් අනූෂ... අපිට ඔය තත්වෙ වෙනස් කරන්න පුලුවන්...''

''මං හිතන් නෑ... මේක අම්මා නැති පුංචි දරුවෙක්ගෙ හිතට බලපාන ප්‍රශ්නයක් තිවංක.''

''අනූෂ හිතන විදියට මොකද්ද අපිට කරන්න පුලුවන්...''

අනූෂ තත්පර කිහිපයක් එක එල්ලේ මදෙස බලා උන්නේය. ඔහුගේ බැල්ම දරාගත නොහැකි තැන මම සුසුමක් හෙලා ඉවත බැලීමි.

''මගෙ දරුවා ගැන හිතලා තිවංකට සමන්දිනීගෙන් ඈත් වෙන්න බැරිද....?''

මා ඉදිරියේ හිඳින්නේ උන්මත්තකයෙක්ද යන ප්‍රශ්නය හදිස්සියේම වාගේ මසිතට එළඹිණි.

''අනූෂට පිස්සුද...?''

මා එය කිව්වා නොව මට එය කියවිණි.

''සමහර විට ඔව්...''

අනූෂ සන්සුන්ව කියා දැම්මේය.

''ඒ දරුවා අපේ වගේ බලා කියා ගන්න මටයි සමන්දිනීටයි පුලුවන්. එහෙම තියෙද්දි මං ඇයි සමන්දිනීගෙන් ඈත්වෙන්නෙ...''

''ඕවා වචන තිවංක...''

අනූෂ කෙරෙහි මා තුළ වූ අනුකම්පාව පරයා කිසියම් අපැහැදීමක් පොදි ගැහෙන්නට විණි.

"අනූෂ මේ කරන යෝජනාව සාධාරණ එකක් කියලා ඔයාට හිතෙනවද...?"

"ඔව්... ප්‍රියංකා මැරිලා අවුරුද්දක් යන්න ඉස්සෙල්ලා සමන්දිනිව කසාද බඳින්න කියලා මට යෝජනා කරේ එයාගෙ තාත්තා."

මේ සැබෑවක් වෙමින් පවතින්නේ මාගේ හිතළුව නොවේද...?

"ඇයි ඉතින් ඒක නොකෙරුණේ...?"

"ප්‍රියංකව අමතක කරන්න තරම් මගෙ හිතට හයියක් නොතිබුණ හින්දා තිවංක."

මම තත්පර කිහිපයක් කිසිවක් සිතා ගත නොහැකිව බලා උන්නෙමි. සියොළඟම දුවෙන්නා වාගේ වේදනාවක් ඇතුල් ගැබ හාරා පාරා විනිවිද යමින් තිබිණි.

"එතකොට සමන්දිනී මේ යෝජනාවට කැමති වෙලා හිටිය ද...?"

මාගේ කටහඬ නික්මුණේ බෙහෙවින්ම දුර්වලවය.

"එයාගෙ හැසිරීමෙන් අකැමැත්තක් පෙනුන් නෑ. ළමයට තිබිච්ච ආදරේ හින්දා එයා ඒ යෝජනාවට කැමැති වෙන්න ඇති."

අප අතර තත්පර කිහිපයක මුනිවතක් ඉගිරිණි. වායුසමීකරණයේ හඬ පවා ඇසුණේ චණ්ඩ කුණාටුවක් සේය. ඉන් එහා කතා කළ යුත්තේ ඔහුද... නොඑසේනම් මාද යන ගැටලුවට අප දෙදෙනාම මැදිව හුන් සෙයකි.

"තිවංක මගෙ ඉල්ලීමට කන් දුන්නත් නුදුන්නත් මේ ගැන සමන්දිනීත් එක්ක කතා කරන්න යන්නෙපා."

මම පෙරලා කිසිවක් නොකියා ඔහේ බලා ගත් අත බලා හුන්නෙමි.

තවත් තත්පර කිහිපයක් ගතවිණි. බැල්ම එහා මෙහා කරන්නටවත් මසිතට දිරියක් නොවිය. කෝපයත්, ශෝකයත්, ආවේගයත් මසිතෙහි පොර බදමින් උන්නේය.



සමන්දිනී කෙරෙහි අපැහැදීමක් ද මා කෙරෙහි දුකක් ද එක්වරම මසිතට රිංගා ගත්තාක් වැනිය.

"මං යන්නම්..."

අනූෂ කතා කළේ කොපමණ වේලාවකට පසුවදැයි මම නොදන්නෙමි. උන් ඉරියව්වේම උන්නා විනා අහම්බෙන්වත් ඔහු දෙස නොබලන්නට ම පරෙස්සම් වීමි. අනූෂ නැගිට දරුවා කරපින්නා ගත්තේ, 'යන්නම්' කියා මිනිත්තුවක් දෙකක් ගෙවී ගියාට පසුවය. මම පෙරලා කිසිවක් නොකිවෙමි. අනූෂ දරුවා කරපින්නා ගත් වනම යන්නට ගියේය.

මම හුනස්නෙන් නැගිට කවුළුව පාමුලට වී වීදිය දෙස බැලීමි. කාමරයෙන් නික්ම ගොස් මිනිත්තු හය, අටක් යන්නට මත්තෙන් අනූෂ පාර මාරු වෙනු මම දිටිමි. පාර මාරු වූ ඔහු දරුවා ද කරපින්නා ගත් වනම මැක්ලම් වීදිය දෙසින් නොපෙනී යන තුරුම මම බලා උන්නෙමි. ඔහු නොපෙනී ගියාට පසුව පාළුවක්, කාන්සියක් හා සබැඳි කැදබල සිත් වේදනාවක් මට දැනිණි. ඔහු කෙරෙහි මසිතෙහි අනුකම්පාවක් මෝදු විය.

බොහෝ දුර බැහැර ගෙවා මා හමුවන්නට පැමිණි අනූෂට හෝ දරුවාට වතුර උගුරක් දෙන්නටවත් මට ඉඩක් නොවිණි. අනෙක සමන්දිනීත් අනූෂත් පිළිබඳව හාරා අවුස්සා දැන ගන්නට ඇති ඉඩකඩ ද මම නැති කර ගත්තෙමි. අනූෂ මුණ ගැසී කතා කළ යුතුය යන සිතිවිල්ල හදිස්සියේ මසිතට රිංගා ගත්තේය. මම මෝටර් රියෙහි නැගී නගරය පීරා සැරි සැරීමි. ඔවුන් යතැයි සැක සිතිය හැකි කිසිම තැනක අනූෂ හෝ දරුවා නොවීය. බස් නැවතුමේ වූ සෑම බසයකටම වාගේ නැග බලා අහවර මම හිස් අතින් කාර්යාලයට පැමිණිමි.

# 05

ගලෙන් ගල, බිඳෙන් බිඳ තැනූ සත්මහල් ප්‍රාසාදයක් නොසිතූ නොපැතූ මොහොතක ඉදිරී ගරා වැටුණු සෙයින් මසිත ලසෝබර වී තිබිණි. සිහිනයෙන්වත් නොසිතූ, අනපේක්ෂිත සිදුවීමෙන් මගේ ඇතුළාන්තය දෙදරා ගොස් තිබුණි. කාමරය තුළ ඔබ මොබ ඇවිද ගිය දුර මැන බැලුවහොත් එය සැතපුම් විස්සකට, තිහකට වඩා වැඩි මිස අඩු නොවේ. මා කාර්යාලයෙන් නික්මුණේ රාත්‍රී දහය පසු වී මිනිත්තු කිහිපයක් ගෙවී ගියාට පසුවය.

"ඇයි උඹ රෑ උනේ...?"

අම්මාත් මැණිකාත් මා එද්දී ආලින්දයේ වූවෝය.

"වැඩ තිබුණා..."

මම කෙටියෙන් උත්තර බැඳීමි.

"මෙච්චර රෑ වෙනකං."

"අම්මා පළකළේ විශ්මයත් සැකයත්ය. එය ඇසෙන විට මා සාලය පසුකරමින් උන්නෙමි. කාමරයට වැද ඇඳිවතින්ම නිදි යහනේ වැතිර ගත් මා මිනිත්තු කිහිපයක් කල්පනාබරව ගෙවා දැමීමි. අනුෂ කළ යෝජනාව දුෂ්ඨ තරුම එකකැයි මට වරෙක සිතිණි. රහසේ සමන්දිනීට පෙම් කර ඇය අහිමිව යන තැන ඊර්ෂ්‍යාව නිසා ඔහු මෙවැනි යෝජනාවක් කළා යැයි මට සිතිණි.



සමහර විටෙක බිරිය ජීවත්ව හිඳිය දී පවා ඔහු සමන්දිනී කෙරෙහි පෙම් සිත් වඩවන්නට ඇත. එනිසාම බිරියගේ මරණය ඔහුට දුකකට වඩා ආශිර්වාදයක් වූවා විය හැකිය. විටෙක ඔහුගේ එම හැඟීම්වලට අනුබල දෙන පරිද්දෙන් සමන්දිනී හැසිරුණා වන්නට බැරි නැත. ඒ ඊළඟට මගේ සිතිවිලි ගමන් කළ දිශාවය. ප්‍රියංකා ජීවත්ව හිඳියදී ඇයත්, ඔහුත් අතර ප්‍රේමයක් තිබෙන්නට ඇත.

එසේ සිතද්දී ප්‍රියංකාගේ මරණය ද සැක සහිතය. මොවුන් දෙදෙනා එක්ව ඇය මරා දැමුවාදැයි කිසිවකුට සැක කරන්නට පවා ඉඩකඩ ඇත. පසු කලෙක මා සමන්දිනීගේ ජීවිතයට ඇතුළත්වීම නිසා ඔවුන්ගේ ප්‍රේමය දෙදරා ගියා විය යුතුය. එය එසේ වී නම් ප්‍රියංකාගේ මරණය සම්බන්ධයෙන් අනුෂත්, සමන්දිනීත් අත්අඩංගුවට පත්වනු ඇත. ඒ සම්බන්ධයෙන් පළවුණ පුවත්පත් දැන්වීම්වලට මගේ නම ද ඇඳීම වළක්වනු නොහැකිය.

කොහේවත් යන කෙල්ලක් මගේ ජීවිතයට කළ විනැහියක තරම...!

මට බර සුසුමක් හෙළිණි.

"මනස්ගාත..."

මා කිවා නොවට මට කියැවිණි. ඇත්තටම සිදු වී ඇත්තේ කුමක් ද...? අනුෂගේ නොදරුවාගේ මුහුණ මගේ මතකයට නැඟිණි. ඔතැවට එපාවට, ආවාට ගියාට හුරතල් කළ ඒ දරුවාගේ මුහුණ මගේ මතකයේ එතරම්ම හොඳින් මිහිදන්ව ඇතැයි මා දැන උන්නේ නැත. මුව ඇස් ඇති පුංචි එකාගේ රවුම් මුහුණ, බොකුටු හිස කෙසින් හැඩ වී ඇත. පෙනුමට පුෂ්ඨිමත් දරුවා හැසිරීමෙන් ඇවතුම් පැවතුමෙන් ඔතැනීය.

ඒ අහිංසකයා හිඳින්නේ අම්මාගේ සෙනෙහස, ආදරය රැකවරණය අවැසිම වයසකය. අම්මාගේ තව් තරම් තාත්තාගේ තව් නොදරුවාට සොඳුරු නොවන්නට ඇත. අම්මාගේ උණුසුම ඉදිරියේ තාත්තාගේ පපුතුර සීතල වැඩි වන්නට ඇත. ඒ සියල්ල මැකුවේ සමන්දිනී නම් අනුෂගේ යෝජනාව අතිශය මානුෂිකය. එය නරියට ජීවිතය ඉල්ලා හඬා වැලපීමක් බඳුය.

තාත්තා මිය ගියාට පසු ඔහු අරඹයා මසිත හඬා වැටුණි

අන්දම මට හොඳින් මතකය. ඔහු නොමැති ලෝකය තුළ මා අසරණය යන හැඟීම මේ දැනුදු මසිතේ වේ.

වැඩිහිටියෙකු වූ පසුව ද ඔහුගේ ඕනෑකම, ඔහු නැති අඩුපාඩුව මට තදින් දැනිණි.

ලොව වඩාත් හයිය මා පිය, දූ දරු සබඳතාවයන්ය. මම මගේ ප්‍රේමය වෙනුවෙන් නොදරුවකුගේ සෙනෙහස උදුරා ගන්නට යතැයි හදිස්සියේ මට සිතිණි. හදගැබ පාරවන, රිදවන මේ සකලවිධ සිතුවිලි සමුදාය අතුරින් ඇත්ත මොකක්දැයි වෙන් කර ගැනීමට මට හැකි නොවීය.

ඇතුළතින් දැවී යද්දී මම පැයකට වඩා වතුර මලයට හිඳ ස්නානය කළෙමි. දුක සේදී ගියේ නැත. සමන්දිනී ළඟ මා රැගෙන දුන් ජංගම දුරකතනය විද ඇයට ඇමතුමක් දෙන්නට තරම්වත් සිතට දිරියක්, ඕනෑකමක් නොවීය. ඒ තබා ඇය දෙන ඇමතුමකට උත්තර බඳින්නට වත් මම උනන්දු නොවීමි. මට උවමනා වූයේ මගේ අසරණකම ආයුධය කොට ගනිමින් ඇයට පහර දී ඇය රිදවන්නටය.

මගේ ජංගම දුරකතනයට කිහිපවර කතා කළ සමන්දිනී දෙවනුව බිම දුරකතනයට ඇමතුමක් ගෙන තිබිණි.

"දොර ඇරහං... අන්න බොට කෝල් එකක්..."

අම්මා කතා කලේ දොරට තට්ටු කර නොවේ. දොරට තඩිබාය. දිගින් දිගටම නාද වූ මගේ සෙල්ෆෝනයේ හඬ අම්මාට හා මැණිකාට ඇසුණු වග මට මෙනෙහි වූයේ එවේලේය.

"කවුද කතා කරන්නේ...?"

"අර ළමයා... දොර ඇරලා හිටහං."

අම්මා උරණ කර ගැනීම තවත් වියවුලකට හේතුවක් වන නිසාවෙන් මම දොර හැරීමි.

"උඹ බීලද...?"

අම්මා රැහැන් රහිත දුරකතනය මවෙතට දිගු කරමින් ඇසුවේ නොරිස්සුමෙනි.



"අම්මට පිස්සුද...?"

මා කතා කලේ මවා ගත් කෝපයෙනි.

"මේ යන කරමෙට ගියොත් පිස්සුත් හැදෙයි."

අම්මා දුරකතනය මට දුන්නා නොව ඉන් අතට තබා පියා යන්නට ගියාය. මම තවත් තත්පර කිහිපයක් ඇමතුමට කතා නොකර කල් මැරීමි.

"ඇයි සමන්දිනී..."

කෙළවර කතා නොකරම බැරි තැන කතා කළෙමි.

"ඇයි කියන්නෙ මං දැන් පැය ගානක් තිස්සෙ ලයින් එකේනේ..."

"මං බාත්රූම් එකේ හිටියෙ..."

"මං මොබයිල් එකටත් ගත්තා."

"මං මිස් කෝල්ස් දැක්කා."

"ඇත්තටම ඔයා බීලද ඉන්නෙ...?"

"විකාරද සමන්දිනී..."

"විකාරද කියලා අහන්නෙ ඔයා අද හරි අමුතුයිනේ."

"මං වැඩ ගොඩක සමන්දිනී ඉන්නේ... කතා කරේ ඇයි කියලා ඉන්නකෝ..."

"මගේ මොළේ හොඳ නෑ... ඒකයි."

සමන්දිනී කෝපයෙන් කියා ඇමතුම විසන්ධි කොට දැම්මාය. පසුතැවිල්ලක්, දෙගිඩියාවක් වැනි හැඟීමක් මසිතේ හිස්තැන් සොයමින් පිරෙන්නට ගත්තේය.

රෑ අලුයමට හැරෙද්දී නින්දට යාමත්, පමාවී අවදිවීමත් දින චර්යාවට බද්ධ වෙමින් තිබුණි. අපිළිවෙළ වූයේ කාර්යාලයේ රාජකාරී පමණක් නොවේ ගෙදර දොර වැඩ කටයුතුද, අඳින පළඳින පිළිවෙළෙහි ද ක්‍රමය, හැඩය වෙනස් වී ගිය ගානය. සතියක් තුළ ජීවිතය සහමුලින්ම පාහේ වෙනස්ව තිබුණි.

දවසේ වැඩි හරියක් මා උන්නේ සෙල්ෆෝනය ක්‍රියා විරහිත කොටගෙනය. සමන්දිනිට කතා නොකරම බැරි තැනෙක ඇය දුන් ඇමතුමකට කතා කිරීම හෝ මවෙතින් ඇමතුමක් ගැනීම සිදු විණි. එම කතා බහ බොහෝ විට රාජකාරි සාකච්ඡාවකට සමාන විය.

සමන්දිනීට මගේ වෙනස හොඳින් වැටහී තිබුණ ද ඕ ඒ ගැන නැවත නැවතත් ප්‍රශ්න නොකළාය. එක්කෝ මා කාර්ය බහුලව ඇතැයි ඈ සිතන්නට ඇත. නොඑසේනම් මගේ වෙනසට හේතුව මගෙන් කියවෙන තෙක් ඕ ඉවසනවා විය යුතුය. ඒ දෙකින් කුමක් වුවද ඇගේ පෞරුෂය ඉදිරියේ මා සිතැඟි පරාජයට පත්ව තිබිණි.

මගේ වෙනස දැනෙන්නට හරින්නට එක දිගට කතා නොකර හිඳින මම අහම්බෙන් ඈ හා කතා කරමින් හිඳින විටෙක, ''ගොඩාක් බිසී සමන්දිනී... පස්සේ ගන්නම්,'' යැයි කියා සංවාදය කෙටි කර දැමීමි. ඉන් එහා මා කතා කරන තෙක්ම ඇය කතා කරන්නේ නැත. දවස ගෙවෙන්නේ ඇගේ ඇමතුමක් පිළිබඳ අවධානයෙනි. ඒ බලාපොරොත්තුව ඉටු නොවන විටෙක මමම ඇමතුමක් ගතිමි.

''ඇයි කතා නොකළේ...?''

මම ඇසීමි.

''වැඩ අස්සෙ කරදර කරනෙක හරි මදිනේ...''

ඇය උත්තර දෙන්නීය.

''මට මෙහෙ තියෙන වැඩවලට වඩා ඔයාට ඔහෙ වැඩ වැඩියි වගේ.''

මට උවමනා අමනාපයක් ගොඩනගා ගන්නටය.

''මට මෙහෙ මොන වැඩද... මේ දවස් ටිකේ නම් උයනවා, කනවා, නිදියනවා විතරයි.''

ඇය නොහොඳ නෝක්කාඩුවකට සූදානම් නැත. මා අමනාපයෙන් කියන බොහෝ ඇනුම්පදවලට ඕ මනාපයෙන් උත්තර බඳින්නේ මසිතේ වන කොස්ස නොදන්නා නිසාවෙන් විය යුතුය. අනූෂට දුන් පොරොන්දුව යටපත් වන්නට ගියේ දෙසතියකටත් වඩා අඩු කාලයකි. කෙළවර අනූෂ මා මූණ ගැසෙන්නට ඒම පිළිබඳව නොකියා ඔවුන් පිළිබඳව කතා බහ කරන්නට මගක් හෙළිදරව් කරගන්නට මම තීරණය කර ගතිමි.

යම් හෙයකින් සමන්දිනීත්, අනූෂට කැමැතිව හිඳ මා කරණ කොට ගෙන වෙනස් වූවා නම් කළ යුත්තේ කුමක් ද...? ඈ අමතක කර දමන්නට තරම් හිතට ධෛර්යයක් නැත. අනෙක් අතට විවාහවන වයස පසු කරමින් හිඳින මට තවත් අවස්ථා සොයමින් කල් මරන්නට ද ඉඩක් නැත.

ඒ එසේ වී යැයි කියා ඇයට ලංව සදා සිත් නොහොඳින් ගත කරන්නටද බැරිය. චිත්ත අභ්‍යන්තරයේ හට ගත්තේ තදබල වියවුලකි. වේදනාවකි. සියල්ලකටම වඩා සමන්දිනී නොදැක හිඳීමෙන් ඇය හා කතාබහ නොකර හිඳීමෙන් ජීවිතය හිස් විණි.

එක සිකුරාදා උදයක කාර්යාලයට යන්නට ගෙදරින් නික්මුණු මා නතර වූයේ සමනලතැන්නේය. සමන්දිනී මා දැකීමෙන් කලබලයට හෝ විස්මයට පත් නොවිණි. මිදුලේ දූ රතු මිරිස් අතුරමින් හුන් ඕ මා දැකීමෙන් සොම්නසට පත් වූ වග නම් සැබෑවකි.

''මං හිතුවා අද එයි කියලා.''

''ඇයි ඒ...?''

''නෑ ඉතින් පහුගිය දවස් ටිකේම ඔයාට මාත් එක්ක කතා කරන්න විවේකයක් තිබුණෙත් නැනේ.''

''අද විවේකයක් තියෙනවා කියලා කොහොමද දැන ගත්තේ...?''

''මට දිවැස් තියෙනවනේ.''

සමන්දිනී කෝල මඳහසකින් කතා කළේ අමනාපයක් හදාගන්නට මට කිසිදු ඉඩකඩක් නොතබාය.

''වැඩ රාජකාරි අස්සේ ඔයාව බලන්න මං ආවේ මට දිවැස් නැති නිසා. මොනවද මෙහෙ වෙන්නෙ කියලා බලන්න නම් එන්න එපැයි...''

මා හා ආලින්දයට ගොඩමින් හුන් සමන්දිනී මදෙස බැලුවේ නංවාගත් මඳහසකිනි.

''ඒක නම් ඇනුම් පදයක්...''

''රෝග ලක්ෂණ පහළ වෙන්නේ ලෙඩේ තියෙන මිනිස්සුන්ට...''

මම ආලින්දයේ අසුනකට බර වීමි.

''අද ආවෙ රණ්ඩු අල්ලන්නද...?''

මම කිසිවක් නොකියා ස්ටූලය මත වන පුවත්පතක් ගෙන පෙරලා ගතිමි.

''ම... කියන්නකෝ... අද ආවෙ රණ්ඩු අල්ලන්නද... අල්ලනවානම් අල්ලමු. හැබැයි හේතුව නොදන රණ්ඩු අල්ලන එක ලේසි නෑ... මොකද්ද හේතුව කියලා ඉන්නකො...''

''හේතුව ඉතින් අහේතුව තමයි.''

''අහේතුවකට රණ්ඩු කරන්නෙ පිස්සො... මං තාම එතෙන්ට පත් උනේ නැති නිසා බෑ... අනේ මිරිස්... හෝදන් එන්නං.''

සමන්දිනී ඇතුල්ගෙයට ගියේ දෝත විහිදා මට පෙන්වාය.

''කොහෙද මේ යන්න හදන්නේ...?''

සමන්දිනීගේ කටහඬ සාලය දෙසින් ඇසිණි.

''දරුවට ටිකක් සනීප මදි වගේ සමන්දිනී... ඩොක්ටර්ට පෙන්නන්න කියලා.''

ඒ අනූෂය. ඔහු ගෙදර හුන් වගක් දැනීමෙන් මසිතේ කෝපය අලුත් විණි.

''උණ නේන්නම... ඇයි පුතේ මොකද උනේ...?''

සමන්දිනී තවත් මොන මොනවා දෝ කියනු ඇසුණද කටහඬ නිරවුල් නොවීය. තත්පර කිහිපයක් ගතවන තැන අනූෂත්, සමන්දිනීත්, දරුවාත් ආලින්දයට ගොඩ විණි. දරුවා උන්නේ අනූෂගෙ ගෙල බදාගෙනය.

''අපි ඩොක්ට ගාවට දුවලා එමුද තිවංක.. බබාට ටිකක් සනීප මදි වගේ.''



දෙන්නට ඉක්මන් පිළිතුරක් සොයා ගන්නට මම අපොහොසත් වුණිමි.

''අනූෂට ඩ්‍රයිව් කරන්න පුලුවන්නේ... ඔය දෙන්නා ගිහින් එන්න.''

මා අනූෂට යතුර දිගු කරමින් කතා කළේ යටපත් කර ගන්නට වෙර දරණ නොසන්සුන් බවෙකිනි.

''සමන්දිනීත් ඉන්න... මං ගිහින් එන්නං.''

අනූෂ මෝටර් රියෙහි යතුර ගත්තේ මගේ නොසන්සුන්කමත්, කලබලයත් වටහාගත් සෙයිනි. මා තුළ වූ කුහකත්වය ඔවුන් ඉදිරියේ ඉස්මතු වීම පිළිබඳව දැඩි සිත් වේදනාවක් මට දැනිණි.

''අනූෂ අයියට තනියම ඔක්කොම කරගන්න පුලුවන්ද...?''

සමන්දිනීගේ කටහඬෙහි කිසියම් අනුකම්පා සහගත බවක් තිබුණි.

''කරන්න වෙන දෙයක් නැති උනාම බැරි කොච්චර නම් දේවල්වලට මිනිස්සු පුරුදු වෙනවද සමන්දිනී...''

අනූෂගේ කටහඬේ කෝපයක් හෝ ද්වේෂයක් නොවීය. ශෝකයක් හෝ පසුතැවිල්ලක් ඒ වචනවල විනැයි මට සිතිණි.

''මං එන්නම් තිවංක.''

අනූෂ කතා කළේ ළෙන්ගතු සමාව අයදින කටහඬකිනි. මම හිස වැනිමි. අනූෂ දරුවා කර පින්නාගෙන ගොස් මෝටර් රියෙහි ඉදිරිපස අසුනට දමා රියට ගොඩවනු මම බලා උන්නෙමි.

''පව්...''

සමන්දිනීගේ කටින් එම වචනය පිට වූයේ කප්පරක් ශෝකයෙන් තෙත බරිත සුසුමක්ද සමඟිනි. අනූෂ පිළිබඳ හාරා අවුස්සන්නට ඒ සුසුම්ම ඇතැයි මට සිතිණි.

''ඇයි පව් කියන්නේ...?''

''ඔය අම්මා කෙනෙක්, දරුවෙක් එක්ක යන්නෙ නැති ගමනක්නෙ තිවංක.''

සමන්දිනීගේ කටහඬේ කිසිදු කිළුටක් අහිතක් නොවීය. නමුදු මගේ පැරුණු සිතට ඒ වචන පිහි තුඩු සේ දැවටිණි. අනූෂ පිළිබඳ කතාව කතිකාවකට බඳුන් කළ යුතු යැයි මට සිතිණි.

"අනූෂලා ආවම පොඩි ගමනක් යන්නෝන... ඔයා ලෑස්ති වෙලා ඉන්න."

කොහේද, මොකටදැයි නොඅසාම සොඳුරු මදහසකින් හිස වැනූ සමන්දිනී ගෙට ගියාය.

මම කතාව ඇරඹිය යුත්තේ කොතැනකින්දැයි මෙනෙහි කරගන්නට වෙහෙසිණි.

සමන්දිනීත් මාත් අතර වූයේ පියවර කිහිපයක දුරකි. ඕ නුවර වැවෙහි කුඩා පදික පාලමෙහි මැද හිඳ නැගෙන දිය රැළි දෙස බලා උන්නාය. මම මෙහා ඉම ගස් සෙවනට වී උන්නෙමි.

කිසිවකු අප දෙදෙනාගේ හැසිරීම දෙස පරික්සමට බලා උන්නේ නම් දෙදෙනාටම හෝ දෙදෙනාගෙන් අයෙකුට පිස්සු යැයි සිතනු නොඅනුමානය.

මොහොතකට පෙර සමන්දිනී උන්නේ මා ළඟය. ඇය කුඩා පාලම මතට ඇවිද ගියේ මගේ මුනිවත දරාගත නොහැකි තැනය. දහසකුත් එකක් ප්‍රශ්න සිත තුළ විද අසන්නට දිරියක් මා තුළ නොවීය. ඍජු තීරණ ගන්නා දැඩි ගැහැනියක් සමන්දිනීගේ සියුමැලි බාහිර වතට යට ජීවත්වන බව මම දැන උන්නෙමි. අනවශ්‍ය ප්‍රශ්න ඇසීමෙන් ඇය උරණ වෙතැයි ද ඇය උරණ වීම හරහා අපට දෙපසට යන්නට සිදු වෙතැයි ද මා තුළ දෙගිඩියාවක් ද සැකයක් ද විණි.

එය එසේ වූවායැයි කියා දුරාචාරයේ යෙදුණු ගැහැනියක් හා එක වහලයක් යටට වන්නට බැරිය. එක මොහොතක මට මා ගැනම ලැජ්ජාවක් දැනුණි. ඊට හේතුව වූයේ නොකළ වරදකට සමන්දිනී මසිතින් අපහාස, උපහාස විඳිතැයි දැනුණු නිසාය.

මම හුනස්නෙන් නැගිට සමන්දිනී වෙතට ගියෙමි. ඕ ඈත දියරැලි දෙස බලා උන්නා විනා මදෙස බැලුවේ නැත.

"අපි ගෙදර යං..."

"ඇත්තටම මේ අහිංසක කෙල්ලට විරුද්ධ උනේ ඔය දරුව ද නැත්නම් ගෙදර ඇයොද...?"

ඇත්ත පිළිතුර නම් මාය. නමුදු එය මතු කර පෙන්වන්නට තරම් සිතට දිරියක් ශක්තියක් නොවේ.

මගේ යටි සිත තවමත් සමන්දිනී කෙරෙහි ඉව කරනවා වත්ද...?

නොඑසේනම් මේ අසරණ ගැහැනියගේ සිත රිදවන පිළිතුරක් දීමට මා තුළ වන නොකැමැත්ත මා දුර්වල කරනවා වත්ද...?

"ඔක ටිකක් දීර්ඝව කතා කරන්න ඕන කාරණාවක් නැත්දේ...?"

"මං ඇහුව ප්‍රශ්නෙට තියෙන්නෙ බොහොම කෙටි පිළිතුරයිනෙ පුතේ... සමන්දිනීට අකැමැති උණේ පුතාද...? ගෙදර ඇයොද...?"

මා සිතුවාට වඩා සමන්දිනීගේ නැන්දා දැනුවත් ගැහැනියකි. ඕ තියුණුය. පරෙස්සම්ශීලීය. ඈ අසන ප්‍රශ්නයකින් පලා යාම හෝ මග හැරීම පහසු නොවේ.

ඇය කෙළින් කතා කරද්දී මා වැන්නෙකු වටින් පිළිතුරු දීම ද නොමනාය.

"සමන්දිනීත්තෙක්ක මට ප්‍රශ්න තිබුණා නැත්දෙ...?"

"මං ඒ මොනවද කියලා අහන්නෙ නෑ... මොකද ඒක ඔගොල්ලන්ගෙ පුද්ගලික ප්‍රශ්නයක්නේ... හැබැයි මං ඔය ප්‍රශ්නෙම සමන්දිනිගෙනුත් ඇහුවා."

"එයා මොකද කිව්වෙ...?"

"එයා දැනුවත්ව කිසි ප්‍රශ්නයක් තිබුණ්නෑ කිව්වා."

සමන්දිනීගේ නැන්දා බර සුසුමක් හෙලමින් රියෙන් බසින්නට සූදානම් වූවාය. මෝටර් රියෙහි අගුල සොයාගත නොහැකිව ඕ දොර ආම්පන්න අත පත ගාද්දී මම රියෙන් බැස ඇයට දොර හැර දුනිමි.

"මං යන්නම් දරුවෝ..."

මම හිස වැනීමි.

"දරුවා ඉන්න වෝඩ් එක මොකද්ද...?"

"දහ තුන... හතළිස් හතේ ඇඳ."

මදක් නතරව කියා යන්නට හැරුණු සමන්දිනීගේ නැන්දා ආයේම මවෙත ආවේ යමක් මෙනෙහි වී වාගේය.

"ඇඬුවේ දෙඩුවේ නැති උණාට කෙල්ල මේ ප්‍රශ්නෙදි ගොඩක් වද විඳපු විත්තිය මං දන්නවා ළමයෝ... එහෙම එකේ ආයෙ ඔය දරුවා ඒ ළමයව මුලිච්චි වෙන එක එච්චර හොඳ දෙයක් නෙවෙයි."

ලෝකය එක තත්පරයක දී නතරව ගියාක් බඳු හැඟීමක් මට දැනුණි. අතිශය වේදනාකාරී සිත් තැවුලක් රත් වූ පිහි තුඩු වාගේ පපු කුහරයට කිඳා බැස්සේය.

"මං ඔය දරුවා හම්බුණ විත්තියක් සමන්දිනීට කියන්නෙත් නෑ. හොඳම දේ ඔය ළමයා ආයෙ සමන්දිනීව හම්බ නොවී ඉන්නෙක."

මම ඉරියව්වකුදු වෙනස් නොකොට ඈ දෙස බලා උන්නෙමි. ඇය අවසන්වරට මදෙස බලන්නා වාගේ බලා පාර මාරු වී යන්නට ගියාය.

"සර් ත්‍රිවිල් පාක් එකේ කාරෙක ගහලා තියෙන්නෙ..."

"මහ්... සොරි..."

මම මැදිවියේ මිනිසාට සිනහ වී මෝටර් රියට ගොඩවීමි. යා යුත්තේ කොහේ ද...? ඒ කුමක් සඳහා ද යන්න පවා මට නිනව් නොවීය.

මට නොදන්වා අක්කාත්, අයියාත් සමන්දිනී සොයා යාමෙන් කර ඇත්තේ වරදකි.

ඔවුනට මැදිහත් වී විසඳන්නට අප අතර වූයේ යෝජිත සබඳතාවක් නොවේ.

එහෙම පිටින්ම ඔවුන් කර ඇත්තේ අනිසි වැඩකි. ඔවුන් සමන්දිනීගෙන් පලිගත්තා වැන්න.

කෝපය උත්සන්න වූයෙන් මම අයියා සොයා කාර්යාලයට ගියෙමි.



ඔහු අත්‍යාවශ්‍ය කරුණක් සඳහා කාර්යාලයෙන් බැහැරව ගොස් තිබුණු අතර සෙල්ෆෝනය ද නිවා දමා තිබුණි. සිතෙහි ආවේගය තුනී නොවූයෙන් මම අක්කා දකින්නට ගියෙමි.

ඕ මගේ පැමිණීමෙන් විස්මයට පත් වූයේ ආරාධනා කොට හෝ ගෙදරට ගෙන්වා ගත නොහැකි මා අහම්බෙන් පැමිණි නිසාය.

"ඇයි මේ වෙලාවෙ..."

"ඔයාට පොඩ්ඩක් කතා කරන්න ඕන."

"මං ඔයා එනකොට බයවුණා අම්මා අසනීපෙන්වත්ද කියලා..."

මම පෙරළා කිසිවක් නොකියාම අසුනකට බර වීමි.

"කාලද ඉන්නෙ...?"

"ඔව්..."

ඔව් යැයි කීවාට දිවා ආහාරය තබා මා උදෑසන කෑම වේලවත් ගෙන තිබුණේ නැත.

"මොනවද බොන්නෙ...?"

"මුකුත් එපා..."

මාගේ අමුතු හැසිරීමෙන් අක්කා දෙගිඩියාවට පත්වන්නට ඇත.

"ඇයි මොකද වුණේ...?"

අක්කා හිඳගත්තේ ප්‍රශ්නකාරී බැල්මකින් මදෙස බලමිනි.

"ඔයයි අයියයි සමන්දිනී හම්බවෙන්න ගියා ද...?"

මා එය ඇසුවේ මහත් වේලාවක් සන්සුන්ව හිඳ සිතට දිරිගෙනය.

මා ආවේ කුමන හෝ ගැටලුවක් මුල් කරගෙන යැයි අක්කා අනුමානයට සිතන්නට ඇත. ඕ මට කතා කරන්නට ඉඩ හැර සන්සුන් වූයේ එනිසා විය යුතුය. මම සිතෙහි ආවේගය මැඩ කතාවට අවතීර්ණ වනු උදෙසා තවත් තත්පර කිහිපයක් ගෙවා දැමීමි.

"ඔගොල්ලො සමන්දිනී හම්බවෙන්න ගියා ද...?" තත්පර කිහිපයක් සන්සුන්ව හිඳ මම ඇසීමි.

''කවද්ද...?''

අක්කා ප්‍රශ්න කළේ මගේ ප්‍රශ්නය එතරම් වැදගැම්මකට ගෙන නොවේ. සැබෑ ලෙසම මම ඉන්කෝපයට පත්වීමි.

''කවද්ද කියලා දන්නෙ ඔගොල්ලොනේ...''

''අපි ඊයේ පෙරේදා ගියේ නෑ.''

''ගියෙ කවද්ද කියලා නෙවේ අක්කෙ මං ඇහුවෙ ගියා ද නැද්ද කියලා.''

මගේ කටහඬ තරමකට සැරවන්නට ඇත.

''තමුසෙගෙ තීරණේ දැනුම දෙන්න ගියාට පස්සෙ ගියෙ නෑ... ඇයි...?''

අක්කා කැත්තට පොල්ල වාගේ උන්නාය.

''මගේ තීරණේ දැනුම් දෙන්න ඔගොල්ලො ගිය මොකටද ඒකට යන්නෝන මමනේ.''

අක්කාගේ දැස් කෝපයෙන් දිලිසෙනු මම දුටිමි. ඒ බැල්ම දරාගත නොහැකි තැන මම අහක බලා ගතිමි.

''උඹට ඒ රාජකාරිය කරන්න දීලා අපිට පැත්තකට වෙන්න තිබුණා උඹ මේකට අපිව ගාව නොගත්තනම්.''

ඉන් එහා එකටෙක කියන්න දිරියක් මා තුළ නොතිබුණා වාගේ මම නිරුත්තර වීමි.

''නෑගම් ගිහින්... නැකැත් බලලා... මඟුලුත් තීන්දු කරාට පස්සේ ඒක තවදුරටත් උඹේ රාජකාරියක් වෙන් නෑ මල්ලියේ...''

''මේක ඔගොල්ලො යෝජනා කරපු මඟුලක් නෙවේනෙ අක්කේ...''

''අපි යෝජනා කරපු මඟුලක් උනා නම් උඹව කසාද බන්දන්නේ බලෙන්. මොකෝ උඹේ මොලේ අමාරුකම්වලට අහිංසක කෙල්ලො පලි නෑ.''

අක්කා කතා කළේ දැඩි ආවේගයකිනි.



''මායි අයියයි ඒ කෙල්ල හම්බ වෙලා මේ විස්තරේ කිව්වෙ උඹ ගැන හිතලා නෙවේ. ඒ කෙල්ල ගැන හිතලා...''

ඉන් එහා කතා කළේ අක්කා පමණි. මා කළේ කරබා ගත් වනම අසා හිඳීම පමණකි.

''උඹ දන්නවද උඹ ඒ කෙල්ලගේ ජීවිතේට කරපු විනාසෙක තරම්... මඟුලට දිනත් තීන්දු කරලා මේ විදියට මඟුල නොකෙරුණාම ඒ කෙල්ල කොහොමද ගම රටට මූණ දෙන්නේ...''

''මොකද්ද මම කරපු වරද...?''

මගේ කටහඬ දුර්වලව තිබෙන්නට ඇත.

''මඟුලකට දින තීන්දු කරලා අවුරුදු දෙකක් ඒ කෙල්ලව ආශ්‍රය කරලා... ගැළපෙන්නෑ කියනෙක වරදක් නෙවෙයිද...?''

මම කරබා උන්නෙමි. තත්පර කිහිපයක් නිසොල්මනේ ගෙවී ගියේය.

''ඒ කෙල්ල කාත් කවුරුවත් නැති අසරණ එකියක් හින්දා උඹ බේරුණා... නැත්නම් අපිට ගෙදෙට්ට ගේන්න වෙන්නෙ උඹේ මිනිය...''

අක්කා කියවිල්ලට විරාම තැබුවේ හුස්ම ගන්නට පමණි. ඇගේ මුවින් පිට වුණු සෑම වචනයකම මා කෙරෙහි වූ පිළිකුලක්, කලකිරීමක් විය.

''සමන්දිනීට උඹ කරා වගේ දෙයක් පිට මිනිහෙක් මට කරානම් උඹයි අයියයි නිකම් ඉන්නවද...? ඒ කෙල්ලට කාත් කවුරුවත් නැති නිසා උඹ බේරුණා...''

අක්කා හුනස්නෙන් නැගිට්ටේ තවදුරටත් එහි රැඳුනහොත් මට පහර දෙන්නට වෙතැයි සැකයකින් මෙනි.

''මම අයියවත් එක්කාසු කරගෙන ඒ ගමන ගියේ නැතිවෙන ඒ කෙල්ලගෙ ආත්ම ගෞරවේ ගැන හිතලා මිසක් උඹ ගැන හිතලා නෙවේ... වෙලාවකට උඹ අපේ තාත්තටත් ලැජ්ජාවක් මල්ලියේ...''

අක්කා යන්නට ගියේ ළඟ තිබූ වඩාත්ම නිදහස් ආසුවෙන් මගේ පපු කුහරය හාරා දමා මෙනි.

මම ඇගේ අවසන් වචනවලින් ලද වේදනාවෙන් ඔත්පලව අසරණව ගියෙමි. අක්කා සාලයෙන් නික්ම ගියාට පසු මම තව දුරටත් එහිම රැඳිමි.

සුළඟ ගස් අතු පතරවල දැවටෙන හඬද දූහුවිලි පොළවෙන් මතුව දිව යන හඬ ද ඇසෙන තරමට මගේ හදවත සන්සුන්ව තිබිණි. අනූෂත්, සමන්දිනීත් අතර වූ සම්බන්ධතාවය අක්කාට කියා දමන්නට මට සිතිණි. නමුදු එය මගේ සිතෙහි අරක් ගත් සැකයකි. ඔප්පු කරන්නට සාක්ෂි හෝ කරුණු කාරණා ඒ සඳහා නොවන තරම්ය.

කියන්නට ඇත්තේ අනූෂ වරක් පැමිණ සමන්දිනී විවාහ කර නොගන්නා ලෙස මට කළ ඉල්ලීමත්, මා ඔහුගේ දරුවාට මවක් නැති කළායැයි බිමතින් ඔහු කළ චෝදනාවත් පමණි.

නැවතිල්ලේ සිතද්දී ඒ කිසිවකට සමන්දිනී සම්බන්ධ නොවේ. මා ඇය කසාද නොබඳින්නට ගත් තීරණය හරියට එක් පාර්ශවයක් පමණක් කැඳවා ගත් නඩු තීන්දුවක් වැන්න.

මා නිසා සමන්දිනීගේ ජීවිතය විනාශ වී ගියායැයි මුල්වරට මට සිතිණි.

පසුතැවිල්ල කළකිරීම වඩ වඩාත් මසිතට එළඹෙද්දී සමන්දිනී කෙරෙහි වූ හිතේ අඳුරු කෙමෙන්... කෙමෙන්... තුරුල් වන සෙයක් මට දැනුණි.

අඩ පැයකට වඩා සාලයේ හුදෙකලාව උන් මම සාලයෙන් නික්ම ගෙයින් දොරට බැස්සේ උහුලා ගත නොහැකි පශ්චාත්තාපයකිනි. සතුටින් කෙළවර වන්නට තිබූ කතාන්දරයක් දුක්බර අවසානයක් දක්වා ආවේ මගේ සිතිවිලිවල වරදකිනැයි මට සිතිණි. මම හැඟීම, දැනීම් නැත්තෙකු සේ කාර්යාලයට රිය පැදවීමි.

වාහනය පිවිසුමේ ගාල් කළ මම යතුර ආරක්ෂක නිලධාරියාට දී කාර්යාල කාමරයට වැද දොර වසා ගතිමි. අසුනේ දිගෑදී සුව පහසු හුස්මක් ගන්නට මත්තෙන් කාමරයට තට්ටු කරන හඬ මට ඇසිණි. එන්නට එපායැයි කෑ ගසා කියන්නට මට උවමනා විද ඊට දිරියක් හෝ නොඉක්මුණුකමක් මා තුළ නොවීය.

ඊළඟ තත්පරයේ චතුරංගී කාමරයට ගොඩ විය.



"සර්ට ආපු ගමන් චෙයාමන්ට කෝල් කරන්න කිව්වා."

මම පෙරලා කිසිවක් නොකියාම ඈ දෙස බලා උන්නෙමි. සිහින් දේහධාරී ඕ කර වැඩිපුර කැපූ බලවුසයට, වියත් දෙකක් පමණ දිග සායක් හැඳ උන්නාය.

"පොඩ්ඩක් ඉන්න."

ඇය පැත්තට හැරෙද්දී මා එසේ කීවේ රාජකාරි කරුණක් අරභයා නොවේ. ඕ ආයේ හැරී තවත් පෙරට විත් සිට ගත්තාය. මම කල්පුව කිලුණුව ඇගේ අඟ පසඟ දෙස බලා උන්නෙමි. ඇය ද කෙමෙන් බියපත් වන බැල්මෙන් මදෙස බලා උන්නාය.

"ඇයි සර්...?"

"මුකුත් නෑ."

එවර ඕ හැරී කාමරයෙන් නිකම ගියේ මගේ බැල්ම දරාගත නොහැකි තැනාය.

දිනක් දෙදිනක් හැල හොල්මනකින් තොරව ගෙවී ගියේය. සමන්දිනී හමුවන්නට මා තුළ වූ උනන්දුව වඩ වඩාත් තීව්‍ර විය. සතියක් ඉකුත් වී ද දරුවා රෝහලින් නිදහස් කොට නොතිබිණි.

මා ඒ බැව් සැක හැර දැනගත්තේ රෝහලට යන එන තැන්දාත්, අනූෂත් දකිමෙනි. මා ඔවුන් දුටුවේ අහම්බෙන් නොවේ. සමන්දිනී තවදුරටත් හිඳින්නේද දැන ගැනීමට තැන්දාත්, අනූෂාත් යන එන බැව් නිරීක්ෂණය කළෙමි.

එක් සවස් වරුවක සමන්දිනී ඇස් වාට්ටුවෙන් බැස සෙනඟ අතරින් පාර මාරු වනු මම දිටිමි. මගේ සිතිවිලි දැඩි ලෙස ව්‍යාකූල විය. සිතෙහි තෙරපවා හුන් සියලු හැඟීම් පුපුරා ගිය බවක් මට දැනිණි. මම මෝටර් රිය මඟ අයිනක නතර කර ගද්දීත් සමන්දිනී ඇස් මානයෙන් දුරස්ව හුන්නාය. දරුවා ළඟ නැන්දා තබා ඇය ඥාති නිවසේ සිට එන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

මාගේ සිතිවිල්ල නිවැරදි නම් දැන් දරුවා ළඟ නතර වන්නේ සමන්දිනීය. පෙරළා ගෙදර යන්නේ ඇගේ නැන්දාය. ඇය හා කතා කරන්නට නොහැකි වීම පිළිබඳව ශෝකයක් පසුතැවිල්ලක් මසිතට

වද දෙමින් තිබිණි. අනෙක් අතට ඇය හමුවීමෙ පරමාර්ථය කුමක්දැයි මම යටි සිතින් අනේක වාරයක් ප්‍රශ්න කළෙමි. ඇය හා කතා කරන්නට නොහැකිවීම හොඳ යැයි මම සිත රවටා ගතිමි.

නමුදු ඇය හෝ නැන්දනිය හෝ රෝහලින් පිටතට එනතෙක් පැයකට වැඩි කාලයක් මම රථයට වී ගෙවා දැමීමි. අනතුරුව ඇගේ නැන්දා පළමු වරට මට හමු වූ බස් නැවතුමට ගොස් මම රථය ගාල් කර ගතිමි. අඩ පැයක් පමණ ගත වන විට නින්දක් මගේ නෙතටත්, සිතටත් වද දෙමින් තිබිණි. යාන්තමට මගේ ඇස් පියවෙමින් එද්දී උස් තැනකින් වැටෙන්නට යන්නාක් බඳු හැඟීමකින් මම අවදි වීමි. එය හරියට දේව හාස්කමක් බඳුය.

මා අවදි වූයේ සමන්දිනී පාර මාරු වෙමින් හුන් ඇසිල්ලේය. නිල් පාට මල් වැටුණු සුදු දිගු ගවුමක් හැඳ හුන් ඕ තනි කොණ්ඩ කරලක් ගොතා හුන්නාය.

මහත පටි කරබෑගයක් පැළඳි ඇගේ දෙපයේ සිහින් පටි සහිත සෙරෙප්පු යුවළකි. තාත්තාගේ වන්දි මුදල ගන්නට කාර්යාලයට ආ පළමු දිනයේ ඈ වෙතින් දිස් වූ සරල සැහැල්ලු බව තවදුරටත් ඈ ළඟ වේ. සොඳුරුකම වෙනදාටත් වඩා වැඩි කමක් ඇතැයි මට සිතිණි.

ලෝභකමක්, ඊර්ෂ්‍යාවක් වැනි හැඟීම අකුණු සැරක් මගේ හදවතේ ඉපිද සිරුර පුරා දිව ගියේ විදුලි සැර ගලා යන්නාක් මෙනි. මම මිනිත්තුවට වැඩි කාලයක් ඉහළට ගත් හුස්ම පහළට නොහෙළා ඈ දෙස බලා උන්නෙමි.

මා පියවි සිහියට පත්වූයේ සමන්දිනී බසයකට අත පාද්දීය. වාසනාවට බසය වේගය බාල කළා පමණි. පිරිමින් කිහිපදෙනකු යමින් සිටි බසයට ගොඩවීය. පිරිමින් වැනි ගැහැනුන් කිහිපදෙනෙකු ද එසේ කළෝය. සමන්දිනී නොරිස්සුමෙන් මෙන් පිටුවා යන බසය දෙස බලා උන්නා පමණි.

ඊළඟට ගත යුතු ආසන්නතම පියවර කුමක්දැයි සිතා ගත නොහැකි මම රියෙන් බැස කඩයකට ගොඩ වූයේ සමන්දිනීට පෙනෙන පරිදිය. දුම් නොබොන මම සිගරට් පැකට්ටුවක් මිල දී ගත්තේ මගේ කඩා වැටීම ඇයට හඟවන්නටය. අනතුරුව දුම්වැටියක් දල්වා ගත්



මම එය ඇයට හොඳින් පෙනෙන පරිද්දෙන් ප්‍රදර්ශනය කරමින් මෝටර් රියට ගමන් කළෙමි.

"මහත්මයා ගින්දර ටිකක් දෙනවද...?"

මා ඉදිරියට විත් නතර වූයේ කිළිටි වී ගිය ඇඳුමින් යුතු සෙම කෙළ පෙරා ගත් උන්මත්තක මිනිසෙකි. ඔහු අත බීඩියක් විය. දුම්වැටිය ඔහු වෙත දෙනවා ද යන්න තීරණය කිරීමට මට තවත් තත්පර කිහිපයක් ගත විය. සිදුවීම සමන්දිනී දුටුවා ද යන ලැජ්ජාව ඒ තත්පර කිහිපය මා සිතට මහත් සේ වදයක් විණි.

එය සැක හැර දැන ගන්නට මම යාන්තමට ඇස් හරවා සමන්දිනී දෙස බැලීමි. සමන්දිනී ඒ මා ද, වෙන කෙනෙකු ද යන්න සැක හැර දැන ගන්නට මෙන් මදෙස බලා උන්නාය. ඉන් එහා කටයුතු සිදු වූයේ මා සිතාමතා සැලසුම් කළ පරිදි නොවේ. මා ඇය අහම්බෙන් දුටු පරිද්දෙන් ඈ දෙස ආගන්තුකව බැලීමි. කෙළවර සිගරට් පැකට්ටුව රහසේ සාක්කුවට රුවා ගත්තේ ද ඇයට පෙනෙන පරිද්දෙනි.

"මහත්තයා ගින්දර පොඩ්ඩක් දෙනවද...?"

මා ඉදිරියේ වන උමතු මිනිසා පිළිබඳව මට අමුතුවෙන් සිහිවූයේ එවිලේය. මම ලැජ්ජාවත් නොසන්සුන්කමත් මැඩ සිගරට්ටුව යාචකයාට දී සමන්දිනී වෙතට ගියෙමි. ඕ මා හඳුනාගත් සෙයින් සිනාසුණේ අප අතර කිසිදු මතභේදයක් හට නොගත් සෙයිණි.

"මං එකපාරටම අඳුන ගත්තේ නෑ... ඒකයි ටිකක් බලන් හිටියෙ"

සමන්දිනීගේ කටහඬෙහි වූයේ ආගන්තුක බවකි.

"ආ... මහත්තයා..."

බීඩිය දල්වා ගත් උමතු මිනිසා මට සිගරට්ටුව දිගු කරගන්වනම බලා උන්නේය. පොළොව පළාගෙන ගොස් සැඟවෙන්නට තරමේ ලැජ්ජාවක් මසිතේ පිළිසිඳිණි.

"එපා..."

මා කීවා නොව මට එසේ කියවිණි.

"කමක් නෑ. මහත්තයා බොන්න මං සිගරට් බොන්නෑ. බීඩිය මගේ නෙවෙයි ඔවා බීලා පුරුද්දට ගියොත් ඉහ ගහන්ට බෑ."

සමන්දිනී යාචකයා දෙසත් මදෙසත් බලා උන්නේ එකම බැල්මකිනි.

"ඕක විසික්කරලා දානවා."

"ඒකට මට හිත දෙන්නෑ මහත්තයා. මොනවා උනත් සල්ලිනෙ. මහත්තයම අරන් විසික්කරලා දාන්න."

මම ඔහු අතින් සිගරට්ටුව ගෙන බිමට අතහැර දැමුවේ වෙන කරන්නට කිසිවක් ඉතිරි වී නැති තැනය. උමතු මිනිසා ඉන් අහවර අමුතු සිනහවක් පා යන්නට ගියේය.

"පිස්සෙක්."

මම කෝපයත් අවඥාවත් පළ කළෙමි.

"ඒ වගේ නේද...?"

සමන්දිනී කීවේ ඕනෑවට එපාවට මෙනි.

"ඔයා ඉස්සර සිගරට් බිව්වෙ නැහැනේ."

ඒ අතර සමන්දිනී ඇසුවේ හදිස්සියේ යමක් මෙනෙහි වූ සෙයියාවෙනි.

"නෑ."

"ඕක තේරුමක් නැති පුරුද්දක්නෙ."

මා සිනාසුණා මිස පෙරලා කිසිත් නොකීමි.

"අනිත්තෙක මිනිස්සු මුලින් කරලා අතාරින පුරුදු.... ඔයා මුලින් නොකර පස්සෙ කරන්න පටන් අරන්."

ඇය අරඹයා මගේ ජීවිතය කාලකණ්ණි වී ඇතැයි හඟවන්නට මා තුළ තිබූ උවමනාව විකසිත වෙමින් තිබිණි.

"නැන්දා කිව්වා ඔයාව හම්බුණා කියලා."

ඊළඟ තත්පරයේ ඒ කතාව ඕ වෙනතකට හැරවූයේ මසිතේ ශෝකයක් ජනිත කරවමිනි. මගේ ජීවිතය කාලකණ්ණි වීම ඇයට බල නොපාන කරුණකැයි ඇය ව්‍යංගයෙන් මට කීවා වැන්න.



"ඔයා මෙහෙන් කොහෙද යන්නෙ."

"අපේ අලුත් ඔෆිස් එකක් දාලා තියෙනවා ඔය ඉස්සරහා."

මම ඇය දකින්නට ලැබෙන තෙක් මග රැක උන් වගක් සඟවා බොරුවක් කීමි.

"ඉස්සර තිබුණේ නැහැනෙ."

"නෑ.... මේ ළඟදී දැම්මෙ."

"ඔයාට පරක්කු වෙයි."

"එහෙමට හදිස්සියක් නෑ සමන්දිනී."

ඉන් එහා තත්පරයක් දෙකක් අප අතර මුනිවතක් ඉතිරිණි.

"අම්මලා මැණිකෙලා... සනීපෙන් ඉන්නවද තිවංක."

"වරදක් නෑ... දූත් දරුවට කොහොමද...?"

මා එය ඇසුවේ සමන්දිනී අම්මාත්, මැණිකාත් සිහිකළ නිසාවෙන් හටගත් මතක්වීමෙනි.

එසේ නොවන්නට දරුවා පිළිබඳ අබමල් රේණුවක වත් මතකයක් මට වූයේ නැත.

"වෙනසක් නෑ තිවංක. තව ටෙස්ට් එකක් කරනකම් මුකුත් කියන්න බැරිලු..."

සමන්දිනී කිව්වෙ අඳුරුව යන මුහුණෙනි. දරුවා පිළිබඳව කණ්ගාටු වෙනවා වෙනුවට, සමන්දිනී එම දරුවා පිළිබඳව මෙතරම් කණගාටු වන්නට හේතු යටි සිතෙන් විමසන්නට තරම් මගේ සිහිවිලි තරුම වී තිබිණි.

සමන්දිනී කතා කළේ යනෙන බස් රථ දෙස මහත් ඕනෑකමින් බලමිනි. මගේ හමුවීමෙන් ඇය කිසිදු විශේෂිත උද්දාමයකට හෝ තිගැස්මකට පත්ව නොඋන්නාය. මම වඩාත් සිත රිදවා ගත්තේ ඒ සම්බන්ධයෙනි.

"මං යන්නෙත් ඒ පැත්තට... යං මං සමන්දිනීව ඇරලවන්නම්."

"තේරුමක් නෑ නිවංක... මට එක බස් එකනෙ. ඇරත් අද සතියෙ දවසක්නෙ. ඔයාට අප්‍රමාණ වැඩ ඇති..."

"එහෙමට වැඩක් නෑ සමන්දිනී... යං... මට පහට ඔෆිස් එකේ හිටියම හොඳටම ඇති."

මම මෝටර් රිය වෙතට යන්නට සූදානම් වෙමින් කතා කළෙමි.

"බොරු වැඩක් නිවංක මට ඔය එන බස් එකේ යනෑකි. අපරාදෙනෙ ඔයාගෙ කාලේ..."

සමන්දිනී කීවේ ඈත රථ පෙළ දෙස පයෙහි ඇඟිලි මතින් ඉස්සී බලමිනි.

"මං යන්නෙ ඒ පැත්තට සමන්දිනී. ඇයි බොරුවට අදිමදි කරන්නේ...?"

අයිතියක් නැතත් මා තුළ සියුම් කෝපයක් හට ගෙන තිබිණි.

"කමක් නෑ නිවංක මං මෙ බස් එකේ යන්නම්."

බසයක් නැවතුමට සේන්දු වූයේත් සමන්දිනී ඒ වෙතට ගියේත් ඇසිපිය සලන වේගයෙනි. කුමක්, කෙසේ කළයුතු දැයි සිතා ගත නොහැකි මම අන්දමන්දව බලා උන්නෙමි.

"අම්මලව මතක් කළා කියන්න."

සමන්දිනී බසයට නඟින්නට යන අවසන් තත්පරයේ හැරී බලා කතා කළාය. ඉන් අනතුරු ඇය සෙනඟ අතරින් නොපෙනී ගියාය.

දෙනෝදාහක් ගැහැනු පිරිමි අතර ඇය සොයා දැක ගන්නට මගේ ඇස් දුක් වින්දේය. බසය පෙරට ඇදිණි. තත්පරයෙන්, තත්පරය එය ඈතට ඇදී ගියේය.

බස් රිය නොපෙනී ගිය පසු සත්තක සියලු දේ නැත්තටම නැති කර ගත්තෙකුගේ සිතිවිලි මසිතේ සෑම සියුම් ලේ නහරයකටම විංගා ගත්තාක් මෙනි.

මම සෙමින් සෙමින් මෝටර් රිය වෙත ගොස් රියදුරු අසුනට කඩා වැටිණි. මසිතේ වන වැරැදිකාරී සිතිවිලි නිසාවෙන් මා සමන්දිනී අහිමි කරගත්තාය යන පසුතැවිල්ල මට තදින් දැනිණි



වර්තමානය දැනෙන්නේ අහිමිවී යද්දීය යන සිද්ධාන්තය මට ප්‍රායෝගික වූවා මෙන් ය.

සමන්දිනී රැගෙන නික්ම ගිය බස් රිය වීදියෙහි නොවිණි. මේ වන විට එය නැවතුමෙන් සැතපුම් තුන හතරක් වත් දුර ගෙවා අවසන් වන්නට ඇත.

නමුදු මට වෙනත් මඟකින් අරංගල හන්දියට යන්නට ගත වන්නේ අඩ පැයකි. දුර ගෙවා යන බස් රියට එසේ කළ නොහැකිය. සමන්දිනී බසින්නේත් ඇගේ නැන්දා බැසී නැවතුමෙන්ම වන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

ආත්ම ගෞරවය හෝ ආත්ම අභිමානය පිළිබඳ අබ මල් රේණුවක තරම්වත් හැඟීමක් නොවුණු මම හැකි උපරිම වේගයෙන් වෙනත් මඟකින් අදාළ තැනට පැමිණියෙමි.

නැවතුම එක එල්ලේ පෙනෙන තැනක මෝටර් රිය නතර කළ මම සමන්දිනී ආ බසය නැවතුමට සේන්දුවන තෙක් බලා සිටියෙමි. බස් රියෙහි මතුපිට වෙනස්කම් පිළිබඳව මා තුළ දැඩි නිනව්වක් නොවීය. නැවතුමට සේන්දුවන සෑම බසයක් පිළිබඳවම ඇස් වැද වූයේ ඒ නිසාවෙනි.

පැයක් හෝ දෙකක් ගෙවිණි. ආ එකම බසයකින්වත් සමන්දිනී බැස්සේ නැත.

සියල්ලත්ම අතහැර දමන ලද රැලකින් තනි වූ මුව පොව්වකු මෙන් මසිත ගැහෙන්නට ගත්තේය. බියක් අසරණකමක් වැනි හැඟීමක් මසිතට තදින් වැද දිණි. බස් නැවතුම්පල අඩ අඳුරෙන් වෙළී යද්දී ඇය මට මඟ හැරුණා යැයි අකැමැත්තෙන් හෝ සිතන්නට මට සිදු විණි.

හෙට උදෑසන ඇය මුණ ගැහෙන්නට නම් පාන්දර හතරයි තිහේ සිටවත් මා මෙහි මඟ රැක සිටිය යුතුයි. රෝහීන් පෙන්වන්නේ හයත් හතත් අතරය. හයට මහ ඉස්පිරිතාලේ ගේට්ටුව ගාවට යන්නට මෙතැනින් පහටවත් බසයට නැඟිය යුතුය. ඇය මුණ ගැහෙන්නට නම් හතර හමාරටවත් මෙහි ඒම ප්‍රමාණවත්ය.

එසේ ඇවිත් ආවේ කුමකටදැයි කියන්නේ කෙසේද?

මම හඬා වැටෙන සිතින් මෝටර් රිය හරවා ගතිමි.

ගෙදරට එන්නට පෙර පාන්දර ඇය සොයා යන්නට කාරණාවක් සොයා ගන්නට මට හැකි විය. ඒ දරුවාගේ අසනීපය සම්බන්ධයෙන් වියදමට මුදල් ටිකක් දීමේ උවමනාවෙන්.

මා ගෙදර එද්දී ගුණසිරි ලිපිගොනුවක් රැගෙන ගෙදර විත් තිබිණි. දවසේ රාජකාරි කෙතරම් මට අතපසු වී ඇද්ද යන්න මෙනෙහි වූයේ එවෙලේය.

''මොකෝ ගුණසිරි....?''

මා ටයිපිටිය බුරුල් කරමින් ගුණසිරි අසල අසුනකට බර වීමි.

''මෙ ෆයිල් ටිකට වෙයාමන් සර් ඇපෲවල් එක අරන් එන්න කිව්වා සර්...''

ගුණසිරිගේ පැමිණීම මාගේ නුරුස්නාවට හේතු වී තිබිණි.

''ඔවා චෙක් කරපුරවද...?''

මා ප්‍රශ්න කිරීමෙන් පළ කළේ ඒ නොරිස්සුම වන්නට ඇත.

''ඒක නම් හරියටම කියන්න දන් නෑ සර්.''

''ඒක හරියටම දන් නෑ කියන්නෙ තමුසෙ මේවා උස්සන් එන්න ඉස්සෙල්ලා ඒවා බලන්න එපැයි අයිසේ...''

''වෙයාමන් සර් දුන්න හින්දා ආරන් අවට අගක් මුලක් නම් බැලුවේ නෑ සර්.''

''තමුසෙලා බූරුවො වගේ වැඩ කරාම අපිනෙ අයිසෙ අමාරුවෙ වැටෙන්නෙ ගන්නවා ඔක බලන්න.''

ගුණසිරි දෝතින්ම ලිපි ගොනුව මා අත තබා පසෙකට වී සිට ගත්තේය.

ඒ අතරම වාගේ අම්මා ආලින්දයට ආවේ කෝපයෙනි. අපේ කතාබහට ඇ කන් දී හුන් වගක් මා දැන ගත්තේ එවේලේ ය.

''මෙ අසරණ මිනිහා හතරෙ ඉඳලා මෙහෙ... ඔච්චා චැක් කොරන එක උඹ ඔෆීසියෙ හිටිය නම් කරන්න තිබුණානේ... ඇත්තටම උඹ රස්සාවට නොයා කොහෙද යන්නේ...?''

අම්මා ආලින්දයට කඩා වැදීමෙන් මගේ මානය බිඳිණි.

''නෑ මැණිකෙ මේ...''

ගුණසිරි තතනුවේ මා ගලවා ගනු පිණිස යමක් කියන්නටය.

''අම්මට මොනවද අම්මේ මේ රාජකාරි ගැන තේරෙන්නේ...''

මම ඔහුට පෙරාතුව අම්මාට සැරවීමි.

''හරි මං ඔය රාජකාරි දන් නෑ කියමුකෝ.''

අම්මා කතා කරමින්ම අසුනක් ඇද හිඳ ගත්තාය. එකවෙක කියන්නට ගොස් නවත් කතාව දිග් ගස්සා ගැනීම පිළිබඳව මා තුළ පසුතැවිල්ලක් හටගෙන තිබිණි.

''උඹ මේ රස්සාවට නොයා කොහෙද යන්නේ කියපං. මට ඒක දැනගන්න අයිතියක් තියෙනවනේ.''

''මං ගියේ රාජකාරි වැඩකට.''

''ඒක චෙන්ඩැති ඔෆීසියෙන් උඹව මෙහෙට හොයාගෙන එන්න ඇත්තේ.''

''නෑ මැණිකෙ මේ...''

ගුණසිරි නවත් වතාවක් මා බේරාගන්නට නිරර්ථක උත්සාහයක යෙදිණි.

''අනේ මේ තමුසෙ කට වහගෙන ඉන්නවා...''

අම්මා ගුණසිරිට වචනවලින් දමා ගසා ගෙට ගියාය. ගුණසිරි මන්දස්මිතියක් මවා ගත්තේ අබ මල් රේණුවක තරම්වත් හිතේ කහටකින් තොවන බව විශ්වාසය. අම්මාගේ ඇනුම් බැනුම් ඔහුට ආදරණීය තරවටුය.

මම ගුණසිරි රැගෙන ආ ලිපි ගොනුවට අනුමැතිය දුන්නේ කිසිදු පිරික්සීමකින් තොරවය. අයථා එක ලිපි ගොනුවක් ඒ අතර වූයේ නම් රස්සාව නැතිවන්නට හෝ හිරේ යන්නට තොරතේ නම් ඒ දෙකම වන්නට ඉඩ තිබේ යැයි දැන දැනත් මම ඒ නොසැලකිලිමත් කටයුත්ත කළෙමි.

"කෝකටත් චතුරානි මිස්ලගෙ ගෙදරටත් ගිහින් චෙක් කරන් යන්න ද සර්...?"

මම කළ කාර්යයෙහි අවදානම වටහාගත් නිසාදෝ ගුණසිරි කීවේ සියුම් පසුතැවිල්ලකිනි.

"මෙතැනින් ගිහින් ඕන කෙහෙල්මලක් කර ගන්නවා අයිසෙ..."

මම කෝපය පළ කළෙමි. ගුණසිරි ලිපිගොනුව ගෙන යන්නට ගියේය. දින හත අටකින්වත් පිරික්සා හමාර කළ නොහැකි එම ලිපිගොනුව රැයකින් පිරික්සන්නේ කෙසේද? එවැනි ලිපිගොනුවක් සභාපති හදිසියේ මට ඒවා අනුමැතිය ගත්තේ ඇයි...?

සතියකින් පමණ මා එකම ලිපියක් හෝ අනුමත නොකළ වගක් මට මතකය. ඒ නිසා ලිපි ගොඩ ගැසෙන්නට ඇතැයි අනුමාන කොට මම හිත හදා ගතිමි. ඒ සා වේගයෙන් ඒ පිළිබඳව මට හිත හදාගන්නට හැකි වූයේ සමන්දිනී පිළිබඳ හටගත් චිත්තවේගය ප්‍රබල වූ නිසාය.

සමන්දිනී හමුවීම, ඈ මා ආගන්තුකයෙකු කොට සැලකීම සේම ඇය මගහැරීමද මට රැයක් පුරා සිතන්නට කාරණා විය. අම්මා කෙතරම් නොහොඳ නොක්කාඩු පළ කළද ඒවා මසිතට බලපෑමක් නොකළේද එනිසා විය යුතුය.

මදක් නින්දෙත්, මදක් අඩ නින්දේත්, තවත් ටිකක් නොනින්දේත් ගත කළ මම හිමිදිරි තුනට නා කියා හමාරව මැණිකා තුද්දා තේ එකක්ද වත්කර ගතිමි.

"සුදු මහත්තයා මෙච්චර පාන්දර කොහෙ යන්නද...?"

"රාජකාරි වැඩක් මැණිකා."

මැණිකාගේ ප්‍රශ්නවලට මා උත්තර දුන්නේ ඒ සියල්ලම අම්මාගේ ද හිතට නැඟෙන ගැටලු වන නිසාය.

"මේ පාන්දර...?"

"ටිකක් දුර ගමනක් යන්නෙ... ඕන කරන තැනට යද්දි හත අට වෙනවා."



අම්මාගේ ගෝරනාඩුව පාරට ඇසෙන තරම්ය.

"මගේ කන් ඇහෙනවා අම්මා."

"තොගෙ කන් ඇහුනට... ඇස් පේන්නෑ තොන් වස්සා."

මා ආලින්දයෙන් යන්නට නොගියේ ඇගෙන් ගැලවෙන්න එම ප්‍රයෝගයෙන් ඵලක් නොවන නිසාය. කෝපයට පත් වූ පසුව ඵලව ඵලවා පහරදීම ඇගේ සිරිතයි.

"ගුල් ගෙයක් කල් දාන්නෙ ඉලව් ගෙයක් ගින්දා විතරයි බූරුවො... එහෙව් එකේ ඔය යෝජනාව යට තියෙන උප්පරවැට්ටිය මොට නොතේරුණාට මට තේරෙනවා..."

කෝපයෙන් කෑ ගසමින් උන් අම්මා වේගයෙන් හුස්ම ඉහළ පහළ හෙලමින් තත්පර කිහිපයක් ගෙවා දැම්මාය.

"ඔය කෙල්ලගෙයි... අර ගෑනි මැරිච්ච මිනිහගෙයි අතර මොකක් හරි පලගිලව්වක් තියෙනවා... එහෙම නැත්නම් තිබුණා... ඌගෙ තර්ජන ගර්ජනවලට බයේ තමයි මෙකී මේ ඇකිලෙන්නෙ."

මගෙ හදගැස්ම නතර විණි. ගලින් ගල, බිඳෙන් බිඳ කැඩූ, මැලිකාවක් ඇස් මත්තේම කඩා වැටුණු දුක මගේ පපු කුහරයට රිංගා ගත්තේය.

කිසිවක් නොදත් අම්මාට එවැනි ඉවක් වැටුණා නම් තවත් සාක්ෂි කුමට ද...?

"ඇයි අම්මා එහෙම කියන්නෙ...?" වැනි ප්‍රශ්නයක් අසන්නට දිරියක් මා තුළ නොවුණ ද සිත දුර්වල වූ නිසදෝ මට එය ඇසිණි.

"ඔහොම කෙල්ලකුයි... ගෑනි මැරිච්ච තරුණ මිනිහෙකුයි එක වහලක් යට ජීවත් වෙත් දි ඔහොම පලගිලව් හැදෙනවා බං..."

මගේ සිත කෑ ගසා හඬා වැටෙනු මට දැනිණි. දෙවූ අම්මා හදිසියේම මුනිවත රැකීම මට වදයක් විය. සමන්දිනීගේ රුවත්, ඇගේ අහිංසක වත්පිළිවෙතුත් ඇය එවැනි එකියකැයි මට වටහා දෙන්නේම නැත.

"හැබැයි ඉතින් ඒ කෙල්ල දිහා බැලුවම නම්... එහෙම එකක් පේන් නෑ... තමයි..."

තත්පර කිහිපයක් මුනිවතින් උන් අම්මා අවසන කිවේ එක්කෝ මගේ හිත හදන්නටය. නොඑසේනම් අනියත සැකයක් උපන්නාට ඇයට සමන්දිනී පිළිබඳ විශ්වාසයක් තිබෙන්නට ඇත.

නමුත් මා කරුණු කාරණා දැන ගොඩ නගා ගත් සැකය ඇය කිසිවක් නොදැන ගොඩ නගා ගැනීම පිළිබඳ මා තුළ වූයේ ප්‍රබල හැඟීමකි.

ඒ හැඟීම මගේ හදවතේ හැම සියුම් නහරයක්ම රිදවමින් ගලා යමින් තිබිණි.

හැල හොල්මනක් නැතුව දවස් ගෙවිණි. රැයක් කල්පයක් බඳු විය. දහවල දශකයක් බඳු විය. ජීවිතය ගමන් කලේ ඉබි ගමනිනි. වේගයෙන් සිදු වූ එකම දෙය වයසට යාම පමණි. සතියක් තුළ සත් වසරකින් මා වියපත් වූවාක් වැන්න.

සමන්දිනී මද සුළඟක් සේ ජීවිතයට එබිකම් කොට චණ්ඩ මාරුතයක් සේ ජීවිතය හැඩි කොට දමා ගිය ගානය. දවසකට වතාවක් හෝ දෙවතාවක් දුරකතනයෙන් ඈ කතා කිරීමද නිකමම නිකම් ඇයි හොඳයියක් ගානය. අපේ විවාහය හෝ ඇගේ විභාගය පිළිබඳව අප කතා නොකළ ගානය.

ඇය හමුවීමෙන් ජීවිතයට බලාපොරොත්තු එක් විණි. ඇය සම්පූර්ණයෙන්ම අහිමි වී නොගියද ඇගේ ඇසුරින් බලාපොරොත්තු කඩවීමේ වේදනාව මම අත්විඳිමි. දැන් මා අවදි වන්නේ ළසොවිනි. නින්දට යන්නේ ද ළසොවිනි. නින්දේදී ද පපුව මත බරක් පැටවූ කලෙක වාගේ අපහසුතාවයක් මට දැනිණි.

අධික තනිකමක් ද ජීවත්වීම පිළිබඳ බියක් ද හට ගත්තෙන් තාත්තාගේ සාලයේ වූ පින්තූරය මම කාමරයේ නිදි යහනට පෙනෙන තැනක එල්ලා ගතිමි. සෙත් පිරිතක් වාගේ සිතෙහි වූ බිය තුරන් විණි.

තාත්තා අදෘශ්‍යමාන බලවේගයක්ව ගැවසෙමින් මා ආරක්ෂා කරතැයි යන විශ්වාසය දැඩිව සිත් පත්ල සිප ගෙන තිබිණි. එය පුංචි සන්දියේ හිඳම මා සිතට කිමිදුණ හැඟීමකි.

අම්මාගේත්, තාත්තාගේත් තුරුලෙන් මිදී තනිව නිදා ගන්නට පුරුදු වූ දා පටන් මා නිදා ගත්තේ තාත්තාගේ සරමක් පොරවාගෙනය.



ඒ සරම කිලිටි එකක් වී නම් මට බියක් දැනෙන්නේම නැත. විශ්වාසය විසින් දෙවියන් මවන්නේ මෙසේම වන්නට ඇතැයි මට සිතිණි.

යමක් නොතේරී හිඳීම තේරුම් ගෙන වද විඳිනවාට වඩා හොඳය. මගේ පුංචි සන්දියත් අද දවසත් අතර ඇති වෙනස එයයි. පිහිවිලි කෙළවර වන්නේ තාත්තා හිටියානම් යන හැඟීමේ පිහිටාය. එකෙනකට ඔක්කෝ ගසාගෙන හදා පියා ඔහු මට කර ඇත්තේ වරදකි.

ගහක් ගලක් වාගේ මට හැදෙන්නට දුන්නා නම් මේ දුක්ඛ දෝමනස්සයන්ට පර්වතයක් වාගේ මුහුණ දෙන්නට තිබිණි. තාත්තා යන විට, දී ගිය දයානුකම්පාවෙන් පිරී ගිය හිතේ හොඳ නරක දෙකම මම අත්විඳිමින් හිඳිමි. සමන්දිනීගේ ගැටලුවේදී මා දුකට පත්වූයේ සිතේ වන දුබලතාව නිසා යැයි දැන් මම දනිමි.

කාර්යාලයෙන් ගෙදරට, ගෙදරින් කාර්යාලයට ද ගෙවෙන ජීවිතය මට දැඩි සේ නීරස විය. අම්මා ආයේම මනමාලියක් සෙවීමේ මෙහෙයුම දියත් කළ ද මම වචනයකින් හෝ ඊට ප්‍රතිචාර නොදැක්වීමි.

ඒ වෙනුවට මගෙන් ඒ අරඹයා ප්‍රකට වූයේ කෝපයමය. කෙමෙන් කෙමෙන් අම්මාත්, මාත් අතර වූ කතාබහ පවා නතරවන තරමට මගේ නොරිස්සුම තියුණු වී තිබිණි.

"වෙයන්ගොඩ පැත්තේ ගෑනු ළමයෙක්ගෙ මඟුල් ඔත්තුවක් ඇවිල්ලා... දෙමව්පියොත් හොඳයි. අයියත් දොස්තර කෙනෙක්ලු..."

මා උන්නේ කාර්යාලයට යාමට සූදානම් වෙමිනි. උත්තර දෙනවා වෙනුවට මම හඳින පළඳින වේගය වැඩි කළෙමි.

"කෙල්ලත් ලස්සනයිලු... යාන්තම් අවුරුදු විසිහය පිරුණා විතරයිලු..."

මාගේ උත්තර නොදීම අම්මාට ප්‍රශ්නයක් වී නොතිබිණි.

"අවුරුදු විසි හය කියන්නෙ ඔය අනම් මනම් හුටපටවලට පැටලෙන්න කාලෙකුත් නෙවේනේ..."

මම ටයි පටිය ගෙන බ්‍රීෆ්කේසයට දමා ගත්තේ එය පළඳින්නට ගතවෙන කාලය ද මට වදයක් වන නිසාය.

"ලබන සතියෙ අඟහරුවාදා ඒ ළමයව බලන්න යන්න දා ගන්න එක උඹට වදයක් ද...?"

"ඔව්..."

මා කීව නොව මට කෑ ගැසිණි.

"එක ගෑනියෙකුට වචනයක් දීලා තව ගෑනු පාරේ යන එක මට වදයක්..."

"කවුද උඹට ගෑනු පාරේ යන්න කතා කරේ..."

අම්මා මගේ කට හඬ පරයා යන්නට කතා කළාය. මැණිකා ද ගෙයි දොරකඩින් මතුව බලා උන්නාය.

"මෙකත් ඒ වගේ වැඩක් තමයි අම්මේ..."

"උඹ කොහේවත් ඉන්න තේ උඩිච්චියෙක්ව ලොකු කරන් ඇඟලුවාට මට ඒක කරන්න බෑ පුතේ... මං මැරෙන්න ඉස්සෙල්ලා උඹව පිළිවෙලක් කරන්නොත්න... නැත්නම් මගේ වලටත් හෙණ ගහයි."

අම්මාගේ කටහඬ යාන්තමට හැඬුම්බර වෙමින් තිබිණි.

"මට මගේ පාඩුවෙ ඉන්න දෙන්න අම්මේ..."

"හරි තැනක් බලලා කසාදයක් බැඳගනින්. ඊට පස්සෙ මං උඹට පාඩුවෙ ඉන්න දීලා සදහටම ඇස් දෙක පියාගන්නම්."

"අර කෙල්ල කසාදෙ පරක්කු කරේ විභාගයක් හින්දා අම්මෙ. ඇයි පවු විදියට හිතන්නේ...?"

"පවු විදියට හිතන්නෙ බොට මොළේ නැති හින්දා. එයා පාස් කොරලා තියෙන විභාග මොනවද කියන්න බොට වඩා හොඳට දන් මං දන්නවා."

"අහිංසක කෙල්ලන්ට කතා හදන්නෙපා අම්මේ..."

"එයාගෙ අහිංසකකම එයා තියාගෙන හිටපු විදියට හිටපුවාවේ... උඹ ලැස්ති වෙයන් අර කෙල්ලව බලන්න යන්න..."

"මට බෑ..."

"බොට බැරිනම් මං ගිහින් බලන් එන්නම්කෝ..."

"අම්මා ගිහිල්ලා බලලා කරලා අම්මම කසාදෙ කරගන්න..."

"උඹ ඔය කතා කරන්නේ කාටද...?"

"අම්මට... මගෙ ජීවිතේ කාලකණ්ණි කරපු අම්මාට."

බ්‍රීෆ්කේසය ගෙන කාමරයෙන් නික්ම යන අවසාන තත්පරයේ අම්මා සුසුමැලිව යනු මම දිටිමි. මාගේ මුවින් එවැන්නක් පිට වූවාදැයි මටම විශ්වාස කරගත නොහැකි විය.

ජීවත්ව හිඳිය දී තාත්තාට නොයෙක් නොකටයුතුකම් කළ ඇය කුමක් අරඹයා වුව ද අපට ද උවමනාවට වඩා සැරපරුෂ විය. සම වයස් පිරිමි ළමුන් අතරේ මා තරමක මන්දගාමී චරිතයක් වූයේ ද අම්මාගේ හැසිරීම නිසායැයි මගේ යටි සිතේ තරහක් විණි.

අනෙක් අතට මාගේ කසාදය පමා වන්නට හේතු වූයේ ද ඇයට සරිලන මනමාලියක් සොයන්නට කල්මැරීම නිසාය.

මාගේ සිත යාන්තමින්වත් දිනාගත් කිසිදු යුවතියකට ඇය එකඟ වූයේ නැත. එක්කෝ එවැන්නියක් දුප්පත් වැඩි විය. නොඑසේනම් අම්මාට පාලනය කළ නොහැකි තරම් පෝසත් වැඩි විය. නොඑසේනම් පෙළපතේ වරදක් විය. හොයන්නට වරදක් නොවූයේ නමේ ගමේ හෝ වරදක් සොයා ඇය සිත් ගත් තැනැත්තිය සෙව්වාය. එය කෙළවර වූයේ මා විවාහය පමා වූ ගොත්තට වැටීමෙනි.

අම්මා විශ්වාස කළේ පිරිමියකු කසාද බඳින්නට නම් අඩුම තරමින් තිස් පස් වැනි විය වත් පසු කළ යුතු යැයි කියාය. ඇගේ ඒ මතය වෙනස් කිරීමට හෝ ඊට අඩුවැඩිය එක් කිරීමට හෝ මට උවමනාවක් නොවිය. උවමනාවක් නොවුණා නොවේ. මට ඊට දිරියක් නොවිය.

මොහොතකට පෙරාතුව මා අම්මාට වචන කොට දමා ගැසුවේ මේ සකලවිධ සිද්ධි කෙළවර සිතෙහි ඉකිරි වී ඇති කළකිරීමය. නමුදු අම්මාට එසේ දොස් පැවරීම පිළිබඳව මා තුළ හටගත් විස්සෝපය පහව ගියේ නැත.

ඇය කුමක් කළ ද කෙසේ කළ ද ඈ ඒ සියල්ල කළේ අපේත්, පවුලේත් යහපත ගැන සිතාය. ගේනක් කොටන්නට, කැලයක් ගිනි තබද්දී සිදුවන විනාශය කොතරම්ද...? වරිනා කියන ගහකොළ පේම

සතා සිවුපාවා ද දුව්හළු වී යයි. නමුදු ඵල බරවන හේන කුසගිනි නිවාලන, සතුට සදන තැනක් ඉමක් බවට පත් වේ. නොදන පව් පුරවා ගන්නා හේන් ගොවියාත් අම්මාත් අතර වෙනසක් නැතැයි මට සිතේ.

සමන්දිනී හා මා අතර ඇති ගැටලු විසඳා අම්මාට ද සහනයක් ලැබෙන පරිදි සියල්ල වෙනස් කර ගැනීමේ තදබල උවමනාවක් මට පහළ විය. ඒ සියල්ලටම වඩා පැරුණු ඇගේ සිත කෙසේ හෝ සුවපත් කළ යුතුය යන චේතනාවේ පිහිටා මම කාර්යාලයට නොගොස් මඟින් රිය හරවා ගතිමි.

මගේ වචන මා සිතුවාට වඩා අම්මාගේ සිත පාරවා විදවා තිබිණි. අන් කවරදාටත් වඩා මා ඇයට කුළුපගකම් පෑව ද ඇගේ අමුතු වෙනසක් සිදු නොවිණි. නමුදු ඔ වෙනදා වාගේම මට මිහුල් තුලා සෙව්වාය. මනමාලිය බලන්නට නොගොස් පෙරාතුව කිසියම් අඩුපාඩුවක් කියා ඒවාට විරුද්ධ වන්නට මම ද පුරුදු වීමි.

"මට ගමනක් යන්න වාහනේ ලේස්ති කර දීපං..."

අම්මා කතා කළේ බොහෝ වේලා කල්පනාබරව හිඳ කෙළවරය. මම පත්තරය බලන මුවාවෙන් ආලින්දයට වී කළේ ඇගේ පශ්චාත්තාප ගත ඉරියව් රහසේ නිරීක්ෂණය කිරීමය.

"කවදටද...?"

"හෙට..."

"කොහෙ යන්නද...?"

"ගමනක්."

මා ඉන් එහා කිසිවක් ඇසුවේ නැත. උත්තර දෙන්නට අම්මා ආලින්දයෙ රැඳුණේ ද නැත. ඇය මනමාලියක් බලන්නට යතැයි සිතා මම කරබා ගතිමි. නමුදු ඈ ගොස් තිබුණේ සමන්දිනී හමුවන්නටය.

"අම්මා අපේ ගෙදර ආපු බවක් ඔයා දන්නැත් ද...?"

සමන්දිනී හදිසියේ මා හමුවන්නට ආවේ අම්මාගේ නුවර ගමන නිසා යැයි මට සිතිණි.



"නෑ..."

"මට හිතුණා."

"මොකට ද අම්මා ආවේ...?"

උත්තර දෙනවා වෙනුවට ඔ තුනී මදහසක් මුවගට නගා ගත්තාය.

"මට බහින්න..."

සිනහව අතරවාරයේ ඔ කීවේ තරහවකින් නොවේ.

"මොනවද අම්මා කිව්වෙ...?"

සමන්දිනීගේ මුහුණේ වූ සිනහව සම්පූර්ණයෙන්ම අතුරුදහන් විණි. ඔ දියණේ හුදෙකලාව නතර වූ නෞකාවකට යොමාගත් නෙතින් උන්නාය. තුළගට දඟලන ඇගේ කෙහෙරොද කන්පෙති අද්දරට තරන්නට සිතෙහි පොර බදන ආසාව මම ආයාසයෙන් මැඩගතිමි.

"මොනවද සමන්දිනී අම්මා කිව්වෙ...?"

ඇගේ සන්සුන්කම මා මහත් සේ නොසන්සුන් කොට තිබිණි.

"අපේ වෙඩින්නෙක පරක්කු වෙච්ච එකට අම්මගෙ හිතට අමාරුයි."

"අම්මා ඔයාට බැන්නද...?"

"ඔව්."

සමන්දිනී බර සුසුමක් හෙළුවාය.

"පව්..."

සුසුමෙන් අනතුරුව ඔ කීවේ පපුව බර කරවන හඬිනි.

"මොනවා කියල ද බැන්නෙ..."

ආයේම සමන්දිනීගේ මුහුණේ වූ තුනී මදහස අලුත් විණි.

"මහ ගොඩක් දේ කිව්වා... ඒ ඔක්කොම ඇත්ත."

අම්මා අනූෂ පිළිබඳ යමක් සමන්දිනීට කීවා ද යන දෙගිඩියාව හදිසියේ මසිත පිළිසිඳිණි.

"මඟුලක් කල් දානවා නම් කල් දාන්න ඕන මරණෙක ද විතරයිලු. කසාදයක් විභාගයක් හින්දා කල් දාමු කියන ළමයෙක්ව අම්මා උපන්තේකට දකලා නැලු."

"ඒ අම්මා හිතන පතන විදිය සමන්දිනී..."

"අම්මා කිව්වෙ ඇත්ත තිවංක... මං කළේත්, කරන්නෙත් ලොකු වරදක්."

සමන්දිනීගේ තෙත ඇස් දිලිසෙනු මම දිටිමි.

"ඒත් දෙයි හාමුදුරුවනේ අර දරුවගෙ මූණ බලාගෙන මට තීරණයක් ගන්න හයියක් නැනෙ."

මම පෙරළා කිසිවක් නොකියා උන්නෙමි. අම්මා සමන්දිනී හමුව කුමක් කීව ද එය දුක කීමකැයි මට සිතිණි. සහජයෙන්ම උද්දච්ච මාන්නක්කාර ගැහැනියක වූ අම්මාගේ මානය දියාරුව ගියේ ඇගේ අතින් මගේ ජීවිතය කාලකන්නි වී ගියා යැයි කියැවුණු තැන් පටන්ය. අම්මා පිහිවීමෙන් හඬන්නට තරම් දුකක් මසිත පිළිසිඳිණි.

"මමත් මේ ලෝකෙ තනිවෙච්ච කෙල්ලක් නිසා ද මන්දා මට අර පුංචි දරුවගෙ වේදනාව හරි තදින් දැනෙනවා තිවංක."

මම ඔහේ රැළි නැගෙන බිඳෙන දියඹ දෙස බලා උන්නෙමි. සමන්දිනීගේ කටහඬ බොහෝ දුරක සිට ඇසෙන පරිද්දෙන් හිත තුළට රිංගා ගත්තේය.

"මට තියෙන එකම බය මමත් කසාද බැඳලා ගියාට පස්සෙ මේ පුංචි දරුවගෙ ජීවිතේ කාලකන්නි වෙයි ද කියලා..."

"අනූෂ දරුවව අපිට දෙන එකක් නැද්ද...?"

සමන්දිනී හිස දෙපසට වැනුවාය.

"අනික ඒ දරුවා මට අම්මා කියන එකත් රටෙ ලෝකේ මිනිස්සුන්ට කතා හදන්න කාරණාවක් වෙයි තිවංක."

"මම රටේ ලෝකෙ මිනිස්සුන්ට ඕන විදියට ජීවත්වෙන මිනිහෙක් නෙවෙයි සමන්දිනී."



ඉන් අනතුරුව අප අතර කෙටි නමුදු ගැඹුරු මුනිවතක් ඉඹිරිණි.

"එක්කො වෙන දෙයක් වෙන්න කියලා අපි බඳිමු."

මුනිවත බිඳිමින් සමන්දිනී කතා කළාය. ඒ යෝජනාවෙන් මට අමුතු ආශ්වාදයක් නොදැනිණි. මා සන්සුන්ව උන් නිසාදෝ සමන්දිනී ගෙළ හරවා මා දෙස බැලුවාය. මට බර සුසුමක් හෙළිණි.

"මොනවද ඔයා හිතන්නෙ...?"

"මං ගැන... ඔයා ගැන... අපි ගැන... මට වෙන හිතන්න දෙයක් ඉතුරු වෙලා නැති ගානයි සමන්දිනී..."

සමන්දිනීගේ මුවගට තුනී සිනහවක් නැගෙනු මම දිටිමි. ඕ එම සිනහා වතින්ම මගේ උරහිසට හිස බර කළාය.

# 06

විවාහය කල් දැමීම සේම හදිස්සියේ විවාහ වන්නට යෑම ද අම්මා දුටුවේ නොහොබිනා කමක් ලෙසය. අම්මා පමණක් නොව සමන්දිනීගේ නැන්දා සිතුවේ ද එලෙසමය. හමුදූ සතියක්, දෙසතියක් නෝක්කාඩු කියා අහවර ඔවුන් එය අත්හැර දැමීය. නොඑසේ නම් ඒ නෝක්කාඩුවලට අප හුරු වන්නට ඇත.

ඉන් එහා සිතන්නට යමක් තිබුණේ නම් ඒ අනුෂගේ අමුතු හැසිරීම පමණි. ඔහු නුවර දී සෑම විටෙකම පාහේ කුළුපගව මා හා කතා කළේය. සමන්දිනී ඉදිරියේ "එන්නම... දන් ද ආවේ...?" වැනි වැකියකට දෙකකට අපගේ කතාබහ සීමා විය. ටික දිනක් යද්දී ඔහු සමන්දිනී හා විරසකව ඇති බවක් මට වැටහිණි. ඒ පිළිබඳව ඇය හා කතා නොකරන්නට උත්සාහ කළ ද උත්සන්න වන කුහුල මසිතට නිරන්තරව වද දුන්නේය.

ගැටුමක් ඇති නොවන පරිද්දෙන් ඒ පිළිබඳව ඇයගෙන් අසා දැන ගැනීමට මා තුළ වූ උනන්දුව සැබෑවක් වූයේ දිනක් කෑම ගනිමින් හිඳියදීය. අනුෂගේ පුතුත්, මාත්, සමන්දිනීත් කෑම මේසයට වාඩි වී උන්නෙමු. අප දෙදෙනාම වෙර දරමින් උන්නේ පුංචි එකාට වැඩි බත් කටක් දෙකක් කවන්නටය.

"ආ... ඔය කට අංකල්ගෙන්... මේක අම්මිගෙන්..."

සමන්දිනී දරුවාගේ මුවට බත් පිඩ පිඩ ළං කළේ එලෙසය.



"අපෝ අම්මිගෙ කට ලොකුයි."

මම ඊළඟ කට වෙනුවෙන් දරුවා පොළඹවනු වස් කීවෙමි.

"ආ එහෙනම් මෙ කටත් අංකල්ගෙන්..."

දරුවා අහිරුචියෙන් කෑම ගත්තේ සෙල්ලමකට පිළිපන් එකකු වාගේය. ඒ කතාබස් අතර අනුෂ කෑම කාමරයේ දොරකඩින් මතු වූයේ දරුවාව විපරම් කරමින් පැමිණය.

"ආ... කනවද...?"

මාත් සමන්දිනීත් දැකීමෙන් අනුෂගේ මුහුණට එක් වූයේ අපහසුතාවයකි. යන්නටත් බැරි ඉන්නටත් බැරි සෙයියාවෙන් හෙතෙම දරුවාගේ හිස පිරිමැද්දේය.

"බබා කාලයැ... නාලතේ..."

අනුෂ කතා කළේ සැහැල්ලු වන්නටය.

"අද නම් බත් ටිකක් කෑවා."

සමන්දිනී කතා කළේ අනුෂට මුහුණ දී නොවේ.

"අනුෂ කෑවද...?"

මා කතා කළේ කුමක් හෝ කිව යුතුයැයි හැඟුණු නිසාය.

"මං එමින් ගමනෙ කාලා ආවෙ... වටුමට ටිකක් යන්නෝන හින්දා මෙයාව හෙව්වෙ..."

"එයා අපිත් එක්ක හිටපුවාවේ."

"ඒක තමයි මාත් බැලුවෙ. තාත්තා වටුමට ගිහින් එන්නම් පුතේ."

සමන්දිනීගේ ඇසුරේ වන දරුවාට තාත්තාගේ යෑම හෝ ඒම පිළිබඳව හැඟීමක් නොවීය.

"මං ගිහින් එන්නම් තිවංක..."

අනුෂ නික්ම ගියේ සමන්දිනීට යනවාවත් කියා නොවේ. මම කෑම ගන්නා අතරවාරයේ රහස් බැල්මෙන් ඇ දෙස බැලීමි. ඔ කිසිවක් නොවුණා වාගේ දරුවාට බත් කවමින් උන්නාය.

''අනූෂ ඔයත්තෙක්ක කතා කරන්නැද්ද...?''

මම නිකමට අසන්නා වාගේ වචන කියා දැමීමි.

''වැඩිය නෑ...''

''මොකද ඒ...?''

''කවුද දන්නෙ...?''

සමන්දිනීගේ කටහඬේ වූයේ අනූෂ කෙරෙහි උපන් කලකිරීමකි. නුරුස්නාවකි. ඔවුන් අතර අමනාපයක් ඇතැයි යන සිතිවිල්ල මසිතේ පිළිසිඳිණි. අමනාපයක් ගොඩ නැඟෙන්නේ මනාපයක් තිබූ තැනකය. ඒ සිතුවිල්ල නිසා දෝ පපුවට කිසියම් බරක් දැනිණි.

''අනූෂ අයියා එයාගෙ කාමරේට පිටින් දොරකුත් දාන්න යනවලු.''

''ඇයි ඒ...?''

''කවුද අනේ දන්නෙ...?''

සමන්දිනී දුන්නේ පෙර පිළිතුරමය.

''අපි බඳින්න යන විත්තිය අනූෂ දන්නවද...?''

''දන්නවා ඇති...''

''දන්නවා ඇති කිව්වෙ...''

''නැන්දා ඒක නොකියා ඉන්නෑ තිවංක.''

''ඒකට මිනිහගෙ හිත රිදිලා ඇති.''

අනූෂගේ හිත රිදීම කෙසේ වෙතත් මා එය කීවේ නම් මගේ සිත රිදී තිබුණු නිසාය. මගේ වචනවලට සමන්දිනී තුනී සිනහවක් මුවගට නඟා ගත්තාය.

''ඇයි හිතා උනේ...?''

''හිත රිදෙන්න තරම් දෙයක් අපි අතර තිබුණෙ නෑ තිවංක. ඔයා දැනගෙන හරි නොදැන හරි ඇනුම්පද කියනවා.''



ආයේම පරණ හිත් නොහොඳකම් අලුත් වේයැයි බියක් මගේ සිහිවිලි වසා ගත්තේය.

''ඔයා ලැස්ති වෙන්නෙ රණ්ඩු කරන්න නම් මං මෙතනින් කතාව නතර කරන්නම්.''

මා කීවේ මවාගත් සිනහවකිනි.

''නෑ තිවංක මං අනූෂයියට සැලකුවෙ මගේම සහෝදරයෙකුට වගේ... අක්කා නැති වෙච්ච වෙලාවේ අම්මල තාත්තලා අපිව ජෝඩු කරන්න හදද්දී උනත් මට ඒක ලොකු දෙයක් නොවුණේ ඒකයි.''

සමන්දිනී එකම බත් ගුලිය එහා මෙහා කරමින් කතා කළේ දැඩි කලකිරීමක ඉරියව්වෙනි.

''දැන් දැන් අනූෂයියා හැසිරෙන හැටියට මට ඒ මනුස්සයා ගැන ලොකු අපැහැදීමක් ඇති වෙනවා තිවංක.''

මට දැනුණේ වචනයෙන් පහදා කිව නොහැකි සොම්නසකි... සැහැල්ලුවකි... ශාන්තියකි.

''ඔයා කියන්නා වගේ මේ මිනිහගෙ හැසිරීම දිහා බැලුවම හිතෙන්නෙ අපි අතර මොනවා හරි සම්බන්ධයක් තිබුණ කියලා...''

මම සිනහා වීමි. සමන්දිනී ඒ සිනහවට හවුල් විණි.

''නෑ අයියෝ... පිට මිනිස්සුන්ට කොහොම වෙතත් මටත් එහෙම හිතෙනවා.''

සමන්දිනී කතා කළේ මසිතේ වන අඳුර, සැකය, වේදනාව දුරීභූතව යන වචනවලිනි.

''ඔයාගෙ හිතේ මුකුත් නොතිබුණාට අනූෂගේ හිතේ මොනවා හරි තියෙන්නැති සමන්දිනී.''

සමන්දිනී බර සුසුමක් හෙලමින් හිස වනා බත් පිඬ දරුවාගේ මුවට ළං කළාය.

''මටත් එහෙම හිතෙනවා... ඒත් ඉතින්... ඇයි අර යෝජනාව ආපු වෙලාවේ එයා අකැමැති උනේ...''

''නෝනා මැරිච්ච ගමන් තව ගෑනියෙක් ගැන කතා කරනෙක සදාචාර විරෝධී කියලා හිතෙන්නැති...''

''ඔව් සමහරවිට... බලාගෙන ගියාම පිටින් පේන මිනිස්සු නෙවේ ඇතුළෙන් ඉන්නේ...''

සමන්දිනිගේ සෑම වචනයකම අනුෂ කෙරෙහි උපන් කළකිරීම විය. ඒ වචන මා සිතේ ඈ කෙරෙහි පැහැදීමක් අවබෝධයක් ගොඩනගමින් තිබුණි.

මේ අතර සමන්දිනී හා මගේ විවාහයෙන් පසු විසීම සඳහා මහගෙදරම තෝරා ගැනීමට මා සිතූ අතර ඒ සඳහා නිවසේ යම් යම් වෙනස්කම් කිරීමටද කල්පනා කළෙමි. මා එම සිතිවිල්ල අම්මා වෙත පැවසීමට උත්සුක වූයේද අම්මාගේ සිත නොරිදෙන පරිද්දෙය.

පැරණි ගෙය වෙනස් කරනවා වෙනුවට හිස් ඉඩමෙහි ඈතට වන්නට අලුත් ගෙයක් තනන්නට අම්මා යෝජනා කළාය.

''තේරුමක් නෑ අම්මේ... මෙච්චර හොඳ ගෙයක් තියෙද්දි අලුත් ගේකට සල්ලි යට කරනෙක බොරු වැඩක්.''

''ඒ උනාට අම්මගෙ උවමනාවට ගේ නොකඩා ඉඳලා බොට සිද්ධ වෙන්නෙ ගෑනිත් එක්ක රණ්ඩු කර කර ඉන්න. අලුත් ගෙයක් හැදුවම උඹට අම්මවයි ගෑනිවයි දෙන්නම බේරගන්න පුලුවන්.''

පිඟන් කෝප්ප පිස දමමින් හුන් මැණිකා මදෙස බලා ඔලොක්කුවට වාගේ හිනැහිණි.

''ගෙවල් හදනෙකටවත්, කඩනෙකටවත් සමන්දිනීගෙ සම්බන්ධයක් නෑ අම්මා... එය පටු විදියට හිතන කෙනෙක් නෙමේ. අම්මා වගේම එයත් ගේ කඩනවට විරුද්ධයි.''

''අනේ ඔව්... ඒ නෝනා ඕනවට වඩා බහුපිණ්ඩිකස්ස නැති විත්තිය බැලූ බැල්මට පේනවා.''

මැණිකා කතාවට හවුල් වූයේ සමන්දිනී කෙරෙහි උපන් අනුකම්පාව සෑම ඉරියව්වකින්ම ප්‍රකට කරමිණි.

''අනේ උඹයි මායි දන්න බහුපිණ්ඩිකස්සේ. කසාද බැඳලා දරුවො හැදුවු උඹ නොදන්න දේ කොච්චර තියෙනවද මැණිකෝ...''

අම්මාගේ කතාවෙන් මැණිකාගේ හිත හොඳටෝම රිදුණු වග ඇගේ මුහුණේ සෑම ඉරියව්වකින්ම කියා පෑවේය.

''මං අලුත් ගෙයක් හදන්ට ඕනෙයි කියනවා කියපං... එතකොට උන්දැත් ඒකම කියයි. කසාද බඳින්ට ඉස්සෙල්ලා ගෑනුන්ගෙ සැම්පලේ ඒකනේ...''

''අපේ නෝනත් බලන්නෙම සමන්දිනී නෝනගෙ ඇගේ එල්ලෙන පොටක්.''

මැණිකා අම්මාගෙන් පෙර පලිය ගෙන මුළුතැන්ගෙයින් නික්මුණේ ඉඳුල් වතුර සහිත කොරහද දෝතට ගෙනය.

''කොහෙද උඹ ඔය යන්නේ...? හිටූ ඔතට මං උත්තර දෙන්ට.''

මැණිකා අම්මා නොතකා පිලිකන්නට බැස යන්නට ගියාය. මම මූවට නැඟුණු සිනහව යටපත් කරගන්නට වෙර දැරීමි.

''හිනාවෙයන්, හිනාවෙයන්... කොහොමත් බොට ඉස්සරහට අඬන්න වෙන හින්දා හිනාවෙයින්...''

මම ඉන් එහා කිසිවක් කීවේ නැත. කියන්නට තරම් කෝපයක් මසිතේ හටගත්තේ නැත. අම්මා කියනා ඇනුම් පද කටට ආ ඒවා මිස හිතට ආ ඒවා නොවේ. ඕ සමන්දිනීට හද පත්ලෙන්ම ආදරේ කරන්නීය. ඇලුම් කරන්නීය. ඈ අක්කාට පවා නොදුන් රත්තරන් බඩු ගෙන පිරික්සා බලා සකසුරුවම් ලෙස අසුරන්නේ සමන්දිනීට දෙන්නටය. අක්කාත්, අයියලාත් වරින්වර ඇයට දුන් සාරි, පළඳනා හා වෙනත් දේ ඕ සකසුරුවමට තබා ඇත.

''යකෝ මුන් මට තෑගි දෙන්නෙ මං දහ අටේ කෙල්ලෙක් කියලා සලකලනේ...''

සමහරක් රෙදි පිළි, පළඳනා අල්මාරියට ගාල් වූයේ එසේය.

''යකඩෝ හතර හන්දි පණ නැතුව ඇඳට වෙච්ච එවුන්ට දෙන තෑගිගෙ මූන් මට දෙන්නේ...''

ඒ තවත් ඇඳුම් ආයිත්තම් කොටසක් අල්මාරියට ගාල් වන්නට හේතුවකි.

''නෝනා මැරිච්ච ගමන් තව ගෑනියෙක් ගැන කතා කරනෙක සදාචාර විරෝධී කියලා හිතෙන්නැති...''

''ඔව් සමහරවිට... බලාගෙන ගියාම පිටින් පේන මිනිස්සු නෙවේ ඇතුලෙන් ඉන්නේ...''

සමන්දිනිගේ සෑම වචනයකම අනුෂ කෙරෙහි උපන් කළකිරීම විය. ඒ වචන මා සිතේ ඈ කෙරෙහි පැහැදීමක් අවබෝධයක් ගොඩනඟමින් තිබුණි.

මෙ අතර සමන්දිනී හා මගේ විවාහයෙන් පසු විසීම සඳහා මහගෙදරම තෝරා ගැනීමට මා සිතූ අතර ඒ සඳහා නිවසේ යම් යම් වෙනස්කම් කිරීමටද කල්පනා කළෙමි. මා එම සිතිවිල්ල අම්මා වෙත පැවසීමට උත්සුක වූයේද අම්මාගේ සිත නොරිදෙන පරිදිය.

පැරැණි ගෙය වෙනස් කරනවා වෙනුවට හිස් ඉඩමෙහි ඈතට වන්නට අලුත් ගෙයක් තනන්නට අම්මා යෝජනා කළාය.

''තේරුමක් නෑ අම්මෙ... මෙච්චර හොඳ ගෙයක් තියෙද්දි අලුත් ගේකට සල්ලි යට කරනෙක බොරු වැඩක්.''

''ඒ උනාට අම්මගෙ උවමනාවට ගේ නොකඩා ඉඳලා බොට සිද්ධ වෙන්නෙ ගෑනිත් එක්ක රණ්ඩු කර කර ඉන්න. අලුත් ගෙයක් හැදුවම උඹට අම්මවයි ගෑනිවයි දෙන්නම බේරගන්න පුලුවන්.''

පිගන් කෝප්ප පිස දමමින් හුන් මැණිකා මදෙස බලා ඔලොක්කුවට වාගේ හිනැහිණි.

''ගෙවල් හදනෙකටවත්, කඩනෙකටවත් සමන්දිනීගෙ සම්බන්ධයක් නෑ අම්මා... එය පටු විදියට හිතන කෙනෙක් නෙමෙ. අම්මා වගේම එයත් ගේ කඩනවට විරුද්ධයි.''

''අනේ ඔව්... ඒ නෝනා ඕනවට වඩා බහුපිණ්ඩිකස්ස නැති වින්නිය බැලූ බැල්මට පේනවා.''

මැණිකා කතාවට හවුල් වූයේ සමන්දිනි කෙරෙහි උපන් අනුකම්පාව සෑම ඉරියව්වකින්ම ප්‍රකට කරමිණි.

''අනේ උඹයි මායි දන්න බහුපිණ්ඩිකස්සේ. කසාද බැඳලා දරුවො තහදපු උඹ නොදන්න දේ කොච්චර තියෙනවද මැණිකෝ...''



අම්මාගේ කතාවෙන් මැණිකාගේ හිත හොඳටෝම රිදුණු වග ඇගේ මුහුණේ සෑම ඉරියව්වකින්ම කියා පෑවේය.

''මං අලුත් ගෙයක් හදන්ට ඕනෙයි කියනවා කියපං... එතකොට උන්දැත් ඒකම කියයි. කසාද බඳින්ට ඉස්සෙල්ලා ගෑනුන්ගෙ සැම්පලේ ඒකනේ...''

''අපේ නෝනත් බලන්නෙම සමන්දිනී නෝනගෙ ඇගේ එල්ලෙන පොටක්.''

මැණිකා අම්මාගෙන් පෙර පලිය ගෙන මුළුතැන්ගෙයින් නික්මුණේ ඉඳුල් වතුර සහිත කොරහද දෝනට ගෙනය.

''කොහෙද උඹ ඔය යන්නේ...? හිටු ඕකට මං උත්තර දෙන්ට.''

මැණිකා අම්මා නොතකා පිලිකන්නට බැස යන්නට ගියාය. මෙ මුවට නැඟුණු සිනහව යටපත් කරගන්නට වෙර දැරීමි.

''හිනාවෙයන්, හිනාවෙයන්... කොහොමත් බොට ඉස්සරහට අඬන්න වෙන හින්දා හිනාවෙයින්...''

මම ඉන් එහා කිසිවක් කීවේ නැත. කියන්නට තරම් කෝපයක් මසිතේ හටගත්තේ නැත. අම්මා කියනා ඇනුම් පද කටට ආ ඒවා මිස හිතට ආ ඒවා නොවේ. ඕ සමන්දිනීට හද පත්ලෙන්ම ආදරේ කරන්නීය. ඇලුම් කරන්නීය. ඈ අක්කාට පවා නොදුන් රත්තරන් බඩු මෙන පිරික්සා බලා සකසුරුවම් ලෙස අසුරන්නේ සමන්දිනීට දෙන්නටය. අක්කාත්, අයියලාත් වරින්වර ඇයට දුන් සාරි, පළඳනා හා වෙනත් දේ ඕ සකසුරුවමට තබා ඇත.

''යකෝ මූන් මට තෑගි දෙන්නෙ මං දහ අටේ කෙල්ලෙක් කියලා සලකලනේ...''

සමහරක් රෙදි පිළි, පළඳනා අල්මාරියට ගාල් වූයේ එසේය.

''යකඩෝ හතර හන්දි පණ නැතුව ඇඳට වෙච්ච එවුන්ට දෙන තෑගිගෙ මූන් මට දෙන්නේ...''

ඒ තවත් ඇඳුම් ආයිත්තම් කොටසක් අල්මාරියට ගාල් වන්නට හේතුවකි.

"මෙච්චර වටින ඒවා මට මොකට ද බං..."

ඒ අල්මාරිය පිරෙන්නට තවත් හේතුවකි.

"මේ කඩමළු අඳින්න මං කවුරු කියලා උන් හිතනවද දන්නෑ..."

මේ සියලු කරුණු කාරණා හේතු කොට ගෙන අල්මාරියක් පිරෙන්නට අම්මාට ඇඳුම්, ආයිත්තම්, පළඳනා හා තෑගි බෝග වේ. දූත් ඕ ඒ සියල්ල නිර්ලෝභීව සමන්දිනීට පවරන්නට සූදානමය.

"කෝ අම්මෙ මේකෙ යතුර...?"

අක්කා ගෙදර පැමිණි සෑමවිටකම අම්මාගේ පෞද්ගලික අල්මාරියේ යතුර පිරික්සයි.

"ඒක ඔය මැණිකා කොහෙද දාලා... මාත් පහුගිය දවස් ටිකේම හෙව්වා... ඒකිටත් සිහිය නෑ."

අම්මා අක්කාව මග හරින්නේ එසේය. මැණිකා දොස් අසන්නේ නිරපරාදේ බව දන්නේ මාත්, මැණිකාත්, අම්මාත් පමණි. අක්කාත්, අයියාත් පොඩි උන් දෙදෙනාත් රැගත් මෝටර් රිය ගේට්ටුවෙන් හතර වද්දී අම්මා කරන පළමු කාරිය වන්නේ අල්මාරියේ යතුර ගෑස් ටැංකිය යට සැඟවීමය.

"අවුරුද්දට දෙතුන් වතාවක් ඇඳුම් කඩමාළු දෙක තුනක් දීලා ඒකි හදන්නේ කොල්ලෝ දෙන දේ ඩැහැන් යන්න... මහ කපටි අම්මණ්ඩි..."

තමා මේ බනින්නේ තමාගේ එකම දියණියට වග ඒ මොහොතේ ඇයට මතක නැත. නමුදු ඕ අක්කාට තරම් මටවත් ආදරේ නොකරන්නීය.

දරුවන් ලැබෙන්නට අක්කා රෝහල් ගත කළ විට ඒ ගැබ්බර වේදනාව තමාට දැනුණ සෙයින් ඕ හඬා වැටුණු වග මට මතකය. අම්මා අක්කා තරම්ට නෝක්කාඩු දෙකවත් රැක්කේ නැත.

එසේ ආදරය කළ අක්කාට නොදුන් දේ ඕ සමන්දිනීට දෙන්නට හිත හදා ගත්තා නම් ආදරය නොදෙන්නට තරම් අකාරුණික නොවන වග මට විශ්වාසය.



ඇනුම්, බැනුම්, රැවුම්, ගැරහුම් ඇගේ ජීවිතයේ කොටසකි.

"අපේ තාත්තා ගෙදර හිටියෙ හරියට පොලිස් මුලාදෑනියෙක් වගේ. ඒ උනාට ඉතින් අප්පේ... අපිට නම් පණ දෙවෙනියට දාලා ආදරේ කළා..."

ඒ අම්මා, අම්මාගේ තාත්තා දුටු හැටිය. ඇය සියා මෙන්ම අපේ තාත්තා කිවේ ද පෙර කී ගතිගුණ නිසාම වන්නට ඇත.

කැන්දාගෙන ආ පසු සමන්දිනී හෝ අම්මා අතර ගැටුමක් හෝ ආරවුලක් ඇති නොවන වග මට විශ්වාසය. දූත් ඇගේ සිහිනය ද බලාපොරොත්තුව ද සමන්දිනී කැටුව ඒමයි.

අපේ විවාහ ගිවිස ගැනීම යෙදුණේ මාර්තු දාහතර වැනිදාටය. පෙබරවාරි මාසයේ මැද භාගයේ ඒ කටයුත්ත යොදා ගන්නට මාත් සමන්දිනීත් තීරණය කළද අම්මා හෝ සමන්දිනීගේ නැන්දා ඊට එකඟ වූයේ නැත.

"පෙබරවාරිය ඔහොම කටයුත්තකට යොදා ගන්න හොඳ මාසයක් නෙවෙයි."

සමන්දිනීගේ නැන්දා පළකළේ ඇගේ මතයයි.

"ඔව්.. ඔව්.. අඩු මාසේ. ඕක කරන්නෝන නෑ. ඕක දාගතින් මාර්තුවලට."

අම්මා ගත්තේ මගේ තීරණයයි.

"පෙබරවාරියෙ ඉපදෙන්න හොඳයි. මැරෙන්න හොඳයි. කසාද බඳින්න නරකයි."

මා එසේ කීවේ අම්මා කෙරෙහි උපන් නොරිස්සුමකින් නොවේ. ඇගේ තීරණය වෙනස් කිරීමේ අභිලාෂයකින් ද නොවේ. මෙකල වන විට විහිළුවට අම්මා කෝප ගන්වන්නට මම පෙළඹී උන්නෙමි. ඊට හේතුව මගේ සිතේ සැහැල්ලුවයි.

"මං කියන්න ගියෙත් ඕකමයි."

සමන්දිනී එය කීවා නොව ඇයට එසේ කියවිණි.

"ඕකමයි කියලා අනුමත කළේ මුගේ කතාව ද...?"

අම්මා මා පෙන්වා සමන්දිනීගෙන් ඇසුවේ කෝපයෙනි. සමන්දිනී මදහසක් මුවගට නඟාගත්තී. මදෙස බැලුවේ අසරණවයි.

''මැරෙන්නෙවත්... ඉපදෙන්නෙවත්... අපේ කැමැත්තට නෙවෙයිනෙ... කැමැත්තට වෙන දේ පාලනේ කොරනෙකයි පුතුකම.''

''ඔවා බොරු කතා අම්මෙ...''

සමන්දිනී ඉන් එහා කතා නොකරන ලෙස මට අභිනයෙන් ඉඟි කළාය. අම්මා යාන්තමට ඒ බැව් දුටුවාය.

''නැන්දම්මත්තෙක්ක එක්කාසුවෙලා මිනිහව මෙච්චල් කරගන්නවා මිසක මිනිහත්තෙක්ක එකතු වෙලා නැන්දම්මව මෙච්චල් කරන්න නම් හිතන්නෙපා දුවේ... වරදින තරමක් ගැනුන්ට වරදින්නෙ ඔතනදී...''

අම්මා සමන්දිනීට දයාබරව කළේ සියුම් තර්ජනයකැයි මට සිතිණි. ඒ සිතිවිලි සමන්දිනීට ද පහළ වන්නට ඇත. ඕ නොහඟා රහස් බැල්මෙන් මදෙස බලා කෑම මේසය අස්පස් කරන්නට ගත්තාය.

''සුළුවට උත්සවයක් ගමු කියලා අර උන්දැ කියන්නෙ...''

ඒ සමන්දිනීත්, නැන්දාත් අපේ ගෙදර වීත් ගොස් සතියක් දෙකක් ගත වූ තැනය.

''කොයි උන්දැද...?''

''සමන්දිනීගේ නැන්දා...''

අම්මා එය කීවේ ඒ යෝජනාවට ඇගේ නම් කැමැත්තක් හෝ සම්බන්ධයක් නොවන බැව් හඟවමිනි.

''ඕවා මහ බොරු වැඩ අම්මෙ... අනික ඔච්චට දැන් වෙලාවක් නෑ.''

''සල්ලි තියෙනවා නම් වෙලාව හදාගන්න බැරිය බං... ඒ ගැනිගෙත් ගිත නොරිද්දා පුංචිවට උත්සවයක් ගත්තම ඉවරයි...''

''බොරු වියදම් කරනෙක තේරුමක් නෑ අම්මා.''

''හොර රහසෙ බඳින්න මේ පලහිලව්වේ මුකුත් වරදක් වෙලා නැනෙ... සතුහරේ උන්ට නොකියා ඕවා කරන්නෝන් නෑ.''



''දැන් අම්මා මොකද්ද කරන්න හදන්නේ...?''

''උඹලා දෙන්නා උඹලා දෙන්නගෙ වැඩ ටික සූදානම් කරගනිල්ලකො. ඉතිරිවා මං අයියලත්තෙක්ක කතා කරලා කරන්නම්.''

''දැන් කාගේ සල්ලි ද ඔකට වියදම් කරන්නෙ...?''

''බොගේ නෙවෙයි මගේ.''

කතාව එතකින් හමාර විණි. අපිළිවෙලට මංගලෝත්සවයක් තර විහිළුවට ලක් වනවාට වඩා එය නොකර සිටීම හොඳ යැයි අම්මාට ඒත්තු ගන්වන්නට සිතුණ ද මම කරබා ගතිමි. එවැන්නක් සිදුවේ නම් කිසිවෙකුට කිසිවක් කියන්නට ඉඩ නොතබා සිදු විය යුතුය.

මම පසුදාම සමන්දිනී දකින්නට ගියෙමි. ගමන අහඹු වුව ද ඕ මා පිළිගත්තේ කියා ගියා වාගේය.

''මං හිතුවා එයි කියලා.''

''ඒ ඇයි...?''

මා මෝටර් රියෙන් බසිමින් ඇසුවෙමි.

''අම්මා වැඩේ රටටම අණබෙර ගහලා තේද කරන්න හදන්නේ...?''

මට සිනහා නොවී සිටින්නට බැරි විය.

''ඇයි හිනාවෙන්නෙ...?''

''අම්මා නම් කිව්වෙ ඒක ඔගොල්ලන්ගෙ නැන්දගෙ යෝජනාවක් කියලා.''

සමන්දිනී ඇඟිලි තුඩු මුවට තබා හිනැහෙන්නට ගත්තේ දඟකාර දැරිවියක වාගේය.

''ඔයා නොදන්නව වුණාට අම්මා හොටෙල්සුත්. බුක් කරලා.''

මගේ මුහුණේ සිනහව අතුරුදහන් වන්නට ඇත.

''හොටෙල්සුත් බුක් කරලා.''

මගේ කටහඬේ අපමණ විශ්මයක් ගැබ්ව තිබෙන්නට ඇත. සමන්දිනී හිස වනමින්ම හිනැහෙන්නට ගත්තාය.

"අපි දෙන්නම බැහැලා වැඩේ නොකළොත් මාර විහිළුවක් වෙයි."

"ඔව් අනේ..."

ඉන් එහා අපට කතා කරන්නට ඉඩ නොතබා ත්‍රීවීලරයක් විත් මගේ කාරය පිටුපස නතර විණි. රිය නතර වූවාට කිසිවකු ඉන් නොබැසි නිසාවෙන් අපගේ කුතුහල් අවධානය ඒ වෙතට යොමු විය.

තත්පර කිහිපයක් නිසොල්මනේ ගෙවිණි.

"කවුද අනේ...?"

සමන්දිනීගේ කටහඬේ සියුම් බියක් විණි.

"අනේ මන්දා..."

ත්‍රීවීලරයේ රියදුරු රියෙන් බැස්සේය.

"බහින්ඩකො මහත්තයා. මේක මාර ඇණයක්නෙ... දවස පුරා මහත්තයව මේක අස්සෙ දාන් රවුම් ගැහුවට අපේ බඩ පිරෙන් නැතෙ."

ත්‍රීවිලර් රියදුරුගේ නෝක්කාඩු කතා අස්සෙ අනූෂ රියෙන් බසින්නට පයක් බිම තැබීය.

"දෙයියනේ..."

සමන්දිනී කිවා නොව ඇයට එසේ කියවිණි. අනූෂ උන්නේ දෙපයින් සිටගන්නට බැරි තරමේ වෙරිමතිනි

"මහත්තයා... මේ මහත්තයලගෙ කවුරු හරිද...?"

රියදුරු එසේ අසන තෙක්ම ඔහු සම්බන්ධයෙන් මටත් කරන්නට වැඩ කොටසක් වෙතැයි මෙතෙහි නොවිය. මම වහා ත්‍රීවිලරය දෙසට ගොස් අනූෂ වත්තන් කර ගන්න තැනීමි. හෙතෙම මගෙ අත ගසා දමා ත්‍රීවිලර් බඳට වාරු විය.

"මගේ හයරෙක දීලා මාව යවලා ඉන්නවද සර්...?"

මදෙස ඔරවා ගත්වනම බලා හිඳිනු විනා අනූෂ රියදුරුට ප්‍රතිචාර දැක්වූයේ නැත.

"කීයද...?"

"රුපියල් දෙදහක්වත් ගන්න වෙනවා සර්."

මම හැරී සමන්දිනී දෙස බැලීමි. ඕ තුෂ්නිම්භූතව බලා උන්නා මිස කිසිවක් කීවේ නැත.

"රුපියල් දෙදහක් කිව්වේ මේ කොහෙ ඉඳල ද එන්නෙ...?"

"ද... දද්... දන් නෑ... ය... යන්නේ නම් අපායට... තමුසෙට ස... සන්තෝස ද...?"

රියදුරු වෙනුවට උත්තර බැන්දේ අනූෂය.

"මෙයා මේ එන්න වෙන්නේ උදේ නමයෙ ඉඳලා සර්... පාන්දරම මාලිගාවට යන්න නැග්ගම මං හිතුවා හෙණ ශ්‍රද්ධාවන්ත පොරක් කියලා."

රියදුරු කතා කළේ අනූෂට ඔරවමිනි.

"මාලිගාවෙන් කනත්තට ගියා... කනත්තෙන් බාර්එකට ගියා. එතනින් දොට්ට බැහපු වෙලාවේ ඉඳලා ගෙවල් හත අටකට ගියා සර්..."

මම ඉන් එහා කිසිවක් නොඅසාම රුපියල් දෙදහක නෝට්ටුවක් රියදුරු අතට දුනිමි.

"මං ගිය ගමනට එක එකාගෙන් සල්ලි ගන්න තමුසෙට පිස්සු ද ඕයි... මං ණයකාරයෙක් ද...?"

අනූෂ වෙරිමතින් නත් දොඩවමින් රියදුරුගෙන් මුදල් උදුරන්නට මෙන් පෙරට ආවේය.

"තමුසෙ ණයකාරයෙක් නෙවේ. හෙණ වණයක්."

රියදුරු කෝපයෙන් ත්‍රීවිලරයට නැග එය පණගන්වා ගත්තේය. එහි බඳට වාරුව හුන් අනූෂට එහාට වන්නට ඉඩක් නොලැබිණි. ත්‍රීවිලරය නික්ම යන ඇසිල්ලේම අනූෂ බිමට පෙරළිණි. බලා සිටිනවා හැරෙන්නට මට හෝ සමන්දිනීට කරන්නට කිසිවක් නොවීය.

''මං වැටුණා... හැබැයි මං වැටුණේ අද ඊයෙක නෙවෙයි ඔයි... තමුසෙට අරයව හම්බ වෙච්ච පළවෙනි දවසෙ...''

බිම හොත් අනූෂ සමන්දිනිව හිසින් පෙන්වා කීවේ අපැහැදිලි හඬිණි. මා තුළ තදබල සිත් වේදනාවක් හට ගත්තේය. වෙරිමතින් මා ළඟ බිම වැටී හිඳින අනූෂට වඩා මා සිතින් දුර්වලව යමින් තිබිණි.

''මෙ මනුස්සයට පිස්සු තිවංක... ඔයා ගෙට එන්නකෝ...''

සමන්දිනීගේ සෑම ඉරියව්වකින්ම ශෝකයත්, කෝපයත් කලවම් බැස්සේය. මම ඈ පස්සේ ගෙට යන්නට හැරිණි. කිසියම් කටයුත්තකට ගෙයින් දොරට බැසි නැන්දා මා දැක ප්‍රමෝදයට පත්ව සිනහවී, බිම උන් අනූෂ දැක නොසන්සුන් විය.

''අර මොකෝ අර...''

මාත් අනූෂත් අතර ගැටුමක් ඇති වෙන්නට ඇතැයි ඔ සිතනවා විය යුතුය.

''කණමදයා වගේ බීගෙන ඇවිල්ලා පිස්සු කියෝනවා නැත්දෙ...''

එවර සමන්දිනී තර කොට හුන් දැක ඉහිරී ගියේය.

''බීලා...''

නැන්දා ඇස් උඩ ඉන්දා ගත්තේ මින් පෙරාතුව අනූෂ අතින් එම වරද සිදු නොවුණු සේය. කෙළවර ඔ අනූෂ වෙතට දිව ගියාය.

''යකඩෝ වෙලා තියෙන දේවල්වල හැටියට ඔච්චරයි අඩුව තිබුණේ... අරහේ අම්මෙක් නැති දරුවක් තනියම දුක් විඳිද්දි මෙහෙම සුදි දාන එක හරි ද... නැගිටහං... නැගිටහං රටේ ලෝකෙ මිනිස්සු දකින්න ඉස්සෙල්ලා නැගිටහං...''

''දෙවෙනි පාරටත් මගේ දරුවට අර මිනිහා අම්මා නැති කරා නැත්දෙ...''

නැන්දාට වාරුව නැගිටන අනූෂගේ දබරැඟිල්ල යොමුව තිබුණේ මා වෙතටය.

''මනුස්සකමට සැලකුවට මට මෙහෙම වෙලා මදි.''



සමන්දිනී කෝපයෙන් වෙව්ලා යමින් උන්නාය. මා තුළ කෝපයක් වෙනුවට හට ගෙන තිබුණේ ශෝකයකි. සමන්දිනිත් අනූෂත් අතරට මා පැමිණියාය යන සිතිවිල්ල ආයේම මගේ හදවතට රිංගා ගත්තේය.

''තමුසෙට මගේ දරුවා ගැන හිතන්න තිබුණා අයිසෙ... මිනිහෙකුට ගැනියෙක් වගේ ද අයිසෙ දරුවෙකුට අම්මා කෙනෙක් කියන්නේ...''

''උඹට පිස්සු අනූෂ... මොකෝ මේ කෙල්ල කසාද බැන්දා කියලා ඒ දරුවා ගැන නොබලා ඉන්නවයැ... අනික ඒ කෙල්ලටත් කියලා හෙටක් තියන්නෙපැයි.''

නැන්දා අනූෂගේ හඬ පරයා කතා කරේ අනූෂ කියන දෙය මට නෑසෙන පරිද්දෙනි.

''ඔය ඔක්කොමලට හෙටක් තියෙනවා... හෙටක් නැත්තෙ මටයි මගෙ දරුවටයි විතරයි.''

අනූෂ ආලින්දය මතින් ඇවිද ගියේ මගේ පපුව මතට අඩි තබා මෙනි.

මාත් සමන්දිනීත් අතර තත්පර කිහිපයක නිසොල්මන්කමක් ඇති විණි. ආයේම අනූෂගේ නත් දෙඩවීම ඇරඹිණි. ඔහු කී වචන අපැහැදිලි නමුදු හෙතෙම නන් දොඩවන්නේ හඬමින් වග නම් නිශ්චයට ම කිව හැකිය.

''මෙ මිනිහා මෙ වගේ පිස්සෙක් කියලා මං දැනගෙන හිටියෙ නෑ තිවංක...''

''මටත් පුදුමයි...''

මා ඒ වචන දෙක පිට කළේ යමක් කිවයුතුම නිසාවෙනි. කෙසේවතුදු මෙය මා එන බවක් දැන අනූෂ විසින් සැලසුම් කළ එකක් නොවේ. මෙම සිදුවීම අහඹු එකකි.

කිසියම් අදෘශ්‍යමාන බලවේගයක් විසින් අනූෂගේ යටි සිත මට දැන ගන්නට ඉඩ හැරියා සේය.

අනූෂ අසිහියෙන් හෝ ඔහුත් සමන්දිනීත් අතරවන අයථා සම්බන්ධයක් ගැන කතා කළේ නැත. කතා කළේ තම පුතුට සෙනෙහස අහිමිවීම පිළිබඳ පමණි.

මා නුවර ගියේ ප්‍රබෝධයත් සතුටත් රැගෙනය. පෙරළා කොළඹ ආවේ චිත්ත පීඩාවත් පරාජිත බවත් ගෙනයි. මා වාගේම සමහර විට ඊටත් වඩා වැඩියෙන් සමන්දිනී කනස්සල්ලට පත්ව උන්නාය. පෙර දවසේ කෙසේ වතුදු අද දවසේ නම් සමන්දිනීට අනූෂ දැඩි හිරිහැරයක්, කරදරයක් වී තිබේ.

මෙදා ඇය ට කරදරයක් වී ඇත්තේ එදා ඔවුනතර වූ සමීප හිතවත්කමය. නොඑසේනම් ළෙන්ගතුකමයි. එය ආදරයකැයි හුවා දක්වන්නට තරම් මම ආත්මාර්ථකාමී නොවෙමි. බොළඳ නොවෙමි. නමුදු ඔවුනතර වූ බැඳීම කවරාකාර එකක් වීද එය මගේ සිත් වේදනාවට හේතුව තිබුණු වග නම් සැබෑවකි. එය සමන්දිනී වෙතින් සඟවා ගන්නට කෙතරම් වෙර දැරුව ද මගේ සෑම ඉරියව්වකින්ම පාහේ ඒ බැව් කළ එළි බසින්නට ඇත.

"ඇයි ඔයා එදා සිද්ධිය ගැන ඊට පස්සෙ කතා නොකළේ...?"

මා ඒ පිළිබඳව කතා නොකළේ සමන්දිනීගේ හිත හැදීමේ අරමුණිනි. නමුදු ඉන් ඕ හිත බිඳගෙන තිබිණි.

"අයේ අයේ කතා කරන්න දෙයක් ඒකෙ නැහැ සමන්දිනී."

"මේ ළඟ දී අනූෂයියා බීගෙන ඇවිල්ලා දරුවව අරන් යන්න හැදුවා."

"පස්සෙ..."

"නැන්දා රණ්ඩු සරුවල් කරලා දරුවව තියාගත්තෙ."

"අනූෂ කොහෙටද ළමයව එක්ක යන්න හදන්නෙ."

"එයාලගෙ අක්කා කෙනෙක්ගේ ගෙදර."

"ඇයි ඉතින් නැන්දා විරුද්ධ."

"අපි වගේ ඒ ගොල්ලො ළමයට සලකන එකක් නෑ තිවංක... ඔය කියන අක්කටත් බබාලා තුන් දෙනෙක් ඉන්නවා. මේ දරුවා නිකම්ම ඒ ගෙදර වැඩකාර කොල්ලා වෙයි."

දරුවා අනූෂ රැගෙන යනවාට විරුද්ධ නැන්දා පමණක් නොවේ. සමන්දිනී ද එතැන දී සිඳින්නේ එම මතයේය.

"ඇත්තටම ඇයි අනූෂ වෙන කසාදයක් කරගන්නෙ නැත්තෙ...?"

"බඳින කෙනා අතින් දරුවට වෙනස්කමක් වෙයි කියන බයටයි."

"අනූෂ එහෙම කිව්වෙ ඔයාටද...?"

"නැන්දට කියලා තිබුණා."

"එහෙම කතාවක් එයා කවදාවත් ඔයාට කියලා නැද්ද...?"

සමන්දිනී කල්පනාබර වූවාය. ඉන් අදහස් වන්නේ ඔවුන් බොහෝ දේ කතාකොට ඇති බවක් නොවේද...?

"ම්..."

මම ඇය ඉක්මන් කරනු රිසින් හූ මිටි තැබීමි.

"දරුවට වෙනස්කම් වෙන හින්දා ආයෙ බඳින් නෑ කියලා වතාවක් කිව්වා."

"ඒ කොයි කාලෙද...?"

"ගොඩ කාලෙකට උඩදී."

"ඔයාට යෝජනා කරන්න ඉස්සරද...?"

"ඒ කාලෙම වගේ."

මගේ හිත ආයේම කඩා වැටෙමින් තිබිණි. අනූෂත් සමන්දිනීත් අතරට මා ආවාය යන චේතනාව අලුතින් හිස ඔසවන්නට පටන් ගත්තා බඳුය.

වෙනසක් අඟවා අප ආ ගමනේ සතුට සමන්දිනීට අහිමි කරන්නට මට සිතක් නොවීය. මාත් ඇයත් පැමිණ උන්නේ මහමාලියන් දක්මකට හා ඒ හා සම්බන්ධ අලෙවි ප්‍රදර්ශනයකටය.

ඒ ගමනේ අරමුණ වූයේද තමාගේ මංගල දා ඇඳුම පිළිබඳ තීරණයක් ගන්නට සමන්දිනීට වූ ඕනෑකමය.

ඇය කිසිදු දොම්නසකින් තොරව ප්‍රදර්ශන කුටි තරඹද්දී මම

ඇයට අඩියක් හෝ දෙකක් පසුපසින් හිඳ ඇගේ රුව නෙත් පුරා විඳිමි.

ඔ සිහින්ය. උකුළ පළල්ය. ළැම උස්ය. රුවැති මුහුණ දිගැටිය. ඇස් සිහින්ය. ගෙල දෙපසෙහි සිහින් අක් බඹරු කලාපයකි. නොවැහැරුණු ඇගේ අත් ගොබ පවා පිරිමියෙකුගේ හැඟීම් අවුස්සන සුළුය. ඇස්, කන්, මුව, නාසය අතින් නොඑවා වැන්න. මේ සියලු රස නෙතින් පිරිමැදි තැන මම සිතින් රෝගීව යමින් උන්නෙමි.

කාලයක් තිස්සේ බිරිය ඔත්පලව හිඳිය දී විවිධ මනස්තාපයන්ට ලක් වූ සැමියෙකු මෙවැනි පිරිපුන් යුවතියක් දෙස කාන්තියෙන් නොබැලූ වගක් අදහන්නට මසිත මැලිවේ.

ඇල්මෙන් - බැල්මෙන් - කැල්මෙන් හෝ ඔවුනතර සබඳතාවයක් නොතිබුණා වන්නට බැරිය. අනූෂ එළිපිටම ඇයට ඇඟැලුම් පෑවා ද විය හැකිය. අනෙක් අතට සමන්දිනී ද විවාහය තරමකට හෝ පමා වූ එකියකි.

පුළුනුත් වෙත්නම්, ගින්දරත් වෙත්නම්, ඒවා ඇවිළෙන්නට බැරි ඇයි...?

මම සමන්දිනී නිවෙසට ඇරලවා ගෙදර ආවේ අලුයම තුනට පමණය. නුවරින් නවයට පමණ නික්මුණ ද සෙමින් ගමන නිසා මඟ මගට පැය පහක් පමණ ගෙවා දමා තිබිණි.

තුනට ගෙදරට ආ මම හා කියා හමාර වනවිට හතර පසුවී තිබිණි.

පසු දා කාර්යාලයට නොයන බව ගුණසිරිට ඇමතුමක් දී ඇහැරවා කියා මා නින්දට ගියේ හතරත් - පහත් අතරමැද වේලාවකදීය.

මට උවමනා පරිද්දෙන් නින්ද නෙතු මතට ආවේ නැත. උදෑසන හත හෝ අට වනතෙක් මා කළේ ඇඳෙහි ඒ මේ අත පෙරළෙමින් නින්ද සෙව්මය. සිහිවිලි කළඹලව තිබේ.

ගත වේදනාවට පත්ව තිබිණි. නෙතු හඬා නොවැටුණා පමණි. විවාහයට පෙරාතුව මගේත් සමන්දිනීගේත් ඇසුර මෙ සා පීඩාවක් මට ගෙන එන්නේ නම් විවාහයෙන් පසු තත්ත්වය කෙබඳු විය හැකි ද...?

සමන්දිනීගේ රුව පිළිබඳව දූත් දූත් මසිතේ මෝදු වන්නේ තදබල ඊර්ෂ්‍යාවකි. එම ඊර්ෂ්‍යාවම අනූෂ පිළිබඳව ද වේ.

සිත් තැවුලත් පසුතැවීමත් අතර මහත් වූ හිසරුදාවක් මට දනෙන්නට ගත්තේ නින්දත් නොනින්දත් අතර හිඳියදීය.

වේදනාව තදබල ලෙස උත්සන්න වූ තැන මට අධික පිපාසයක් දැනුණි. මම යහනින් නැගිටගෙන දිය බොනු පිණිස මේසය මත වූ කෝව ගන්නටය. මට මතක තිබුණේ වීදුරු කෝව අතට ගනු පමණි. එය අතින් ගිලිහී යනු ද මා ගැඹුරු යමකට ඇද වැටෙනු ද මට යාන්තමට මතකය.

යකඩ පට්ටම් දෙකක් සමාන කාලයක දී එකට ඇතිල්ලී යන හඬ මට ඇසෙමින් තිබිණි. මුල දී බොහෝ දුරකින් ඇසුණු ඒ හඬ කෙමෙන් ළං ළංව ඇසෙන්නට ගත්තේය. කණට අමිහිරි එම හඬ සිතට වදදෙද්දී සියුම්ව නැඟී හිසරුදාවක් උත්සන්න වෙමින් තිබිණි. මා උන්නේ නින්දත් - නොනින්දත් අතරේය.

"මං හිතුවෙ රෑ වෙලා ආපු හින්දා නිදි කියලා." ඒ අම්මාය.

"කොච්චර වෙලා සිහිය නැතුව ඉඳලා තියෙනවද...?"

ඒ අයියාය.

"අනේ මන්දා පුතේ."

මට නෙතු හරින්නට තදබල ඕනෑකමක් වී ද ඇස්තටු මත ගල් පැටවූවාක් මෙන් නෙතු හරින්නට ශක්තියක් නොවේ.

"කාමරෙත් පැය දෙක තුනකට වඩා ඉඳලා තියෙනවා කියලා ඩොක්ට කිව්වා."

අක්කා කතා කළේ ශෝකයෙනි. ඔවුන් සියලුම දෙනා මා වටකොට හිඳින්නේ ඇයි...? දනෙන හිසරුදාව සේම අපහසුතාවයද කුමක් නිසා කෙසේ හටගත්තාදැයි මම නොදනිමි. නෙතු වසා උන්නද හිඳින්නේ නුහුරු පරිසරයකය යන හැඟීම මට ඉඳුරන් මෙන් දනේ. මම වෙර යොදා නෙතු පියවිලි හරින්නට වෙර දැරීමි.

"සිහිය එනවා."

"ඩොක්ට."

"ඔය බෙල් එක රිංග් කරන්න ලොකු."

"පුතේ... පුතේ..."

"ඩොක්ට එනකම් වැඩිය කරදර නොකර ඉන්න..."

එකිනෙකාගේ කටහඬ වෙන්කර හඳුනාගත් කල එවැනි වචන කිහිපයක් මට ඇසිණි. නෙතට හසුවන විදුලි පංකාවේ පෙති වෙන් කර හඳුනාගත හැකි තරම් අස්වැසිල්ලක් නෙත ලැබුවේ මිනිත්තුවක් පමණ ගතවූවාට පසුවය. පෙර දී බොහෝ ඈතකින් සේ ඇසුණේ අබලන් විදුලි පංකාවේ කිරි කිරියයි.

මම ඇස් කරකවා හාත්පස බැලීමි. අම්මා, අක්කා, අයියා හා දන්නා හඳුනන බවලතකු යහන වටා විය. හෙදියන්, වෛද්‍යවරයාත් දකින්නට පෙරම මා හිඳින්නේ රෝහලක වග මම නිශ්චය කොට උන්නෙමි.

"මුකුත් අමාරුකම් තියෙනවද...?"

වෛද්‍යවරයා ප්‍රශ්න කරන අතර හෙදිය මගේ රුධිර පීඩනය මනින්නට කළමනා සකසමින් උන්නාය.

"ම්... මුකුත් අමාරුවක් තියෙනවද...?"

මම හිස දෙපසට වනා නැතැයි හැඟවීමි.

"ඔළුව රිදෙනවද...?"

"ටිකක් රිදෙනවා."

මා කතා කළේ මහත් වූ වෙර වීරියක් සිතට ගෙනය.

"ඒ වැදිච්ච පාරට."

සිදුවූයේ කුමක්දැයි පෙරපර ගලපන්නට මම වෙහෙසීමි. ඒ අතර වෛද්‍යවරයා මගේ රුධිර පීඩනය නිශ්චය කර ගත්තේය.

"ඔලඩ් ප්‍රෙෂරෙක නම් දැන් අඩුයි."



හෙතෙම මගේ ඇස් පියවිලි පාත් කොට බැලීය.

"මොනවද ඇඟට දැනෙන වෙන අමාරුකම්."

"නි...දි...ම...ත...යි..."

"ඒ බෙහෙත්වලට."

ඒ අතර හෙදිය තම වාරය එනතෙක් බලා උන්නේ බෙහෙත් පෙති කිහිපයක් අතල මත තබාය.

"ම්... මේක බීලා ඉන්න."

ලොකු අයියා මා වත්තන් කොට ගත්තේය. අක්කා බෙහෙත් පෙති කිහිපය මුවට දමා වතුර වත් කළාය. සිරුරක් නැත්තා වාගේ මාගේ ගත අප්‍රාණිකව තිබිණි. නිදාගැනීමේ තදබල ඕනෑකමක් මට විය. දුර ගමනක් යන්නට සමු දෙන්නාක් මෙන් මම ඇඳ වටා බැල්මක් යවා නමාගෙන නෙතු පියා ගත්තෙමි.

අඩ නින්දේ කාලය ආපස්සට යවමින් වූයේ කුමක්දැයි සිහි එලවා ගන්නට මම වෙහෙසෙමි. නුවර ගොස් සමන්දිනී හා මනාලියන් දක්ම බලන්නට ගිය වග මට මතකය. ඒ ගමනේ දී අප අතර වූ සිත් රිදවන සුළු කතා බහ ද මතකයේ වේ. අලුයම ගෙදර පැමිණිය ද නින්දෙන් කිසියම් ශාරීරික වෙහෙසක් මා පෙළ වග යාන්තම් මතකය. ඉන් එහා සිදුවූවන් පිළිබඳ හරියාකාර මතකයක් මා තුළ නොවේ. ඒවා සිහිම වෙහෙසකර වූයෙන් මම හිතට හිස්වන්නට ඉඩහැරීමි. තදබල ඉතා මිහිරි සුවබර නින්දක් මා කරා ආවේ ඉන්පසුවය. පිරිස මා වටකොට වූයෙන් පුදුමාකාර සුරක්ෂිත බවක් මට දැනුණි.

මා අවදි වූයේ ඉන් පැය අටකට පමණ පසුව බව කීවේ ගුණසිරිය. මගේ තනිවට ගුණසිරි තබා සියල්ලෝම නික්ම ගොස් තිබුණි.

"මොකද්ද ගුණසිරි උනේ...?"

ඒ වන විට කායිකව ද - මානසිකව ද මා පිළිවෙලක් වී තිබිණි.

"මහත්තයා ගෙදර ආවෙ කීයට ද කියලා මතක ද...?"

"හුනට විතර. ඇයි...?"

"එතකොට නිදාගත්තෙ...?"

''හතර විතර වෙලා.''

''මහත්තයා සිහිය නැතුව වැටුනෙ කීයට ද කියලා මතක නැද්ද...?''

අලුයම අඩ නින්දෙ දී දැනුණ පිපාසාව හා වෙහෙස නිසා වතුර වීදුරුවක් බොන්නට මම ඇඳෙන් බැස්සේ තවදුරටත් පරිසරය අඳුරුව තිබියදිය.

''මතකයක් නෑ.''

''කීයට සිහිය නැති උනත් මහත්තයාට සිහිය ආවේ නම් එකොළහට.''

''මාව හොස්පිට්ල් ගෙනාවෙ.''

''නමයට විතර. අර... අටහමාර වෙලත් මහත්තයා කාමරෙන් එළියට නේනකොට ලොකු නෝනලා ජනේලෙන් බලලා...''

''ඉතින්...''

''එතකොට දැකලා තියෙන්නෙ මහත්තයා හතරගාතෙ දාලා බිම දාපලා ඉන්නවා.''

''දොස්තර මොකද කියලා තියෙන්නෙ...?''

''අසූහාරදාහට ප්‍රෙෂර් නැගලලු.''

''මගේ...''

''ඔව්.''

මා තුළ මා කෙරෙහිම උපන් තදබල අනුකම්පාවක් හටගත්තේය. මා ලෙඩෙකු, දුර්වලයෙකු වූයේ සමන්දිනී නිසාය යන හැඟීම පුළුන් රොදකට දිය උරා ගන්නා සේ මසිතට උරා ගත්තේය.

එක් සවස් වරුවක සමන්දිනී මා බලන්නට රෝහලට ආවාය. ඉක්මනින් රෝහලින් නික්ම යන්නට හැකි වෙතැයි සිතූ මා මගේ අසනීප තත්ත්වය ඇගෙන් වසන් කළෙමි.

''මං දැනගත්තෙ අද උදේ අම්මා කතා කරාම...''



සමන්දිනී නොසන්සුන්ව උන්නාය. ශෝකයක සේයාද ඇගේ මුහුණේ සෑම ඉරියව්වකම විණි.

''මෙච්චර කතා කරලත් ඇයි මට මේ විස්තර නොකිව්වෙ...?''

''ඉක්මනට ඩිස්චාර්ජ් කරයි කියලා හිතුවා... අනික් එක ලෙඩෙක් බලන්න එන්න පුලුවන් දුරකයෑ ඔයා ඉන්නේ...''

''මොනවද මේ කතා කරන්නේ... ඔහොම කතා කරන්න මොකද්ද අපි අතර තියෙන සම්බන්ධකමේ තේරුම...''

''සතුටු වෙන්න පුලුවන් දෙයක් නම් මම ඉක්මනට කියනවා... දුකක් කරදරයක් ගැන කොහොමද එහෙම කියෙන්නෙ...?''

''ඔයා නම් මහ පුදුම මනුස්සයෙක්නේ.''

සමන්දිනී ඉන් එහා කතා කළේ එදිරිවාදිකම් අත්හළ සේය. කතා කරන අතරවාරයේ ඕ ගිලන් කාමරය අස්පස් කළාය. රටාවකට, ලතාවකට ඇය අතින් සියල්ල හැඩවෙනු මම බලා උන්නෙමි. ඈ ඇසූ ඇතැම් ප්‍රශ්නවලට මා උත්තර දෙන්නට පමා වූයේ ද ඒ අවධානය නිසාවෙනි.

''එදා ඔයා මහන්සි උනා වැඩියි. ඒකයි වෙන්න ඇත්තෙ.''

මම හිස වැනුවා මිස කිසිවක් නොකීමි.

''උදේ හවස නුවර ඇවිත් ගියා මදිවට අපි එදා කොච්චර නම් ඇවිද්දද...?''

මගේ අසනීප තත්ත්වයට හේතුව ලෙසින් ඈ උලුප්පා දක්වන්නට හැදුවේම මාගේ සිරුරේ දුබලතාවයයි. ඇය එසේ කළේ මා රෝගී වන්නට හේතුව තමාය යන සිතිවිල්ල තදින් ඇයට වද දුන් නිසා වන්නට ඇත. ඒ හැඟීම මා තුළ සියුම් තොරිස්සුමක්, තරහක් ඇති කොට තිබුණි.

''ඩොක්ට මොකද කිව්වෙ...?''

සමන්දිනී කතා කළේ ඇඳ ඇතිරිල්ල සකසමිනි.

''වැඩිය අනම් මනම් කල්පනා නොකර පාඩුවෙ ඉන්න කිව්වා.''

සමන්දිනී වැඩ කරමින් උන් වේගය හදිස්සියේම බාල වනු මම

හොඳාකාරවම දිටිමි. මා තුළ හටගත්තේ සියුම් සතුටකි. වෛද්‍යවරයා නොකීවත් මා කීවේ මගේ රෝගී තත්ත්වයට හේතුව මානසික වියවුලකැයි ඇයට ඒත්තු ගන්වන්නටය.

"ඇයි දන්නෑ ඩොක්ට එහෙම කිව්වෙ...?"

"අනේ මන්දා..."

"කල්පනා කරන්න තරම් ප්‍රශ්නයක් ඔයාට තිබුණෙත් නෑනේ."

මම කිසිවක් නොකියා වැඩූ වතුර වීදුරුව ගෙන මදක් බිව්වෙමි.

"ඔෆිස් එකේ වැඩවලට එහෙම මහන්සි උනෙත් නෑනෙ..."

ඇය හදන්නේම වරද කාගේ හෝ පිට පවරන්නටය.

"ඒවා ඉතින් මොනවාට කල්පනා කරන්න ද...?"

සමන්දිනී ඇඳ ඇතිරිල්ල සකසා අවසන් කළාය.

මම ඇඳ වියලට පිට දී වැතිර ගතිමි. සමන්දිනී මා ඉතිරි කළ වතුර වීදුරුව බී හිස් කළාය.

"ඉතින් ඔයා ඩොක්ටට කියන්නෙපැයි එහෙම කල්පනා කරන්න දෙයක් තිබුණේ නෑ කියලා."

ඕ දිගු වටරවුම් සාය එක් පසෙකින් අල්වා දෙකකුල් මැදට කර ගනිමින් හිඳ ගත්තාය.

"දොස්තරලා ආවට ගියාට දෙයක් කියන්නෑනෙ සමන්දිනී..."

මම මවක් පසුපස දුවටෙමින් බොරු ලෙඩක් ගැන කියන දරුවෙකු වාගේ හැසිරෙනැයි වරෙක මට සිතිණි. නමුදු ඒ බොරුවෙන් හැසිරීමෙන් මා කිසියම් තෘප්තියක් ලැබුවා වැනිය.

"බලන් ගියාම ඔයාගෙ ඔක්කොම ලෙඩ මං හම්බුණාට පස්සෙනේ..."

සමන්දිනී රිදවීමේ - පැරවීමේ මාගේ උවමනාව සඵල වී තිබිණි.

"විකාර කතා... මොකෝ ඔයා හම්බවෙන්න ඉස්සෙල්ලා මං ලෙඩ වෙලා නැතුවයැ..."

"ඇයි අම්මත් කිව්වෙ උපන්තේකට ඉස්පිරිතාලෙක නතර නොවෙච්ච කොල්ලට එහෙත් ලගින්න උනා කියලා."

මා සමන්දිනී දෙස බැලුවා නොව බැලිණි. මාගේ මේ සියලු දුක් කරදරවලට හේතුව ඇය බැව් අම්මාද ඇයට ඒත්තු ගැන්වූවා විය හැකිය.

"එයා ඉතින් කරන්නෙ මොනවද... කියන්නෙ මොනවද කියලා දන්නැති මනුස්සයනෙ. මට උනේ එක දිගට නිදි මරපු එක නරකට හිටිය එක."

සමන්දිනී කිසිවක් නොකීවාය. හොඑසේ නම් ඇයට කිසිවක් කියන්නට ඉඩකඩක් නොලැබිණි. අම්මාත්, අක්කාත් අඩුම කුඩුම පොදි බැඳගෙන කාමරයට පැමිණියෙන් අපේ කතාබහ එතැනින් නතරවිණි.

"ඔය ළමයා කොයි වෙලාවෙද ආවේ...?"

"දැන් පැයකට විතර උඩදි අම්මා..."

"අදම යන්නෑනේ..."

ඒ අක්කාය.

"පහේ බස්සෙකේ ගියොත් නවය විතර වෙද්දි යන්නැහැකි... ඒත් අද ඉඳලා හෙටම යන්න හිතාගෙන ආවේ."

"ඒක හොඳයි... ගෙදරත් අම්මයි මැණිකයි විතරයිනෙ."

"ඔය ගෙදර ඉතින් කොයිතරම් නම් මායි මැණිකයි තනියම ඉඳලා තියෙනවද...?"

අම්මාත්, අක්කාත් ගෙනා බඩු මුට්ටු අස් පස් කරමින් කතා කළේ තම තමන්ගේ දේය. ඔවුන් මාගේ සුවදුක් බලන්නට පැමිණි සෙයක් ඉරියව්වකින්වත් පළ නොවිය.

"සුප් එකක් ගෙනාවා බොනවද...?"

අක්කා සුප් බඳුන අතේ තිබියදීම ඇසුවේ බොනවා නම් බීපන් නැත්නම් නිකං හිටපන් යන බැල්මක පිහිටාය.

"මං පස්සෙ බොන්නම්."

අක්කා සුප් බඳුන කබඩය මත තබා මගේ කිළිටි රෙදි බෑගයකට අසුරන්නට ගත්තාය.

''නිවුනට පස්සෙ කොහොමද සුප් බොන්නෙ... ඉන්න මං පොවන්නම්.''

සමන්දිනී මගේ අවසරය නොතකාම තසිම ගෙන ගියේ සෝදන්නටය.

''හරි පුදුම කෙල්ලෙක්නෙ අම්මෙ... මෙච්චර දුරක් ඇවිත් තියෙන්නෙ තනියමනේ.'' ලද අවසරයෙන් අක්කා සමන්දිනිට එරෙහි පළමුවෙනි නෝක්කාඩුව පළ කළාය.

''උඹලගෙ අපේ වගේ නෙවේ... ඒ කෙල්ලගෙ හිත හයියයි.''

අම්මා එය කීවේ සමන්දිනී කෙරෙහි හටගත් ප්‍රසාදයකින් නොවන බැව් මට වැටහිණි. පෙරළා ආ ඇය තසිමට සුප් පුරවන්නට ගත්තාය.

''දාලා දෙන්න මං බොන්නම්.''

සමන්දිනී හිස වැනුවාය.

''කට්ටිය සනීපෙන් ඉන්නවද ළමයො...''

''ඔව් අම්මෙ...''

''තාමත් අර මිනිහයි ළමයයි ඒ ගෙදරද...?''

මට සමන්දිනී දෙස බැලිණි. ඒ පැනයෙන් ඕ අසරණව ගියා වැන්න.

''ඔව්...''

සමන්දිනී කීවේ ඇසෙන නෑසෙන හඬිනි. අම්මා, අක්කා දෙස බලා හිස ඇල කරනු මම යාන්තමට දුටිමි. සමන්දිනී අරබයා, මේ නැගෙන අවලාදය හෙට අම්මාට අක්කාට පමණක් සීමා නොවනු ඇත. සමන්දිනීත්, අනුෂත් අතරට ඒමෙන් මා කළේ ඇගේ ජීවිතයට අඳුරක් හෙළා මගේ ජීවිතයත් අඳුරට හෙළා ගැනීම නොවේද...?



kathapothak.blogspot.com

# 07

මම කයින් සම්පූර්ණයෙන්ම සුවය ලදිමි. නමුදු සිතින් කෙමෙන් කෙමෙන් රෝගීව යමින් උන්නෙමි. රෝහලේ සිටිය දී සමන්දිනී මා දකින්නට නාවේ එක දිනක් පමණි. අම්මා පවා දෙදිනක් නාවාය. ඇගේ ඇවෑමෙන් පැවතුමෙන් මට හිඳින හොඳම ළඟම ඥාතියා තමා බව ඇය ඔප්පු කොට තිබිණි.

ඈ කෙරෙහි ප්‍රේමය, ලෝබකම මසිතේ දළුලා වැඩුණු ද ඒ අප්පේ සැකයක්. අපැහැදිමක් ඔඩුදුවමින් තිබිණි. ඇය හිමිකර ගැනීමෙන් ලබන තෘප්තියට වඩා ඇය අහිමිවීමෙන් ලබන වේදනාව මිහිරි යැයි මට හැඟුණා විය හැකිය. සිරුර තුළ වන වේදනාවට හුරු සහනය ඇගේ ප්‍රේමය අරබයා මම විඳිමින් උන්නෙමි.

දිනෙන් දින දෙවැනි වරටත් යොදාගත් විවාහ ගිවිස ගැනීමේ දවස ළඟාවෙමින් තිබිණි. මම ඒ පිළිබඳව යටි සිතින් දෙගිඩියාවට පත් වූවා මිස කිසිවකු හා කතා නොකළෙමි. සමන්දිනී ද කාලය ගෙවීමේ සිදුවන්නට යන්නේ කුමක්දැයි නොතේරුම් හැඟීමෙන් වන්නට ඇත. ඇය දවසකට දෙතුන් වතාවක් මට කතා කළාය. මම ද එවැනිම වාර ගණනක් ඇයට කතා කළෙමි. නමුදු අපි අප පිළිබඳව කතා නොකළෙමු.

''දැන් මොකද්ද මල්ලි වෙඩින්නෙකට වෙන්නෙ...?''

ලොකු අයියා කතා කළේ දින සනි හැල හොල්මනක් නැතුව ගෙවෙමින් තිබුණු යුගයකදීය.

"මෙ හද්ස්සියෙ ඔවා කරන්න බෑනෙ ලොකු අයියෙ."

"කල් දාන්න ද යන්නෙ...?"

මම හිස වැනීමි

"කොච්චර කාලෙකට ද...?"

"එහෙම කාලයක් හිතුවෙ නෑ."

"කාල වකවානුවක් නැතුව කසාදෙ පරක්කු කරන්න තරම් වයසක නෙවෙයි ඔයා ඉන්නෙ..."

ලොකු අයියා නැගිට ගියේ හිත හොඳකින් නොවේ. සත්තකින්ම මා මේ ගතකරමින් හිඳින්නේ විවාහවන වයසේ අවසන් යාමයයි. මගේම වයසේ පසුවන දන්නා හඳුනන බොහෝදෙනාට දරුවෝ ද වෙති.

සම වයසේ පසුවන ගුණසිරිගේ පුතු දහතුන් හැවිරිදිය. දුව අට හැවිරිදිය. ගුණසිරි විවාහ වී ඇත්තේ විසි හැවිරිදි වියේ දී යැයි කියා මම අසා ඇත්තෙමි. ඔහු විවාහ වී ඇත්තේ විවාහ නොවිය යුතු වයසකය.

මා තවත් පමා වුවහොත් මට සිදුවන්නේ ද විවාහ නොවිය යුතු වයසක විවාහ වන්නටය. සමන්දිනී අතහැර අන් යුවතියක් හා විවාහ වන්න ට සිතට දහිරියක් ද නැත.

සියලු ප්‍රශ්න හා මතවාද පසෙකලා ඇය විවාහ කරගන්නට ද සිතට දහිරියක් නැත. මට සිතෙන්නේ ම ඕ අනූෂට පෙම් කළ වගකි. අනූෂ ඇයට පෙම් කළ වගකි.

අනූෂගේ බිරිය රෝගාතුරව හිඳිය දී සමන්දිනී ඇගේ ආවතේව පිණිස එහි උන්නාය. දකීමෙන් පිරිමිකම් ඇහැරෙන සමන්දිනී වැන්නියක් නිවෙසේ හිඳිය දී අනූෂ බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කළා යැයි සිතීම ද විහිළුවකි. අනූෂ ඇය ප්‍රේමයක ට පොළඹවා නොගත්ත ද කායික ඇසුරකට පොළඹවා ගන්නට ඇතැයි මට සිතේ.

පිරිමියෙකුගේ ආයාසය මත ගැහැනියක් නිරායාසයෙන් රාගික ඇසුරකට පෙළඹෙන බව මම අසා ඇත්තෙමි. එය එසේ වී නම් ඔවුනතර සම්බන්ධයක් නොතිබුණා වන්නට බැරිය.



අනෙක් අතට මේ සියලු දේ මගේ මනෝවිකාර විය හැකිය.

"ඔබේ දෑසට උවමනා නම් කොතරම් පිරිසුදු තැනක වුව කිලිටි දකින්නට ඔබට හැකිවනු ඇතැයි" යන කියමන මම දනිමි.

සමන්දිනී පිළිබඳ සෙනෙහසත්, ඊර්ෂ්‍යාවත්, අපැහැදීමත්, කුහකකමත් සමඟ මම අනන්ත අප්‍රමාණව වද වීමි.

ඒ අතරවාරයේ දවසක අයියා ද අයියාගේ පවුලේ සැම ද, අක්කා ද, අක්කාගේ පවුලේ සැම ද මහ ගෙදර ආවෝය. ඔවුන් පැමිණියේ සමන්දිනීත් මාත් පිළිබඳ තීරණයක් ගන්නට වග මට ඉවෙන් මෙන් වැටහිණි. ඒ නිසාම දහවල් කෑම මගහැර යන්නට මට උවමනා විය.

"අද ඔයා කොහෙවත් යන්නෙ නෑ නේද...?"

අක්කා ආ විගසම කළේ මගේ කාලය වෙන්කර ගැනීමය.

"ඇයි ඒ...?"

"පොඩ්ඩක් අපිට කතා කරන්නෝනා."

"මං ගිහින් ඉක්මනට එනවා."

දොර ළඟ තවත් තත්පර කිහිපයක් රැඳුණු අක්කා යන්නට ගියේ කල්පනාබරව හිඳය. මා ලකලෑස්ති වීම කඩිනම් කළේ යන තැනක් පිළිබඳව නිවැරදි නිගමනයක පිහිටා නොවේ.

මට උවමනා වූයේ අක්කාත්, ලොකු අයියාත්, අම්මාත් එක්තැන්ව කරන කතාබහ මගහරින්නටය. හැඳ පැළඳ අහවර කාමරයෙන් නික්මුණු මම කිසිවකු නොවන කොරිඩෝරය, තරප්පු පෙළ, සාලය ද පසුකොට ආලින්දයට පැමිණිමි.

ඉන් එහා අඩියක් මිදුලට තබන්නට මට නොහැකි වූයේ සතුරකු බලාපොරොත්තුවෙන් හිඳින හමුදාවක් වාගේ අම්මාත්, අක්කාත්, ලොකු අයියාත් මඟ රැක හිඳීමෙනි.

"පොඩ්ඩක් ඉඳගන්නවකො... ඔයා එනකම් අපිට ඉන්ඩ බෑනෙ."

අයියා මා දුටුවෙන් කතා කළේ තරමක නොරිස්සුමින් ඉවත බලාගත්වනමය. ඉඳගැනීම හැරුණු විට මට කරන්නට අන් යමක්

ඉතිරි වී නොතිබිණි. මම අසුනකට බර වූයේ ඔවුන් කතා කරන්නට යන දේ පිළිබඳව හාංකවිසියක්වත් නොදන්නා ස්වරූපයකිනි.

"දැන් මොකද්ද මල්ලි වෙන්නෙ...?"

අයියා කටහඬ අවදි කළේ මහා ගැඹුරු කතාවකට මුල් පුරන සෙයියාවෙනි.

"මොකද්ද වෙන්නෙ කියන්නෙ...?"

"ඔයාගෙ කසාදෙට..."

අයියාට පෙර අක්කා ඉක්මන් වූයේ නොඉවසුමකිනි.

"නව ටික දවසක් යන්ඩ ඇරලා කරනවා."

"උඹ හැරමිටියෙන් යන කාලෙට ද...?"

මම අම්මා දෙස නොඉවසුමින් බැලුවා විනා කිසිවක් නොකීමි.

"තමුසෙලා දෙන්න අතර මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවද...?"

අයියා ඇසුවේ ගැඹුරු ශාන්ත ස්වරූපයකිනි.

"ඔව් එහෙම දෙයක් තියෙනවා නම් කියනවා... මොකද කසාදයක් කියන්නෙ අද ගැට ගහලා හෙට ලෙහන්න පුලුවන් ගැටේකට නෙවෙයිනෙ..."

අයියා හා අක්කා සමඟ සමන්දිනී පිළිබඳ තනු කතා කරන්නට මසිත පෙළඹෙමින් තිබිණි. නමුදු අම්මා හිඳීම සිතේ දිරිය හීන කරවන්නකි. මම යටැසින් අම්මා දෙස බැලීමි.

අයියා මගේ එම බැල්ම දකින්නට ඇත.

"අම්මා ටිකක් ගෙට යන්නකො..."

"ඇයි මං හිටියම කාටද හෙණ ගැහෙන්නෙ...?"

"කියන දේ අහන්නකො අම්මා."

අක්කාගේ පෙළඹවීම මත අම්මා නැඟී උන්නාය.

"එහෙනම් උඹලා ඕන කෙංගෙඩියක් කරගනිල්ලකො."



ඕ ගෙට ගියේ තරහින් පුපුරමින් මොන මොනවාදෝ කියවමින්ය. නමුදු ඒවා නිවැරැදිව මට නැසිණි.

අම්මා පිවිසුම් ආලින්දයෙන් නික්ම ගිය පසුව ඇති වූයේ උහුලා දරාගත නොහැකි සන්සුන්කමකි. මිදුලේ රොබරෝසියා මල් පඳුරේ සිරිසිරිය පවා ඇසෙන තරමට හාත්පස සන්සුන් විය. මුලින් කතා කළ යුත්තේ කවුරුදැයි නිශ්චය කරගත නොහැකිව වාගේ මාත්, අක්කාත්, අයියාත් තත්පර කිහිපයක් ගෙවා දැමීමු.

"ඔයත් පිළිවෙළක් උනානම් අම්මගෙ හිතටත් ලොකු නිදහසක්නෙ මල්ලි. එයා ඔයා ගැන ඔයා හිතනවට වඩා වද වෙනවා."

මුලින් කතාකළේ අයියා ය.

"ඔව්... අම්මා හිතන්නෙ අපි ඔයා ගැන උනන්දුවක් නෑ කියලා."

අක්කා අයියාගේ කතාවේ අඩුපාඩු සකස් කළාය.

"හොඳ කසාදයක් කරගන්න ඕන කරන හැම සුදුසුකමක්ම තියෙද්දී ඔයා මෙහෙම ඉන්නෙක අපිටත් වදයක්නෙ මල්ලි..."

"ඒක නෙන්නම්... මේ විදියට ගියොත් අම්මත් නැති උනාට පස්සෙ ඔයා විතරක් ගෙදර තනි වෙනවා."

අක්කාත්, අයියාත් කතා කළේ මා බ්‍රහ්මචාරී ජීවිතයකට තීරණයක් ගෙන උන්නා වාගේය. සමන්දිනී පිළිබඳව ඔවුන් හා කතා කරන්නට මා තුළ වූ උවමනාව ගිලිහෙමින් තිබිණි.

"මේ විදියට කසාද පරක්කු වෙන එකත් හොඳ දෙයක් නෙවේ මල්ලි... දැන් කී වතාවක් ඔයා දාගත්ත දින කැන්සල් කරාද...?"

නා නා ප්‍රකාර දේ කියා හමාරව අයියා මාතෘකාවට ගොඩ විණි.

"ඇත්තටම මොකද්ද ඔය දෙන්නා අතර තියෙන ප්‍රශ්නෙ...?"

අක්කාද මා උනන්දු කළාය.

"ඔය අනූෂ කියන මිනිහයි මේ ළමයයි අතර මොකක් හරි යාළුකමක් තිබිලා තියෙනවද...?"

අයියා ප්‍රශ්නෙ අසා කෙලවර මදෙස බලා හිඳිනු මම යාන්තමට නෙතගින් දුටිමි.

"එයා නම් කියන්නෙ නෑ කියලා."

මං වචන අහුලා ගතිමි.

"ඒ උනාට ඔයාට සැකයි. එහෙමද...?"

"ඒක සැකයක්ම නෙවෙයි."

"එහෙමනම් මොකද්ද...?"

අක්කාත්, අයියාත් දෙපස හිඳ මාරුවෙන් මාරුවට මා ප්‍රශ්න කරමින් උන්නෝය.

"අනූෂ කැමැති නෑ මායි සමන්දිනීයි කසාද බඳිනවට..."

"මොකද්ද හේතුව..."

අයියාගේ කටහඬේ තිබූ තරහව සමන්දිනී කෙරෙහි උපන්නක් ද අනූෂ කෙරෙහි උපන්නක් ද යන්න පිළිබඳව වෙන් කර හඳුනා ගන්නට මම අපොහොසත් වීමි.

"අනූෂගෙ දරුවා අම්මා කියන්නෙ සමන්දිනීට... ඒ දරුවා උනත් සමන්දිනීට ගොඩක් ආදරෙයි. ඒ බැඳීම නැති වෙනවට අනූෂ කැමති නෑ..."

"මිනිහා එහෙම කිව්වද...?"

මම හිස වැනීමි. මා මේ කියන සියලුම තොරතුරු අක්කා හා අයියා අම්මාගෙන් අසා දැන සිටි වග ඔවුන්ගේ ඉරියව්වලින් ප්‍රකට විණි. අම්මා කී දේ මගෙන් අසා දැන ස්ථිර කරගන්නට ඔවුනට උවමනා වූවා විය යුතුය.

"ඔය විදියට ගියාම සමන්දිනීයි ඔය මනුස්සයයි අතර මොකක් හරි සම්බන්ධයක් තිබිලා තියෙනවා."

අක්කා වචන පිට කළේ කළකිරුණු නොසන්සුන් බවකිනි.

"අනිවාර්යයෙන්ම..."



ඔවුන්ගේ නිගමනය මසිතේ ඇති කළේ වේදනාවකි. සමන්දිනී පිළිබඳ වැරදි චිත්‍රයක් ඔවුන් තුළ මවන්නට මුල් වූයේ මාය.

මා තුළවන පටු ඊර්ෂ්‍යාකාරී සිතිවිලි සමන්දිනීගේ දොස් දැකීමෙන් තෘප්තිමත් විය. ඒ තෘප්තිය කෙළවර වූයේ සිත ඔද්දල් කරවන කළකිරීමකිනි. පීඩාවකිනි.

ඒ කළකිරීම හෝ පීඩාව විසින් ඇයගේ මවිසින් මවාගත් මුහුණ අනායන්ට කියන්නට මා පෙළඹවූවා වැන්න.

තනිකඩව දිවි ගෙවන්නට පෙළඹෙන බොහෝ පිරිමින්ගේ මානසික සංකූලතාවයන් මම පොත පතින් කියවා ඇත්තෙමි. මා තුළ ඇත්තේ ද එවැනි ව්‍යාධියකි.

ඇළුම් කරන දේ අහිමි වේ යැයි බියෙන් දක්වන නොහිසි ප්‍රතිචාර සම්බන්ධ ව්‍යාධියක් නිසා අනුන් රිදවා සතුටු වන්නට ද අනුන් අරබයා දුක් වන්නට ද සිතෙන රෝගයක් බොහෝ කාන්තාවන්ට වේ. පිරිමින් සුළු පිරිසක් ද මීට ගොදුරු වේ. බරපතල නොවන මේ මානසික ව්‍යාධිය මගේ හදවත ආක්‍රමණය කොට ඇතැයි මට සිතිණි.

"සමන්දිනී එහෙම කෙනෙක් නෙවෙයි..."

මා උත්තර දුන්නේ කොපමණ වේලාවකට පසුවදැයි මා නොදනිමි.

නිරුත්තරව මා බොහෝ වේලාවක් හිඳ ඇතැයි මට සිතුණේ අක්කාත්, අයියාත් ගැස්සී වාගේ මදෙස බලද්දීය.

"මොකද්ද එහෙම කෙනෙක් නෙවෙයි කියන කතාව..."

අයියාගේ කටහඬේ වූයේ කුතුහලකි. නොඑසේනම් නොඉවසුමකි.

"සමන්දිනීයි අනූෂයි අතර එහෙම සම්බන්ධයක් තිබුණේ නෑ. ඒක ඒ අම්මා නැති දරුවා නිසා ඇති වෙච්ච ප්‍රශ්නයක්."

"එහෙමනම් මොකද්ද තමුසෙ මේ කසාදෙ කල්දාන්න හේතුව...?"

අක්කා පිට කළේ සමන්දිනී කෙරෙහි වූ කෝපයයි.

"ඒකනේ... නොකිව්වට තමුසෙලා දෙන්නා අතර ප්‍රශ්න තියෙන

විත්තිය අපි දන්නවා. මෙ ප්‍රශ්නෙ තමුසෙට විසඳගන්න බැරිනම අයින් වෙනවා. අපි විසඳලා දෙන්නම්."

අයියා උන්නේ ද වෙව්ලා යන කෝපයකිනි.

"මං කතා කරලා ප්‍රශ්නෙ විසඳගන්නම්."

මගේ කටහඬ අතිශයින් දුර්වලව තිබෙන්නට ඇත.

"අපි මැදිහත් වෙන්න හදන්නෙ වරදක් කරන්න නෙවෙනෙ... ඔයා ඉන්න මායි අයියායි හෙට සමන්දිනීව හම්බවෙන්නම්..."

"ඒක නිකම් තේරුමක් නැති ගමනක් අක්කේ."

"තේරුමක් නැති උනොත් නැති වෙන්නෙ අපිටනේ. තවත් මෙක මේ විදියට බලන් ඉඳලා අමමව ලෙඩ කරන්න බෑ."

"අපි ගිහින් වටාපිටාව බලලා ඒ ළමයත්තෙක්ක කතා කරලා එන්නම්. මෙක කෙරෙන්න හොඳ ද, නරක ද කියලා බලන් ආවට පස්සෙ ඔයා කැමති තීරණයක් ගන්න."

අයියා මගේ ප්‍රතිචාරයක් බලන්නට පමා නොවීම නැගිට ගියේය.

"ඒක නොකෙරෙනවනම් වෙන දෙයක්වත් කෙරෙන්න එපැයි මල්ලි. අපි හෙට ගිහින් එන්නම්."

අක්කා නැගිට ගියේ මුදු මොළොක් හඬින් කියාය.

අක්කාත්, අයියාත් සමන්දිනී හමුවන්නට යන්නට තනන්නේ ඇගේත්, මගේත් ප්‍රේමයෙහි මළගමේ අවසන් කටයුතු සිදු කරන්නට යන වග මට සිතිණි. දැඩි සිත් වේදනාවක් ද ආත්ම අනුකම්පාවක් ද මා වෙළා ගත්තේය.

සහබන්ධු හමුව කොහේට වී හෝ මධුවිතක් තොල ගාන්නට, දුක තනිකම මෙදා ගන්නට සිත ඉව කළෙත් මම ගෙයින් දොරට බැසීමි.

සහබන්ධුගේ නිවෙස වූයේ ප්‍රධාන පාරින් මඳක් ඇතුළට වන්නටය. අඩි පහළොවට නොවැඩි පාර කෙළවර වූයේ ඔහුගේ ගෙදරිනි. ඒ පාරෙහි මෝටර් රිය පදවන්නට මා තුළ වූයේ නොකැමැත්තකි. ඊට හේතු වූයේ එනවිට පෙරට සහ යනවිට ආ



පස්සට ක්‍රමයට රිය පදවන්නට වන නිසාය. බොහෝ කලකින් නො ආ නිසාදෝ මගේ නොරිසිකම මට ද අමතකව තිබිණි.

රිය වැලිපාර දිගෙහි ගොස් සහබන්ධුගේ මිදුලේ නතර විණි.

වෙනදාට ඒ මිදුලේ වන අපිලිවෙල මෙවේලේ එහි නොවීය.

කිසියම් පිරිසිදු කමක්, ලස්සනක් එහි විය.

මම ගෙයි විදුලි සීනුව නාංවා ආයේම මිදුල දෙස බැලීමි. දොරකඩ සිට බලද්දී මිදුල ඩබාත් පියකරුය.

දොර හැරිණි. දොරටුවෙන් මතුව දොරකඩ හිඳ මා දෙස බලන්නේ පැහැපත් සිහින් යුවතියකි.

"සහබන්ධු ඉන්නවද...?"

ඒ සහබන්ධුගේ දියණියක වන්නට ඇතැයි මට සිතිණි.

මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා වෙනුවට ඕ කළේ මගේ පාදාන්තයේ සිට හිස්මුදුන තෙක්ම බැල්ම යැවීමය.

"තාත්තා නැති උනානෙ."

මාගේ පපුව ගැහෙමින් තිබූ රිද්මය වෙනස් විය.

"නැති උනා කියන්නෙ...?"

මා එය ඇසුවා නොව මට එය ඇසිණි. එවර යුවතිය තවත් තත්පරයක් දෙකක් මා දෙස බලා උන්නාය.

"තාත්තා අන්තරා උනා."

එවර ඇය කතා කළේ කිසියම් සිත්වේදනා සහගත බවකිනි.

"දෙයියනේ..."

මුලින් මගේ පපුව බරවිණි. දෙවනුව එය පිපිරිණි. නොබිඳී ඉතිරි වූයේ දුක පමණි.

"මොනවා වෙලාද නැති උනේ...?"

"ඇතුළට එන්න."

මගේ ප්‍රශ්නයට උත්තර දෙනු වෙනුවට ඔ දොර සම්පූර්ණයෙන්ම හැර දැම්මා ය. මම ගෙට ගොඩව ආසන්නයේම වූ අසුනකට බර වීමි.

"තාත්තා ඉතින් ගොඩක් බිව්වනේ."

ඔ මරණයට හේතුව කිව්වේ මා හිඳගත්තාට පසුවය.

"තාත්තව කොහොමද අඳුරන්නෙ...?"

සහබන්ධු මුල්වරට මට හමුවූයේ අවන්හලේදීය. එදා මට කතා කරන්නට කෙනෙකු ඕනෑ විය. අප දෙදෙනාගේ හිතවත්කමට හේතු පාදක වූයේ ඒ ඕනෑකමයි.

"ඔයා තාත්තත්තෙක්කද වැඩ කළේ...?"

"නෑ තාත්තා මගෙ ඔෆිස්සෙකට ඇවිත් තියෙනවා."

"මරණය ගැන දැනගෙන හිටියෙ නැද්ද...?"

මම හිස දෙපසට වැනුවේ බර හුස්මක් හෙළමිනි.

"තාත්තා නැතිවෙලා කොච්චර කාලයක් වෙනවද...?"

"දැන් මාස තුනකුත් පහු උනා."

මගේ දෑසට කඳුළක් මෝදු විණි. සහබන්ධු හා මා අතර වූ සුහද බැඳීමේ මතක සටහන් මගේ දෑස මුත අලුතින් ඉඳිවෙමින් තිබිණි.

මගේත්, සමන්දිනීගේත් ප්‍රේමයේ වයසත්, සහබන්ධුගේත් මගේත් ඇයි හොඳයියේ වයසත් සමානය.

ඒ ඇයි හොඳයිකම, මගේ පැත්තෙන් ගත කළ අමුම අමු අච්චාරුවත්, ආත්මාර්ථකාමී සබඳතාවයකි. මම මේ අසරණ මිනිසා පාවිච්චි කළේ මගේ දුක් කියන්නටය.

ඒ වෙනුවට ඔහු ලද වැටුප වන්නේ මත්පැන්ය. ඔහුගේ මරණයට අනියම් කොටස්කාරයකු වූ මට ඔහුගේ මළගමට එන්නට නොලැබීම එක්තරා අපූරක ශාපයකි. පාපයකි.

"මං ගිහින් එන්නම්."

මම බොහෝ වේලා කල්පනාවේ නිමග්නව හිඳ කෙළවර පැවසීමි.

"ඉන්න මොනවා හරි බීලා යන්න."



"එපා."

මං ගෙයින් දොරට බසිද්දී ඇය ද පසුපස උන්නාය. ඇතැම් විට දරුවන් පවා කඳුළු නොසැලූ සහබන්ධුගේ මළගම වෙනුවෙන් මගේ දෑසේ කඳුළක් වීම ඇගේ පුදුමයට හේතුවන්නට ඇත.

"මොකද්ද මිස්ටර්ගෙ නම...?"

"තිවංක... එතකොට මිස්...?"

"ෆියෝනා... මං පවුලෙ බාලයා."

ෆියෝනා, ඒ සහබන්ධු වැඩිමනත් ආදරය කළ දරුවාය. මම තවත් වතාවක් ඈ දෙස බලා මෝටර් රියට ගොඩවීමි.

වෙනදා රිය හරවන්නට ඉඩකඩ මදි වූ මිදුලෙහි අද ඉඩකඩ වේ.

සහබන්ධුගේ මරණය ඇසීමෙන් කම්පිතව ගිය මම රිය පැදවූයේ යන්ට තැනක් නිශ්චය කොට අවසානව නොවේ.

රිය ඔහේ ඉදිරියට ඇදිණි. කෙළවර සමන්දිනී හමුව සහබන්ධුගේ මරණය සැළකර එන්නට මට සිතිණි.

"මං එනකොට ටිකක් රෑ වෙයි."

ගෙදරට ඇමතුමක් දී රිසීවරය එස වූ මැණිකාට පෙරළා ප්‍රශ්න අසන්නට ඉඩ නොතබා ඇමතුම විසන්ධි කොට මම කොළඹින් ඔබ්බට රිය පැදවීමි.

සහබන්ධුගේ මරණයේ වේදනාව සේම අක්කාත්, අයියාත් සමන්දිනී හමුවන්නට යාමේ දෙගිඩියාව දමනය කර ගැනීම මගේ මේ ගමනේ අරමුණ විය.

සැබෑ ලෙස මම දැඩි සේ කලකිරී උන්නෙමි. හදිසියේම වසර දහයකින් වියපත් වූවා වගේ මසිත දුර්වලව ඔද්දල්ව ගොස් තිබිණි.

ජීවිතය පිළිබඳ ආශාව, බලාපොරොත්තු හීනව ගිය කල්හි ඉතිරිව තිබුණේ කලකිරීම පමණි.

"දිගු ගමනක් හුදෙකලාව යාමේදී සිත ප්‍රබලවේය" යන සිද්ධාන්තය මම අත්විඳිමින් උන්නෙමි. පියවි දෑසින් විත්ඩිත්ත්‍රිනය

එපිට දකිමින් රිය පැදවී ද මගේ සිත දූරාතීතයක දුවමින් තිබිණි. අතීතයේ හිඳ සිත ආයේම වර්තමානය කරා නොගොස් අනාගතය කරා යයි.

අම්මා මිය ගියාට පසු මගේ ජීවිතය කෙබඳු විය හැකිද...? හුදෙකලා වියපත් වයසේ සිහිවිලි මා ඉක්මණින් මරණය කරා ගෙන යනු ඇත.

සියල්ලන්ගේම වාගේ මාගේ අවසානය වන්නේ ද හුදෙකලා දුක්බර මරණයකි.

එය දක දකම ජීවත්වන සංදියේ මා සතුට අරඹයා යමක් නොකරනුයේ මන්ද...? කාලකණ්ණිකම යැයි ලෝකය හඳුන්වන්නේ එය නොවේද...?

මා නුගේතැන්නට ළඟාවද්දී කඳු අතරින් කළුවර ගාටමින් තිබිණි. ඒ මං මාවත්වල කිසිම දවසක නොදැකී පාළු මුසල හුදෙකලා බවක් මගේ දෑස්වල ඇතිල්ලෙමින් තිබිණි. වගෙක ආ ගමන පිළිබඳ පසුතැවිල්ලක් මට දැනුණි. සමන්දිනීගේ නිවෙස පෙනි පෙනී හැරී යන්නට සිතෙන තරම් කුසීත බවක් මා පෙළීය.

මම තත්පර කිහිපයක් රියදුරු අසුනේ හිඳම නිවෙස දෙස බලා උන්නෙමි. කෙලවර රියෙන් බසින්නට මම සිත දැඩිකර ගතිමි. මා පැමිණි වග ඉවෙන් මෙන් දැනී වාගේ සමන්දිනී දොරකඩින් මතුවිය. ඇගේ සිනහා වතේ කිසියම් වෙහෙසකර බවක් විණි. සිහින් ඩා බිඳිති ඇගේ තොල් ඉස්මත්තේ ද කොපුලතේ ද විය. හිසෙක් රොද පවා තරමකට අවුල් වී තිබිණි.

ජනේලයකින් එබී බලන අනූෂ දකිමෙන් ඇගේ එම වතේ කලබලය මගේ සිතේ නොයෙක් ජරාජීර්ණ අදහස් ජනිත කළේය.

"ඔයාව දැක්කම මට පුදුම හිතුණා."

සමන්දිනී මිදුලට බැස්සේ සොම්නසකින් ද නොඑසේ නම් බියකින් ද යන්න සිතන්නට මම වෙහෙසීමි.

"ඇයි ඒ...?"

"ඇයි ඒ කියන්නෙ ඔයා නොකියම ඇවිත්නෙ."



"එහෙම එන එක වරදක්ද...?"

මා කතා කළේ සිතෙහි පොර බදන අප්‍රමාණ කෝපය සඟවා කෙරපාය.

"මොන වරදක් ද... මං ඇහුවෙ පුදුම හිතුණු හින්දා."

"කෝ තාත්තා."

"දැන් හිටියා කොහෙට හරි ගිහින් මං හිතන්නෙ."

මසිතේ වූ සැකය දෙගිඩියාව සිත උතුරා පිටාරා වාත් දැමීය.

සමන්දිනී වෙතින් ප්‍රකට වූ නොසන්සුන් වෙහෙසකර බව මට වඩ වඩාත් තීව්‍රව පෙනිණ. ඇගේ හැසිරීමේ වූ වෙනස ද, මීතැවට වඩා ඉස්මතුව පෙනෙන්නට ගත්තේය. අනූෂ පෙනී නොපෙනී ගියෙන් මසිතෙහි වූ දෙගිඩියාව තව තවත් දැඩි විණි.

"ඉඳගන්න තිවංක..."

සමන්දිනී එම ආරාධනාව කළේ ද දෙගිඩියාවෙනි.

"ඇයි ඔයා මේ බයවෙලා වගේ.."

තවදුරටත් මා සිටගෙන හුන් නිසාදෝ ඇය ඇසුවේ සැක උපදවන සුළු හඬකිනි.

"මොකට බයවෙන්න ද...?"

"ඇයි මේ කේන්තියෙන්...?"

මා කිසිවක් නොකියාම හිඳ ගතිමි. සමන්දිනී මදෙස බලාගත් වනම යාබද අසුනකට බර වූවාය.

"ඇයි තිවංක මොකක් හරි ප්‍රශ්නයක් ද...?"

"වතුර එකක් බොමු."

මා ඇගේ ප්‍රශ්නය මඟ හැරියා නොව මට සිතෙන දෙය මට හැඟෙන දෙය තවදුරටත් හරි ද වැරදි ද යන්න සිතන්නට කල් ගන්නා පමණි. සමන්දිනී නැඟිට ගෙට ගිය පසු මගේ කුතුහලය ද වේදනාව ඇවිස්සිණි.

මොහොතකට පෙරාතුව සමන්දිනී ගෙතුළ හිඳ පිටතට ආවේ

බයකිනි. දෙගිඩියාවකිනි. ඇගේ ඇඳුම් පැළඳුම් පොඩි වී හිසකෙස් අවුල්ව තිබිණි. මුහුණ බයකින් ද නොසන්සුන් කමකින් ද රතුව තිබිණි. අනූෂ ද ජනේලයෙන් එබී නොපෙනී ගියේ උඩුකය නිරුවතිනි. මෙ සියල්ල ඇසින් දුටු දේය. නැන්දාත් ගෙදර නැත. ඔවුන් දෙදෙනා නිවෙස තුළ නොමනා ලෙසින් හැසිරෙනු මගේ ඇස් මත්තේ සිතුවම් පටයක් මෙන් දිග හැරිණි.

''කාලකණ්ණි ගැති...''

ඒ වචන මගේ මුවින් නික්මුණේ හිතා මතා නොවේ. සමන්දිනී වතුර වීදුරුව මට පාමින් බලා උන්නාය. මාගේ කියමන ඇයට නැසුන වග සියක් වාරයක් විශ්වාසය. නමුත් මම යමක් මිමිණූ වග ඇයට ඇසෙන්නට හෝ ඇය දකින්නට හෝ ඇත.

''මෙක බිලා ඉන්න...''

ඇගේ දෝතින් දෙන වතුර වීදුරුව පානය කරන්නට හෝ පිරියක් මා තුළ නොවේ. මට ඇ පිළිබඳ අප්‍රුලක් දැනිණි.

''ඔයා මොකක් හරි ප්‍රශ්නෙක ද තිවංක ඉන්නේ...?''

ඇය සෙනෙහෙබර වන්නට වෙර දැරුවාය. මට එය පෙනුණේ සටකපට කමක් ලෙසිනි.

''එක ප්‍රශ්නෙක නෙවේ ප්‍රශ්න ගොඩක.''

''ප්‍රශ්න ගොඩක කියන්නෙ...?''

''මං ආවේ ඒවා කතා කරන්න නෙවේ සමන්දිනී... ඔයාට පණිවිඩයක් දෙන්න.''

සමන්දිනී ඒ මොකක්දැයි නොඅසා මදෙස බලා උන්නාය. එක්කෝ ඇ සිත පෙලූ වරදකාරී හැඟීම ඕ නිරුත්තර කළා විය යුතුය. ඇ නිදොස් නම් මාගේ අමුතු හැසිරීමෙන් ඇය වික්ෂිප්ත වූවා විය යුතුය. කෙසේ වත් ඇය නිදොස් වන්නට බැරිය.

''මොකද්ද තිවංක පණිවිඩය...?''

මා නොදොඩා හුන් කාලය දිගු වැඩි යැයි මට සිතුණේ එවේලේය.

''සහබන්ධු මැරිලා.''



මම හැඟීම් දැනීම් නැත්තෙකු සේ කියා දැම්මි.

''දෙයියනේ...''

සමන්දිනී ඇඟිලි මුවට තබා පශ්චාත්තාපය පළ කළේ අවංක හැඟීමකින් යැයි මට සිතිණි.

සහබන්ධු වූ කලී මගේත්, ඇගේත් ප්‍රේමයේ නිමැවුම්කරුවාය.

''කවද්ද නැති වෙලා තියෙන්නෙ...?''

සමන්දිනී ඇසුවේ හැඬුම්බර බිඳුණු හඬිනි.

''තුන් මාසෙකට උඩදී...''

සමන්දිනී අන්දමන්දව යමින් මදෙස බැලුවේ මා උමතුවෙන්දැයි ඇගවෙන බැල්මකිනි.

''තුන් මාසෙකට උඩදී...''

සමන්දිනී ප්‍රතිරාව කළේ විශ්මයෙනි. මම ප්‍රතිචාර නොදැක්වීමි.

''ඔයා දැනගත්තෙ අද...?''

''ඔව්... ඒක විතරක් නෙවෙයි තව ගොඩක් දේවල්...''

''ගොඩක් දේවල් කියන්නෙ...?''

ඊට උත්තරයක් දෙන්නට මට ඉඩ නොතබා හැඳ පැළඳගත් අනූෂ ගෙයින් දොරට බැස ගියේ අප දෙදෙනාම නොතකාය. සමන්දිනී තමන් පසුකර යන අනූෂ දෙස බැලුවේ කිසියම් තිගැස්මකින් මෙනි.

''ඇයි ඔයා ගැස්සුණේ...?''

''අනූෂ අයියා ගෙදර හිටියා කියලා මං දැනගෙන හිටියෙ නෑ. නැන්දයි පුතයිත් ගෙදර නැති නිසා ඒ මනුස්සයා දන් යද්දි මං ගැස්සුණා.''

සමන්දිනී සැක කරන්නට මට සාධාරණ කරුණු නොවී ද ඈ ඉතා සියුම්ව මා මෝඩයාට අන්දවන්නට වෙර දරන බව මට ඉවෙන් මෙන් වැටහිණ.

''එක වහල යට ඉඳගෙනත් එහෙම නොදැක ඉන්න පුළුවන් ද...?''

''එයා ඉතින් ගෙදර හිටියත් නොහිටින ගානනෙ... දූත් ඒ මනුස්සයා නැන්දා එකක් කතා කරන්නෙත් නෑ....''

සමන්දිනී කල්පනාබරව කතා කළේ තමන් තව දුරටත් සහබන්ධුගේ මරණය ගැන සිතන බැව් අඟවමිනි.

''මං නම් ගෙට ගොඩ වෙනකොටම අනුෂව දැක්කා.''

මට උවමනා වී තිබුනේ මගේ සැකය ඇගේ වචනවලින් තහවුරු කරගන්නටය.

''ගේ ඇතුළෙ ඉන්නවා...''

සමන්දිනී ඇසුවේ ප්‍රශ්නයක ස්වරූපයෙනි.

''ඔව්. කාමරේ ජනේලෙන් එබිලා බලලා යන්න ගියේ...''

''වාහනේ සද්දෙට කවුද කියලා බලන්න ඇති.''

සමන්දිනී කීවේ ඔනෑවට එපාවටය.

''කොහොමද සහබන්ධූ නැතිවෙලා තියෙන්නේ...?''

''හුස්ම හිරවෙලා.''

මාගේ කෝපය වචනවලට පෙරළුණේ සමන්දිනී අනූෂ පිළිබඳ කාරණාව මගහරිනැයි දැනුණ නිසාය.

''ඇයි මේ ඔයා ආපු වෙලාවෙ ඉඳලා කේන්තියෙන් කතා කරන්නේ...?''

එවර සමන්දිනී කතා කළේ නොරිස්සුමෙනි.

''කේන්තියෙන් නොවේ සමන්දිනී කලකිරීමෙන්.''

මම හුනස්නෙන් නැගුනෙමි.

''මොකද්ද කලකිරෙන්න හේතුව...?''

''හේතු ගොඩයි සමන්දිනී... මං යන්නෝන... මට පරක්කු වෙනවා.''

මම ඒ වචන කෙළවර වන්නට පෙරාතුව ගෙයින් දොරට බැස්සෙමි.



සමන්දිනී තුෂ්නිම්භූතව බලා උන්නා මිස මා වලක්වන්නට උත්සාහ කළේ නැත. නොඑසේනම් එවැන්නකට සිහි එළවා ගන්නට තරම් ඇ සිත නිරවුල් නොවන්නට ඇත.

මා මෝටර් රියට නැගී රිය පණ ගන්වා ගනිද්දී සමන්දිනී රිය වෙතට දිව එනු මම දිටිමි. ඇය එන්නට පෙරාතුව රිය මගට ගන්නට වෙර දැරුව ද ඈ ඉක්මන් විය.

''මොකද්ද තිවංක මේ වෙලා තියෙන්නේ...? ඇයි මේ...?''

''ඔය ප්‍රශ්නෙ අහන්න ඕන මමනෙ සමන්දිනී... මං ඔය ප්‍රශ්නෙ ඇහුවොත් දෙන්න උත්තර ඔයා ගාව තියෙනවද...?''

මෝටර් රියේ කවුළුව වෙතට නැඹුරුව හුන් සමන්දිනී විදුලි සැර වැදුණා වාගේ ඉන් පසෙකට විණි.

''ඔයාට පිස්සු...''

කෙළවර ඕ කීවේ උන්මත්තක විලාශයෙනි. ඉන් මසිත රිදිණි. මෝටර් රියෙන් බැස ඇයට පහර දෙන්නට තරමේ කෝපයක් මසිතේ පුළුසිඳිණි.

මම ඒ සියලු සිතිවිලි මැඩ මෝටර් රිය පෙරට කළෙමි. රියෙහි දකුණු පස දොර ගේට්ටු බඳෙහි වැදී සීරී යනු මට ඇසිණි. හදවත පැරී ලේ ගලද්දී මෝටර් රියට සිදු වූ තුවාල ගැන සොයන්ට තරම් ඕනෑකමක් හෝ දිරියක් මට නොවිය. මම පෙරට රිය පැදවීමි. සමන්දිනී නතර වූ තැන හිඳ බලා සිටිනු මම පැති කණ්ණාඩියෙන් දිටිමි.

මා රිය කෙතරම් වේගයෙන් පැදවූවා දැයි නිනව් නොවේ. මග සලකුණු පිළිබඳ මතකයක් ද මට නොවේ. දුරස්ව යන මෝටර් රිය දෙස බලා හුන් සමන්දිනී තව දුරටත් පැති කණ්ණාඩියේ නොවුණ ද සිතෙහි නතරව උන්නාය.

ඇය පිළිබඳ සියලු සොඳුරු හැඟීම් අඳුරු වලාවකින් වැසී, මැකී යමින් තිබිණි.

ඇයට ආදරය කළ, ඇය පිළිබඳ ලොබ බැඳගත්, සිත බිඳී සී සී කඩ විසිරී තිබිණි. නොබිඳී ඉතිරිව තිබුණේ දුකත්, කලකිරීමත්, සංතාපයත් පමණි.

කුමන හෝ උවමනාවකට කිසියමම තැනක නතර නොකළ රිය කොළඹට ළඟා වද්දී රාත්‍රී අට පසු වී තිබිණි.

ගාලු පාරේ වින අවන්හලකට වැදී මම කුස ගින්දර මත්පැනින් සංතර්පනය කළෙමි. මුල සිට අගටත්, අග සිට මුලටත් සිතිවිලි එහා මෙහා යැව්ව ද වැරැදිකාරිය වූයේ සමන්දිනීමය.

සමන්දිනීත්, අනූෂත් අතර සබඳතාවක් වේ. එය අනූෂගේ පැත්තෙන් ප්‍රේමයකි. වසර ගණනාවක් තිස්සේ රෝගාතුර බිරිය ට කළ නොහැකි වූ අනූෂගේ ආවතේව, ඔනෑ එපාකම් ඉටු කළේ සමන්දිනිය. අනූෂගේ සිතෙහි බිරිය කෙරෙහි අනුකම්පාවක් ද සමන්දිනී කෙරෙහි ප්‍රේමයක් ද වන්නට ඇත.

සමන්දිනීගේ පසින් එය හුදු කායික ඇසුරක් පමණක් වූවා විය යුතුය. දිනෙක අහම්බෙන් හෝ සිදුවීමක් ඇසුරේ ඇය ඊට පෙළඹෙන්නට ඇත. පුරුද්දට ගිය ඒ ඇසුරෙන් මිදෙන්නට ම මගේ සෙනෙහස පැතුවා විය යුතුය.

සියලු පෙර වැරදිවලින් මිදී නිවැරදි වනු පිණිස තෝරා ගත්තේ මා හා විවාහ වීමය. ඒ මට සිතුණු හැටිය. මගේ ඒ සිතිවිලි තහවුරු කළ හැකි සාක්කි මමම උඩින් පල්ලෙන් සොයා ගතිමි.

මත්පැන් වඩි හය හතක් හමාර වද්දී සමන්දිනී මට තබා සල්ලාලකමේ යන පිරිමියෙකුටවත් ගැලපෙන්නියක් නොවන බව මම තීරණය කොට උන්නෙමි.

ඇයට ඒ බැව් කතා කොට පුද්ද සිංහලෙන් කියන්නට මට උවමනා විය. ඒ සඳහා කීප වරක්ම උත්සාහ කළ ද ඇගේ සෙල්ෆෝනය නිවා දමා තිබිණි. ගෙදර දුරකතනයෙහි අංකය අලුත් වූයෙන් එය මගේ මතකයේ නොවේ. මම ඒ කෝපය පිට කලේ ද තවත් මත්පැන් වඩියක් දෙකක් බීමෙනි.

"සර් අපි එකොළහට වහනවා..."

මම බැල්ම ඔසවා අවන්හල් සේවකයා දෙස බැලීමි. පිරිසිදු සුදුවතින් සැරසී ගත් ඔහු මට පෙනුණේ වදයක් පරිද්දෙනි.

"මොකද්ද කිව්වෙ...?"



"අපි එකොළහට වහනවා සර්..."

"එතකොට තමුසෙ කියන්නෙ මට යන්න කියලද...?"

"නෑ සර්... මොනාහරි ඕඩර් කරන්න තියෙන දෙයක් තියෙනව නම් ඕඩර් කරන්න... කිචන් කවුන්ටරේ එකොළහයින් පස්සෙ ඕඩර්ස් බාරගන්නෑ."

"තව කොහෙට කන්න බොන්න ද අයියෙ..."

"බිල් එක හදන්න ද සර්..."

"දැන් බිල කීයක් විතර ඇද්ද...?"

"වන් සෙකන්ඩ් සර්..."

අවන්හල් සේවකයා සිටගත් වනම ගණන් සාදන්නට ගත්තේය. මම ඉතිරිව තිබූ අවසන් මත්පැන් වඩියද ගිල දැම්මෙමි. අවට විදුලි බුබුළු නෙතට හිරිහැර කරමින් දඟලන සෙයක් මට දැනිණි.

"මේ වීකට වන් තවුසන්ඩ් සෙවන් හන්ඩ්‍රඩ් ෆිෆ්ටි සර්..."

මා පසුම්බිය ගෙන රුපියල් දෙදහසේ නෝට්ටුවක් තෝරා බේරා ගත්තේ මහත් වෙර වීරියෙනි.

"තමුසෙ බිල ගෙවා ගන්නවා."

ඉන් එහා ඔහු කිසිවක් කියන්නට පෙරාතුවම මම හුනස්නෙන් නැගිට ගතිමි.

බමන මත උත්සන්නව දැනුණ ද මා තුළ නිවැරදි සිහි කල්පනාවක් විණි. රථ ගාලෙන් මගේ මෝටර් රිය ගන්නට ගියහොත් තවත් රථයක ගැටේවිය යන දෙගිඩියාව මා තුළ ඇති වූයේ ඒ සිහි කල්පනාව නිසා වන්නට ඇත.

"මට මේක පොඩ්ඩක් පාරට අරන් දෙනවද...?"

සිහින් දේහධාරී මැදි වයසේ අයෙකු මගේ බැල්මට හසු විණි.

"පාරට නම් අරන් දෙන්න පුළුවන් සර්. එතනින් එහා සර්ට ගෙනියන්න පුළුවන් වෙයි ද...?"

"තමුසෙ මේක පාරට අරන් දෙනවකෝ... මට ඒ ඇති."

හෙතෙම මා අතින් යතුර ගත්තේය. මම රථ ගාලෙන් පිටවන ගේට්ටුව අභියසට පැමිණියේ කෙලින් සිටගෙන සිටින්නටත් නොහැකි තරමේ අවසිහියෙනි.

මගේ මෝටර් රිය රථ අතරින් පෙරට විත් ගේට්ටුව අභියසට පැමිණෙනු මම දිටිමි. ඒ ජායාවක් බඳු විය. රථය මා ළඟදී වේගය බාල කොට අනතුරුව කඩිනමින් ගාලු පාරට වැටී නික්ම ගියේය. ඒ මගේ මෝටර් රිය නොවන්නට ඇතැයි මට සිතිණි.

මෝටර් රිය ගේට්ටුව පාමුලට එනතෙක් මම තවත් විනාඩි කිහිපයක් ගෙවා දැමීමි. කොහේ හෝ වැටී නිදන තරමට මගේ සිත ඔද්දල්ව තිබිණි. මම අතට අසුවන යම් යම් දේට වාරු වී ආයේම රථගාලට පැමිණියෙමි.

මෝටර් රිය හෝ යතුර දුන් තැනැත්තා රථ ගාලේ නොවිය. පෙර දී නික්ම ගියේ මගේ මෝටර් රිය වන්නට ඇතැයි යන සිහිවිල්ල සිතට එබුණා ද එහි වන බරපතලකම සිතට නොදැනිණි.

ආයේම අවන්හලට යනවා ද නොඑසේ නම් ගෙදර යනවා ද යන අතරමැදි හැඟීමෙන් මසිත නතරව තිබිණි. මම රථ ගාල සිසාරා බැලීමි. උදව්වට හෝ පිහිටට කිසිවකු නොවිය.

මෝටර් රිය පිළිබඳ මගේ මතකය සිතින් බැහැර වූවා වැනිය. ඊළඟට සිතට වද දුන්නේ මා ආවේ කෙසේ ද යන ගැටලුවයි. කෙසේ ආවත් වැටෙන්නට පෙර ඉක්මනට ගෙදර යා යුතුය යන හැඟීම ප්‍රබල විය.

මා ත්‍රී වීලරයකට ගොඩ වනු ද මහ මග පුරුදු මං සලකුණු පසුවනු ද ත්‍රී වීලරයෙන් බසිනු ද මට මතකය. අම්මාගේ ගාලගෝට්ටි, ඇනුම් බැනුම් ද මැණිකාගේ විස්මය ප්‍රකට කරවන රොස් පරොස් වචන ද එවේලේ මට බලපෑම් කළේ නැත. දිගු තද නින්දකට වැටෙනවා මට යාන්තමට මතකය.

"මං වාහනේ පොලිසියට ගෙනැත් පාක් කළේ සර්ට දඬුවමක් දෙන්ඩෝනා හින්දා."

"ඔබතුමා කරලා තියෙන දේ බොහොම හරි."

අයියා කතා කළේ තෘප්තියකිනි.



"වෙච්ච දේ සර්ට මතක නැති කතාව ඇත්ත... ඒක මතක තියෙන්ඩ තරම් සිහිය තිබුණා නම් සර් යුනිෆෝම් ඇඳපු පොලිස්කාරයෙකුට යතුර දෙයි යෑ වාහනේ පාරට අරන් දෙන්ව කියලා."

පිරිස හිනැහිණි. මා ආයාසයෙන් ඔවුනට හවුල් වීමි.

"එතකොට ඔබතුමා හිටියෙ යුනිෆෝම් ද...?"

අයියා කතා කළේ ඔහු උද්දාමයට පත් කරමිනි.

"ඔව්නෙ..."

"ඉන්නරේ දාන්ඩ වැඩේ..."

පැමිණිලි කවුන්ටරයේ උන් පොලිස් නිලධාරියා කීවේ සුහද සිනහවකිනි.

"සර්ලා වගේ රටට ප්‍රයෝජනවත් මිනිස්සු ඔහොම ඕලා විනාශවෙන්ඩ ගියොත්... රටක් ඉතුරු වෙන එකකුත් නෑ."

"මං එහෙම පුරුද්දට බොන කෙනෙක් නෙවෙයි."

මා කුමක් හෝ කිව යුතුයැයි හැඟුණෙන් කතා කළෙමි.

"මට හිතුණා."

පොලිස් නිලධාරියාගේ ලීලාව වඩාත් ළෙන්ගතු විය.

"සර් නුගේතැන්නෙ කෙනෙක් කියලයි මං හිතුවේ..."

"ඇයි ඒ...?"

අයියා ඒ කියමනෙන් කලබල වූයේ සමන්දිනීගේ ගම නුගේතැන්න වග සිහිවීමෙන් වන්නට ඇත.

"නෑ... නුගේතැන්න පෙට්‍රල් ෂෙඩ් එකේ බිලක් කාරෙකේ තිබුණා ඒකයි."

අයියා නෙතඟින් මදෙස බලනු මම දිටිමි. මම ඔහුගේ බැල්ම මගහැර ඉවත බැලීමි. මා හදිසියේ නුගේතැන්නේ යාමත්, රැයෙහි බීමත් අතරවන සබඳතාව තේරුම් ගන්නට ඔහු වෙහෙසුණා විය යුතුයි.

"යං... කා එක පාක් එකේ."

සිහින් දේහධාරියා, මට මෝටර් රියෙහි යතුර දෙමින් කතා කළේය.

"මං එස්. අයි. ගුණසිංහ."

මම ඔහුට සුහදතාවයත්, ස්තූතියත් පළ කරනු වස් ඔහුගේ උරහිසට තට්ටු කළෙමි. සිත නොසන්සුන්ව, ආවේගශීලීව තිබුණෙන් ඉන් එහා ප්‍රතිචාරයකට දිරියක්, ශක්තියක් මට නොවීය. මට ඕනෑ වී තිබුණේ සියල්ලන්ගෙන්ම මිදී කාමරයෙහි හුදෙකලා වන්නටය.

මා රැකගත් ආත්ම ගරුත්වය ද, ආත්ම අභිමානය ද සමන්දිනී නිසාවෙන් නැත්තටම නැති වී යන බවක් මට දැනිණි. වරද ඇගේ චර්යාවේ ද මගේ සිතිවිල්ලේ ද යන ගැටලුව මා පෙළුව ද සියල්ල සිදු වූයේ නම් ඇය නිසා වග මට සහතිකය. ඈ හමුවීමෙන් පසු ජීවිතයට සිදු වූ අනේක විධ ගිරිහැර වෙනස්කම් මා වෙහෙසට පත් කොට තිබිණි. ඇය හරි හෝ වේවා වැරදි හෝ වේවා ඇය සමඟ විවාහවීමෙන් මගේ ජීවිතයට උදා වන කලඑළියක් නැතැයි මට සිතිණි. ඇගෙන් මිදීම වෙහෙසකර කටයුත්තකි. ඒ අරඹයා සිතට දැනෙන දුක වේදනා කවදා කෙසේ තුනී වේදැයි මම නොදනිමි. සමහර විට ඒ දුක සංතාපය සදහටම මා පෙළනු ඇත.

කුමක් හෝ අසුබවාදී සිතිවිල්ලක් සමන්දිනීත්, මාත් අතර වූ හිඩැස පුරවා තිබේ. ඇය ගැන මෙතෙහි වද්දී සිතට එළඹෙන්නේ දුකට හුරු ඉමිහිරි සිතිවිලි ගොන්නකි. තුවාලයක වේදනාවකින් ලබන විකෘති සුවය ඊට සමානය. ඇය හිමි වීමෙන් මට ලැබෙන සතුට හෝ සොම්නසට වඩා ඇය අහිමිවීමෙන් ලැබෙන පාලුව, තනිකමට මසිත ඉව කරයි. මේ එක්තරා ආකාරයක විකෘති මනෝභාවයකැයි මට සිතුණි.

අනුෂ පිළිබඳව උපන් ඊර්ෂ්‍යාවක් ද, සමන්දිනී කෙරෙහි උපන් කේන්තියක් ද මෙම සිතිවිල්ලට හේතු වූ වග මම දනිමි. අම්මා නැති අනූෂගේ දරුවා පිළිබඳ මසිතේ අනුකම්පාවක් වේදැයි වරෙක මම මගේ යටි සිතෙන් ඇසීමි. තාත්තාත්, මාත් අතර වූ බැඳීම හේතු කොට ගෙන දරුවා පිළිබඳ කිසියම් අනුකම්පාවක් මසිත පිළිසිඳුණද එය සමන්දිනී දුන් දෙන්නට තරම් ප්‍රබල කාරණාවක් නොවීය.



සමන්දිනී කෙරෙහි මසිතේ වන ප්‍රේමය මහා විශාලය. ඇය අරඹයා සිතේ පැන නගින උමතුව ද එසේමය. ඇගේ සිතත් රිදවා, මගේ සිතත් රිදවා ගැනීම හැරුණු විට මේ සම්බන්ධයෙන් අප ලබන අන් දෙයක් නැති තරමය.

සමන්දිනීගෙන් ඈත් වන්නට මම තීරණය කළෙමි. මගේ තීරණය ඇය කෙසේ බාර ගනීවි ද යන්න මම නොදනිමි. වරෙක ඇය එයට හඬා වැටෙනු ඇත. තීන්දු වූ මංගල්ලයක් සිදු නොවීම පිළිබඳව ඇය ලැජ්ජාවට පත් වනු ඇත. සියල්ල කෙළවර ඇගේත් අනූෂගේත් සම්බන්ධය අලුත් වී විවාහ වී හෝ නොවී ඔවුන් එක වහලක් යට ජීවත්වනු ඇත. එම සිදුවීම ඉක්මන් කරන්නට මා කාගේ හෝ අත ගැනීම ද බලපානු ඇති බව මම දනිමි. මෙවර ගෙදරින් යෝජනා කරන වඩා හොඳ තැනැත්තිය විවාහ කර ගැනීමට මා තීරණය කළේ එනිසාය.

ඉන් එහා සිතිවිලිවලට හදවතට එන්නට ඉඩ නොදී මම නොනු පියා ගතිමි. පෙරදා රැයෙහි බීමතින් ලද ශාරීරික වෙහෙසත්, සමන්දිනී නිසාවෙන් ලද මානසික වෙහෙසත් නිසා දවල් වරුවේම මා උන්නේ තද නින්දේය.

සවස් වරුවේ අක්කාත්, අයියාත්, අයියාගේ බිරියත් මහගෙදර විත් තිබුනේ මගේ ප්‍රශ්නයෙහි නිමාවක්, කෙළවරක් දකින්නටය. මෝටර් රිය සම්බන්ධසිදුවීම අම්මාට හැරුණු විට අන් සියල්ලන්ටම නොරහසක්ව තිබිණි.

"තාත්තා හිටියානම් තමුසෙගෙ මේ වැඩ දැකලා වහ බොයි..."

අක්කා බුරුලක් නොදීම කළේ දොස් නැගීමය.

"බාර් ගානේ ගිහින් සිහි නැතිවෙනකන් බොන තත්වෙට තමුසෙ වැටුණෙ කොහොමද...?"

අවංකවම අයියා මගේ හැසිරීමෙන් පශ්චාත්තාපයට පත් වී තිබිණි.

"අයියා විස්තරේ කියද්දී මට අදහගන්නත් බැරි උනා..."

විවේකා අක්කා ඒ කතා කරන මොහොතේ උන්නේ ද මා එවැන්නක් කළාදැයි අවිශ්වාසයෙනි.

"මූට මුගෙ රස්සාව ගැන හිතන්න තිබ්බා..." මාගේ මුනිවත හමුවේ අක්කාගේ කෝපය වඩාත් තීව්‍ර වූවා මිස අඩු වූයේ නැත.

"මේවා මෙහෙම උනාම ජනිත්ලත් අපිට හිනා වෙනවනෙ අයියේ..."

ජනිත් අක්කාගේ ස්වාමි පුරුෂයාය. සරල සැහැල්ලු ජීවිතයක් ගෙවන ඔහු මෙවැනි සිදුවීම් බරපතල ලෙස නොගනී. ඔහු උදෑසන දුරකතනයෙන් කතා කොට කීවේ, "ඔහොම බොනවානම් ඩ්‍රයිවර් කෙනෙක් එක්කන් යන්නට එපැයි" කියාය. ඒ හැරුණු විට ඔහු බොන්නට එපායැයි කිවේ නැත.

"දැන් ඉතින් තවත් බලන් ඉඳලා වැඩක් නෑ. හෙටම සමන්දිනි මූණ ගැහිලා මේවා ඉවරයක් කරලා දාමමු ඉවරයි."

දෙස් දෙවොල් තබන තැන අයියා කිවේය.

"ඔව් අන්තිමට ඒවා වෙලාවට කරලා දුන්නෑ කියලා අම්මගෙන් නරක නාමෙ එන්නෙ අපි දෙන්නට..."

"කොහොමටත් ඉතින් තවත් ඔක කල් දාන එකේ තේරුමක් නැනේ..."

විවේකා අක්කා උත්සාහ කළේම සියල්ල සාමදානව විසඳන්නටය.

"ඔව්... හෙටම ඒ ගමන දා ගත්තම ඉවරයි..."

අයියා ගත්තේ කිසිම හේතුවක් උඩ වෙනස් නොකරන තීරණයකැයි මට සිතිණි. කතා කරන්නට මා පෙළඹවූයේ ඒ සිතිවිල්ලයි.

"සමන්දිනිව හම්බවෙන්න යන්නෙපා."

දෙදණ මත දෙවැළමිට තබා බිම බලා හුන් මම එම ඉරියව්වේම පිහිටා බිම බලාගත් වනම කතා කළෙමි.

"මොකක්ද හේතුව...?"

අක්කාගේ කටහඬෙහි වූයේ කෝපයකි.

"ඒක කෙරෙන්නෙ නෑ..."

කිසිවකු කතා කළේ නැත. හිස ඔසවා ඔවුන්ගේ ප්‍රතිචාර බැලීමේ



හැඟබල උවමනාවක් මට ඇති විණි. නමුදු ඊට දිරියක් හෝ ශක්තියක් මට නොවුණි.

"ඇයි ඒ...?"

තත්පර කිහිපයකට පසු අයියාගේ බිඳුණු කටහඬ මතු වය.

"කතා කරනවා... ඇයි ඒ...?"

පෙරාතුව අක්කාගේ කටහඬෙහි වූ ආවේගය හෝ කෝපය කවදුරටත් එහි නොවීය.

"හේතු හොයනෙක් තේරුමක් නෑ..."

මම ආයාසයෙන් වචන ගොනු කොට ගත්තෙමි.

"හේතු හොයන්නැතුව කොහොමද මිනිහෝ... මේක තීන්දු කර ගත්ත මඟුලක්නේ. ඒ කෙල්ල කොහොමද ගමෙ රටෙ නෑයින්ට, මිනිස්සුන්ට මූණ දෙන්නේ..."

"ඒකනෙ මල්ලියේ..."

විවේකා අක්කා කතා කළේ පශ්චත්තාපයත්, විස්මයත් කැටි කොට ගත් හඬිනි.

"දැන් තමුසෙගෙ තීරණේ සමන්දිනි දන්නවද...?"

අයියා කතා කළේ තත්පර කිහිපයක් සන්සුන්ව හිඳ හමාරවය.

"නෑ... මං ඒක කියන්නම්."

"හේතුවක් නැතුව කොහොමද මිනිහෝ ඒක කියන්නේ...?"

වේදනාවත් කලකිරීමත් විසින් අක්කාගේ වචන මා තුළ කෝපයක් ඇති කළේය.

"කියන්නෙ මම නම් ඒක ඕගොල්ලන්ට අදාල නැතේ..."

"උඹ ඕන කුදයක් ගහගනින්..."

අක්කා ආවේගයෙන් නැඟිට කාමරයෙන් නික්ම ගියේ මහ හඬින් දොර වසමිණි. මම ද නාන කාමරයට වැද දොර වසා ගතිමි.

අක්කාත්, අයියාත් කාමරයෙන් නික්ම යනු මට ඇසිණි.

# 08

සමන්දිනි පිළිබඳ කතාබහ හිටි හැටියේම නතර විණි. අක්කාත්, අයියාත් අම්මාට ඒ පිළිබඳව කතා නොකරන ලෙස අවවාද කරන්නට ඇත. අම්මාත්, මැණිකාත් එක්ව මට පුරුදු ලෙස මඟුල් තුලා සෙව්වෝය. අක්කාත්, අයියාත් හැකි පමණින් ඒ කටයුත්තට දායක වූවෝය.

දරාගත නොහැකි තරමේ සන්තුෂ්ටකමක් ජීවිතය වසා පැතිරෙමින් තිබිණි. මම හැකි වෙර යොදා සාමාන්‍ය ජීවිතයට පුරුදු පුහුණුවීමි. කාර්යාලයේ වැඩ කටයුතු සඳහා මම වෙනදාට වඩා කැප වීමි. සතුට වෙනුවෙන් කළ හැකි සියල්ල කළෙමි.

නමුදු සතුට හෝ සැනසීම මා කරා ආවේ නැත. එය එසේ වීද තෘප්තිමත් සර්ව සම්පූර්ණ මිනිසෙකු ලෙස ජීවත්වීමේ ඔනෑකම ද අභිමතය ද මා තුළ විය.

සියල්ල අභිබවා හදවතට වද දුන්නේ සමන්දිනීගේ සන්සුන්කමය. ඇය පිළිබඳව ආරංචියක් නොමැතිව, ඇයගෙන් ඇමතුමක් හෝ ලිපියක් නොමැතිව ගෙවෙන නෙවන සතියේ මම වඩාත් නොසන්සුන් වූයෙමි.

ඇය හමුව අවසන් වරට ආ දා ඇයත්, මාත් අතර සිත් බිඳීමක් ඇති වූ වග සැබෑවකි.

අනූමත්, ඇයත් හුදෙකලාව නිවෙසේ හිඳීමෙන් හා ඔවුන්ගේ



අමුතු හැසිරීමෙන් මම සිත රිදවා ගත්තෙමි. ඒ සිත් රිදීම ප්‍රකට කළ පමණින් ඇය මා හා මෙතරම් බිඳෙන්නට තරම් කිසියම් වරදක් ඔවුන් අතින් සිදු වූවා විය යුතුය.

මම අලුතින් ඇගේ දොස් දකිමින් ඇය ප්‍රතික්ෂේප කරමින් උන්නෙමි. අඩුම තරමින් ඇගේ නැන්දාවත් මා හමු නොවූයේ ඔවුන් තුළ පවතින පහත් ගතිය නිසා යැයි මම සිතමි. යෝජිත මෙවැනි මංගල්‍යයක් බිඳුණු දා ගැහැනු කෙතරම් නම් සැලේ ද...?

ඔවුන් එසේ නොවූයේ මෙවැනි සිදුවීම් ඔවුනට සරල සාමාන්‍ය ඒවා වීම නිසා විය යුතුය.

හිත හදා ගන්නට එයම ප්‍රබල කරුණක් විය. මම හුස්ම ගන්නවාට වැඩි වාර ගණනක් ඒ පිළිබඳව සිතමින් සිත දැඩි කර ගත්තෙමි.

පුරුදු ඒකාකාරී කුසීත ජීවිතය නැවත මා සිතට එබෙමින් තිබුණු අතර දිනෙක සමන්දිනීගේ නැන්දා ඇස් වාට්ටුව හන්දියේ දී මම දිටිමි. යටපත්ව තිබූ හැඟීම අවදිව මා දැඩි සේ නොසන්සුන් කළේය. යමින් හුන්නේ වැදගත් රාජකාරි ගමනකි. මම එය පසෙකලා වට රවුමෙන් මෝටර් රිය හරවා ගතිමි. ඇමතුමක් දී රාජකාරි කටයුත්තට සහභාගී විය නොහැකි බව දැනුම් දුන් මම පෙරළා ඔවුන්ගේ ප්‍රතිචාර ලැබෙන තෙක් නොහිඳ සෙල්ෆෝනය නිවා දැමීමි.

වටරවුම ළඟින් බස් නැවතුම තෙක් යමින් හිඳිය දී සමන්දිනීගේ නැන්දා මා සොයා ගත්තේ ද තෙවතාවකට වඩා මෝටර් රිය එහා මෙහා කරකැවීමෙන් අනතුරුවය.

මම මෝටර් රිය ඇය සමීපයේ නතර කළේ අහම්බෙන් ඇ හුදු බවක් පාමිනි.

"නැන්දෙ..."

සැබැවටම ඕ මා දකිමෙන් තිගැස්සිණි.

"කොහේ යන ගමන් ද...?"

"ඉස්පිරිතාලෙට ආවා දරුවෝ..."

ඇය කතා කළේ ද ප්‍රකට කළ තිගැස්මෙන් යුතුව

''මාත් මෙ මිනිස්ට්‍රියට යන ගමන්. අහම්බෙන් නැන්දව දැක්කේ... කවුද ඉස්පිරිතාලෙ ඉන්නෙ...''

''පොඩි එකා පුතේ. සමන්දිනී දරුවා ගාව...''

''නැන්දා මේ කොහෙ යන ගමන්ද...?''

''මං මේ දරුවා බලලා යමින් ගමන්...''

''නුවර...?''

මා ඇසුවේ විස්මයක සරිනි.

''නෑ දරුවෝ මේ දවස්වල අපි ඉන්නෙ අරංගල... අනූෂගෙ අක්කා කෙනෙක්ගෙ ගෙදර...''

''නැන්දා දැන් ඔය ඒ පැත්තට යන ගමන්ද...?''

''ඔව් පුතේ... මං දරුවා බලන්න දවල්ට එනවා. අනූෂ හවසට එනවා.''

''නගින්න මාත් යන්නෙ ඒ පැත්තට මං ගිහින් ඇරලවන්නම්.''

''ඕනැත් නෑ දරුවෝ... මට බස්සෙකේ යනැකි. අනික රාජකාරි ගමනකට යද්දි මාව ඇරලව ඇරලව ඉන්න පුලුවන්ද...?''

''මට ඒ ගමන යන්න තියෙන්නෙ හතරට නැන්දෙ. ඉක්මනට නගින්න. පිටිපස්සෙ වාහන හිරවෙලා.''

මම ඇයට මෝටර් රියේ දොර හැර දුන්නේ නොවුණු කලබලයක් පාමිනි. ඕ වහා රියට නැග හිඳ ගත්තාය.

''දරුවාට මොනවා වෙලාද...?''

මම කතා කරන්නට ගත්තේ මඳ දුරක් මෝටර් රිය පැදවීමෙන් අනතුරුවය.

''බඩේ අමාරුවක් කියලා එහෙ ඉස්පිරිතාලෙට ඇතුල් කරේ... පස්සෙ එහෙන් කොළඹට මාරු කරා පුතේ...''

''මොකද දන්නෑ හේතුව.''

''ඔපරේෂන් එකක් කරන්න තියෙනවැයි කියලා...''



''දරුවා ගාව දිගටම ඉන්නෙ සමන්දනීද...?''

''නෑ පුතේ මායි සමන්දිනීයි මාරුවෙන් මාරුවට හිටියෙ... දැන් දවස් දෙකක් තිස්සෙම ඉන්නෙ කෙල්ල... ඔපරේෂන් එකේ චිත්තිය කියනවැයිත් මං ඉඳලා වැඩක් නෑ කියලා එයැයි කියනවනේ.''

''එහෙමද...?''

අප අතර මුනිවතක් ඉහිරිණි. සමන්දිනීගේ නැන්දා කතා නොකර සිටින්නට, සිටින්නට මම රියෙහි වේගය බලා කළෙමි.

ඒ කතා කිරීම සඳහා උවමනා කාලය ඉතිරිකර ගන්නටය.

''මොකෝ දරුවො අරහෙම උනේ...''

තත්පර කිහිපයකට පසුව සමන්දිනීගේ නැන්දා කතා කළේ පරිස්සමෙනි.

''මොකක් ගැනද නැන්දා අහන්නේ කියලා මම තේරුන් නෑ...''

''ඔය දරුවා මෙච්චර ඉක්මනට වෙච්චි හැමදෙයක්ම අමතක කරපු එක ගැන මට හරි පුදුමයි. මං උනත් මේක පස්සෙ හාර අවුස්ස අවුස්ස නාවේ සමන්දිනී තදින් එපාය කිව්වා ගින්දා.''

''සමන්දිනීටත් මට කතා කරන්න යුතුකමක් තිබුණෙ නැන්දේ... කතා නොකරෙත් එයාගෙ හිතෙත් මොකක් හරි තියෙන හින්දනෙ...''

''ඒක මහ අසාධාරණ කතාවක් දරුවෝ... ඔයාගෙ අයියායි, අක්කයි දෙන්නම ඇවිත් මේ කසාදෙ කෙරෙන් නැතෙයි කිව්වට පස්සෙත් ඒක පස්සෙ එලවන් එන්න ඒ දූරිවිට පුලුවන් ද...?''

මගේ ඇඟ හිරි වැටී යනු මට දැනිණි. සිතිවිලි නතර වූවා වැන්න.

''අපෙ අක්කලා එහෙ ආවද...?''

මා ඇසුවා නොව මට ඇසිණි.

''මං කියන්නෙ ඊයෙ පෙරේදා ආව කතාවක් ගැන නෙමේ... ඔය ළමයා එච්ච වතාව ගැන...''

''මං එච්ච වතාව...''

මගේ කටහඬට නොරිස්සුමක් එක්වන්නට ඇත.

"එතකොට ඔය ළමයගෙ අයියයි, අක්කයි ආවෙ ඔය ළමයා නොදැනුවත්වද...?"

පිළිතුරු දෙනවා වෙනුවට මම රියෙහි වේගය වැඩි කළෙමි.

විනාඩි කිහිපයක් දුර මාත් සමන්දිනීගේ නැන්දාත් මුනිවතින් ගමන් කළෙමු. මා වාගේම සමන්දිනීගේ නැන්දා උන්නේත් දෙගිඩියාවෙන් වන්නට ඇත. අරංගල හන්දිය පසු කරද්දී ඇ නැවත කතා කළේ ඒ දෙගිඩියාව දරාගත නොහැකි තැන යැයි මට සිතිණි.

"ඔය ළමයාගෙ අයියයි අක්කයි ආවෙ ඔය ළමයා නොදැනුවත්වද...?"

ඇය ඇසුවේ පෙර ප්‍රශ්නයමය. වචනවල එහා මෙහාවක් මිස එහි අරුතෙහි වෙනසක් නොවීය. දිය යුත්තේ කුමන පිළිතුරක්දැයි සොයා ගන්නට මට නොහැකි විය.

අක්කාත්, අයියාත් ආවේ මගේ ඕනෑකමට නොවේයැයි කිවහොත් අප අතර වූ බැඳීම ආයේම මුලට යනු ඇත.

එය සිදු වූයේ මා දැනුවත්ව යැයි කිවහොත් තව තවත් අපේ සිත් පළුදු වනු ඇත.

"යන කතාවක් කිව්වට ගියා කියලා මං දැනගෙන හිටියෙ නෑ."

මම තවදුරටත් රිය පදවමින් කතා කළෙමි.

"මං ඔය ඉස්සරහ හන්දියෙන් බහිනවා දරුවෝ..."

සමන්දිනීගේ නැන්දාගේ කටහඬේ වූයේ නොතිම් කලකිරීමකි.

"මං ගෙවල් ගාවට දාන්නම් පාර කියන්න."

"ඕන නෑ ළමයො මං මෙහෙන් බහින්නම්... පොළටත් යන්න තියෙනවා."

මම රිය මඟ අයිනකට වන්නට නතර කළෙමි. සමන්දිනීගේ නැන්දා රියෙන් බසිනවා වෙනුවට යාදින්නියකගේ බැල්මෙන් මදෙස බැලීය.



"ඇත්තටම මේ අහිංසක කෙල්ලට විරුද්ධ උනේ ඔය දරුව ද නැත්නම් ගෙදර ඇයොද...?"

ඇත්ත පිළිතුර නම් මාය. නමුදු එය මතු කර පෙන්වන්නට තරම් සිතට දිරියක් ශක්තියක් නොවේ.

මගේ යටි සිත තවමත් සමන්දිනී කෙරෙහි ඉව කරනවා වත්ද...?

නොඑසේනම් මේ අසරණ ගැහැනියගේ සිත රිදවන පිළිතුරක් දීමට මා තුළ වන නොකැමැත්ත මා දුර්වල කරනවා වත්ද...?

"ඔබ ටිකක් දීර්ඝව කතා කරන්න ඕන කාරණාවක් නැත්දේ...?"

"මං ඇහුව ප්‍රශ්නෙට තියෙන්නෙ බොහොම කෙටි පිළිතුරයිනෙ පුතේ.. සමන්දිනීට අකැමැති උණේ පුතාද...? ගෙදර ඇයොද...?"

මා සිතුවාට වඩා සමන්දිනීගේ නැන්දා දැනුවත් ගැහැනියකි. ඕ තියුණුය. පරෙස්සමශීලීය. ඇ අසන ප්‍රශ්නයකින් පලා යාම හෝ මඟ හැරීම පහසු නොවේ.

ඇය කෙළින් කතා කරද්දී මා වැන්නෙකු වටින් පිළිතුරු දීම ද නොමනාය.

"සමන්දිනීත්තෙක්ක මට ප්‍රශ්න තිබුණා නැත්දෙ...?"

"මං ඒ මොනවද කියලා අහන්නෙ නෑ... මොකද ඒක ඕගොල්ලන්ගෙ පුද්ගලික ප්‍රශ්නයක්නේ.. හැබැයි මං ඔය ප්‍රශ්නෙම සමන්දිනිගෙනුත් ඇහුවා."

"එයා මොකද කිව්වෙ...?"

"එයා දැනුවත්ව කිසි ප්‍රශ්නයක් තිබුණ්නෑ කිව්වා."

සමන්දිනීගේ නැන්දා බර සුසුමක් හෙළමින් රියෙන් බසින්නට සූදානම් වූවාය. මෝටර් රියෙහි අගුල සොයාගත නොහැකිව ඕ දොර ආම්පන්න අත පත ගාද්දී මම රියෙන් බැස ඇයට දොර හැර දුනිමි.

"මං යන්නම් දරුවෝ..."

මම හිස වැනීමි.

''දරුවා ඉන්න වෝඩ් එක මොකද්ද...?''

''දහ තුන... හතළිස් හතේ ඇඳ.''

මඳක් නතරව කියා යන්නට හැරුණු සමන්දිනීගේ තාත්තා ආයේම මවෙත ආවේ යමක් මෙනෙහි වී වාගේය.

''ඇඬුවේ දෙඩුවේ නැති උණාට කෙල්ල මේ ප්‍රශ්නෙදි ගොඩක් වද විඳපු විත්තිය මං දන්නවා ළමයෝ... එහෙම එකේ ආයෙ ඔය දරුවා ඒ ළමයව මුලිච්චි වෙන එක එච්චර හොඳ දෙයක් නෙවේ.''

ලෝකය එක තත්පරයක දී නතරව ගියාක් බඳු හැඟීමක් මට දැනුණි. අතිශය වේදනාකාරී සිත් තැවුලක් රත් වූ පිහි තුඩු වාගේ පපු කුහරයට කිඳා බැස්සේය.

''මං ඔය දරුවා හම්බුණ විත්තියක් සමන්දිනීට කියන්නෙත් නෑ. හොඳම දේ ඔය ළමයා ආයෙ සමන්දිනීව හම්බ නොවී ඉන්නෙක.''

මම ඉරියව්වකුදු වෙනස් නොකොට ඇ දෙස බලා උන්නෙමි. ඇය අවසන්වරට මදෙස බලන්නා වාගේ බලා පාර මාරු වී යන්නට ගියාය.

''සර් ත්‍රීවිල් පාක් එකේ කාරෙක ගහලා තියෙන්නෙ...''

''මහ්... සොරි...''

මම මැදිවියේ මිනිසාට සිනහ වී මෝටර් රියට ගොඩවීමි. යා යුත්තේ කොහේ ද...? ඒ කුමක් සඳහා ද යන්න පවා මට නිනව් නොවීය.

මට නොදන්වා අක්කාත්, අයියාත් සමන්දිනී සොයා යාමෙන් කර ඇත්තේ වරදකි.

ඔවුනට මැදිහත් වී විසඳන්නට අප අතර වූයේ යෝජිත සබඳතාවක් නොවේ.

එහෙම පිටින්ම ඔවුන් කර ඇත්තේ අනිසි වැඩකි. ඔවුන් සමන්දිනීගෙන් පලිගත්තා වැන්න.

කෝපය උත්සන්න වූයෙන් මම අයියා සොයා කාර්යාලයට ගියෙමි.



ඔහු අත්‍යාවශ්‍ය කරුණක් සඳහා කාර්යාලයෙන් බැහැරව ගොස් තිබුණු අතර සෙල්ෆෝනය ද නිවා දමා තිබුණි. සිතෙහි ආවේගය තුනී නොවූයෙන් මම අක්කා දකින්නට ගියෙමි.

ඕ මගේ පැමිණීමෙන් විස්මයට පත් වූයේ ආරාධනා කොට හෝ ගෙදරට ගෙන්වා ගත නොහැකි මා අහම්බෙන් පැමිණි නිසාය.

''ඇයි මේ වෙලාවෙ...''

''ඔයාට පොඩ්ඩක් කතා කරන්න ඕන.''

''මං ඔයා එනකොට බයවුණා අම්මා අසනීපෙන්වත්ද කියලා...''

මම පෙරළා කිසිවක් නොකියාම අසුනකට බර වීමි.

''කාළුද ඉන්නෙ...?''

''ඔව්...''

ඔව් යැයි කීවාට දිවා ආහාරය තබා මා උදෑසන කෑම වේලවත් ගෙන තිබුණේ නැත.

''මොනවද බොන්නෙ...?''

''මුකුත් එපා...''

මාගේ අමුතු හැසිරීමෙන් අක්කා දෙගිඩියාවට පත්වන්නට ඇත.

''ඇයි මොකද වුණේ...?''

අක්කා හිඳගත්තේ ප්‍රශ්නකාරී බැල්මකින් මදෙස බලමිනි.

''ඔයයි අයියයි සමන්දිනී හම්බවෙන්න ගියා ද...?''

මා එය ඇසුවේ මහත් වේලාවක් සන්සුන්ව හිඳ සිතට දිරිගෙනය.

මා ආවේ කුමන හෝ ගැටලුවක් මුල් කරගෙන යැයි අක්කා අනුමානයට සිතන්නට ඇත. ඕ මට කතා කරන්නට ඉඩ හැර සන්සුන් වූයේ එනිසා විය යුතුය. මම සිතෙහි ආවේගය මැඩ කතාවට අවතීර්ණ වනු උදෙසා තවත් තත්පර කිහිපයක් ගෙවා දැමීමි.

''ඕගොල්ලො සමන්දිනී හම්බවෙන්න ගියා ද...?'' තත්පර කිහිපයක් සන්සුන්ව හිඳ මම ඇසීමි.

''කවද්ද...?''

අක්කා ප්‍රශ්න කළේ මගේ ප්‍රශ්නය එතරම් වැදගැම්මකට ගෙන නොවේ. සැබෑ ලෙසම මම ඉන්කෝපයට පත්වීමි.

''කවද්ද කියලා දන්නෙ ඔගොල්ලොනේ...''

''අපි ඊයේ පෙරේදා ගියේ නෑ.''

''ගියෙ කවද්ද කියලා නෙවේ අක්කෙ මං ඇහුවෙ ගියා ද නැද්ද කියලා.''

මගේ කටහඬ තරමකට සැරවන්නට ඇත.

''තමුසෙගෙ තීරණේ දැනුම දෙන්න ගියාට පස්සෙ ගියෙ නෑ... ඇයි...?''

අක්කා කැත්තට පොල්ල වාගේ උත්තරය.

''මගේ තීරණේ දැනුම දෙන්න ඔගොල්ලො ගිය මොකටද ඒකට යන්නෝන මමනේ.''

අක්කාගේ දෑස් කෝපයෙන් දිලිසෙනු මම දිටිමි. ඒ බැල්ම දරාගත නොහැකි තැන මම අහක බලා ගතිමි.

''උඹට ඒ රාජකාරිය කරන්න දීලා අපිට පැත්තකට වෙන්න තිබුණා උඹ මෙකට අපිව ගාව නොගත්තනම්.''

ඉන් එහා එකටෙක කියන්න දිරියක් මා තුළ නොතිබුණා වාගේ මම නිරුත්තර වීමි.

''නැගම් ගිහින්... නැකැත් බලලා... මඟුලුත් තීන්දු කරාට පස්සේ ඒක තවදුරටත් උඹේ රාජකාරියක් වෙන් නෑ මල්ලියේ...''

''මේක ඔගොල්ලො යෝජනා කරපු මඟුලක් නෙවේනෙ අක්කේ...''

''අපි යෝජනා කරපු මඟුලක් උනා නම් උඹව කසාද බන්දන්නේ බලෙන්. මොකෝ උඹේ මොළේ අමාරුකම්වලට අහිංසක කෙල්ලො පලි නෑ.''

අක්කා කතා කළේ දැඩි ආවේගයකිනි.



''මායි අයියයි ඒ කෙල්ල හම්බ වෙලා මේ විස්තරේ කිව්වෙ උඹ ගැන හිතලා නෙවේ. ඒ කෙල්ල ගැන හිතලා...''

ඉන් එහා කතා කළේ අක්කා පමණි. මා කළේ කරබා ගත් වනම අසා හිඳීම පමණකි.

''උඹ දන්නවද උඹ ඒ කෙල්ලගේ ජීවිතේට කරපු විනාසෙක තරම... මඟුලට දිනත් තීන්දු කරලා මේ විදියට මඟුල නොකෙරුණාම ඒ කෙල්ල කොහොමද ගම රටට මූණ දෙන්නේ...''

''මොකද්ද මම කරපු වරද...?''

මගේ කටහඬ දුර්වලව තිබෙන්නට ඇත.

''මඟුලකට දින තීන්දු කරලා අවුරුදු දෙකක් ඒ කෙල්ලව ආශ්‍රය කරලා... ගැළපෙන්නෑ කියනෙක වරදක් නෙවෙයිද...?''

මම කරබා උන්නෙමි. තත්පර කිහිපයක් නිසොල්මනේ ගෙවී ගියේය.

''ඒ කෙල්ල කාත් කවුරුවත් නැති අසරණ එකියක් හින්දා උඹ බේරුණා... නැත්නම් අපිට ගෙදෙට්ට ගේන්න වෙන්නෙ උඹේ මිනිය...''

අක්කා කියවිල්ලට විරාම තැබුවේ හුස්ම ගන්නට පමණි. ඇගේ මුවින් පිට වුණු සෑම වචනයකම මා කෙරෙහි වූ පිළිකුලක්, කළකිරීමක් විය.

''සමන්දිනීට උඹ කරා වගේ දෙයක් පිට මිනිහෙක් මට කරානම් උඹයි අයියයි නිකම් ඉන්නවද...? ඒ කෙල්ලට කාත් කවුරුවත් නැති නිසා උඹ බේරුණා...''

අක්කා හුනස්නෙන් නැගිට්ටේ තවදුරටත් එහි රැඳුනහොත් මට පහර දෙන්නට වෙතැයි සැකයකින් මෙනි.

''මම අයියවත් එක්කාසු කරගෙන ඒ ගමන ගියේ නැතිවෙන ඒ කෙල්ලගෙ ආත්ම ගෞරවේ ගැන හිතලා මිසක් උඹ ගැන හිතලා නෙවේ... වෙලාවකට උඹ අපේ කාත්තටත් ලැජ්ජාවක් මල්ලියේ...''

අක්කා යන්නට ගියේ ළඟ තිබූ වඩාත්ම කිසුණු ආධාරයෙන් මගේ පසු කුහරය හාරා දමා මෙනි.

මම ඇගේ අවසන් වචනවලින් ලද වේදනාවෙන් ඔත්පලව අසරණව ගියෙමි. අක්කා සාලයෙන් නික්ම ගියාට පසු මම තව දුරටත් එහිම රැඳිමි.

සුළඟ ගස් අතු පතරවල දවටෙන හඬද දුහුවිලි පොළවෙන් මතුව දිව යන හඬ ද ඇසෙන තරමට මගේ හදවත සත්සුන්ව තිබිණි. අනූෂත්, සමන්දිනිත් අතර වූ සම්බන්ධතාවය අක්කාට කියා දමන්නට මට සිතිණි. නමුදු එය මගේ සිතෙහි අරක් ගත් සැකයකි. ඔප්පු කරන්නට සාක්ෂි හෝ කරුණු කාරණා ඒ සඳහා නොවන තරමය.

කියන්නට ඇත්තේ අනූෂ වරක් පැමිණ සමන්දිනී විවාහ කර නොගන්නා ලෙස මට කළ ඉල්ලීමත්, මා ඔහුගේ දරුවාට මවක් නැති කළායැයි බීමතින් ඔහු කළ චෝදනාවත් පමණි.

නැවතිල්ලේ සිතද්දී ඒ කිසිවකට සමන්දිනී සම්බන්ධ නොවේ. මා ඇය කසාද නොබඳින්නට ගත් තීරණය හරියට එක් පාර්ශවයක් පමණක් කැඳවා ගත් නඩු තීන්දුවක් වැන්න.

මා නිසා සමන්දිනීගේ ජීවිතය විනාශ වී ගියායැයි මුල්වරට මට සිතිණි.

පසුතැවිල්ල කළකිරීම වඩ වඩාත් මසිතට එළඹෙද්දී සමන්දිනී කෙරෙහි වූ හිතේ අඳුරු කෙමෙන්... කෙමෙන්... තුරුල් වන සෙයක් මට දැනුණි.

අඩ පැයකට වඩා සාලයේ හුදෙකලාව උන් මම සාලයෙන් නික්ම ගෙයින් දොරට බැස්සේ උහුලා ගත නොහැකි පශ්චාත්තාපයකිනි. සතුටින් කෙළවර වන්නට තිබූ කතාන්දරයක් දුක්බර අවසානයක් දක්වා ආවේ මගේ සිතිවිලිවල වරදකිනැයි මට සිතිණි. මම හැගීම්, දැනීම් නැත්තෙකු සේ කාර්යාලයට රිය පැදවීමි.

වාහනය පිවිසුමේ ගාල් කළ මම යතුර ආරක්ෂක නිලධාරියාට දී කාර්යාල කාමරයට වැද දොර වසා ගතිමි. අසුනේ දිගෑදී සුව පහසු හුස්මක් ගන්නට මත්තෙන් කාමරයට තට්ටු කරන හඬ මට ඇසිණි. එන්නට එපාැයි කෑ ගසා කියන්නට මට උවමනා වීද ඊට දිරියක් හෝ නොහික්මුණුකමක් මා තුළ නොවිය.

ඊළඟ තත්පරයේ චතුරංගී කාමරයට ගොඩ විය.



"සර්ට ආපු ගමන් චෙයාමන්ට කෝල් කරන්න කිව්වා."

මම පෙරලා කිසිවක් නොකියාම ඈ දෙස බලා උන්නෙමි. සිහින් දේහධාරී ඕ කර වැඩිපුර කැපූ බ්ලවුසයට, වියත් දෙකක් පමණ දිග සායක් හැඳ උන්නාය.

"පොඩ්ඩක් ඉන්න."

ඇය පැත්තට හැරෙද්දී මා එසේ කීවේ රාජකාරි කරුණක් අරභයා නොවේ. ඕ ආයේ හැරී තවත් පෙරට විත් සිට ගත්තාය. මම තදුව තියුණුව ඇගේ අඟ පසඟ දෙස බලා උන්නෙමි. ඇය ද කෙමෙන් බියපත් වන බැල්මෙන් මදෙස බලා උන්නාය.

"ඇයි සර්...?"

"මුකුත් නෑ."

එවර ඕ හැරී කාමරයෙන් නිකම ගියේ මගේ බැල්ම දරාගත නොහැකි තැනාය.

දිනක් දෙදිනක් හැල හොල්මනකින් තොරව ගෙවී ගියේය. සමන්දිනී හමුවන්නට මා තුළ වූ උනන්දුව වඩ වඩාත් තීව්‍ර විය. සතියක් ඉකුත් වී ද දරුවා රෝහලින් නිදහස් කොට නොතිබිණි.

මා ඒ බැව් සැක හැර දැනගත්තේ රෝහලට යන එන නැන්දාත්, අනූෂත් දකිමෙනි. මා ඔවුන් දුටුවේ අහම්බෙන් නොවේ. සමන්දිනී තවදුරටත් හිඳින්නේද දැන ගැනීමට නැන්දාත්, අනූෂාත් යන එන බැව් නිරීක්ෂණය කළෙමි.

එක් සවස් වරුවක සමන්දිනී ඇස් වාට්ටුවෙන් බැස සෙනඟ අතරින් පාර මාරු වනු මම දිටිමි. මගේ සිතිවිලි දැඩි ලෙස ව්‍යාකූල විය. සිතෙහි තෙරපවා හුන් සියලු හැඟීම් පුපුරා ගිය බවක් මට දැනිණි. මම මෝටර් රිය මඟ අයිනක නතර කර ගද්දීත් සමන්දිනී ඇස් මානයෙන් දුරස්ව හුන්නාය. දරුවා ළඟ නැන්දා තබා ඇය ඈත් නිවසේ සිට එන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

මාගේ සිතිවිල්ල නිවැරැදි නම් දැන් දරුවා ළඟ නතර වන්නේ සමන්දිනීය. පෙරළා ගෙදර යන්නේ ඇගේ නැන්දාය. ඇය හා කතා කරන්නට නොහැකි වීම පිළිබඳව ශෝකයක් පසුතැවිල්ලක් මසිතට

වද දෙමින් තිබිණි. අනෙක් අතට ඇය හමුවීමෙ පරමාර්ථය කුමක්දැයි මම යටි සිතින් අනේක වාරයක් ප්‍රශ්න කළෙමි. ඇය හා කතා කරන්නට නොහැකිවීම හොඳ යැයි මම සිත රවටා ගතිමි.

නමුදු ඇය හෝ නැන්දනිය හෝ රෝහලින් පිටතට එනතෙක් පැයකට වැඩි කාලයක් මම රථයට වී ගෙවා දැම්මී. අනතුරුව ඇගේ නැන්දා පළමු වරට මට හමු වූ බස් නැවතුමට ගොස් මම රථය ගාල් කර ගතිමි. අඩ පැයක් පමණ ගත වන විට නින්දක් මගේ නෙතටත්, සිතටත් වද දෙමින් තිබිණි. යාන්තමට මගේ ඇස් පියවෙමින් එද්දි උස් තැනකින් වැටෙන්නට යන්නාක් බඳු හැඟීමකින් මම අවදි වීමි. එය හරියට දෙව හාස්කමක් බඳුය.

මා අවදි වූයේ සමන්දිනී පාර මාරු වෙමින් හුන් ඇසිල්ලේය. නිල් පාට මල් වැටුනු සුදු දිගු ගවුමක් හැඳ හුන් ඕ තනි කොණ්ඩ කරලක් ගොතා හුන්නාය.

මහත පටි කරබෑගයක් පැළඳි ඇගේ දෙපයේ සිහින් පටි සහිත සෙරෙප්පු යුවළකි. තාත්තාගේ වන්දි මුදල ගන්නට කාර්යාලයට ආ පළමු දිනයේ ඈ වෙතින් දිස් වූ සරල සැහැල්ලු බව තවදුරටත් ඈ ළඟ වේ. සොඳුරුකම වෙනදාටත් වඩා වැඩි කමක් ඇතැයි මට සිතිණි.

ලෝභකමක්, ඊර්ෂ්‍යාවක් වැනි හැඟීම් අකුණු සැරක් මගේ හදවතේ ඉපිද සිරුර පුරා දිව ගියේ විදුලි සැර ගලා යන්නාක් මෙනි. මම මිනිත්තුවට වැඩි කාලයක් ඉහළට ගත් හුස්ම පහළට නොහෙළා ඈ දෙස බලා උන්නෙමි.

මා පියවි සිහියට පත්වූයේ සමන්දිනී බසයකට අත පාද්දීය. වාසනාවට බසය වේගය බාල කළා පමණි. පිරිමින් කිහිපදෙනකු යමින් සිටි බසයට ගොඩවිය. පිරිමින් වැනි ගැහැනුත් කිහිපදෙනෙකු ද එසේ කළෝය. සමන්දිනී නොරිස්සුමෙන් මෙන් පිටුවා යන බසය දෙස බලා උන්නා පමණි.

ඊළඟට ගත යුතු ආසන්නතම පියවර කුමක්දැයි සිතා ගත නොහැකි මම රියෙන් බැස කඩයකට ගොඩ වූයේ සමන්දිනීට පෙනෙන පරිදිය. දුම් නොබොන මම සිගරට් පැකට්ටුවක් මිල දී ගත්තේ මගේ කඩා වැටීම ඇයට හඟවන්නටය. අනතුරුව දුම්වැටියක් දල්වා ගත්



මම එය ඇයට හොඳින් පෙනෙන පරිද්දෙන් ප්‍රදර්ශනය කරමින් මෝටර් රියට ගමන් කළෙමි.

"මහත්මයා ගින්දර ටිකක් දෙනවද...?"

මා ඉදිරියට විත් නතර වූයේ කිලිටි වී ගිය ඇඳුමින් යුතු සෙම කෙළ පෙරා ගත් උන්මත්තක මිනිසෙකි. ඔහු අත බීඩියක් විය. දුම්වැටිය ඔහු වෙත දෙනවා ද යන්න තීරණය කිරීමට මට තවත් තත්පර කිහිපයක් ගත විය. සිදුවීම සමන්දිනී දුටුවා ද යන ලැජ්ජාව ඒ තත්පර කිහිපය මා සිතට මහත් සේ වදයක් විණි.

එය සැක හැර දැන ගන්නට මම යාන්තමට ඇස් හරවා සමන්දිනී දෙස බැලීමි. සමන්දිනී ඒ මා ද, වෙන කෙනෙකු ද යන්න සැක හැර දැන ගන්නට මෙන් මදෙස බලා උන්නාය. ඉන් එහා කටයුතු සිදු වූයේ මා සිතාමතා සැලසුම් කළ පරිදි නොවේ. මා ඇය අහම්බෙන් දුටු පරිද්දෙන් ඈ දෙස ආගන්තුකව බැලීමි. කෙළවර සිගරට් පැකට්ටුව රහසේ සාක්කුවට රුවා ගත්තේ ද ඇයට පෙනෙන පරිද්දෙනි.

"මහත්තයා ගින්දර පොඩ්ඩක් දෙනවද...?"

මා ඉදිරියේ වන උමතු මිනිසා පිළිබඳව මට අමුතුවෙන් සිහිවූයේ එවේලේය. මම ලැජ්ජාවත් නොසන්සුන්කමත් මැඩ සිගරට්ටුව යාචකයාට දී සමන්දිනී වෙතට ගියෙමි. ඕ මා හඳුනාගත් සෙයින් සිනාසුණේ අප අතර කිසිදු මනබේදයක් හට නොගත් සෙයිණි.

"මං එකපාරටම අඳුන ගත්තේ නෑ... ඒකයි ටිකක් බලන් හිටියෙ"

සමන්දිනීගේ කටහඬෙහි වූයේ ආගන්තුක බවකි.

"ආ... මහත්තයා..."

බීඩිය දල්වා ගත් උමතු මිනිසා මට සිගරට්ටුව දිගු කරගන්වනම බලා උන්නේය. පොළොව පළාගෙන ගොස් සැඟවෙන්නට තරම් ලැජ්ජාවක් මසිතේ පිළිසිඳිණි.

"එපා..."

මා කීවා නොව මට එසේ කියවිණි.

"කමක් නෑ. මහත්තයා බොන්න මං සිගරට් බොන්නෑ. බීඩිය මගේ නෙවෙයි ඔවා බීලා පුරුද්දට ගියොත් ඉහ ගහන්ඩ බෑ."

සමන්දිනී යාචකයා දෙසත් මදෙසත් බලා උන්නේ එකම බැල්මකිනි.

"ඔක විසික්කරලා දානවා."

"ඒකට මට හිත දෙන්නෑ මහත්තයා. මොනවා උනත් සල්ලිනෙ. මහත්තයම අරන් විසික්කරලා දාන්න."

මම ඔහු අතින් සිගරට්ටුව ගෙන බිමට අතහැර දැමුවේ වෙන කරන්නට කිසිවක් ඉතිරි වී නැති තැනය. උමතු මිනිසා ඉන් අහවර අමුතු සිනහවක් පා යන්නට ගියේය.

"පිස්සෙක්."

මම කෝපයත් අවඥාවත් පළ කලෙමි.

"ඒ වගේ නේද...?"

සමන්දිනී කීවේ ඔනෑවට එපාවට මෙනි.

"ඔයා ඉස්සර සිගරට් බිව්වෙ නෑනේ."

ඒ අතර සමන්දිනී ඇසුවේ හදිස්සියේ යමක් මෙනෙහි වූ සෙයියාවෙනි.

"නෑ."

"ඔක තේරුමක් නැති පුරුද්දක්නෙ."

මා සිනාසුණා මිස පෙරලා කිසිත් නොකීමි.

"අනිත්තෙක මිනිස්සු මුලින් කරලා අතෑරින පුරුදු.... ඔයා මුලින් නොකර පස්සෙ කරන්න පටන් අරන්."

ඇය අරඹයා මගේ ජීවිතය කාලකණ්ණි වී ඇතැයි හඟවන්නට මා තුළ තිබූ උවමනාව විකසිත වෙමින් තිබිණි.

"නැන්දා කිව්වා ඔයාව හම්බුණා කියලා."

ඊළඟ තත්පරයේ ඒ කතාව ඕ වෙනතට හැරවූයේ මසිතේ ශෝකයක් ජනිත කරවමිනි. මගේ ජීවිතය කාලකණ්ණි වීම ඇයට බල නොපාන කරුණකැයි ඇය ව්‍යංගයෙන් මට කීවා වැන්න.

"ඔයා [illegible] යන්නෙ."

"අපේ අලුත් ඔෆිස්සෙකක් දාලා තියෙනවා ඔය ඉස්සරහා."

මම ඇය දකින්නට ලැබෙන තෙක් මඟ රැක උන් වගක් සඟවා බොරුවක් කීමි.

"ඉස්සර තිබුණේ නෑනෙ."

"නෑ.... මේ ළඟදී දැම්මෙ."

"ඔයාට පරක්කු වෙයි."

"එහෙමට හදිස්සියක් නෑ සමන්දිනී."

ඉන් එහා තත්පරයක් දෙකක් අප අතර මුනිවතක් ඉහිරිණි.

"අම්මලා මැණිකෙලා... සනීපෙන් ඉන්නවද තිවංක."

"වරදක් නෑ... දූත් දරුවට කොහොමද...?"

මා එය ඇසුවේ සමන්දිනී අම්මාත්, මැණිකාත් සිහිකළ නිසාවෙන් හටගත් මතක්වීමෙනි.

එසේ නොවන්නට දරුවා පිළිබඳ අබමල් රේණුවක තරම්වත් මතකයක් මට වූයේ නැත.

"වෙනසක් නෑ තිවංක. තව ටෙස්ට් එකක් කරනකම් මුකුත් කියන්න බැරිලු..."

සමන්දිනී කිව්වෙ අඳුරුව යන මුහුණෙනි. දරුවා පිළිබඳව කණගාටු වෙනවා වෙනුවට, සමන්දිනී එම දරුවා පිළිබඳව මෙතරම් කණගාටු වන්නට හේතු යටි සිතෙන් විමසන්නට තරම් මගේ සිතිවිලි නරුම වී තිබිණි.

සමන්දිනී කතා කළේ යනෙන බස් රථ දෙස මහත් ඕනෑකමින් බලමිනි. මගේ හමුවීමෙන් ඇය කිසිදු විශේෂිත උද්දාමයකට හෝ තිගැස්මකට පත්ව නොඋන්නාය. මම වඩාත් සිත රිදවා ගත්තේ ඒ සම්බන්ධයෙනි.

"මං යන්නෙත් ඒ පැත්තට... යං මං සමන්දිනීව ඇරලවන්නම්."

''තේරුමක් නෑ තිවංක... මට එක බස් එකනෙ. ඇරත් අද සතියෙ දවසක්නෙ. ඔයාට අප්‍රමාණ වැඩ ඇති...''

''එහෙමට වැඩක් නෑ සමන්දිනී... යං... මට පහට ඔෆිස් එකේ හිටියම හොඳටම ඇති.''

මම මෝටර් රිය වෙතට යන්නට සූදානම් වෙමින් කතා කළෙමි.

''බොරු වැඩක් තිවංක මට ඔය එන බස් එකේ යනෑකි. අපරාදෙනෙ ඔයාගෙ කාලේ...''

සමන්දිනී කීවේ ඈත රථ පෙළ දෙස පයෙහි ඇඟිලි මතින් ඉස්සී බලමිනි.

''මං යන්නෙ ඒ පැත්තට සමන්දිනී. ඇයි බොරුවට අදිමදි කරන්නේ...?''

අයිතියක් නැතත් මා තුළ සියුම් කෝපයක් හට ගෙන තිබිණි.

''කමක් නෑ තිවංක මං මේ බස් එකේ යන්නම්.''

බසයක් නැවතුමට සේන්දු වූයේත් සමන්දිනී ඒ වෙතට ගියෙත් ඇසිපිය සලන වේගයෙනි. කුමක්, කෙසේ කළයුතු දැයි සිතා ගත නොහැකි මම අන්දමන්දව බලා උන්නෙමි.

''අම්මලව මතක් කළා කියන්න.''

සමන්දිනී බසයට නගින්නට යන අවසන් තත්පරයේ හැරී බලා කතා කළාය. ඉන් අනතුරු ඇය සෙනඟ අතරින් නොපෙනී ගියාය.

දෙතොල්දාහක් ගැහැනු පිරිමි අතර ඇය සොයා දැක ගන්නට මගේ ඇස් දුක් වින්දේය. බසය පෙරට ඇදිණි. තත්පරයෙන්, තත්පරය එය ඈතට ඇදී ගියේය.

බස් රිය නොපෙනී ගිය පසු සන්තක සියලු දේ නැත්තටම නැති කර ගත්තෙකුගේ සිතිවිලි මසිතේ සැම සියුම් ලේ නහරයකටම රිංගා ගත්තාක් මෙන්ය.

මම සෙමින් සෙමින් මෝටර් රිය වෙත ගොස් රියදුරු අසුනට කඩා වැටිණි. මසිතේ වන වැඩ්දිකාරී සිතිවිලි නිසාවෙන් මා සමන්දිනී අහිමි කරගත්තාය යන පසුතැවිල්ල මට තදින් දැනිණි.



වටිනාකම දැනෙන්නේ අහිමිව යද්දීය යන සිද්ධාන්තය මට ප්‍රායෝගික වූවා මෙන්ය.

සමන්දිනී රැගෙන නික්ම ගිය බස් රිය විදියෙහි නොවිණි. මේ වන විට එය නැවතුමෙන් සැතපුම් තුන හතරක් වත් දුර ගෙවා අවසන් වන්නට ඇත.

නමුදු මට වෙනත් මඟකින් අරංගල හන්දියට යන්නට ගත වන්නේ අඩ පැයකි. දුර ගෙවා යන බස් රියට එසේ කළ නොහැකිය. සමන්දිනී බසින්නේත් ඇගේ නැන්දා බැසි නැවතුමෙන්ම වන්නට ඇතැයි මම අනුමාන කළෙමි.

ආත්ම ගෞරවය හෝ ආත්ම අභිමානය පිළිබඳ අබ මල් රේණුවක තරම්වත් හැඟීමක් නොවුණු මම හැකි උපරිම වේගයෙන් වෙනත් මඟකින් අදාල තැනට පැමිණිමි.

නැවතුම එක එල්ලේ පෙනෙන තැනක මෝටර් රිය නතර කළ මම සමන්දිනී ආ බසය නැවතුමට සේන්දුවන තෙක් බලා සිටියෙමි. බස් රියෙහි මතුපිට වෙනස්කම් පිළිබඳව මා තුළ දැඩි නිනව්වක් නොවීය. නැවතුමට සේන්දුවන සැම බසයක් පිළිබඳවම ඇස් වද වූයේ ඒ නිසාවෙනි.

පැයක් හෝ දෙකක් ගෙවිණි. ආ එකම බසයකින්වත් සමන්දිනී බැස්සේ නැත.

සියල්ලන්ම අතහැර දමන ලද රැලකින් තනි වූ මුව පොව්වකු මෙන් මසිත ගැහෙන්නට ගත්තේය. බියක් අසරණකමක් වැනි හැඟීමක් මසිතට තදින් වද දිණි. බස් නැවතුම්පල අඩ අඳුරෙන් වෙලී යද්දී ඇය මට මඟ හැරුණා යැයි අකැමැත්තෙන් හෝ සිතන්නට මට සිදු විණි.

හෙට උදෑසන ඇය මුණ ගැහෙන්නට නම් පාන්දර හතරයි තිහේ සිටවත් මා මෙහි මඟ රැක සිටිය යුතුයි. රෝගීන් පෙන්වන්නේ හයත් හතත් අතරය. හයට මහ ඉස්පිරිතාලේ ගේට්ටුව ගාවට යන්නට මෙතැනින් පහටවත් බසයට නැඟිය යුතුය. ඇය මුණ ගැහෙන්නට නම් හතර හමාරටවත් මෙහි ඒම ප්‍රමාණවත්ය.

එසේ ඇවිත් ආවේ කුමකටදැයි කියන්නේ කෙසේද?

මම හඬා වැටෙන සිතින් මෝටර් රිය හරවා ගතිමි.

ගෙදරට එන්නට පෙර පාන්දර ඇය සොයා යන්නට කාරණාවක් සොයා ගන්නට මට හැකි විය. ඒ දරුවාගේ අසනීපය සම්බන්ධයෙන් වියදමට මුදල් ටිකක් දීමේ උවමනාවත්.

මා ගෙදර එද්දී ගුණසිරි ලිපිගොනුවක් රැගෙන ගෙදර විත් තිබිණි. දවසේ රාජකාරි කෙතරම් මට අතපසු වී ඇද්ද යන්න මෙනෙහි වූයේ එවෙලේය.

"මොකෝ ගුණසිරි....?"

මා ටයිපිටිය බුරුල් කරමින් ගුණසිරි අසල අසුනකට බර වීමි.

"මේ ෆයිල් ටිකට වෙයාමන් සර් ඇපෑවල් එක අරන් එන්න කිව්වා සර්..."

ගුණසිරිගේ පැමිණීම මාගේ තුරුස්නාවට හේතු වී තිබිණි.

"ඔවා චෙක් කරපුරවද...?"

මා ප්‍රශ්න කිරීමෙන් පළ කළේ ඒ නොරිස්සුම වන්නට ඇත.

"ඒක නම් හරියටම කියන්න දන් නෑ සර්."

"ඒක හරියටම දන් නෑ කියන්නෙ තමුසෙ මේවා උස්සන් එන්න ඉස්සෙල්ලා ඒවා බලන්න එපැයි අයිසේ..."

"වෙයාමන් සර් දුන්න හින්දා ආරන් අවට අගක් මුලක් නම් බැලුවේ නෑ සර්."

"තමුසෙලා බූරුවො වගේ වැඩ කරාම අපිනෙ අයිසෙ අමාරුවෙ වැටෙන්නේ ගන්නවා ඕක බලන්න."

ගුණසිරි දෝතින්ම ලිපි ගොනුව මා අත තබා පසෙකට වී සිට ගත්තේය.

ඒ අතරම වාගේ අම්මා ආලින්දයට ආවේ කෝපයෙනි. අපේ කතාබහට ඈ කන් දී හුන් වගක් මා දැන ගත්තේ එවේලේ ය.

"මේ අසරණ මිනිහා හතරෙ ඉඳලා මෙහෙ... ඔච්චා චෙක් කොරන එක උඹ ඔෆිසියෙ හිටිය නම් කරන්න තිබුණානේ... ඇත්තටම උඹ රස්සාවට නොයා කොහෙද යන්නේ...?"

අම්මා ආලින්දයට කඩා වැදීමෙන් මගේ මානය බිඳිණි.

"නෑ මැණිකෙ මේ..."

ගුණසිරි තැතනුවේ මා ගලවා ගනු පිණිස යමක් කියන්නටය.

"අම්මට මොනවද අම්මේ මේ රාජකාරි ගැන තේරෙන්නේ..."

මම ඔහුට පෙරාතුව අම්මාට සැරවීමි.

"හරි මං ඔය රාජකාරි දන් නෑ කියමුකෝ."

අම්මා කතා කරමින්ම අසුනක් ඇද හිඳ ගත්තාය. එකවෙක කියන්නට ගොස් නවත් කතාව දිග් ගස්සා ගැනීම පිළිබඳව මා තුළ පසුතැවිල්ලක් හටගෙන තිබිණි.

"උඹ මේ රස්සාවට නොයා කොහෙද යන්නේ කියපං. මට ඒක දැනගන්න අයිතියක් තියෙනවනේ."

"මං ගියේ රාජකාරි වැඩකට."

"ඒක වෙන්ඩැති ඔෆිසියෙන් උඹව මෙහෙට හොයාගෙන එන්න ඇත්තේ."

"නෑ මැණිකෙ මේ..."

ගුණසිරි තවත් වතාවක් මා බේරාගන්නට නිරර්ථක උත්සාහයක යෙදිණි.

"අනේ මේ තමුසෙ කට වහගෙන ඉන්නවා..."

අම්මා ගුණසිරිට වචනවලින් දමා ගසා ගෙට ගියාය. ගුණසිරි මන්දස්මිතියක් මවා ගත්තේ අඹ මල් රේණුවක තරම්වත් හිතේ කහටකින් නොවන බව විශ්වාසය. අම්මාගේ ඇනුම් බැනුම් ඔහුට ආදරණීය තරවටුය.

මම ගුණසිරි රැගෙන ආ ලිපි ගොනුවට අනුමැතිය දුන්නේ කිසිදු පිරික්සීමකින් තොරවය. අයථා එක ලිපි ගොනුවක් ඒ අතර වූයේ නම් රස්සාව නැතිවන්නට හෝ හිරේ යන්නට නොඑසේ නම් ඒ දෙකම වන්නට ඉඩ තිබේ යැයි දැන දැනත් මම ඒ නොසැලකිලිමත් කටයුත්ත කළෙමි.

''කෝකටත් චතුරානි මිස්ලගෙ ගෙදරටත් ගිහින් චෙක් කරන් යන්න ද සර්...?''

මම කළ කාර්යයෙහි අවදානම වටහාගත් නිසාදෝ ගුණසිරි කීවේ සියුම් පසුතැවිල්ලකිනි.

''මෙතැනින් ගිහින් ඔන කෙහෙල්මලක් කර ගන්නවා අයියෙ...''

මම කෝපය පළ කළෙමි. ගුණසිරි ලිපිගොනුව ගෙන යන්නට ගියේය. දින හත අටකින්වත් පිරික්සා හමාර කළ නොහැකි එම ලිපිගොනුව රැයකින් පිරික්සන්නේ කෙසේද? එවැනි ලිපිගොනුවක් සභාපති හදිසියේ මට ඒවා අනුමැතිය ගත්තේ ඇයි...?

සතියකින් පමණ මා එකම ලිපියක් හෝ අනුමත නොකළ වගක් මට මතකය. ඒ නිසා ලිපි ගොඩ ගැසෙන්නට ඇතැයි අනුමාන කොට මම හිත හදා ගතිමි. ඒ සා වේගයෙන් ඒ පිළිබඳව මට හිත හදාගන්නට හැකි වූයේ සමන්දිනී පිළිබඳ හටගත් චිත්තවේගය ප්‍රබල වූ නිසාය.

සමන්දිනී හමුවීම, ඇ මා ආගන්තුකයෙකු කොට සැලකීම සේම ඇය මගහැරීමද මට රැයක් පුරා සිතන්නට කාරණා විය. අම්මා කෙතරම් නොහොඳ නොක්කාඩු පළ කළද ඒවා මසිතට බලෑපමක් නොකළේද එනිසා විය යුතුය.

මදක් නින්දෙත්, මදක් අඩ නින්දේත්, තවත් ටිකක් නොනින්දේත් ගත කළ මම හිමිදිරි තුනට නා කියා හමාරව මැණිකා කුද්දා තේ එකක්ද වත්කර ගතිමි.

''පුදු මහත්තයා මෙච්චර පාන්දර කොහෙ යන්නද...?''

''රාජකාරි වැඩක් මැණිකා.''

මැණිකාගේ ප්‍රශ්නවලට මා උත්තර දුන්නේ ඒ සියල්ලම අම්මාගේ ද හිතට තැගෙන ගැටලු වන නිසාය.

''මෙ පාන්දර...?''

''ටිකක් දුර ගමනක් යන්නෙ... ඔන කරන තැනට යද්දි හත අට වෙනවා.''

''නෝනා හාමුට කුද්දලා කියලා ගියොත් නේද හොඳ...''

''මොකටද නිකම් ඇහැරවන්නෙ.''

මම මැණිකාට උත්තර බැන්දේ මවාගත් නොරිස්සුමකිනි.

''අපි එහෙම කිව්වට නැගිට්ට ගමන් ඇයි කිද්දුවෙ නැත්තෙ කියලා අගලා දෙස් දෙවොල් තියන්න ගනී.''

''දෙස් දෙවොල් තියනෙක නම් දූත් නැගිට්ටුවත් වෙන දේනේ.''

ඉන් එහා මැණිකාට කතා කරන්නට ඉඩ නොතැබූ මම මුළුතැන් ගෙයින් නික්මුණි.

''අනේ මන්දා මේ අම්මලා පුතාලගෙ ප්‍රශ්නවලට නිකරුණේ බැණුම් අහන්නෙ මං...''

මැණිකාගේ නොරිස්සුම් සහගත කටහඬ සාලය හරහා යද්දි මට ඇසිණි.

සත්තකින්ම මගේත් අම්මාගේත් ගැටලුවලට මැදිවන මැණිකා දෙදෙනාගෙන්ම නොසෑහෙන්නට බැණුම් අසයි. එවැනි ඇනුම් බැනුම් ඇණ වූ සමහර දිනක ඕ ගෙදර යන්නට අඩුම කුඩුම ද පොදි බඳියි. නමුදු ඕ කවමදාකවත් ගෙදරින් පිටතට ගිය වගක් නම් මට මතක නැත. ඇය ද දූත් අම්මා තරමට මට හුරුය. පුරුදුය. අපගේ සියලුම පෞද්ගලික මතිමතාන්තර ඈ දනී. වරෙක ඒවා විසඳන්නට ද, තවත් වරෙක ඒවා අවුලවන්නට ද ඕ මැදිහත් වෙයි. දූත් දූත් ඈ අපේ පවුලේම එකියක ගානය.

මං මැණිකාත් අම්මාත් පිළිබඳ සිතිවිල්ලේ අරංගල හන්දියට පැමිණිමි. එය පාළු, අමු සොහොනක සිරි ගත්තේය. ඉඳහිට යන්න වාහනයක් හැරුණු විට මගතොට වන්නේ එක රැළට දුවාවනේ යන බල්ලන් රැනකි.

වේලාව හිමිදිරි හතරයි තිහ පසුවෙමින් තිබිණි. හයට දරුවා බලන්නට යන්නට නම් පහටවත් සමන්දිනී බස් නැවතුමට පැමිණිය යුතුය. මේ සා හිමිදිරියේ පිට ගමක දී තනිපංගලමේ පාරට එන්නට තරම් දිරියක් ඇයට තිබෙන්නට නොහැකි යැයි සිතුණෙන් තවත් අයෙකුගේ පැමිණීම මම බලාපොරොත්තු වීමි.

කවුරුන් ආවද කතා කොට මුදල් ටික දී ඔවුන් ගෙන ගොස් රෝහලට ඇරලවන්නට මම හිත හදාගෙන උන්නෙමි.

මිනිත්තු දහයක් හෝ පහළොවක් ගෙවෙන තැන ගැහැනු පිරිමි කිප දෙනෙකුගේම කටහඬ මට අතුරුමඟකින් ඇසිණි. පිරිසක් සමන්දිනී ඇරලවන්නට එතැයි සිතුණෙත් මම ඔවුනට මුහුණ දීමට සිතින් සූදානම් වීමි.

මෝටර් රියට මදක් එපිට වූ පටුමඟින් මහපාරට ආවේ පස් හය දෙනෙකුගෙන් යුත් වන්දනා නඩයකි. ඔවුන් ටික දෙනා මුළු හන්දියේම හුදෙකලාව සන්සුන්කම බින්දා වැන්න. මම ඔවුන් දෙස බලාගත් වනම උන්නෙමි. විවිධ දේ කෑ කෝ ගසමින් විහිළු තහළු කරමින් උන් ඔවුන් තවත් මිනිත්තු පහකින් පමණ පැමිණි වන්දනා බස් රියකට නැග නොපෙනී ගියේය. හන්දිය ආයේ සන්සුන්කමේ ගිලිණි. හාත්පස වූ පාළුව දැඩි වූවා වැන්න. ආසාවට දකින්නට මිනිස් පුළුටක් නොවීය.

ඇස් තටු මත බරක් එල්ලා තැබුවාක් මෙන් නින්දක් නෙතට ද වද දුන්නේය. මම තවදුරටත් ඇස් හැර උන්නේ සිතෙහි වූ ධෛර්යයට මිස කයෙහි වූ ශක්තියකට නම් නොවේ. ඊයේ රාත්‍රියේ එක දිගට නිදිමැරීමෙන් ලද වෙහෙස දෙගුණ තෙගුණ වී මට දනෙමින් තිබිණි.

එසේ කොපමණ වේලා ගත වූවාදැයි නිශ්චිත නොවේ. සමාන කාල ප්‍රාන්තරවල දී නැගෙන කිසියම් හඬක් දුරක සිට ගලා එන්නා සේ මට ඇසිණි. එය කුමක්දැයි තෝරා බේරා ගන්නට මම සිතින් ඉව කළෙමි. ඒ සිහිවිල්ල කෙළවර වූයේ මා තද නින්දකට වැටී හිඳින වග මට ඒත්තු යාමෙනි. එක තත්පරයක් තුළ පාන්දර තුනට අවදි වූ තැන හිඳ දෑස් නිදිබර වූ තත්පරය දක්වා මතකය දිග හැරිණි.

මා අවදි වූයේ දෙකන් පෙති අද්දර බෝම්බයක් පුපුරා ගිය කලෙක වාගේ කලබලයෙනි.

දෑස් නිදි පියද්දී අවට වූ අඳුර වෙනුවට දෑස් හරිද්දී අවට වූයේ චණ්ඩ හිරු රශ්මියකි. ගිම්දිරියේ හාත්පස වූ සන්සුන්කම දන් එකම කාලගෝට්ටියකි. සිදු වූ දෙය මට වැටහිණි. වැසුණු ජනේල් රාමුවට තට්ටු කරමින් උන්නේ පොලිස් නිලධාරියෙකි. මම වහා රිය කවුළුව පාතට කළෙමි.

"මෙක වාහන නතර කරන් බුදියන තැනක් ද මහත්තයා..."

පොලිස් නිලධාරියා ඇසුවේ කෝපයෙනි.

"සොරි රාළහාමි... මෙ නින්ද ගියා."

මහත්තයගෙ ලයිෂන් ඉන්ෂුවරන්ස් ගන්නකෝ."

සමාව අයදීමෙන් ඔහු මෙල්ලවන පාටක් නොවිණි. මම ඔහු ඉල්ලූ ලියකියවිලි වෙනුවට මගේ රාජකාරි හැඳුනුම්පත පෙන්වීමි. ගෙනම එය අතට ගෙන බලා නැවත මට දුන්නේ හොඳ හිතකින් නොවේ. ඉන් එහා ඔහු මායිම් නොකොට රිය පැද වූ මම එය මඟ අයිනකට වන්නට නතර කළෙමි. වේලාව උදෑසන නවය පසුවන්නට ඔන්න මෙන්න කියා තිබිණි. පැය හතරකට වඩා මම මෝටර් රියේ හිඳාගෙන ඇත්තෙමි. මා තුළ මා ගැනම කෝපයක්, කළකිරීමක් ඇති විය.

"කාලකණ්ණියෙක්."

මා දෙස් දෙවොල් තබා ගත්තේ මටමය. බර සුසුමක් හෙළා ළය සැහැල්ලු කරගත් මම නෙතු වසා හිස රිය අසුනට වාරුකොට තත්පර කිහිපයක් ගෙවා දැමීමි. ඊළඟට කළ යුත්තේ කුමක්දැයි තීරණය කරන්නට පෙරාතුව කාර්යාලයට යා යුතු යැයි සිතුණෙන් මම නැවත මෝටර් රිය පණගන්වා ගතිමි.

මම කාර්යාලයට ගොඩවී කාමරයට වැද දොර වසා ගතිමි. රාජකාරි මේසය මත වන කළයුතු නමුදු නොකළ වැඩ කන්දරාව මගේ පපුකුහරයට ගිනි තබයි. අද හෙට නොවුණ ද මතු දිනෙක මට මේ සියල්ලට වන්දි ගෙවන්නට සිදුවනු ඇත. සියල්ලකටම වඩා රාජකාරිය පැහැර හැරීමෙන් මා කර ගන්නා පව් කන්දරාව සුළුපටු නොවේ.

මගේ මේසය මතවන සෑම ලිපිගොනුවකම හිමිකරුවා අසරණයෙකි. එක්කෝ ඔවුන් වන්දි හිමි නාම ලේඛනයට ඇතුළත්ව හිඳින්නේ ශාරීරික දුබලතාවයක් නිසාය. නොඑසේනම් මානසික දුබලතාවයක් නිසාය. එසේ නොමැති නම් පියා අහිමි දරුවකුගේ හෝ ස්වාමියා අහිමි බිරියකගේ ලිපිගොනුව මෙහි වේ.

ගැහැනියක් පස්සේ උමතු වූවකු වාගේ දිව යමින් මා කරන්නේ

ඒ අසරණයින් කුස ගින්දරේ හෙළීම නොවේද? දුකට කළකිරීමකට සංතාපයට පත්කිරීම නොවේද? සමන්දිනී අරඹයා මසිතට සැහැල්ලුවක් සැනසීමක් නොදනෙන්නේ මේ පව් කන්දරාව නිසා විය හැකිය.

මම ලිපිගොනු දෙස බලාගත්වනම පිළිකුල් භාවනාව වැඩුවා වාගේය. කෙසේ හෝ මේ බරින් නිදහස් වියයුතුයැයි සිතුණෙත් මම මේසය මත වන සීනුව නාද කළෙමි. මොහොතකින් ගුණසිරි දොරකඩින් මතුවිණි.

''චතුරිකා මිස්ට කතා කරනවා.''

හෙතෙම අඩක් විවරකොට ළුන් දොර අත හැර නික්මිණි. ඊට මිනිත්තුවකට දෙකකට පසුව චතුරානි දොරකඩින් මතුවිණි.

''සොරි සර්...''

ඕ කාමරයට ගොඩ වූයේ සමාව අයදිමිනි.

''මක් කළාටද...?''

මා එසේ ඇසුවා නොව මට එසේ ඇසිණි.

''මං ටිකක් පරක්කු උනා සර්.''

''වැඩට එන්න ද...?''

''නෑ සර්. සර්ගෙ රූම් එකට එන්න.''

මෙකීට පිස්සු යැයි මසිතට නැගී සිතිවිල්ල වචන බවට පෙරළුණේ නැත. සමහරවිට ඇගේ සිතේ ද මෙවැනිම සිතිවිල්ලක් ඇති වන්නට ඇත.

''එහෙම පරක්කුවක් උන් නෑ.''

ඒ කතාව එතනින් හමාර කළ යුතු යැයි සිතුණෙන් මම පැවසීමි. චතුරානි මනමාල සිනවහක් මුවගට නගා ගත්තාය.

''මේ දවස්වල චතුරානිගෙ වැඩ තත්ත්වෙ කොහොමද?''

''මෙහෙද සර්...''

''මෙහෙද කියලා ඇහුවේ චතුරානි තවත් කොහේ හරි වැඩ කරනවාද?''



''නෑ සර් නිකමට ඇහුවෙ.''

ඒ ප්‍රශ්නයට පිළිතුර නොවේ.

''චතුරානිට වෙලාව තියනවා නම් මගේ පොඩි වැඩක් කරගන්න තකා කළේ.''

''කරලා දෙන්නම් සර්.''

''ඉඳගන්නකෝ.''

චතුරානි ඉදිරිපස අසුන ඇද හිඳ ගත්තාය.

''චතුරානිට පුළුවන් ද මේ ෆයිල්ස්වලට එප්රූවල් ලෙටර්ස් හදන්න.''

ඇය මදෙස විස්මයෙන් මෙන් බැලුවේ මා අනුමත කරන ලිපිගොනු සඳහා දනුම් දීම ලිපි සකසන්නේ ඇයම වන නිසාය.

''දනවත් මං තමයි සර් ලෙට(ර්)ස් හදන්නෙ.''

''මං ඇහුවෙ මගේ පාට්ටෙකත් චතුරානිට කරන්න පුළුවන් ද කියලා.''

ඇගේ ඇස් මහත්ව මුව විවර වනු මම දිටිමි. ඇගේ විස්මයට හේතු වූයේ එය මේ ආයතනයෙහි ඉහළම කටයුත්ත වීම නිසා නොවේ. එය ඇසුරේ අත යටින් හම්බ කළ හැකි මුදල් කන්දරාව සිහිවීමෙන් විය යුතුය. තිගැස්සී පුදුමයට පත් වී කෙළවර ඕ සිනහවක් මුවගට නගා ගත්තේ මා විහිළුවක් කළ සෙයිනි.

''හැබැයි මේක රහසක් හැටියට තියෙන්නෝනා වැඩක්.''

මා කරන්නේ විහිළුවක් නොවන බව වැටහී වාගේ ඇගේ මුහුණේ සිනහව තුනී විණි.

''මං කරන්නං... ඒත් ඇයි සර් ඒ තරම් ලොකු වැඩක් මට පවරන්නෙ.''

බර හුස්මක් නොඑසේනම් ලොකු සුසුමක් මගේ මුවින් පිළිහිණි.

මා මේ පවරන කටයුත්ත දිවයිනේ ජනප්‍රිය පාසලකට දරුවන් ඇතුළත් කර ගැනීමේ බලය පැවරීමකට සමානය. එය චතුරානිට එක

සතියකින් ලක්ෂපතිනියක විය හැකි මගකි.

අනෙක් අතට මෙය මගේ රස්සාව අනතුරේ හෙළා ගැනීමකි. මුළු සිරුරේම පණ ගිය ද මොළේ පණ කළදක් ඇති තැනැත්තෙකු මෙවැනි කටයුත්තක් නොකරයි. මට සිදු වී ඇත්තේ ඒ සියල්ලටමත් වඩා කෙටියෙන් සරලව කිවහොත් පණටත් වඩා සමන්දිනීට ඇලුම් කිරීමයි.

"මේ දවස්වල මං ලොකු කරදරේක පැටලිලා චතුරානි ඉන්නේ..."

මං චතුරානිට උත්තර බැන්දේ බොහෝ සෙයින් මවා විය.

"මට හිතුණා සර්."

මා චතුරානි හා මෙතරම් කුළුපගව කතා කර නැත. සහබන්ධූ මිය ගියාට පසු සමන්දිනී පිළිබඳ දුක කියන්නට මට කිසිවෙකුත් වූයේ ද නැත. එනිසාදෝ මම උවමනාවට වඩා හැඟුම්බරව උන්නෙමි.

"මටත් සර්ට උදව්වක් කරන්න පුලුවන්කම තියනවා නම් මාත් කරන්නම සර්."

"අහිංසක මිනිස්සුන්ගෙන් සල්ලි නොගෙන මේ වන්දි හිමි නාමලේඛනේ වැඩ ටික කරන්න පුලුවන් නම් ඒක මේ වෙලාවේ මට කරන්න පුලුවන් ලොකු උදව්වක් චතුරානි."

චතුරානි හිස වැනුවේ ලෙන්ගතු හිතවතියක වාගේය.

"මං සර් කළා වගේම ඒක කරන්නම්."

"දවසට පස් දෙනෙකුටවත් අනුමැතිය දෙන්න පුලුවන් නම් හොඳයි."

"මං දවසකට ෆයිල් හත අටක් ගෙදර ගෙනිහින් වැඩ කරන්නම් සර්... එතකොට මෙහෙ කවුරුවත් දැන ගන්නැනෙ."

"එහෙම තමයි කරන්නොනා."

මා අත් ඔරලෝසුව දෙස බැලුවේ එතෙකින් ඒ කතාව හමාර යයි හඟවන්නට වෙර දරමිනි.

"මහ ඉස්පිරිතාලෙ ලෙඩ්ඩු පෙන්නන්නෙ දොළහත් එකත් අතර නේද...?"



නික්ම යනු පිණිස හුනස්නෙන් නැගිටි චතුරානිගෙන් මම ඇසිමි.

"ඔව් සර්..."

"හොඳයි."

චතුරානි දොර ළඟදී ආයේම හැරිණි.

"මහ ඉස්පිරිතාලෙන් මොනවා හරි දෙයක් කරගන්න තියනවා නම් කියන්න සර් අපෙ අම්මා එහෙනෙ."

නිවෙන්නට අර අඳිමින් තිබූ පහනක දැල්ල වැඩි වන්නා සේ මසිතේ බලාපොරොත්තු දැල්විණි.

"අම්මා මොනවද එහෙ කරන්නෙ...?"

"මේට්‍රන් කෙනෙක් සර්..."

මා තුළ හටගත් සංකීර්ණ සිතිවිලි තෝරා බේරා ගන්නට මට නොහැකි විය. දරුවා බලන්නට නොව ඉස්පිරිතාලයට පිංගා සමන්දිනීගේත් අනුෂගේත් හැසිරීම බැලීමේ උවමනාවක් ඒ සංකීර්ණ සිතිවිලි අතර විය.

චතුරානිගේ අම්මා මහ රෝහලෙහි යමක් කළ හැකි මේට්‍රන්වරියක බව මට දැනුණේ ඇගේ නම කියූ පමණින් මෝටර් රිය රෝහල් භූමියට ගැනීමට දුන් අවසරයෙනි. රෝගීන් බැලීමට පැයකට පමණ පෙරාතුව මම රෝහලට පැමිණිමි. චතුරානිගේ අම්මා මා පිළිගනු පිණිස රථගාලෙහි සේවකයෙකු නවතා තිබිණි.

"තිවංක මහත්තයද...?"

එම සේවකයාගේ අනුමානය නිවැරදි විය.

"ඔව්."

"මේට්‍රන් මැඩම් උඩට එක්කන් එන්න කිව්වා."

"යමු."

දියණියගේ වෘත්තීමය දියුණුව ගැන සිතාදෝ චතුරානිගේ අම්මා මා පිළිගත්තේ උවමනාවටත් වඩා හරසරිනි.

"සර්ගේ කවුද ඇඩ්මිට් කරලා ඉන්නෙ...?"

"ළඟ ඥාතියෙක්ගෙ දරුවෙක් මිස්..."

"තේ ටිකක් බීලාම ලෙඩා බලනවද...? ලෙඩා බලලා තේ ටිකක් බොනවද...?"

"තේ නම් එන්න කිටවුවත් බිව්වා."

"එහෙමනම් දරුවව බලලා ඉමු."

ඇය විසින් ස්වාමීන් වහන්සේ නමක් වඩම්මන්නා වාගේ භක්තියකින් මා කොරිඩෝරය දිගේ පෙරට රැගෙන ගියාය.

"ඇඳේ අංකෙ හරියටම දන්නැති එකේ අපි වාට්ටුවට ගිහින්ම විපරම කරමු."

ඇය යමින් ගමනේ තොරතෝංචියක් නැතුව දෙඩුවාය.

"ඇඳේ අංකය කිව්වට මට මතක හිටියෙ නෑ."

සන්සුන්ව මමද ඉඳහිට කතා කළෙමි.

"ඔය රාජකාරි කන්දරාව අස්සෙ ඕවා කොහේ මතක හිටින්න ද නේද...?"

මම උත්තර බැන්දේ සිනහාවකිනි. ඒ සිනහව ඇ තොදකින්නට ඇත.

"වාට්ටුව නම් මෙක."

ඇය තැනෙක නතර වෙමින් කතා කළාය. මගේ පපුවේ ගැස්ම තීව්‍ර විණි.

"අපි දරුවගෙ නමින් ඇඳේ අංකෙ බලාගමු."

මගේ නොසන්සුන් සිතිවිලි මතට තවත් තිගැස්මක් එක්වූයේ නම මගේ මතකයෙහි නොවුණු බැවිනි.

"ළමයාගෙ නමත් මට හරියට මතක නෑ මිස්..."

මා කතා කළේ සමාව අයදින හඬකිනි.

"ඒකට කමක් නෑ... අපි ඇවිදලා බලමු. පොතක් බලන්න ගියත් ඇවිදලා බලන්න යන කාලෙම යනවා. එන්න සර්..."



චතුරානිගේ මව ඉස්සර විණි. මා ඇගේ පසු පස්සෙන් පියවර මැනිමි.

වාට්ටුවෙන් හතරෙන් තුනක් ගෙවා දමන්නට පෙරාතුව ඇත කොණක වන අනුෂ මගේ බැල්මට හසු විණි.

මම හුන්නැනම නතර විණි.

අනුෂ ළඟ සමන්දිනි ද වූ අතර ඇය දරුවාට ඇඳුම් අන්දවමින් උන්නාය.

අනුෂත් ඇයත් සිනහාවකින් යම් යම් දේ දොඩමින් හිඳිනු දකිමෙන් මසිත හඬන්නට ගත්තාක් බඳුය.

"මං හිතුවෙ සර් පස්සෙන් ආවා කියලා."

වාට්ටුවේ එහා ඉමට ඇවිද ගිය චතුරානිගේ මව පෙරලා එමින් තැවසුවේ සිනහාවෙමිණි. මම ද මුහුණට සිනහවක් නඟා ගන්නට වෙර දරිමි.

"මේ වාට්ටුවෙ නෑ වගේ."

මම පෙරට නොයන්නට හේතුව කියන්නා වාගේ පැවසීමි.

"එහෙමනම් ඩිස්චාජ් කරල ද දන් නෑ."

"සමහරවිට එහෙම වෙන්ඩැති."

"දූන් මොකද කරන්නෙ...?"

"මං ගෙදරට යන්නම් මේට්‍රන්..."

"අපරාදෙ මහන්සිය."

"කමක් නෑ. ඉතින් මොනවා කරන්න ද...?"

දරුවාව අන්දවා හමාර කළ සමන්දිනී බෑගයකට බඩුබාහිරාදිය අසුරන්නට ගත්තාය.

ඒ ඇසිල්ලේ අහම්බෙන් වාගේ ඕ මා දුටුවාය. කරන්නට ඇත් කටයුත්ත එසේම තිබිය දී ඇය පෙරට එනු මම දකිමි. තවත් ඇයත් මාත් අතර කුමන කතාවක් ද...?"

"අනේ බොහොම ස්තූතියි මිස්. මං එහෙනම් ගිහින් එන්නම්."

මාගේ හදිසි කලබලය වටහාගත නොහැකි මෛත්‍රන් මට පෑවේ අන්ද මන්දව ගිය සිනහවකි.

මම නික්ම යන්නට මත්තෙන් ආයේම වාට්ටුවේ ඉම දෙස බැලීමි.

සමන්දිනී මඳහසකින් පෙරට එමින් උන් අතර දරුවා වඩා ගත් අනූෂ දුර තියා බලා හිඳිනු මම දිටිමි.

"යමු මාත් පහළට යනවා."

මම පය ඉක්මන් කළෙමි. මා හා හරි හරියට යා නොහැකි මෛත්‍රන් උත්සාහය අත් නොහැරම මා සමගින්ම අඩි තිබ්බාය. වාට්ටුවෙන් නික්ම කොරිඩෝරයට පිවිස මම යාන්තමට හැරී බැලීමි.

සමන්දිනී කොරිඩෝරයේ තැනෙක නතරව මදෙස බලා උන්නාය. ඒ අතර මා ඇය දකී වගට ද ඔ සැක හැර ගත්තාය.

"මං මෙ හරියෙන් නතර වෙන්නම් සර්."

චතුරානිගේ අම්මා තැනෙක දී කතා කළේ වේගයෙන් හුස්ම ඉහළ පහළ හෙළමිණි.

"හොඳයි මිස්... අනේ කරපු උදව්වට බොහොම ස්තූතියි."

"එහෙම කිව්වට මොකද මට ඉතින් උදව්වක් කරන්න හම්බුන් නැතේ."

ඇය හති දමමින්ම තවදුරටත් කතා කළාය.

"ඒක ඉතින් මිස්ගෙ වරදක් නෙවෙයිනෙ."

"ඒක නම් ඉතින් එහෙම තමයි."

"මං එහෙනම් ගිහින් එන්නම්."

"හොඳයි... මෙහෙන් මොනවා හරි කරගන්න තියේනම්... මගේ නම කියන් කෙලින්ම ඇතුළට එන්න."

"හොඳයි."



මෛත්‍රන් කතා කරන අතරවාරයේ මගේ නෙතත් හිතත් වූයේ කොරිඩෝවේ ඈත කෙළවරේය.

එහි වන සමන්දිනී තවදුරටත් බලාගත්වනම උන්නාය.

මෛත්‍රන් ද මගේ අමුතු හැසිරීමෙන් අන්දමන්දව හැරී ඈත කොරිඩෝරය දෙස බැලුවාය.

"අර දුරිඩ් බලන් ඉන්නෙ අපි දිහා ද මන්දා...?"

"නෑ මං හිතන්නෙ කවුරු හරි එයත්තෙක්ක කතා කර කර ඉඳලා ගියා."

මෛත්‍රන් ඊට හිස වැනුවේ විශ්වාසයකින් නොවේ.

"මං එහෙනම් යන්නම්."

ඒ මා යන්නම් කීවේ සිව්වන හෝ පස්වන වතාවටය.

"හොඳයි."

මෛත්‍රන් ද ඒ පිළිතුර කිහිප වතාවක්ම දුන්නාය. මම වරක් හැරී සමන්දිනී දෙස බලා පෙරට ගමන් කළෙමි.

ලෙඩුන් බලන මොහොත උදාව සෙනග කඩි ගුලක් ඇවිස්සුණා සේ පෙරට එමින් උන්නෝය. මා තවත් වතාවක් හැරී සමන්දිනී දෙස බැලීමි.

ඕ පෙර ලෙසම මදෙස බලා උන්නාය. ඒ අතර දෙතෝදාහක් සෙනග මා පසු කර ඉදිරියට ඇදිණි. ඔවුන් අතරේ සමන්දිනීගේ රුව නොපෙනී ගියේ මාගේ පපු කුහරයට ගිනි තබමිණි.

සමන්දිනී හමුවූදා පටන් කොතෙක් නම් දේ සිදු විණිද...? ඒවායින් ඇතැම් සිදුවීම් දුක්බරය. සමහරක් හිස්ය. ටිකක් සොම්නස් සහගතය. සොම්නස් සහගත ටික වුව දුන් හදවතට දනවන්නේ වේදනාවකි.

ඇයගේ හමුවීම එහෙම පිටින්ම අහම්බයකි. ඈ ආවේ පියාගේ වන්දිය නොලැබීමෙන් හටගත් කෝපය පළ කරන්නටය. මට බැණ වදුණු ඇයට මම ආදරය කළෙමි.

පෙරළා ඇය ද මට ආදරය කළාය. දූන් ආහම්බෙන් හමුවූ යුවතියකට ආදරය කිරීමේ පාපයෙන් මම වද විඳිමින් හිඳිමි.

ඇය ඇතුවත් බැරිය නැතුවත් බැරිය. සිතට වදය දීමෙන් ඇය සිතින් බැහැර කිරීම මම තෝරා ගතිමි.



# 09

අවසන් වරට සමන්දිනී හමුව දැක බලා ඒමේ ආශාවක් මා සිතෙහි හට ගත්තේය. රැයෙහි ඒ සිහිවිල්ල මට පහළ විය. උදයේ මම නුවර යන්නට පිටත් වීමි.

දෙපැයක් ගතවන තැන මම නුගේතැන්නේ වීමි. නිවසේ දොර වසා දමා තිබිණි. මම විවර වූ ආලින්දයට වී පිළිවෙලක් වී ඇති මිදුල දෙස බලා උන්නෙමි.

පැයක් හෝ දෙකක් නිසොල්මනේ ගෙවී යන්නට ඇත. ගෙවී ගිය කාලය පිළිබඳ මට ගනිච්චියක් නොවීය. ඒ මා තින්දකට වැටී හුන් නිසාය.

"තිවංක..."

එය ඇසුණේ සිහිනයෙන් යැයි මුල දී මට සිතිණි. සමන්දිනීගේ කටහඬ මට ඇසුණේ ඒ තරම්ම දුරිනි.

"තිවංක..."

එවර සමන්දිනීගේ ඇඟිලි තුඩු මගේ උරහිසේ දුවටිණි. මා ඇස් තවු හැරියේ ඒ මොහොතේය. දරුවා වඩා ගත් සමන්දිනීගේ තැන්දාත් සමන්දිනීත් මා ඉදිරියේ විය.

"මං මේ ළඟකට ආපු ගමන්..."

සමන්දිනී සිනහ වී නැන්දණිය දෙස බලනු මම දිටිමි. ඒ මගේ පැමිණීම කෙරෙහි උපන් උපහාසයට නැගි එකක්දැයි මට සිතිණි.

"මං මේ දරුවා ඇඳෙන් තියලා එන්නම්."

නැන්දා ගෙට ගියේ මදෙස බලා නොබලා මෙන් කතා කොටය.

"අපිත් මේ පොඩි උත්සවේකට ගිහින් ආවා තිවංක."

ඇගේ පියකරු බව මා දුටුවේ එවේලේය. කොණ්ඩය තනි කරලකට ගොතා, හිසෙහි මල් ගවසා හුන් ඈ ලා නිල් පැහැති මල් වැටුණු සාරියට සිහින් සුදු පටි සහිත සෙරෙප්පු ලා තිබිණි. මසිතේ ලෝභකමක් ඇහැරෙන්නට පෙර මම ඈ වෙතින් බැල්ම ගෙන ඈත බලා ගතිමි.

"කොහෙද උත්සවේ තිබුණේ..."

"නුවර..."

"මඟුල් ගෙයක්..."

මම ප්‍රශ්නයක ස්වරයෙන් ඇසීමි.

"ඔව්... ලොකු උත්සවයක් නෙවෙ... පොඩි චාම් එකක්. අපි මේ ඒයෙ ගිය ගමන්."

"බස් එකේද ආවේ...?"

"වෑන් එකේ ගෙනත් ඇරලවලා ගියෙ."

"යාළුවෙක්ගෙ වෙඩින් එකක්ද...?"

"අනූෂ අයියලගෙ..."

ඉන් එහා ඒ ගැන හාරා අවුස්සන්නට මා තුළ වූ උනන්දුව පහ විය. අනූෂගේ මඟුල් ගෙවල්වලට සහභාගී වන්නට තරම් අනූෂත් සමන්දිනීත් අතර බැඳීම පුළුල් වී ඇත.

එක අතකට ඔවුන් දැන් නීත්‍යානුකූල අඹු සැමියන් වැන්න. තවදුරටත් ඒ ගැන සිතීමෙන් ඵලක් නොවේ.

"ඇයි එදා තිවංක ඉස්පිරිතාලෙට ඇවිල්ලා මඟ දී හැරිලා ගියේ...?"



"මං වෙන හදිස්සි වැඩකට ආපු ගමන් සමන්දිනී හිටියේ..."

"මං හිතුවා ඔයා දරුවා බලන්න ආවා කියලා."

"ඒකටත් එක්කම තමයි ආවේ... ඊත් වෙලාව මදි උනා."

"මං හිතුවා අනූෂ අයියා හිටපු නිසා ගියාද කියලා..."

සමන්දිනී ඇසුවේ තුනී මදහසකිනි. මා ඊට පිළිතුරු දෙන්නට නොගියෙමි.

"දූත් දරුවට හොඳයි."

සමන්දිනී කතා කළේ මට යුතුකමක් මෙහෙහි කර දෙන සේද්දෙනි.

මා දුන් පිළිතුරු කෙතරම් සුදුසුද... මනුස්සකමින් යුතුද යන්න වත් මම නොදත්තෙමි. සත්තකින්ම මා මේ පැමිණ ඇත්තේ වෛරී චේතනාවෙන් ආ ගමනකි. මේ ගමනේ ඔවුන්ගේ දුක ඇසීමෙන් මිය සතුටෙන් මා තෘප්තිමත් වන්නේ නැත. විටෙක මට මා පිළිබඳවම ඇති වන්නේ ලැජ්ජාවකි.

"දූත් ඉතින් දරුවා දිගටම බලාගන්න වෙන්නෙ මට..."

සමන්දිනී එය කුමන අරමුණක පිහිටා කීවාදැයි මම නොදත්තෙමි.

නමුදු ඉන් මගේ සිත පෑරිණි. ඇය මේ නොකියා කියන්නේ තමාත්, අනූෂත් පිළිවෙලක් වූ වග නොවේද...? ඉක්මනින් පිටවීමේ වුවමනාවක් හදිස්සියේ මට පහළ විණි.

"මං එහෙනම් ගිහින් එන්නම් සමන්දිනී..."

"මොනවහරි කාලා යන්න."

"වෙලාවක් නෑ සමන්දිනී."

"අඩුම තරමින් තේ එකක්වත් බීලා යන්න."

ඉන් එහා ඇයට හෝ මට කතා කරන්නට ඉඩ නොතබා සමන්දිනීගේ නැන්දා තේ බන්දේසියක් අතැතිව අප අතරට වූවාය.

"දූත් ඉතින් ඒ බරන් හැල්ලුයි."

ඇය මට තේ බඳුන පිළිගන්වමින් කීවේ දරුවාගේ අසනීපය සුව වීම පිළිබඳව යැයි මට සිතිණි.

"කවද්ද බබාගේ ටිකට් කැපුවේ..."

"අර ඔයා ඇවිල්ලා ගිය දවසේ."

"ආ... එදා මේ ළමයා ආවද...?"

සමන්දිනීගේ නැන්දා ඇසුවේ උද්දාමයකිනි.

"ඔව්... ඒ උනාට දරුවවත් හරියට බලාගන්න උන් නෑ."

මා කතා කළේ වරදක් නිවැරදි කරන සෙයියාවෙනි.

"ඒ මොකෝ..."

සමන්දිනීගේ නැන්දා ඇසුවේ දෙබැම රැළි නංවා ගත් වනමය.

"ඒ වෙලාවෙ තිවංක හිටියෙ හදිස්සියක නැන්දෙ..."

"ඒක මිසක්... දරුවගෙ ටිකට් කැපුවෙත් මේ මංගල්ලේ කට උඩ තියලනේ."

මම උගුරක් දෙකක් බී තේ බඳුන බන්දේසිය මත තැබුවෙමි.

"අද මේ දරුවා නුවර ආපු ගමන් ද...?"

"ඔව්... පහ වෙද්දී මං ආයේ නුවර ඉන්නෝන."

සමන්දිනී බර සුසුමක් හෙළා බිම බලා ගනු මම දිටිමි. ඇගේ දෙබඩි ජීවිතය ගැන එවේලේ ද මා තුළ හට ගත්තේ තදබල කළකිරීමකි.

"පහට කොහේ නුවර යන්න ද ළමයෝ... මෙතනදීම පහයි."

මම අත් ඔරලෝසුව දෙස බැලීමි.

"යන්නම් සමන්දිනී... යන්නම් නැන්දෙ..."

"ගිහින් එන්නම්." යැයි නොකියන්නට මම පරිස්සම් වීමි.

නැවත ඇය හමුවන්නට නොයන බවට මා ගත් තීරණයක් ආයේම වෙනස් නොවේ. සමන්දිනී සිනහාවකින් තොරවම හිස වැනුවාය. කතා කළේ නැන්දා පමණි.



"අම්මව මතක් කලා කියන්න දරුවෝ."

මම හිස වනා ගෙයින් දොරට බැස මෝටර් රිය වෙත පැමිණිමි. සමන්දිනී මා පසුපසින් ඇවිද එන වග ඉඳුරාම දැන උන්න ද මම අත්වැරැද්දීමකින් හෝ හැරී නොබැලීමි.

මෝටර් රියට නැඟ නික්ම යද්දී තැනෙක නතරව බලා හිඳින සමන්දිනී මම පැති කණ්ණාඩියෙන් දිටිමි. මම ඇගෙන් ඇස් අද්දා ගත්තේ හඬා වැටෙන හදවතිනි.

මා තුළ නොසංසිඳෙන පශ්චාත්තාපයක් හටගෙන තිබිණි. එය කළකිරීමටත්, ඉච්ඡාභංගත්වයටත් අතරමැදි හැඟීමක් විය. පිරිසිදුව පිළිවෙළට හිඳීමෙන් ලැබෙන සතුට මගෙතින් පලා ගොස් තිබිණි. නිදිමත මිස නින්ද මා කරා ආවේ නැත. ලෝභය මසිතින් සංසිඳිණි.

ඒ නිසාම කිසිවක වටිනාකමක් මට නොදැනුණි. නොවටිනා දේ අතර මගේ ජීවිතය ද විය. ජීවිතය නොවටිනා කළ, අවශේෂ අන් සියලුම දේ පයට පෑගෙන දූවිලි තරම් වන්නේය.

කලෙක රැකියාවේ දියුණුව ජීවිතයේ එකම අභිලාෂය කරගත් මම රස්සාව තණඹිකට නොවටිනා තත්ත්වයකට වැටී උන්නෙමි. මගේ රාජකාරිය එහෙම පිටින්ම ඉෂ්ට සිද්ධ වූයේ චතුරානිගේ අතිනි.

එය කාර්යාල සේවකයින්ට රහසක් වන්නට ඇතැයි යන මුලාවෙන් මම රැවටෙමින් උන්නෙමි.

දහයට දහයාමාරට පමණ කාර්යාලයට යන මම හතරට හතරහමාරට පමණ ඉන් පිටත් වීමි. ඉන් අහවර හත අට පමණ වන තෙක් අවන්හලේ රැඳීම මම පුරුද්දක් කොට ගතිමි.

අම්මාට නොඇඟවෙන තරමට අවන්හලෙන් බී, මදි පාඩුවට ගෙදර විත් කාමරයට වී බොන තැනට මම පත්ව උන්නෙමි.

මගේ චර්යාව එන්න එන්නම නරක අතට හැරෙද්දී අම්මා, අක්කා සේම අයියා ද එක්ව මඟුල් තුලා සෙවීම දැඩි කළේය. මම ඒවාට එරෙහි නොවීමි. ඔවුන් යෝජනා කළ සෑම තැනකටම මම පැකිලමකින් තොරව ගියෙමි.

අම්මාත්, අක්කාත්, අයියාත් කිසිදු කොන්දේසියකින් තොරව ඒ

සෑම මනමාලියකටම කැමැති වූවෝය. පසුවේ සෑම ලේ නහරයකම සමන්දිනීගේ මතකය දිවයද්දී ඒ කිසිදු යුවතියක් මසිත ගත්තේ නම නැත.

වරක් රැකියාවක් නොකර ගෙදරටම වී හැදුණු පැහැපත් යුවතියක කෙරෙහි මසිතේ යම් කැමැත්තක් ඇති විණි.

එකතකට එය කැමැත්තක් නොවේ. අම්මාගේත් අක්කාගේත් පෙරැත්තයට ඇති වූ හැඟීමකි.

ඔනෑ ෙහණයක් ගසන්නට ඉඩ දී මෙ විවාහය කරගත යුතු යැයි මට සිතිණි. ඇය බලන්නට ගොස් ඇති වූ ඇයි හොඳයිය පෙරටු කොටගෙන වරක් මම ඇගේ නිවෙසට ගියෙමි.

පැහැපත් සිහින් දේහධාරී ඇය තුළ සමන්දිනීගේ රූපකායේ ඇතැම් අංග ලක්ෂණ විය.

ඇය දකින්නට යාමෙ යටි අරමුණ සමන්දිනීගේ මතකය අලුත් කරවා ගැනීමකැයි මට සිතිණි. ඔ හරිම සාම්ප්‍රදායික ලෙස මට තේ දුන්නාය. වැඩිහිටියන් එහාට මෙහාට වී අපට කතා කරන්නට ඉඩ සලසා දුන්නෝය.

''මොකද්ද ඔයාගෙ නම කිව්වෙ...?''

ඒ හුදෙකලාව මම ඇගෙන් ඇසූ පළමු පැනයයි.

''ප්‍රියංකා...''

''ප්‍රියංකා ඉස්කොලෙ ගියේ...''

''බාලිකාවට.''

''ඒ ලෙවල් කළා.''

''ම්...''

''මොනවාවලින්ද...?''

''කොමස්වලින්...''

''කැම්පස් සිලෙක්ට් උන් නෑ.''

''ලකුණු පහක් මදි උනා.''



''අපරාදේ''

''ම්...''

මා සමඟ කතා කරමින් හිඳින ප්‍රියංකා කිසියම් නොසන්සුන් අවධානයකින් හිඳින බැව් මඳ වේලාවක් යද්දී මට වැටහිණි. නමුදු ඊට හේතුව මට අඩමානයටවත් වටහාගත නොහැකි විය.

''ඇයි ආයෙ ඒ ලෙවල් නොකළේ...?''

''නිකම්...''

''කරන්ඩ තිබුණනේ...''

''ම්...''

ඇය පිළිතුරු දෙන්නේ ද හුමිටි තබන්නේ ද ඇතුල් ගේ දෙස බලමිනි. ඇගේ හැසිරීමෙ වෙනස මා තුළ තදබල කුතුහලයක් ඇති කොට තිබිණි.

''ප්‍රියංකා මොකක් හරි ප්‍රශ්නෙක ද ඉන්නෙ...?''

''නෑ.''

ඉන් එහා මට ප්‍රශ්න කරන්නට හෝ ඇයට උත්තර දෙන්නට ඉඩ නොතබා සරම්කාරයෙකු අප අතරින් ගෙයින් දොරට බැස ගියේ ප්‍රියංකාට ඔරවාය.

''කවුද...?''

''අපේ ඩ්‍රයිවර්...''

මිදුල මැද දී ඇගේ කියමන ඔහුට ඇසිණි. හෙතෙම ගිය වේගයෙන්ම පෙරළා විත් අප දෙදෙනා අතර සිට ගත්තේය.

''ඔව්... මං මෙ ගොල්ලන්ගෙ ඩ්‍රයිවර්. ඒ උනාට මේ නෝනා ර්යෙ රෑ නිදාගත්තෙත් මගේ කාමරේ.''

රෞද්‍ර විලාසයෙන් ඇතුල් ගේ දෙස බැලූ පියදුරා මදෙස බලා කීවේ රහසින් මෙනි.

''මහත්තයව බැන්දත් මෙයාට රෑට කාමර මාරු වෙනවා.''

මට ඉහළට ගත් හුස්ම පහළට හෙළින්නට අමතක විය. රියදුරු තැන මිදුලට බැස පරණ ෆෝර්ඩ් රියෙහි නැගී යන්නට ගියේය.

මට ප්‍රියංකා දෙස බලන්නට පාවා දිරියක් නොවීය. ඒ අතර ප්‍රියංකා සැලෙන වතින් - හදින් ඇතුල් ගේ දෙස බලනු මම දිටිමි.

"මං ඔයා ඉල්ලන ඔන උදව්වක් කරන්නම්. ගෙදරට මේ සිද්ධිය කියන්නෙපා."

තත්පර කිහිපයකට පසු ප්‍රියංකා ඇසෙන නෑසෙන හඬින් කතා කළාය.

"හෙට මට කුකරි ක්ලාස්... ඔන්නම් මං මඟදි ඔයාව හම්බවෙලා විස්තර කියන්නම්."

මා නැගිට්ටා නොව - නැගිට්ටිණි. ප්‍රියංකා කෙරෙහි මහත් පිළිකුලක් මට දැනුණි. අවසන් වරට මම ඇ දෙස බැලීමි. ඒ පව්කාරකම ද සමන්දිනීගේ පිටින් ගිය සෙයින් දුටුවේ ප්‍රියංකා නොව සමන්දිනීය.

බැල්ම හරවාගත් මම කිසිවකුට යනවා යැයි කියන්නට පමා නොවී ආලින්දයෙන් පිට වීමි.

ප්‍රියංකාගේ ප්‍රතිචාරය කෙබඳුදැයි බලන්නටවත් පමා නොවුණු මම මෝටර් රියෙහි නැගී නික්මිමි.

ඒ මා බලන්නට ගිය අවසන් මනමාලියයි.

සාර්ථකයැයි අම්මා අනුමාන කළ ප්‍රියංකාගේ විවාහය ද නොකෙරී යාමෙන් ඇ තදබල දෙස දූකටත් කළකිරීමටත් පත්වූවාය.

"ඇයි පුතේ උඹ ඒ කෙල්ලට අකමැති උනේ...?"

ඇය ගෙදර රියදුරු හා සංවාසයේ යෙදෙතැයි කියන්නට නොසිතුණෙන් මම කරබා උන්නෙමි.

"උඹට මඟුල් හරියන්නෑ පුතේ."

මගෙන් පිළිතුරක් නොවන තැන අම්මා මගේ විවාහය සම්බන්ධ ඇගේ අවසන් තීරණය නොඑසේ නම් සිතිවිල්ල වචනවලට පෙරළා දැම්මාය.

එය මගේ ජීවිතයේ ඉතිරි කාලය පිළිබඳව වූ අසුබම අනාවැකිය යැයි මට සිතිණි.

මගේම අම්මාගේ මුවින් එය නික්මීම පිළිබඳ චින්තා වේගය බලවත් වූයෙන් මගේ දෑසට කඳුළු ඉනුවේය.

එය දකින්නට පමා නොවූ අම්මා මගේ කාමරයෙන් නික්ම ගොස් තිබුණි. මියගොස් දස අවුරුද්දකට පසුව ද තාත්තා ළඟ නොවීමේ අඩු පාඩුව මට තදින් දැනුණි.

ඔහු සිටියා නම් මීට වඩා සංවේදීව මගේ ගැටලු විසඳනු ඇතැයි මට විශ්වාසය. ඇතැම් විට ඔහු මැදිහත් වූවා නම් සමන්දිනී මගේ බිරිඳ වන්නට ඉඩ තිබිණි.

ඇය මෙතෙහි වීමෙන් තාත්තා පිළිබඳ හටගත් ආදරණීය චින්තාවේගය ද තුනී වී ගියේය. ගැහැනුන් පිළිබඳ මගේ පොදු ආකල්පය ඉතාම නීරස අවපැහැ ගැන් වූ එකක් විය.

ජීවත්වීම සඳහා විවාහය අත්‍යවශ්‍ය සාධකයක් නොවේය යන සිතිවිල්ල පිණිස මම හිත මෙහෙයවමින් උන්නෙමි.

ඒ අතරවාරයේ දිනක් අම්මා ටික කලක් හිඳිනු පිණිස අක්කාගේ ගෙදර ගියාය. ඊ දෙකක් මා නිවෙසේ හුදෙකලා කොට ඇ මෙවන් ගමන් ගොස් තිබුණ ද දිගු කලක් මවෙතින් දුරස්ව ඇය කල් ගෙවූ මුල්ම වතාව එය විය.

එක්කෝ ඇය මට තනිකඩ හුදෙකලා ජීවිතය නීරස බව ඒත්තු ගන්වන්නට වෙර දරුවා විය යුතුය.

නොඑසේනම් ඒ ජීවිතයට හුරුවන්නට මට ඉඩහරින්නට සිතුවා විය යුතුය. ඒ දෙකින් කුමක් වුවද අම්මා අක්කා ළඟට වී ගෙවෙන තුන්වැනි දවසේ මැණිකාද ගියේ බොහෝ විට නිදන්නට පමණක් මා නිවෙසට ඒම නිසා විය යුතුය. මැණිකාද නිවසින් බැහැර වූ විගස අම්මා ගෙදර එතැයි මා කළ අනුමානය ද වැරදිනි.

මා ළඟ නොමැති අඩුව ඇයට දැනුණ ද - නොදැනුණ ද මට නම් ඇය නැති අඩුව තදින් දැනුණි. රැයෙහි මේ විසල් නිවසේ හුදෙකලා වීමෙන් මා තුළ තදබල බියක් හටගත්තේය. ඒ අද්භූත මිනිසකු මගේ

නිදියහනට එතැයි කියා හෝ ජනේලයෙන් එවැනි මිනිසකුගේ මුහුණක් එබෙතැයි කියා හෝ බියක් නොවේ.

එවැනි සිතිවිලි මට මේ වහල යට දී පහළ වූයේ පුංචි සංදියේ දී ය. දැන් මා පෙළන්නේ රෝග බියයි. සොර සතුරු බියයි. ඒ සියල්ලකටම වඩා තනිකමයි. පාළුවයි. ඒ සැක සංකා සමඟ පොර බදමින් ඊට හුරු වන්නට මම වෙර දරමින් උන්නෙමි. වසර ගණනාවක පුරුදු දිනකින් දෙදිනකින් වෙනස් කරගත නොහැකි තැන මම කයින් මනසින් දුර්වල වීමි.

මුලින්ම මම කුස රුදාවකින් පෙළීමි. ඒ සමගින්ම කෑම අරුචියක් ද හටගත්තේය. කෙතරම් නා කියා පිරිසිදුව උන්න ද කිසියම් අපිරිසිදු හැඟීමක් මා වෙලා ගත්තේය. දිනකට තුන් හතර වතාවක් ස්නානය කිරීම මට පුරුද්දක් විණි. රැයෙහි මහා ගොඩක් මත්පැන් බොනවා වෙනුවට මඳක් බොන්නට මම වෙහෙසීමි.

ඇතැම් විට මගේ වෙහෙස පළ දුරුවේය. බොහෝවිට එය ගඟට ඉනි කැපුවා සේ විය.

මේ සියලු සිත් තැවුල් මැද්දේ සෑම දිනක් හැර දිනක්ම අම්මා බලන්නට යන්නට ද මම අමතක නොකළෙමි.

ඒ යන සෑම දිනෙකම මගේ ජීවිතයේ කඩා වැටීම අම්මාට නොපෙනෙන පරිදි හැසිරෙන්නටත්, අඳින්න පළඳින්නටත් මම වගබලා ගතිමි.

"බලං ගියාම උඹට තිබිලා තියෙන්නෙ මං එහෙ ඉන්න අපලෙ."

මගේ මවාපෑම නොඑසේනම් මා හිඳින්නේ සතුටින් යැයි අම්මාට ඒත්තු ගන්වන්නට මා දරූ උත්සාහය පල දරා තිබිණි.

"ඒක නොවෙන්නං... දැන් ඔය සුදු මහත්තයා ඉන්නෙ සුද්දෙක් වගේ."

"එකටම ඉන්න හින්දද කොහෙද මැණිකාත් දැන් අම්මා වගේ."

"මං නං කිව්වෙ පෙනෙන්න තියෙන දේ සුදු මහත්තයෝ."

"නෙවෙන්නත්..."

අම්මාත් මැණිකාත් මගේ බාහිර වෙනස්කම් ඇසුරේ සංතෘප්තියට



පත්ව උන්නාහ. අක්කා ඔවුන් ඉදිරියේ ඒ පිළිබඳ කිසිදු මතයක් පළ කළේ නැත.

ඇය ආ ගිය තොරතුරුත් මා පිළිබඳත් කතා කළේ අම්මාත් මැණිකාත් මඟහැරය.

"කොහෙන් ද ඔච්චර නීට්ටෙකට ඇඳුම් මැද ගන්නේ ලොන්ඩරියෙන්ද...?"

අක්කා ඇඟට පතට නොදැනී ඇසුවේ ගැස් ලිප මත වන හොද්දක් හැඳි ගාමිනි.

"ඔව්... සතියෙම ඇඳුම් එක පාර මැදගන්නවා."

"බර ගානක් සතියට යනවා ඇතිනෙ."

"ගෙදර මැද්දා කියලා ගානෙ ලොකු වෙනසක් වෙන් නෑ අක්කෙ..."

"ලොන්ඩරියට දෙන ගානෙයි ලයිට් බිලයි අතර තියෙන්නෙ පොඩි වෙනසයි."

අක්කා ඒ කතාවෙන් බැහැර වූයේ මගේ කියමනට එකඟව වාගේය.

"තමුසේ මේ දවස්වල කන්නෙ කොහෙන්ද...?"

"උදේට ඔය මොනා හරි පොඩි දෙයක් මංම හදා ගන්නවා... දවල්ට ගුණසිරි ලවා මිනිහගෙ ගෙදරින් කෑමෙකක් ගෙන්න ගන්නවා."

"ගුණසිරිලා බත් දෙනවද...?"

"ඔව්... එහෙ හාගෙට භාගයක් කෑම ගන්නේ එහෙන්..."

"ඒ උනාට ඔයා එහෙන් කෑම ගන්නෙක හරි ද...?"

"වෙයාමනුත් වෙලාවකට එහෙන් කෑම ගෙන්න ගන්නවා... ගුණසිරි ඒක බොහොම පිළිවෙලට ලස්සනට කරන වැඩක්..."

"එතකොට රෑට..."

"එක්කෝ මොනවා හරි හදනවා... නැත්තං කෑම කඩෙන් ගේනවා."

අප අතර තත්පර කිහිපයක මුණිවතක් ඉහිරිණි.

"මේ දවස්වල වැඩ අධිකයි අක්කෙ... කෑම බීම නින්ද ගැන හිතන්නවත් වෙලාවක් නෑ."

අක්කා කිසිවක් නොකීවය.

"ඔගස්ට්වල ඉංග්ලන්ඩ් ටුවරෙකකුත් තියෙන නිසා... මේ දවස්වල දඩ බඩ ගාලා වැඩ."

මගේ ජීවිතය පිළිබඳ මවිසින්ම නිර්මාණය කරන කයිකතාන්දර අක්කා විශ්වාස කරන බවක් නොපෙනුණි.

නමුත් ඒවා ඇත්ත ද නැත්ත ද යන දෙගිඩියාවෙන් ඇය පෙළෙන වග ඇගේ ඉරියව් කියා පෑවේය.

මට දුකක් පසුතැවිල්ලක් දැනුණි. මා මේ බොරු කියන්නේත් බොරු කරන්නේත් මගේ හිත සුව පිණිස නොවන බැව් සිතා සිත හදාගන්නට මම සිතිවිලිත් සමඟ පොර බැදීමි.

අම්මාට උවමනා වී තිබුණේ තනිව ජීවත්වීමට මා හුරු කරවන්නටය. ඕ අක්කාගේ ගෙදර නතර වූයේ ඒ අභිප්‍රායෙනි. හුදෙකලා ජීවිතයෙන් හෙම්බත්ව වෙහෙසට පත්ව ගියද මම අම්මාට ඒ බැව් නොඇඟවීමි. අක්කා හා අයියා ඒ බැව් වටහා ගත්තද ඔවුන් එය නොවැටහුණා සේ උන්නෝය. අම්මාට මසක් පමණ අක්කාගේ නිවසේ විසීමෙන් පසු තවදුරටත් එහි විසීම එපා විණි.

"අම්මට ගෙදර එන්න ඕන කියනවා..."

එක් සවස් වරුවක කාර්යාලයට කතා කළ අක්කා කීවාය. මවි තනපුඩුව දුටු කිරි කැටියෙකු වාගේ මසිතට සොම්නසක් සැනසීමක් දැනිණි.

"මං හවස එන්නම්."

අක්කා එහා ඉමෙන් රිසීවරය තැබුවාය. අම්මා ගිය දා පටන් අස්පස් නොකළ ගේ දොර සිහිවීමෙන් මසිත නොසන්සුන් විය. ඇය නොමැති දින කිහිපය මා නිවෙසේ ගත කළේ සතෙකු වාගේය යන්න ඒත්තු ගන්වන්නට නිවසේ අපිළිවෙල හේතුවනු ඇත.



අම්මා ගෙදර කැටුව එන්නට ඇති පැය කිහිපය තුළ දී ගේත්, වත්තත් පිරිසිදු කොට එළි පෙහෙළි කරන්නට හැකි නම් හොඳය. මම ගුණසිරි කැඳවා කටයුත්ත ඔහුට පැවරීමි. නිවසට ගිය හෙතෙම පෙරළා මට කතා කළේ කලබලයෙනි.

"සර්... පහුගිය දවස්වල හිටියෙ ගෙදර නෙවේ ද...?"

"ගෙදර... ඇයි...?"

"නෑ සර් මේක පිස්සන් කොටුවක් වගේනෙ..."

"ඒ නිසා නෙවෙන්නම් අයියෙ තමුසෙට අස් කරන්න කිව්වෙ..."

"සර් මේක හතරෙන් පහෙත් ඉස්සෙල්ලා ගොඩදාන්න නම් දොළොස් දෙනෙක් විතර වැඩට දාන්න වෙයි. මං මේ ටෙලිෆෝන් එකෙන් කතා කරන්නෙත් පැයක් හමාරක් විතර සුද්ද කරලා."

ගුණසිරිගේ කටහඬේ වූයේ ඔහුගේ තත්ත්වය අමතකව ගිය නොරිස්සුමකි.

"එහෙම කට්ටිය දාලා හරි කමක් නෑ වැඩේ ඉවර කරනවා."

"එහෙම කරලත් හතරෙන් පහෙත් ඉස්සෙල්ලා මේක සුද්ද කරලා ඉවර කරන්න පුළුවන් වෙයි ද කියලා ෂුවර් නෑ සර්..."

"එක්කෙනෙකුට වැඩක් ඉවර කරන්න දවස් දහයක් යනවානම් දහ දෙනෙකුට ඒ වැඩේ ඉවර කරන්න යන්නෙ දවසයි අයියේ... කියෝ කියෝ ඉන්නැතුව වැඩේ ඉවර කරනවා."

මම ඉන් එහා කතා නොකර රිසීවරය තැබීමි. ගුණසිරි කෙසේ හෝ තම කටයුත්ත හමාර කරන බව මම දැන උන්නෙමි. සකලවිධ බලාපොරොත්තු බිඳී ගිය තැන ඉතිරි වන එකම කුඩා බලාපොරොත්තුවේ ද මිනිස් සිත එල්බ ගැනීම පුදුම සහගතය. අම්මා නැවත ගෙදර ඒම ද මට එවැනි බලාපොරොත්තුවකි.

සමන්දිනී විසින් බලාපොරොත්තු භංගත්වයට පත් කළ සිත දුන් දුන් අන්ත අසරණය. දුර්වලය. එකතාකට මේ සියල්ල මෙසේ සිදු වූයේ ඇගේ වරදකින් නොවේ. මගේ සිත තුළය. තිබැද්දදේ ද මා ඇය වැරදි ලෙස දක්කායැයි බොහෝවර මට සිතිණි. ඒ සිතිවිල්ලේ ගැඹුරට යද්දී ඇය ද අනූෂ ද වැරදිකරුවන් වේ. නිවැරදිකරු වන්නේ

මාය. එනිසාම අවසන නිදොස්වන්නේ ද වදවේදනා විඳින්නේ ද මාය. සමන්දිනී සිහිවිල්ලක්ව හදවතට ආ පසු එළැඹෙන සෑම තත්පයක්ම කාලකණ්නි වී යයි. සෑම අරුචිය සේම රාජකාරියෙහි අතෘප්තිය ද මා දවයි. තවයි. ගෙවෙන හැම තත්පරයේම ඇය සිතින් පළවා හරින්නට වෙර දරනු මිස කරන්නට මට වෙනත් රාජකාරියක් නොවේ.

මගේ රාජකාරි සියල්ල මේ වනවිට සිදුවනුයේ වතුරානි අතිනි. මා කළේ අවසන් අනුමත ලිපියට අත්සන් තැබීම පමණි. ඒ කටයුත්තේ බරපතලකම නිදින් මට දැනුණ ද අකර්මන්‍ය සිතට ඉන් අත් මිදීමේ හැකියාවක් නොවීය.

"ඔයා කීයට ද එන්නෙ..,?"

සවස අක්කා මට නැවත ඇමතුමක් දුන්නාය.

"හතරට පහට විතර එන්නම... ඇයි...?"

"අම්මට ටිකක් සනීප මදි වගේ... මං තව ටිකකින් නර්සින් හෝම්මෙකට එක්කන් යනවා... ඔයා කෝල් කරලා එන්න."

"ගොඩක් අමාරුයි වගේද...?"

"නෑ... එහෙමටම අමාරුවක් නෑ. කෝකටත් බෙහෙත් ටිකක් අරගෙනම ගෙදර යනේක හොඳයිනෙ."

"මං වේලපහ එන්නෝත්තම් එන්නම්."

"තේරුමක් නෑ. අයියා අද වාහනේ තියලා ගියේ."

මම අම්මා ගෙදර කැටුව එන්නට පෙර එහි ගොස් සෝදිසි කර බැලීමි. ගුණසිරි හැරුණු විට ගැහැනුන් තිදෙනෙකු ද, පිරිමින් දෙදෙනෙකු ද ගෙදරත්, වත්ත පිටියේත් වැඩ පල කරමින් උන්නෝය. ගෙදරත්, ගෙවත්තත් බලන්නට ප්‍රියජනක තැනක් බවට පත්වෙමින් තිබිණි.

"මේ විදියට කට්ටිය හොඳම්මා නම් වැඩේ කරන්නට වෙන්නෑ සර්."

ගුණසිරි කතා කළේ වැඩි පිරිසක් යොදවන්නට වීමේ වරදකාරි හැඟීමකින් මෙනි.



"ඒකට කමක් නෑ. වැඩේ හරියට කෙරිලනෙ."

මම ගණන් මිනුම නාසා රුපියල් හත්දහසක් ගුණසිරි අත තැබීමි. කටයුත්තෙන් රුපියල් තුන්දාහකටත් වැඩි ශුද්ධ ලාභයක් ඔහුට වනු ඇත.

"සර් ලොකු මැණිකෙව එක්ක එන්න... තව පැයක් යන්න ඉස්සර මං වැඩේ ඉවර කරලා කට්ටිය යවන්නම් සර්."

ගුණසිරි ඉක්මනින් මා යවා ගන්නට වෙර දරුවේ පිරිසට දෙන පඩිය මා දකිවිය යන බියෙන් වග මට වැටහිණි.

"අම්මා ආවට පස්සෙ වැඩ කරන්න තියන්නෙපා."

"තව පැයයි සර්... ඊට පස්සෙ වැඩක් පලක් යෙදුණොත් මං තනියම කරන්නම්."

"ඒක හොඳයි."

මම අක්කාට ඇමතුමක් ගත්තේ මෝටර් රියට ගොඩවීය. දිගින් දිගටම සෙල්ෆෝනය නාද වුවා මිස ඇගේ ඉමෙන් ප්‍රතිචාරයක් නොවීය. මම එම ඇමතුම විසන්ධි කර ගෙදර අංකය අංකනය කළෙමි. ඊට පිළිතුරු දෙන්නට ද ගෙදර කිසිවෙකු නොවීය. ඇය අම්මා හා වෛද්‍යවරයා ළඟට එන්නට ඇතැයි අනුමාන කළෙන් මම පුද්ගලික රෝහල වෙත රිය පැදවීමි. අයියා මට කතා කළේ ඒ ගමන අතරවාරයේය.

"ඔයා කොහෙද ඉන්නෙ...?"

"අම්මව අක්කා ඩොක්ට ගාවට ගෙනියනවා කිව්වා. මං එහෙට යන ගමන්. ඇයි...?"

"නෑ... දැන් අක්කලා ගෙදර ඇවිත් ඔයා එහෙට එන්න."

"මං දැන් ගෙදරට කතා කළා... කවුරුත් ආන්සර් කළේ නැනෙ."

"මං දැන් එහෙ ඉන්නෙ... ඔයාගෙ නම්බර් එක දකලා තමයි කතා කළේ."

මම යන මඟ වෙනස්කොට රිය හරවා ගතිමි. යා යුතු මඟ පිළිබඳ හරියාකාර ආරංචියක් නොලැබීමෙන් මම නොරිස්සුමට පත්ව උන්නෙමි.

මෝටර් රිය එහා මෙහා පැදවීමෙන් මා තුළ හටගත් නොරිස්සුමත් ආවේගයත් බියකටත් දෙගිඩියාවටත් පෙරළුණේ අක්කාගේ ගෙවත්තට රිය හරවද්දීය. අයියාගේත්, අක්කාගේත්, පොඩි උන් මිදුලේ ඒ මේ අත දුවමින් හුන් අතර අයියාගේ මෝටර් රියත්, අක්කාගේ මෝටර් රියත්, අවශේෂ තවත් රියකුත් මිදුලෙහි විය. අක්කා කීවාට වඩා අම්මාගේ තත්ත්වය බරපතල වන්නට ඇතැයි මට සිතිණි. මා රියෙන් බසිද්දීම අයියාගේ වැඩිමහල් පුතු මවෙත දිව ආවේය. අනතුරුව හෙතෙම රහසක් කියන්නට වාගේ අවට බැලීය.

"මං කිව්වා කියලා කියන්නැත්නම් බඩ්ඩක් කියන්නම්."

"මොකද්ද පුතේ...?"

"කන ළං කරන්නකෝ..."

මම දරුවා වෙතට නැඹුරු වීමි.

"ආච්චි මැරුණා."

පුතු මිමිණීය. එක්වරම මසිතට දුකක් හෝ ආවේගයක් ඇති නොවූයේ ඒ ආරංචිය සිතෙහි දුවටී නොරැඳී ගිය නිසාය. මගේ පපුව ගැහෙන්නට ගත්තේ ඉන් අනතුරුවයි. මම හිස ඔසවා නිවෙස දෙස බැලිමි. අක්කාත්, අක්කාගේ සැමියාත් අයියාත්, අයියාගේ බිරියත් ගෙයින් දොරට බසිමින් උන්නෝය. පුතුගේ ආරංචියේ බරපතලකමත්, වේදනාවත් මට දැනුණේ එවෙලේය. මම දෙකකුල් පිටත තිබියදීම රියදුරු අසුනේ හිඳ ගතිමි. එක තත්පරයක් තුළ යටගියාව නෙත මත ඇඳිණි.

මට යුතුකම් ඉටු කරන්නට ඉඩ නොතබාම, මගෙන් සැලකුම් ලබන්නට නොරැඳීම අම්මා යන්නට ගියාය යන්න මට විශ්වාස කළ නොහැක්කක් විය. ඇය ජීවත්ව උන්නේ තාත්තාට අහවර කරන්නට බැරි වූ මගේ පුද්ගලික ජීවිතයේ ඇතැම් කරුණු උදෙසාය. ඒවා ඉටු නොකොට ඇය නික්ම යාම අදහාගත නොහැක්කකි. මම හුනස්නෙන් නැගිට රියෙහි දොර වසා පිරිස වෙතට ගියෙමි.

"මොකද උනේ..."

මගේ කටහඬ නික්මුනේ උගුරෙනි. එය ඇසෙන නෑසෙන තරම් දුර්වල කටහඬක් වන්නට ඇත.



"යංකො ගෙට..."

අයියා මගේ උරහිසට අතක් දමා කතා කළේය.

"මොකද්ද උනේ කියනවකෝ අයියේ..."

මගේ වෙව්ලන කටහඬේ ශෝකයත්, කෝපයත්, ආවේගයත් වන්නට ඇත. අයියා ඊට පිළිතුරක් දෙන්නට පෙරාතුව අක්කා කපා හෙලූ ගසක් වාගේ සිහිසුන්ව වැටුණාය.

අම්මා මිය ගියාය. කෑ ගසා, විලාප තියා නොහැඬුවද, ඇගේ මරණය මගේ සිතේ සතුට සෝදා පාළුවට ලක් කොට තිබිණි. සිතෙහිවන නොසතුට මහගෙදර වූ කලබලකාරී පරිසරයෙන් වැසී තිබිණි. අම්මාගේ වියෝ වීමේ දුක බෙදා ගන්නට හතර වරිගයම මහගෙදරට එක්ව තිබිණි.

කලකින් දුටු නෑයෝ ද, නොනෑයෝ ද ඔවුන්ගේ දරු පරපුරේ ඇයෝ ද සතියකට වැඩි කාලයක් මහගෙදර තනිකම රැක්කෝය. අම්මාගේ දෙහ ආදාහනය කිරීමෙන් අනතුරුව ඔවුන්ගෙන් හරි අඩක් ගම රට බලා ගියේය. හත් දවසේ දානයෙන් පසු ඉතිරි වූයේ අම්මාගේ එක කුස උපන් බාල සහෝදරයාත්, ඔහුගේ පවුලේ අයවලුන් පමණි. අක්කාත්, දරුවන් දෙදෙනාත්, මහගෙදර විණි. අයියා දානයට පසුදාම තම ගෙදර ගියේය.

අම්මා සතුටු කරනු පිණිස එළි පෙහෙළි කළ වත්තේ ඇගේ මරණය සඳහා කුඩාරම් ගසන්නට මට සිදු විය. ඇගේ සිතේ සතුට වෙනුවෙන් අස් පස් කළ නිවෙසේ ඇගේ දෙහ තබන්නට සිදු විය. ඒ සියලු කනස්සලු සහගත සිදුවීම් ඔස්සේ ඇය ඇඳකට වැටී දුක් නොවිඳීම පිළිබඳව මගේ සිතේ තුටු සොම්නසක් විය. අක්කා කියන ආකාරයට ඕ මරණයේ වේදනාව වින්දේ තම තත්පර කිහිපයක් පමණි. "පපුව රිදෙනවා බං." යැයි කී ඇගේ හිස රැළක තත්පරයේ කඩා වැටුණු බවක් අක්කා කීවාය. ඈ මිය ගොස් ඇත්තේ ඒ මොහොතේ යැයි වෛද්‍යවරු කීමෙන් ඇගේ මරණීය වේදනාව ඉතා කුඩා එකක් වන්නට ඇතැයි මට සිතිණි.

නමුත් මිය යන මොහොතේ තාත් කවුරුවත් නැතිව හුදෙකලාව හුන් මා ගැන ඇයට මෙතෙහි නොවුණා වන්නට බැරිය. ඇය මිය

ගියේ හිත හොඳකින් නොවන බැව් හැඟෙන හැම මොහොතකම මගේ ඇතුළාන්තය ඉකිබිඳ හඬා වැටේ.

"දැන් සුදු මහත්තයා මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නේ...?"

ඒ හිච්චි මාමා මහගෙදරින් යන්නට පෙරාතුව ගෙවූ ආසන්නම දවසයි.

"එහෙම විශේෂ දෙයක් නෑ හිච්චි මාමේ..."

"දැන් ඉතින් එහෙම කියලා බෑනේ. මොකෝ උඹ මේ සාගරයක් වගේ ගේ ඇතුළෙ තනියෙන් ජීවත් වෙන්න කියලයෑ..."

ඒ වචනවලින් පවා මා තුළ හටගත්තේ බියකි. හුදෙකලාව ජීවත් වන්නට මා තුළ වන නොහැකියාව අන් කවරදාකවත් නොවන තරමේ ශක්තියකින් නැඟී උන්නේය.

"අක්කයි අයියයි ජීවතුන් අතර ඉන්නකම් කරෙත් සුදු මහත්තයට මඟුල් හොයපු එකනේ..."

හිච්චි මාමා අක්කායි, අයියායි කීවේ අම්මාට සහ තාත්තාට විය.

"මොන හපන්කම කරත් ඒ දෙන්නට ඒ හපන්කම කොරගන්ඩ බැරි උනා..."

"කොච්චරවත් මනමාලියෝ බැලුවට මෙයා ඒ එකකටවත් කැමති උන් නෑනෙ හිච්චි මාමේ..."

අක්කා කතා කළේ අම්මාගේ මරණයට එය ද හේතුවක් කරගෙන වාගේය.

"අම්මා මේ පාර අපේ ගෙදර ඇවිත් හිටියෙත් මෙයාට මනමාලියෝ හොයලා එපා වෙලා..."

"බඩුවක් භාණ්ඩයක් කඩෙන් ගන්නවා වගේ ගෑනියෙක් ගන්ඩ බැරි විත්තිය ඇත්ත... නමුත් ඉතින් එහෙම කියලා තනිකඩව ඉන්නයෑ..."

මාමා කතා කළේ මගේ හිත නොරිදෙන පරිදිය.



"සියට සියක් ගැළපෙන ගෑනු, මිනිස්සු කාට ද හිච්චි මාමේ හම්බ වෙන්නේ... නමුත්ට විකක් හරි ගැලපෙන ගෑනියෙක් මෙයා කසාද බැන්දනම් අදත් අම්මා ජීවත් වෙනවා..."

මා තනිවීමේ වේදනාව අක්කා පළ කළේ අම්මාගේ මරණයට මගේ හැසිරීම හේතු කරගෙනය. එනිසාම ඇය පිළිබඳව නොසතුටක් හෝ කලකිරීමක් මා තුළ හට ගත්තේ නැත.

"මෙයා කසාද බැන්දයි කියලා කොහොමද බං අම්මාගෙ ආයුෂ වැඩි වෙන්නේ... කටට ආවට මෝඩ කතා නොකියා හිටහං..."

හිච්චි මාමා අක්කාට සැර වූයේ ඇගේ වචන මගේ දොම්නසට හේතු වී ඇතැයි වැරදි නිගමනයක පිහිටා වන්නට ඇත.

"ඒ කොයි හැටි වෙතත් දැන් ඉතින් උඹේ මංගල්ලෙත් ඉස්සර වෙන්නෝන සුදු පුතේ... හිටහංකො ඒ කටයුත්තටත් මංම කර ගහන්න..."

හිච්චි මාමා එසේ කීවේ අක්කාගේත්, අයියාගේත් විවාහයන් සඳහා මූලික වූයේ ඔහුම නිසාය. මම ඔහුගේ වචනවලට එකඟවීම හෝ නොවීම නොකළෙමි.

පසුදා නා නා ප්‍රකාර අවවාද අනුශාසනා කිරීමෙන් අනතුරුව ඔවුන්ද මහ ගෙදරින් නික්ම ගියෝය. ඉන් සතියකට පසු දරුවන්ගේ පාසල් ගමන මාතෘකාව කර ගනිමින් අක්කා ද මහගෙදරින් නික්මිණි. අක්කර කාලයකට වැඩි භූමි භාගයක් තුළ පිහිටි ප්‍රතාපවත් වළව් පාන්තික නිවසේ එතැන් පටන් මගෙ තනියට වූයේ මැණිකාය. ඇය ද මට තනි රැක්කේ දිනකි. නොඑසේනම් දෙකකි.

"මං ගෙදර යන්න ද සුදු මහත්තයෝ..."

එක් උදෑසනක කාමරයට තේ බඳුන ගෙනවිත් දුන් මැණිකා කතා කළේ හඬන්නට අර අඳින දැරිවියක වාගේය.

"ඒ ඇයි හදිස්සියේ..."

"නෝනා නැතිවෙච්ච දා ඉඳලා මේ වහළ යට මට ඇහැපියවෙන්නෑ මහත්තයෝ..."

"මැණිකට බයයිද...?"

''බයක්ම නෙවේ මහත්තයෝ... මගේ හිතට හරි දෙගිඩියාවයි...''

මම කවුළුවෙන් පෙනෙන ඈත මිදුල දෙස බලාගත් වනම තේ බඳුන තොල ගෑමි. මා මේ රස විඳිමින් හිඳින්නේ මැණිකා මා වෙනුවෙන් අවසන් වරට තැනූ තේ බඳුන යැයි සිතීමෙන් මගේ දෑස් තෙත් විණි.

''... මං පනස් අවුරුද්දක් උන්නේ ලොකු හාමිනේ එක්කනේ... ඒ උත්තම් නැතුව මේ වහළ යට ඉන්නෙක මට මහ මොකද්ද වගේ...''

''මං දන්නවිදිහට මං නම් මැණිකට වරදක් කරලා නෑ.''

''අදටත් ඉතින් ඒක නම් එහෙම තමයි...''

''... එහෙම නම් මොකද්ද මැණිකා ගමේ යන එකේ තේරුම...''

''මට පුංචි නෝනා එහාට එන්න කියලත් කතා කරා...''

මැණිකා පුංචි නෝනා යැයි කීවේ අක්කාටය.

''මැණිකා එහෙ යන්න...''

''සුදු මහත්තයා මෙහාට උයන්න පිහන්න පුළුවන් කෝකියෙක්ව ගත්ත නම් හෙදයි...''

''මං ඒක මොනවා හරි කරගන්නම්... මැණිකා දන්ම ලෑස්ති උණොත් මං ඔෆිස් යන ගමන් මැණිකව එහෙම ඇරලෝගෙන යන්නම්...''

''සුදු මහත්තයත් මේ ගේ වහලා දාලා එහෙ ආවා නම් නේද හොඳ...''

මැණිකාගේ වචනවල මා අතහැර දා යා නොහැකියාව ගැබ්ව තිබිණ.

''මට පරක්කු වෙනවා... මැණිකා ඉක්මනට ලෑස්ති වෙන්න...''

මට උවමනා වූයේ මැණිකා කී වචන තඹේකට මායිම් නොකළ වග අඟවන්නටය. මැණිකා නෙතු කඳුළු පුරවාගත්වනම කාමරයෙන් පිටව ගියාය. අන්ත අසරණ, පරාජිත, හුදෙකලා සිතිවිල්ලකින් මගේ ඇස් කෙවෙනි තෙත් විණි. ඒ තනිකම, ඒ අසරණකම, ඒ හුදෙකලාව ඉන් එහා රොද බඳිමින් මාගේ ජීවිතය වසා ගන්නට පටන් ගත්තේය.



මට විවාහයක් කර දීමේ කටයුත්තට උර දෙන්නට ප්‍රතිඥා දී නික්ම ගිය හිච්චි මාමා අම්මාගේ තුන් මාසයේ දානයටවත් ආවේ නැත. ඒ ඔහු අංශභාග රෝගයෙන් ඔත්පල වී යාම නිසාය. අයියා හෝ අක්කා ඉන් එහා මට කසාද සොයන්නට වෙහෙසුනේ ද නැත.

''උන් දෙන්නා දූන් බලන් ඉන්නේ උඹේ දේපළ උන්ගෙ දරුවෙක්ගෙ නමට ලියවෙනකම්...''

හිච්චි මාමා බලන්නට ගිය විටෙක ඔහු කීවේය. එය සැබෑවකි. අක්කාත්, අයියාගේ පවුලත් තම තමන්ගේ දරුවන් මට කුළුපග කරන්නට අමුතු තරගයක යෙදී උන්නෝය. ඊට හේතුව මගේ දේපල වග මම දන උන්නෙමි.

# 10

හුදෙකලා ජීවිතය පිළිබඳව කලකිරීමක් ද තවත් වරෙක සොම්නසක් ද මට දනෙමින් තිබිණි. ගුණසිරි ලවා උයන්නට, පිහන්නට හැකි තලත්තැනි පිරිමියෙකු මම ගෙදර නතර කොට ගත්තෙමි. බිරිය හා දරුවන් සමග උරණව උන් ඔහු ගෙදර බලා කියා ගනිමින්, උයමින්, පිහමින් ඒ පිළිබඳ මගේ බර හැල්හු කළේය. ඔහු වෙතින් වරදක් ප්‍රකට වූයේ නම් ඒ බෙබද්දුකම පමණි. ඒ වන විට මම ද බෙබද්දකු වූ නිසාවෙන් මට එය වරදක්ව නොපෙනිණි.

සමන්දිනී එද වාගේම අදද සිතෙහි නතරව උන්නාය. ඇය හරියට මසිතේ කටු සිත්තමක් මෙනි.

මම අතීතය හාරා අවුස්සමින් ඒ කටු සිත්තම වර්ණ ගන්වමින් උන්නෙමි. එසේ ගෙවුණු කාලය මගේ හිසකෙසින් වැඩි කොටසක් සුදු පැහැයට හරවමින් තිබිණි.

ඒ කාලය තුළ සිදු වූ මසිත කම්පාවට පත් කළ සිදුවීම වූයේ අයථා ලෙස චන්දි ගිම් නාම ලේඛන සැකසීමේ චෝදනාවට මා ලක්වීම පමණි. චතුරංගී විසින් මගේ බලතල පාවිච්චි කරමින් කළ ඒ නොමනාකමින් මම දෙමසකට වැඩි කාලයක් විනය පරීක්ෂණ සඳහා සහභාගි වීමි.

කෙළවර මගේ නිදොස් බව ඔප්පු විණි. මා සදොස් යැයි චෝදනා ලද මොහොතේත් මට අමුතු දුකක් නොදැනිණි. නිදොස් යැයි දැනගන්නා ලද මොහොතේත් මට අමුතු සොම්නසක් ද නොදැනිණි.



ජීවිතය යනු සිදුවීම් ජාලයක් වග ඒ වන විට මම වටහා ගෙන උන්නෙමි. හැඬීම, සිනාසීම තරමටම සාමාන්‍ය විය. සිනාසීම, හැඬීම තරමටම සාමාන්‍ය විය. ජීවිතය ඒ තරමටම මියැදී තිබිණ.

මා විදෙස් වෘත්තිය සබඳතා අමාත්‍යාංශයට මාරු කරනු ලැබුවේ පූර්ව දනුම් දීමකින් නොවේ. අමාත්‍යාංශය උසස් වී ද, මට ලැබුණේ කළ රැකියාවට වඩා පහත් එකකි. පෙර වෘත්තියේ මට ඉහළින් වූයේ සභාපතිවරයා පමණි. මෙහි සභාපතිවරයාට පසුව පිළිවෙලින් දෙදෙනකුට පසුව මගේ නම විය. නමුදු ඒ පිළිබඳ කණගාටුවක් හෝ කලකිරීමක් මා තුළ නොවීය.

ජීවිතයට අහිමිව ගිය දේ පිළිබඳව සිතද්දී රස්සාව නම් කුමක්දැයි සිතෙන තරමට මා සරලව උන්නේය.

අනෙක් අතට නිලතල ගරු නම්බු නාම හෝ මුදල් හදල් පොදි බැඳ ගන්නට තරම් අනාගත බලාපොරොත්තු මට නොවිණි. වස්තුව දේපල රැස් කරන්නේ කවුරුන් උදෙසා ද යන ගැටලුව මට නිරන්තර වද දුනි.

අක්කාත්, අයියාත් නිරන්තර සටකපට කමින් කඳවුරු බැන්දේ මගේ දේපල වස්තුව තමුන්ගේ දරුවන්ගේ නමට ලියා ගන්නටය.

උයන්නට, පිහන්නට හුන් දයාදේව පවා සිතා උන්නේ මා මිය යනවිට යමක් ඔහුටත් ලියා තබාවියැයි කියාය.

වෘත්තියෙන් පසු ද මට ආවතේව කරමින් හුන් ගුණසිරි ද එවැන්නක් බලාපොරොත්තු වූවා විය යුතුය.

හම්බ කරන මුදල් වියපැහැදම් කරමින් හුන් මම නම් ඒ පිළිබඳව සිතුවේම නැත.

සමන්දිනී වෙනුවෙන් යමක් කළයුතුය යන හැඟීම මසිතේ විය. ඉන් ඇගේත්, අනුෂගේත් ජීවිතයට අනිසි බලපෑමක් වේ යැයි සිතා කරබා ගතිමි.

හම්බ කරන මුදල් වියපැහැදම් කරමින් ජීවත් වනු විනා මට ඉන් එහා බලාපොරොත්තුවක් නොවීය. ජීවිතය කාර්යාලයෙන් ගෙදරටත්, ගෙදරින් අවන්හලටත් සීමා වී තිබිණි.

''එහෙ කතාව යන්නෙ සර් බොන හින්දා එහෙන් අයින් කළා කියලා...''

වරක් ගේ දොර අස්පස් කරන්නට උදව්වට ආ ගුණසිරි කීවේය.

ඔහු එහෙ යනුවෙන් අදහස් කළේ මගේ පෙර වෘත්තිය ස්ථානයයි.

''ඇත්තටම ඒක ද දන් නෑ අයිසෙ උනේ...''

ගුණසිරි මගෙන් එවැනි පිළිතුරක් බලාපොරොත්තු නොවුණා විය යුතුය.

''එහෙම කොහොමද සර් වන්නේ... සර් එහෙ අවුරුදු දහයක් විතර ගින්දර වගේ වැඩ කරානේ...''

''ගින්දර වගේ වැඩ කරා නම් කොහොමද බං මාව ඉන්ටඩික් කෙරේ...''

''එව්වා ඉතින් චතුරංගනී මිස්ලගෙ වැඩනෙ සර්...''

''චතුරාංගනිලා ඒ තත්ත්වෙට පත් උනේ මං හින්දනෙ අයිසෙ...''

සැබෑ ලෙසම මගේ සිතෙහි කිසිවකු පිළිබඳව වෛරයක් හෝ අපැහැදීමක් නොවේ. සියල්ල සිදුවූයේ මගේ තාරක වේලාවටයැයි සිතෙන තරමට මම උපේක්ෂා සහගතව උන්නෙමි.

''ඒ දවස් ටිකට චතුරංගනී මිස් ලක්ෂ හැට හැත්තෑවක් හම්බකරා සර්...''

ගුණසිරි කීවේ වෙරිමතිනි. එකල වනවිට ඔහු හා හරි හරියට මත්පැන් බොන තරමට මගේ තත්ත්වය පාතට වැටී තිබුණි.

''එච්චර කොහෙ හම්බ කරන්නද බං...''

''සර් මොනවද සර් මේ කියන්නේ... මං ෆයිල් එකක් එහාට මෙහාට කරන්න රුපියල් පන්දාහ අරන් තියෙනවා...''

මට මා පිළිබඳව ඇති වූයේ තදබල කළකිරීමකි. සමන්දිනී මත්තෙහි නැගෙමින් විශ්‍රාම ගිය රජයේ සේවකයින්ට සේම රටට ද මා කර ඇත්තේ අවැඩකි.

''සර් කියන්නේ එක වන්දියක් පාස් කරන්න විසිදාහක් ගත්තොත් වන්දි පහක් පාස් කරාම ලක්ෂයක්නෙ... දවසට ෆයිල් හත අටක් ගොඩ දාන එකේ මාසෙකට ලක්ෂ පනහක් හැටක් හම්බ කරනෙක නතින්නෙ සර්...''

මා කන් දෙමින් සිටියේ ඉතා අමිහිරි කටුක කතාන්දරයකටය.

''එහෙම බලන් ගියාම චතුරංගනී මිස් ලක්ෂ දෙතුන්සියක් හම්බ කරන්නැති සර්...''

''ඔය කතාව නතර කරපං මිනිහෝ...''

සමන්දිනී අහිමිවීමෙන් හටගත් චිත්ත පීඩාවට ගුණසිරි පොහොර දමනවා වැන්න.

''නෑ සර් මං කිව්වෙ...''

''උඹ කිව්ව දේ මට තේරෙනවා මිනිහෝ ඔන්න ඕක මෙහෙන් තියලා පලයං යන්න.''

මම ගුණසිරි වෙතින් මත්පැන් වීදුරුව උදුරාගෙන පසෙක තබා ඔහු එළවා ගතිමි. හෙතෙම එහාට මෙහාට ඔට්ටු වෙමින් බලා සිද ගියේ මත්පැන් වීදුරුව ද බිය.

රාජකාරිය නිසි ලෙස ඉටු නොකිරීමේ පාපය එතැන් පටන් මා පසු පස හඹා ආවේය.

එක් පසෙකින් සමන්දිනී අහිමිවීමේ වේදනාවත් අනෙක් පසින් වංචනිකයකු වන්නට වීමේ වේදනාවත් මා පෙළන්නට විය.

පන්සලකට පල්ලියකට නොයන, සම්මත පින් දහම් කටයුතුවල නොයෙදෙන මම එතැන් පටන් දාන මාන දෙන්නටත්, අවංක ලෙස මිනිසුන්ට සේවයක් වන පරිද්දෙන් රස්සාව කරන්නටත් පෙළඹීමි. මගේ දානය හුදෙක් වංචනිකයන්ට හසු වීමක් බඳු විය.

රස්සාව අවංකව කරන්නට යාමෙන් සිදුවූයේ ද එයමය. ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන්න මෙතෙහි කොට මම සිත හදා ගතිමි.

ඇතුළාන්තයෙන් ජීවිතය චණ්ඩ සුළඟක් වුවද පිටතින් එය මඳ පවනක්ව ගලා යමින් තිබිණි. මුල දී ඒකිනෙක නැගෙන කුඩා නිසකෙස් කළු කළ ද කුඩු නිසකෙස් ගණන වැඩි වෙද්දී ඒ විශ්‍රු පන්තිය

මට නීරස විය. මම ශාරීරය වියපත් වන්නට හැර එය ද අත්හැර දැමීමි. අතීතයේ අළු යට සැඟව තිබූ ගිනි පුපුරක් අලුතින් දල්වෙන්නට ගත්තේ ඒ අතරේය.

"සර්ව හම්බ වෙන්ඩ කවුද ඇවිල්ල..."

"එන්න කියන්න..."

කවුරුන් හෝ මා හමුවන්නට ආ විට වෙනදා මෙන් කල්මැරීමේ සිරිතක් මට නොවේ. වහා ඔවුන් මුණ ගැසී කළ හැකි යමක් නම් කර දී කළ නොහැකි යමක් නම් පහදා දී පිටත් කර යැවීම මාගේ අලුත් පුරුද්ද විය.

කාර්යාල කාර්ය සහයිකාව පැමිණ තත්පර කිහිපයකට පසුව කාමරයෙහි දොරකඩින් මතු වූයේ අනුෂත්, තවත් බවලතකු හා පහළොස් හැවිරිදි යැයි කිව හැකි දැරිවියකි.

වසර පහළොවකට පමණ පසුව ඔහු දැකීමෙන් මම විශ්මයටත් තිගැස්මටත් ලක් වීමි. සියලු අතීත සිද්ධි අලුතින් ප්‍රති නිර්මාණය වූවා වැන්න.

"අනූෂ..."

මම හුනස්නෙන් නැගිටිමින් කතා කළෙමි.

"මං හිතන්නේ අවුරුදු පහළොවකට විතර පස්සෙ..."

"ඒක නෙවෙන්නං... ඉඳගමු..."

මම අතින් අසුන පෙන්වමින් අසුනට බරවීමි. ඔවුන් ආවේ කුමකටද...? බවලතා හා දැරිවිය කවුද...? සමන්දිනී හා පුතු කොහේද...? යන අනේකවිධ ප්‍රශ්න මසිතේ හොල්මන් කළේය.

"මේ මගේ නෝනා... මේ දූ..."

අනූෂ මා වටහාගත් සෙයින් කතා කළ අතර මම උන් හිටි තැන් අමතකව ගිය සෙයියාවෙන් හිනැහුණෙමි.

"දුව බංග්ලාදේශ් ටුවරෙකකට තේරිලා... ස්කූල් හොකී ටීම් එකේ... අද ස්පොන්සර්ෂිප් එක ගැන කතා කරගන්න එන්න කිව්වා... තිවංක මෙහෙ විත්තිය දත ගත්තේ බෝඩ් එකේ නම දැක්කම..."

අනූෂ තව මොන මොනවාදෝ කතා කළ ද මට ඒවා නිවැරදිව නැසිණි.

"එතකොට මේ..."

මා ඇසුවේ සොඳුරු පෙනුමින් යුතු බවලතා දෙසට ඇඟිල්ල දිගු කරමිනි.

"මගෙ නෝනා වසුන්දරා... මේ දූ අමායා..."

"ආ....?"

මේ සිදුවූයේ කුමක් ද... සමන්දිනී හෝ දරුවා පිළිබඳ ඇසීම නොනොඟිනා යැයි දුර්වලව යමින් තිබූ මගේ මනසට වැටහිණි.

තත්පර කිහිපයක මුනිවතක් අප අතර ඇති වෙමින් තිබිණි. මගේ හැසිරීමෙන් අනූෂගේ බිරිය වසුන්දරාත්, දූ අමායාත් විපිළිසරව උන්නෝය. අනූෂ පවා මගේ හැසිරීමෙන් නොසන්සුන්ව උන්නේය.

තවදුරටත් දෙගිඩියාව දරා සිටින්නට තරම් මසිත සවිමත් නොවිය. සන්සුන්ව හිඳිනවාට වඩා කතා කිරීම මැනවියැයි මට සිතුණේ වසුන්දරාත්, අමායාත් යමුදැයි රහසින් අනූෂගෙන් විමසනු දැකීමනි.

"මේ නෝනයි දූයි තරහා නොවෙනවා නම් මං කැමතියි අනූෂත්තෙක්ක ටිකක් තනියම කතා කරන්න."

මා මට ආචාරශීලී විය හැකි උපරිමයෙන් කතා කළෙමි.

"අනේ කමක් නෑ."

වසුන්දරා කතා කළේ දියණියගේ අත ගෙන හුනස්නෙන් නැගිටිමිණි.

"තිවංක කතා කරන්නෙ මගේ පුද්ගලික දෙයක් ගැන නම්... මේ දෙන්නා හිටියට ප්‍රශ්නයක් නෑ."

"නෑ කමක් නෑ අනේ අපි එළියෙන් ඉන්නම්."

"අපි එළියෙන් ඉන්නම් අප්පච්චි."

වසුන්දරා හා දියණිය කතා කළාට පසුව කතා කරන්නට ඉතිරි වූයේ මා පමණි. නමුදු කියන්නට යමක් සොයා ගන්නට මම අපොහොසත් වීමි.

"මගේ ජීවිතේ මේ දෙන්නට හංගපු කිසිම පුද්ගලික දෙයක් නෑ තිවංක."

වරදකාරයකු වාගේ නිරුත්තරව හිඳින්නට සිදුවීම පිළිබඳව මසිතේ හටගත්තේ නොරිස්සුමකි.

"තිවංක ඕනම දෙයක් කතා කරන්න මේ දෙන්නා හිටියට කමක් නෑ."

මට බර සුසුමක් හෙළිණි.

"නෑ... මං මේ අර මේ..."

"තිවංක අහන්න හැදුවෙ සමන්දිනී ගැනද...?"

මා කතා කරද්දී අනූෂ කතා කළේය. මට වසුන්දරා හා දියණිය දෙස බැලිණි.

"මේ ගොල්ලො ඒ හැම දෙයක්ම දන්නවා තිවංක."

අනූෂ කතා කළේ උපේක්ෂා සහගත මදහසකිනි.

"පුතයි සමන්දිනියි පහුගිය දවස් ටිකේම හිටියෙ අපේ ගෙදර... ලබන සතියෙ ඉස්කෝලෙ පටන් ගන්න හින්දා ඊයෙ ගියෙ."

වසුන්දරා මා කතා කරවන්නට වෙර දරුවා වැන්න.

"මට මෙ වෙච්ච කිසි දෙයක් තේරෙන් නෑ අනූෂ."

"ඇයි තිවංක සමන්දිනීව නොබැන්දේ...?"

අනූෂ ඇසුවේ කාලාන්තරයක් හදවතට වද දුන් ප්‍රශ්නයක් එළියට ඇද දමන සෙයිනි.

මා නිරුත්තරව ඔහු දෙස බලා උන්නා මිස පෙරළා කිසිවක් කීවේ නැත. නොඑසේ නම් කියන්නට යමක් මට ඉතිරිව නොතිබුණා ද විය හැකිය.

"අපි අංකල්ලෙක්ක කතා කරනකම දූ එළියෙන් ඉඳන් ඉන්නවද...?"

අනූෂ දියණිය අමායා දෙස බැලුවේ යමක් හදිසියේ මෙනෙහි වී වාගේය.

"හා අප්පච්චි."

දියණිය සොඳුරු සිනහවකින් හුනස්නෙන් නැගිට්ටාය.

"මං එළියෙන් ඉන්නම් අංකල්."

මා හිස වැනුවා පමණි. දියණිය කාමරයෙන් පිටව ගියාට පසුව අනූෂ වඩාත් හැගිම්බර විය.

"තිවංක සමන්දිනීව නොබැන්දෙ... මායි සමන්දිනියි අතර සම්බන්ධයක් තියනවා කියලා සැක කරපු හින්දද...?"

තවදුරටත් කතා නොකර සිටින්නට මට නොහැකි විය.

"එහෙම සැකයක් ඇතිවෙන විදියටනෙ අනූෂත් කතා කළේ."

මාගේ කටහඬේ සියුම් තරහවක් වන්නට ඇත. අනූෂ බර සුසුමක් හෙළමින් හිස දෙපසට වැනුවේය.

"තිවංක එහෙම පිටින්ම මාව තේරුම් ගත්තේ වැරදියට."

අනූෂ කතා කළේ බෙහෙවින් හැඟුම්බර අසරණ ලීලාවකිනි.

"දරුවා සමන්දිනීට ගොඩාක් හුරුවෙලා හිටපු හින්දා අනූෂ හිටියෙ අසරණ වෙලා තිවංක."

වසුන්දරා කතා කළේ බොහෝ වේලා නිහඬව සිට හමාරය.

"ඔය ප්‍රශ්න ඇතිවෙනකොටත් මගෙයි අනූෂගෙයි සම්බන්ධෙ තිබුණා... පුතාගෙ හිත හැදෙනකම් ඔය දෙන්නගෙ මැරේජ්ජේක පරක්කු කරවන්න කියලා අනූෂට කිව්වෙත් මං."

මගේ පපු කුහරයේ කිසියම් තැනෙකින් නැඟි ගිනි සිළුවක් පපුව හාර හාරා දැල්වෙන්නට පටන් ගනිමින් තිබිණි.

"අනූෂ ඔයාව හම්බවෙන්න ආපු හැම වෙලාවකම මත් ආවා... මං ඔයාට මූණ නොදී මග හිටියෙ ඔයා අපි ගැන වැරදි වැටහීමක් ඇති කර ගනී කියන බයට."

මම නෙතට උනන කඳුළු වෙර වීරියෙන් වලකා ගන්නට වෙර දරමින් උන්නෙමි.

"ඒත් අපි හිතුවා මායි වසුයි බැන්දට පස්සෙවත් ඔයා ඇත්ත තේරුම් ගනී කියලා."

අනූෂ බර සුසුමක් හෙළුවේය.

"මං ඔය කිසි දෙයක් දැනගෙන හිටියෙ නෑ..."

මා කිවා නොව මට කියවිණි. ඉන් එහා මා යමක් කතා නොකළේ හැකි වී යැයි බියෙනි.

"අපි බැන්ද දවසෙත් ඔයා එහෙ ඇවිත් ගියා කියලා සමන්දිනී මට කිව්වනෙ."

වසුන්දරා කතා කළේ මගේ කියුම් පිළි නොගන්නා සෙයියාවකිනි.

මගේ මතකය වසර ගණනාවක අතීතයට විසි විණි. සමන්දිනීත් ඇගේ නැන්දාත් අනූෂගේ උත්සවයකට ගොස් ආ මොහොතක මා එහි ගිය වග මතකය. එදා මා සමන්දිනී කෙරෙහි සිත් බැඳවා ගත්තේ අනූෂ හා මඟුල් ගෙවල්වලට යන්නට තරම් දෙදෙනා අතර බැඳීම තිබුව ඇතැයි සිතමිණි.

"දෙවියනේ..."

වචන වී පිටවුණේ මගේ පපුවේ ඇවිලී ගිය පශ්චාත්තාපයයි.

"මං මේ විස්තර කියන්න කීප වතාවක්ම තිවංකව හම්බවෙන්න හැදුවා... ඒත් සමන්දිනී ඒකට ඉඩ දුන් නෑ."

මගේ කටහඬ තරමටම අනූෂගේ කටහඬද බරව තිබුණි.

"පව්... සමන්දිනී අනුත්ගෙ දරුවෙක් වෙනුවෙන් මුළු ජීවිතේම කැප කළා."

වසුන්දරාගේ කටහඬද වෙව්ලා යන තරම් විය. මගේ ඇතුළාන්තයේ වූ ශෝකය කෝපයක් බවට පෙරළෙමින් තිබිණි.

"තමුසෙ මගෙ ජීවිතෙත් කාලා ඒ අසරණ කෙල්ලගෙ ජීවිතෙත් කෑවා අයිසෙ."

තවදුරටත් කෝපය හෝ ශෝකය සඟවා සිටින්නට මා තුළ දිරියක් නොවීය. මගේ කටහඬ කාමරයෙන් පිටතද ඇසෙන්නට ඇත.



වසුන්දරා සේම අනූෂ ද මගෙන් එවැන්නක් බලාපොරොත්තු නොවූණු සෙයින් තිගැස්සී මදෙස බලනු මම යන්තමට දිටිමි. තවදුරටත් ඔවුන්ගේ ප්‍රතිචාර දකින්නට පමා නොවූණු මම ඔවුන් එහි හිඳියදීම කාමරයෙන් නික්මීමි.

මම දැඩිසේ කැලඹීමට පත්ව උන්නෙමි. පසුතැවිල්ල මහෝඝයක් සේ හදවතට වද දුන්නේය. අතීතය සිත්තමක් සේ මා දෙනෙත් අභිමුව ඇඳෙමින් මැකිණ. අම්මා, අප්පච්චි, අක්කා, අයියා සේම සමන්දිනී ද ඒ කටු චිත්‍ර අතර විය.

සමන්දිනී මට හමුවීම ජීවිතයේ සතුට සඳහා අප්පච්චි මට හිමි කර දුන් අවසාන අවස්ථාව බඳුය. නොලැබීමට මම එය අහිමි කර ගත්තෙමි.

මම රැය ගෙවා දැමුවේ මරණාසන්න රෝගියකු මෙනි. රැය පුරා බීව මත්පැන් මා සිරුරෙන් දුර්වල කර තිබුණ ද හදවත වේගයෙන් සිතිවිලි පස්සේ හඹා යමින් තිබුණි. ආයේම තරුණ වියට යා නොහැකි වීද වැරැදි නිවැරැදි කර ගන්නට ඉඩ කඩක් නැත්තේම නොවේ.

සමන්දිනී හමු වී සමාව ගන්නට තවමත් ඉඩකඩ ඉතිරිව ඇත. ඇය දිවි හිමියෙන් රැකගත් ඇගේ නොවන දරුවාට මගේම දරුවකු ලෙස සලකන්නට මට හැකියාව ද බොහෝය. අනෙක් අතට මා ඇය වෙනුවෙන් ද ඇය මා වෙනුවෙන් ද තනිකඩව සිටි කාලය සුළුපටු නොවේ. ඉස්සර තරම් ආත්මාර්ථකාමී නොවන මට වෙනදාට වැඩියෙන් ආදරය කරන්නට ද හැකිය.

වයසට ගියද මා ව්‍යාධියට පත්ව ජරාවාස වී නොමැත. තවමත් කළු කෙස් සුදුකෙස්වලට වඩා දහගුණයකින් පමණ වැඩිය. මා එසේ වී නම් සමන්දිනී කෙසේ වන්නට ඇත්ද. අතු රිකිලි මෝරා වැඩුණ ද ගස් මල් පුදන්නේය. මා තරමටවත් ඇය වයසට නොගිහින් ඇතැයි මට සිතිණි.

මම රැයෙහි වෙහෙසකර බව තුනී වී යනතෙක් නිදි යහනට වී උන්නෙමි. දයාදේව උයන පිහන හඬ ද ගුණසිරි ගේදොර අස් පස් කරන හඬ ද වරින් වර මට ඇසිණි. ඒ හඬ අස්සේ ද මම කදිමල නින්දකට වැටී උන්නෙමි. දහවල් දොළහ පසුවන තුරුම මා අවදි නොවූයෙන් මා මැරිලා යැයි සැක සිතාදෝ ගුණසිරිත්, දයාදේවත් කාමරයට ගොඩ විය.

"සර්..."

ගුණසිරිගේ පරිස්සම් කටහඬ ඇසෙද්දී මා උන්නේ අවදියෙනි.

"මොකෝ බං..."

මම නෙතු වසා ගත් වනම කතා කළෙමි.

"සර් දැන් දොළහත් පහු වෙලා..."

"ඉතින්..."

"නෑ ඉතින් වෙනදා සර් මේ වෙලාවට ඇහැරිලානේ... ඒකයි බැලුවෙ..."

"මං මළා කියලා හිතලා උඹලා දේපල බෙදා ගන්න වගේනේ කාමරේට ආවේ."

දයාදේව සහ ගුණසිරි ඊට සිනහා විය. ඔවුන් තුළ ද වෙනදාට වඩා පියකරු බවක් ම දිටිමි.

"දයාදේව..."

"සර්..."

"මට දෙහි ටිකක් වැඩියෙන් දාලා අලිගැට පේර එකක් හදහං."

"උඹට අලිපේර නම් කඩෙන් ගේන්න වෙනවා රජෝ..."

දයාදේව බෙරි කරගත් හඬින් ගුණසිරිට කීවේ පිට කසමිනි.

"මොකෝ අලිපේර ගේන්න රට යන එකක්යැ... මං ගේන්නම්..."

"කාරෙකත් සර්විස් එකට දාන්න ගුණසිරි. මට හෙට දුර ගමනක් යන්න තියෙනවා."

"ඒ කොහෙද සර්..."

"ගෑනියෙක් බලන්ඩ."

මා කීවේ බොරු නොරිස්සුමක් මවාය.

"අනේ සාදු..."

ගුණසිරි නික්ම ගියේ උපහාසයට බර හඬකින් කියමිනි.



හිතෙහි සැක සංකාව යන්නටත් ලෙයට එක් වූ වේදනාව තුනී වන්නටත් ඉඩ හැර මම පැය ගාණක් දිය නෑමි. සමන්දිනී හමුවන්නට පෙරම නැවත නොබී සිටින්නට මම සිතට දිරි ගතිමි. සැබවින්ම මම බලාපොරොත්තු සහගත උද්යෝගිමත් මිනිසකු වී උන්නෙමි.

ඇතමකුට මුළු ජීවිත කාලය පුරාම කළ නොහැකි දේ සමහරක් දිනකින් දෙදිනකින් හමාර කරයි. සතුට රැඳී ඇත්තේ ජීවත්ව හිඳින කාලය තුළ නොවේ. සැහැල්ලුවෙන් සැනසීමෙන් ගෙවූ කාලය තුළයි. මම පමා වී උදාවන්නට යන වසන්තය පිළිබඳව සතුටු වූවා මිස කම්පා නොවීමි. නමුදු අක්කාත්, අයියාත් මේ ආරංචියෙන් අඩු වැඩිය වශයෙන් කම්පාවට පත්වන්නට ඇත. සියල්ල අහවර කොහේවත් යන එකියක මාර්ගයෙන් කාගේවත් දරුවකුට මගේ දේපල උරුම වන්නට යාම ඔවුනට රිසි වූයේ නැත.

"දැන් ඔය සිද්ධිය වෙලා අවුරුදු පහළොවකුත් වෙච්චි කොට සමන්දිනී මොන මොන නැටුම් නැටුවද කියලා අපි කොහොමද බං දන්නේ..."

ඒ අක්කාගේ අදහසයි. එදසවස නම් මම ඔවැනි දේකින් කඩා වැටෙන්නෙමි. නමුදු හිත මෝරා වැඩී උපේක්ෂා සහගත වී ඇත. මගේ ජීවිතය විනාශයට පත්කළේ අනුමානයට සිතන්නට යාමෙත්, සැක කරන්නට යාමේත් කැත පුරුද්දයි. වයසින් මුහුකුරා වැඩෙද්දී ඒ පුරුද්ද මසිතින් දියාරුව ගොස් තිබිණි.

"මල්ලි කැමති දෙයක් කරන්න... මට නම් ඔය පලහිලව්ව ගැන වැඩිය පැහැදීමක් නෑ..."

අයියාගේ මතය අක්කාගේ මතයට වඩා මැදහත් වී ද ඔවුන්ගේ සිතෙහි වූ හැඟීම නම් එකම බව මට වැටහිණි.

කෙසේ වුවද සමන්දිනී සොයා මා නුවර ගියේ මගේ යැයි කියා ගන්නා කිසිවෙකුගේ ආශිර්වාදයෙන් තොරවය. මෝටර් රිය සෝදා දී ඇඳුම මැද මගේ හැඩ වැඩ බලා "දෙයියන්ගේ පිහිටෙන් නෝනවත් එක්කගෙනම එන්නැයි" කියා මා පිටත් කළේ ගුණසිරිත් දයාදේවත් පමණි. හැඩරුවින් පෙනුමින් සේම සිහිවිලිවලින් ද තිරිහන් වෙමින් මා නුවර ගියේ සමන්දිනීට කතා කළ යුතු අන්දම පිළිබඳව තනියම පුහුණු වෙමිනි.

වෙනදා පැය දෙකකින් නිමා කරන එම ගමනට මට පැය තුනකට වඩා වැඩි කාලයක් ගත වූයේ වයස විසින් මට ලබාදුන් සන්සුන්කම නිසා වන්නට ඇත. නොඑසේ නම් සමන්දිනී හමුවීමේ නොසන්සුන්කම මා ඔනෑවට වඩා සන්සුන් කර තිබුණා විය යුතුය. කෙසේ වුවද සමන්දිනීගේ නිවස ඉදිරියේ මින් වසර පහළොවකට පෙරාතුව දී මෙන්ම මම සැලෙන්නට ගතිමි.

සමන්දිනීගේ නිවස ද හාත්පස ද මා සිතුවාට වඩා සොඳුරු වී තිබිණි. නිතපතා ලබන සාත්තුවක සේයා ගහ කොළේ විය. එදවස වල් වැදී තිබුණු ගෙයි එක් පසෙක ළමා උයනක් විය. ඉන් අනෙක් පස නෙක පැහැයෙන් යුතු කුඩා ගොඩනැගිල්ලක් විය. වීදිය ආරම්භයේ වූ 'මල් විමන' ළදරු පාසලේ හිමිකාරිය සමන්දිනී වන්නට ඇත. අහිංසක ලෙස ඇය ගොඩ නගාගත් ජීවිතයේ වටිනාකමත්, පවිත්‍රකමත් මගේ පපුවට දැනිණි.

මිදුලේ හිඳ ගෙයත් හාත්පසත් නෙතින් උරා ගනිමින් හුන් මම දුහැනින් මිදුලේ කුඩා මෝටර් රියක හඬිනි. මා පිටුපසින් ගෙවත්තට පිවිසිමි. කුඩා මෝටර් රිය මගේ වාහනයට ඔබ්බෙන් නතර විය. සිනහ කටක් පුරවා ගත් සමන්දිනී රියෙන් බැස්සාය. මෙවර මගේ අනුමානය නිවැරදි විය. දීප්තිමත් දෑසින් යුතු ඇය වයසට නොගොස් තිබුණි. පළින් පල සුදු කෙස් ගසක් දෙකක් වී ද පෙර සොඳුරු බව ඈ වෙතින් පළා නොගොස් තිබුණි. මා දකිමෙන් ඕ අමුතු තිගැස්මකට හෝ සොම්නසකට පත් වූයේ නැත. මා මෙසේ ඒවි යැයි ඕ බලාපොරොත්තු වූවා වැන්න.

"කොහොමද තිවංක...?"

ඕ මගේ හුස්ම ගැටෙන මානයටම විත් කතා කළාය. මගේ මුහුණේ සැඟවුණු යමක් වේදැයි ඕ සොයා බලමින් උන්නාය.

"ඉන්නවා සමන්දිනී."

මා උත්තර දුන්න පමා වන්නට ඇත.

"අනුෂ අයියලා කිව්වා ඔයාව හම්බඋනා කියලා."

මා දකිමෙන් ඕ විස්මයට පත් නොවන්නට හේතුව එය වන්නට ඇත. මගේ පැමිණීම ඕ බලාපොරොත්තු වන්නට ඇත. ඉන් එහා



ඇයට හෝරාව කතා කරන්නට ඉඩ නොතබා විසි හැවිරිදි වියේ යැයි කිව හැකි තරුණයකු වියදුරු අසුන ළඟින් රියෙන් බැස්සේය.

"දුවා..."

සමන්දිනී තරුණයාගේ අත ගොබය පිරිමදිමින් කිවේ සිහසුන පිළිබඳ උදව් අනන රජතක පරිද්දෙනි.

"දූත් සැහෙන්න ලොකුයි... ලබන මාසේ දහ අටට විස්සක්..."

"තාම ඉගෙන ගන්නවද...?"

"ඔව් අංකල්... ෆස්ට් ඉයර්..."

"කැම්පස් එකේ..."

මා තුළ විස්මයක් හට ගැනුණෙත් මට ඇසිණි.

"ඔව්... ජයවර්ධනපුර."

සමන්දිනී කතා කළේ ඇයට වඩා අඩියක් එක හමාරක් උස පුතු දෙස ආදරයෙන් බලමිනි.

"එතකොට කැම්පස් යන්නේ...?"

"දෙල්කඳ තැනක බෝඩ් වෙලා අංකල් ඉන්නේ..."

"එහෙ බෝඩ් වෙලා හිටියට මොකද වැඩි කාලයක් ඉන්නෙ මෙහෙ... මෙයා මෙහෙ ටියුෂන් කරනවා... කාරෙක ගත්තෙත් යන්න එන්න පහසු වෙන්න."

"ලොකුවට පන්ති කරනවද...?"

"ඔව්... මෙයා මේ පැත්තේ ලීඩින් ඉකෝන් මාස්ටර්."

"ඔව් අංකල්. හැබැයි පස් හය දෙනකුට පස්සෙ..." සමන්දිනී පුතුගේ උරයට පහරක් ගැසීය. මා මැදිහත් වී මොවුන්ගේ ජීවිතයේ ළඟා කර දිය හැකි සතුටක්, සම්පතක් හෝ සැනසීමක් නොවේ යැයි මට මුල් වරට සිතිණි.

"ඔයා බඩු ටික ගෙට ගන්නකො පුතේ... අපි යං තිවංක ගෙට..."

වෙනදා අප පෙම්වත්වන, හුදෙකලාවක, දෙ[illegible] වැඩකට ආලින්දයේ අප තවත් වතාවක් තනිව හමු වී උන්නෙමු. [illegible] නැති කතා බස්, අනුන්ගේ සැප සනීප අපේ මාතෘකාවට බඳුන් විය.

"මට සමාවෙන්න සමන්දිනී..."

අප ගැන කතා කරන්නට අවස්ථාවක් නොලැබෙනම[illegible] තැන මම නුසුදුසු වේලාවක කියා දැමීමි.

"අනේ ඒ ගැන හිතන්නෙපා තිවංක... ඒක එහෙම උනා කියලා ඔයාටවත් මටවත් වැරදුන්නැනේ. ජීවිතය කියන්නෙ කසාද බැඳලා දරුවො හදන එකටම නෙවේනේ..."

ඈ අඳුරට හැරෙමින් තිබිණි. සමන්දිනීගේ සිතෙහි මා පිළිබඳව ඇත්තේ මතකයක් පමණක්ම බව මගේ සිත අවබෝධ කර ගනිමින් තිබිණි. ගිය පයින් එන්නට බැරිකමට මම පැයකට වැඩි කාලයක් එහි ගත කළෙමි.

"පරක්කු උනා සමන්දිනී... ගිහින් එන්නම්..."

"පරිස්සමින්..."

ඒ ඇය නුවර සිට කොළඹ යන්නට දුන් අවවාදය නොවේ. ජීවිතය ඉදිරියට ගෙවා දමන්නට දුන් අවවාදයයි.

මම මිදුලට බැස මෝටර් රියට නැගීමි. වෙනදා වාගේම ඇය ද මිදුලට බැස පුරුදු තැන නතර විය. මෝටර් රිය ඈතට ඇදී යද්දී ඇය බලා සිටිනු පැති කණ්ණාඩියෙන් මම දිටිමි. එ දවස වාගේම අදත් ඕ අනුන්ගේ දරුවෙකු වෙනුවෙන් තම ජීවිතය දුන්නාය.

ඉනික්බිති වසර පහකට වැඩි කාලයක් මම කරන්නන් වාලේ රස්සාව කළෙමි. රැකියාව කරන්නට තවත් වයස තිබියදී ද අතිරේක චක්‍රලේඛයකට අනුව විශ්‍රාම ගිය මම ඉතිරි කළ දෙයින් කා බී ජීවත්වීමි.

වසර ගණනාවකට පෙරාතුව සිතට වැළඳි අංශභාග රෝගය මගේ කය ද ආක්‍රමණය කළේය. මත්පැන් විෂ වී මා ලෙඩ ඇඳට සීමා විය. කෙමෙන් මවෙතින් මතකය දුරස් විය. ජීවිතයේ අවසාන කාලයේ ඔත්පල වූ මා අසල දවටෙමින් මගේ කැත කුණු අතගාමින් සමන්දිනී මා බලා කියා ගත් වග මට යාන්තමට මතකය. එය ඇත්තටම සිදුවුවක්ද නොඑසේනම් සිතෙහි වූ බලාපොරොත්තු විසින් මවනා ලද කල්පිතයක්දැයි මම නොදනිමි.

ඒ කුමක් වුවද මරණයත්, ජීවිතයත් අතර කෙටි සීමාවේදී මා උන්නේ අප්‍රමාණ සැහැල්ලුවකිනි, සොම්නසකිනි, භක්තියකිනි. ජීවිතය එය යැයි මට දැනෙමින් මා කොපමණ කලක් ජීවත්ව උන්නාදැයි මම නොදනිමි. ඇතැම්විට එය වසරක් හෝ දෙකක් වන්නට ඇත. නොඑසේ නම් දිනක් හෝ දෙදිනක් වන්නට ඇත. එසේත් නොමැති නම් එය විනාඩියක් හෝ තත්පරයක් වූවා විය යුතුය.

\- නිමි -

kathapothak.blogspot.com